† මුද්‍රිත මහාභාෂ්‍යයෙහි මේ පාඨය මදක් වෙනස්ලෙස පැනේ. ඒ මෙසේය :—"තෘජාදිභිස්තුල්‍යං පය්‍යායඃ ප්‍රාප්නොති, තද්‍යථා තෘජාදයඃ පය්‍යායෙණ භවන්ති, කිං පුනඃ කාරණං තෘජාදයඃ පය්‍යායෙණ භවන්ති, අනවයවප්‍රසඞ්ගාත් ප්‍රතිපදවිධෙශ්ච ; අනවයවෙන ප්‍රසජ්‍යෙතෙ ප්‍රතිපදං ච විධීයෙතෙ, අප්‍රතිපත්තිරෙවොභයොස්තුල්‍යබලත්වාත් ; අප්‍රතිපත්තිරෙව පුන රුභයොඃ ශාස්ත්‍රයොඃ ස්‍යාත්, කිං කාරණම්, තුල්‍යබලත්වාත්, තුල්‍යබලෙ හ්‍යුභෙ ශාස්ත්‍රෙ, තද්‍යථා වයොස්තුල්‍යබලයොරෙකඃ ප්‍රෙෂ්‍යො භවති ස තයොඃ පය්‍යායෙණ කාය්‍යං කරොති, යදා තු තමුභෞ යුගපත් ප්‍රෙෂයතො නානාදික්ෂු ච කාය්‍යෙ භවතස්තද්‍යද්‍යසාවවිරොධාර්ථී භවති උභයොරර්ථං කරොති, කිං පුනඃ කාරණමුභයොරර්ථං කරොති, යෞගපද්‍යාසම්භවාත්, නාස්ති යෞගපද්‍යෙන සම්භවඃ, තත්‍ර ප්‍රතිපත්ත්‍යර්ථං වචනම්."

‡ පා. 1, 4, 52.

| පිට | පෙළ. | අශුඞ. | | ශුඞ. |
|---|---|---|---|---|
| 77 | 21 | වාක්‍යපී | ... | වාක්‍යාපී |
| 90 | 8 | විවිත්වා | ... | පිවිත්වා |
| 91 | 16 | | ... | a |
| 94 | 13 | ව්‍යවෙච්ජද | ... | ව්‍යවෙච්ඡදක |
| ,, | 18 | විශෙෂයා | ... | විශෙෂයා |
| 100 | 24 | සාපෙකඛා, | ... | සාපෙක්ඛා, |
| ,, | 25 | ශබ්දයෙන් | ... | ශබ්දයන් |
| 104 | 9 | සම්භවක් | ... | සම්භවයක් |
| 106 | 1 | අප්‍රයෙගයෑ | ... | අප්‍රයොගයෑ |
| 112 | 1 | ඨාන | ... | ෂ්ඨාන |
| 114 | 6 | සමාහාරයද | ... | සමාහාරයද |
| 123 | 5 | ජයම්පති තුදම්පති | ... | ජයම්පතී තුදම්පතී |
| ,, | 6 | ජයම්පති ච දම්පති | ... | ජයම්පතී ච දම්පතී |
| 124 | 1 | ගන්ථා | ... | ගන්ථ |
| 127 | 22 | ප්‍රථමා | ... | ප්‍රථම |
| 132 | 20 | නීඥ | ... | නිඥා |
| ,, | 27 | ධවජේසු | ... | ධවජේෂු |
| 133 | 4 | 'තොය්‍යා න | ... | 'තොය්‍යන |
| ,, | 16 | c | ... | b |
| ,, | 18 | d | ... | c |
| ,, | 21 | උඟධම් | ... | උඟධීව |
| 134 | 5 | පුරියතෙ | ... | පූරියතෙ |
| 141 | 16 | විවජ්ඣායං | ... | විවජ්ජායං |
| 143 | 20 | d | ... | c |
| ,, | 22 | e | ... | d |
| ,, | 28 | f | ... | e |
| ,, | 30 | e | ... | f |
| ,, | 32 | g h | ... | f g |
| 145 | 5 | ණෙ ඨා කත | ... | ණෙඨාකත |
| ,, | 8 | සංඛරිය | ... | සාංඛරිය |
| 147 | 15 | h | ... | c |
| 148 | 3 | ණිං නි | ... | ණිංනිඃ |
| ,, | 27° | පවතෙ | ... | පච්චතෙ |
| ,, | 28 | චතුත්ථී | ... | චතුත්ති |
| 152 | 1 | ඉඩ්ඩායෙහිඃ | ... | ඉඩ්ඩායෙහිඃ |
| 161 | 25 | විහන්ති | ... | විහන්ති |
| 163 | 11 | තත්තිවෙදිහීති | ... | තත්තවෙදිහීති |
| 172 | 16 | බ්‍රම්හා | ... | බ්‍රහමා |
| 173 | 39 | ආචාරියා | ... | ආචරියා |
| 179 | 20 | හජාදිහි | ... | හජාදිහි |

---

° "පච්චනෙති හි වුත්තෙත තු" යනාදි ගාථාව හා (31 වෙනි පෙළේ "තීණ්ති දෙවදතෙතාති" යනාදි ගාථාවද මෙහි පාඨ මෙන් මුද්‍රිතවීම ප්‍රමාදයකි.

## ERRATA OF THE NOTES.

### අශොධාලිපි ශුද්ධිය.

| පිට. | | පෙළ. | | අශුද්ධ. | | ශුද්ධ. |
|---|---|---|---|---|---|---|
| 14 | ... | 33 | ... | 26 | ... | 30 |
| ,, | ... | 34 | ... | 100—119 | ... | 112—131 |
| 15 | ... | 33 | ... | 96 | ... | 108 |
| 16 | ... | 33 | ... | 45—17 | ... | 46—21 |
| ,, | ... | 34 | ... | 119 | ... | 131 |
| 30 | ... | 33 | ... | [d] 1, 19 සූ. | ... | [d] 1, 17 සූ. |
| 35 | ... | 34 | ... | 78—43—55 | ... | 79—44—56 |
| 48 | ... | 34 | ... | 56 | ... | 57 |
| 85 | ... | 31 | ... | 27 | ... | 31 |
| 86 | ... | 33 | ... | 128 | ... | 140 |
| 87 | ... | 32 | ... | 2, 193 සූ. | ... | [i] 2, 193 සූ. |
| ,, | ... | ,, | ... | [k] 2, 197 සූ. | ... | [k] 2, 198 සූ. |
| 108 | ... | 33 | ... | 74—120 | ... | 82—132 |
| 110 | ... | 33 | ... | 14 | ... | 18 |
| ,, | ... | 34 | ... | 15—16—17 | ... | 19—20—21 |
| 124 | ... | 33 | ... | 121 | ... | 133 |
| 141 | ... | 33 | ... | 44 | ... | 45 |
| 148 | ... | 32 | ... | [b] 5, 4 සූ. | ... | [b] 5, 54 සූ. |

---

## ABBREVIATIONS. සඞ්කෙතඥාපනය.

සූ. සූත්‍රය.
පා. පාණිනීය.
ක. කච්චායන.
කා. කාතන්ත්‍ර.

# PAÑCHIKÁPRADÍPA.

# පඤ්චිකාප්‍රදීපය.

# PAÑCHIKÁPRADÍPA.

# පඤ්චිකාප්‍රදීපය.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

සම්බොධිනිම්මලපයොධිසමුබ්භවස්ස
යස්සුජ්ජලන්තවචනජ්ජුතිසන්තතීහි
සඞ්කොචමෙන්ති පරවාදිමුඛාරවින්දා
වන්දෙ සදා තමතුලං මුනිරාජචන්දං.

ආදිච්චවංසකමලාකරභාකරෙන
රාජින්දමොලිමණිරඤ්ජිතසාසනෙන
ලඞ්කිස්සරෙන මයමත්‍රජපෙමබුද්ධා
සංවඩ්ඪිතා පිතුපදාධිගතෙන යෙන.

සත්ථන්තරෙ ච විවිධෙ සමයන්තරෙ ච
භාසන්තරෙ ච සකලෙ පිටකත්තයෙ ච
ආචෙරභාවමුපගම්ම භජාම පීතිං
දීඝං ස ජීවතු පරක්කමබාහුරාජා.

---

මොග්ගල්ලායනාචරිය ථෙරෙන පිරබුද්ධිනා
කතා යා පඤ්චිකා සුද්ධා ගුළ්හභාවා සවුත්තියා.
ව්‍යාඛ්‍යාතුනමකොසල්ලා නාධීතා චිරමන්තරෙ
සා ටීකාය'පි දුබ්බොධා සත්ථන්තරනයාකුලා.
තස්මා සීහළභාසාය තිමුත්‍යාදීහි භාසිතං
ලක්ඛණං දස්සයිත්වාන දීපො තස්සා විධීයති.

---

යම්කිසි ප්‍රකරණයක් විකීර්ණුවූ ආචාර්‍ය්‍යයාවිසින් සංඥා නිමිත්ත කර්තෘ පරිමාණ ප්‍රයොජනයැ යන මේ පචපදාර්ථය සන්දර්ශිතව්‍යයි.

එහි සංඥා වක්තෘශ්‍රොතෘලොකයාගේ ව්‍යවහාරසෞකර්‍ය්‍ය සඳහා වක්තව්‍යයි.

කීයේ මැ නෝ :—

“ යථා ගන්‍ධවශාත්පුල්ල මලිනො යාන්ති ශාඛිනම්
තථොද්ඝාතවශාච්ඡාස්ත්‍ර මුපගච්ඡන්ති සාධවඃ ” යි.

නිමිත්තද මනීෂිජනසම්භාවනාව ග්‍රන්ථොත්පත්තිනිමිත්ත පරිඥානමූලක වැ වන්නෙන් තදුත්පාද සඳහා වක්තව්‍යයි.

කීයේ මැ නෝ :—

“ ක්ෂත්‍රස්‍ය සූනොර්නීත්‍යුපලොකභකතිර්-
ඥනාද්‍යථා ස්‍යාත්ප්‍රභවස්‍ය ශුද්ධෙඃ
සම්භාවනා බුද්ධිමතාන්තමෙව
ග්‍රන්ථෙ නිමිත්තාවගමානන්තවීනෙ ” යි.

ග්‍රන්ථකර්තෘද පුද්ගලප්‍රමාණලොකයහට ග්‍රන්ථවිෂයගෞරවයැ පුද්ගලධාරක වැ වන්නෙන් තදුත්පාද සඳහා වක්තව්‍යයි.

කීයේ මැ නෝ :—

“ ශාස්ත්‍රප්‍රමාණමපුරුෂප්‍රමාණ-
තෙන'පි ප්‍රමාණමප්‍රණයන්ති යෙ තත්
ආචාරමාහුශ්ච පුනස්සතීයං
ධර්‍මස්‍ය චාපත්‍යචරිත්‍රඃ ප්‍රමාණම් ” යි.

පරිමාණද ප්‍රතිපත්තෘප්‍රොත්සාහනයැ වනහෙයින් වක්තව්‍යයි.

කීයේ මැ නෝ :—

“ පරිමාණවචනං ශිෂ්‍යස්‍ය යථාශක්ති ප්‍රතිපත්ත්‍යර්ථම් ” යි.

ප්‍රයොජනද තත්ප්‍රයොජනාපෙක්ෂ වැ පවත්නා ජනයන් ගේ ප්‍රවෘත්ති සඳහා වක්තව්‍යයි.

කීයේ මැ නෝ :—

“ සර්වස්‍යෙව හි ශාස්ත්‍රස්‍ය
කර්මණො වා'පි කස්‍යචිත්
යාවත්ප්‍රයොජනං නොක්ත-
ස්තාවත්තත්කෙන ගෘහ්‍යතෙ ” යි.

මේ යථොක්තප්‍රකාරයෙන් සප්‍රයොජනවූ සංඥාද්‍යුපපඤ්චකයැ දක්වන්නට චිරන්තනව්‍යාඛ්‍යානකාරයෝද කීහ :—

“ සංඥං නිමිත්තං කර්තාරමපරිමාණමප්‍රයොජනම්
ප්‍රාගුක්ත්වා සර්වතන්ත්‍රාණමපිබ්‍රූයාද්විචක්ෂණඃ ” යි.

එහි සාමාන්‍යසංඥාය, විශේෂසංඥායැයි සංඥා විවිධ වේ—මෞද්ගල්‍යායනව්‍යාකරණය, යනු සාමාන්‍යසංඥාය, මුගලන් පඤ්චිකාය, යනු විශේෂසංඥායි—ඒ “සංවණ්ණනං” යන්නෙන් දක්වනලදී—අන්තර්නිමිත්තය, බාහ්‍යනිමිත්තයැයි නිමිත්ත විවිධ වේ—“තස්සාපි සංඛෙපනයෙන සොව සංවණ්ණනං දානි සමාරභෙය්‍ය” යි ප්‍රතිඥාකරණයට මූලකාරණවූ කරුණාව අන්තර්නිමිත්ත නම, ; සත්පුරුෂවූ ශ්‍රොතෘජනතෙම බාහ්‍ය නිමිත්ත නම් වේ—කවරහු අනුරාධපුරයෙහි සතුපාරාමවිහා රාධිවාසී ශිලාචාරශ්‍රද්ධාවීර්‍ය්‍යප්‍රඥාකෘපාදි ලෞකිකගුණරත්නභූෂණයෙන් විභූෂිතවූ :—

“යා ශක්තිඃ පාණිනෞ යා ච චන්ද්‍රකාත්‍යායනාදිෂු
සෙයමුත්තිමතී මන්‍යෙ මෞද්ගල්‍යායනරූපිණී.”

යනාදීන් ස්වකෘතව්‍යාකරණශ්‍රවණපරිණතප්‍රීතිභරිත තදනීන්තනමහාවෛයාකරණකවිවරයන්විසින් ශබ්දශාස්ත්‍රකරණයෙහි දත්තාභිෂෙකඇති භූමණ්ඩලමණ්ඩන සකලගණිගණයන් විසින් සම්භාවනීයවූ ආචාර්‍ය්‍ය මෞද්ගල්‍යායනමහාස්වාමිපාදයෝයි—ඔහු “යො ඉද්ධිමතෙතසු” යනාදීන් දක්වනලදහු—පරිච්ඡෙදපරිමාණය, ග්‍රන්ථපරිමාණයැයි පරිමාණ විවිධ වේ—එහි සංඥාදිකාණ්ඩය, සන්ධිකාණ්ඩය, සමාසකාණ්ඩය, ණාදිකාණ්ඩය, ඛාදිකාණ්ඩය, ත්‍යාදිකාණ්ඩය, යනු පරිච්ඡෙදපරිමාණය, —“සමත්තා චායං මොග්ගල්ලානපඤ්චිකා වීසතියාභාණවාරෙහි” කීබැවින් බණවරවිසින් විසිබණවරෙක, ග්‍රන්ථවිසින් පන්දහසෙක, අක්ෂරවිසින් එක්ලක්ෂසැට දහසක් අකුරු, වේ—මේ ග්‍රන්ථපරිමාණය, ; හේ “සංඛෙපනයෙන” යන්නෙන් දක්වනලදී—මුඛ්‍යප්‍රයොජනය, ආනුෂඞ්ගිකප්‍රයොජනයැයි ප්‍රයොජන විවිධ වේ—එහි මුඛ්‍ය ප්‍රයොජන නම් විචිත්‍රප්‍රකරණකරණයෙහි ශක්තිය, විවත්සභායෙහි අභිමතාර්ථප්‍රතිපාදනයෙහි යුක්ත්‍යාගමානුගතකෞශල්‍යය, යන මේ ආදියයි.

කීයේ මැ නෝ රත්නශ්‍රීඥානාචාර්‍ය්‍යයන් විසින් :—

“ශබ්දාපිරූපාවගමාච්ච සම්‍ය-
ක්ත්ත්විච්ච ව්‍යක්ත්‍යා ච යශඃප්‍රසිද්ධිඃ,
සත්කාරලාභාවපි සම්භවෙතාං
ගුණප්‍රියෙභ්‍යඃ ඵලමෛහිකන්තත්” — යි.

නොහොත් ධර්‍මවිනයදෙක්හි කුලපුත්‍රයන් හික්මැවීමද පරිවාසමානත්තාදි විනයකර්‍මයෙහි තදනුරූපකර්‍මවාක්‍ය යොදා තත්තත්කර්‍මනිස්තරණසාමර්ථ්‍යයද මුඛ්‍යප්‍රයොජනයි—ආනුෂඞ්ගිකප්‍රයොජන නම්:—"සද්දලක්ඛණාවබොධනෙන පදාවබොධො තෙන පාළියත්ථවිජානනං තෙන යොනිසො පටිපජ්ජනං තෙන කිලෙසසංසාරෙහි විමොක්ඛො" යනුයි.

යථොක්ත සංඥාදිපූර්වපීඨිකායද රත්නත්‍රයප්‍රණාමපූර්වක කොට දක්වනුකැමැති වූ පඤ්චිකාපරනාමධෙයයක් ඇති මේ මෞද්ගල්‍යායනවෘත්තිවර්‍ණනායෙහි ප්‍රථම කොට "**මහාදයො**" යනාදි ගාථා ප්‍රාරම්භ කොළේ.

මෙහි සමුදායාර්ථයැ අවයවාර්ථයැයි අර්ථදෙකෙක් වේ—සමුදායාර්ථ නම් ඉෂ්ටදෙවතානමස්කාරය හා සංඥාදිපීඨිකායැ හේ පූර්වනිර්දිෂ්ටයි—අවයවාර්ථද ව්‍යුත්පත්ත්‍යර්ථයැ පදාර්ථයැයි ද්විප්‍රකාර වේ—එහි ව්‍යුත්පත්ත්‍යර්ථ නම් "මහාදයො" යනාදි තත්තත්පදයන්ගේ ව්‍යුත්පත්තිනිමිත්තාර්ථයි — **මහාදයො** යන තන්හි "අරහ-මහ-පූජායං" යන ධාතුයැ, "දය-දානගතිහිංසාදානෙසු" යන ධාතුයැ, කෘදන්තයෙන් බහුව්‍රීහිසමාසයි—විසය මහන්තතාය මහතී පසත්ථා වා දයා අස්සාති මහාදයො—**යො** යනු යශබ්දයැ අර්ථමාත්‍රයෙහි ප්‍රථමායි—**ජනතාහිතාය** යන තන්හි "ජන-ජනනෙ" යන ධාතුයැ, "හි-ගතිම්හි" යන ධාතුයැ, ජනානං සමූහො ජනතා, තස්සා හිතාය, තද්ධිත කෘදන්තයෙන් තත්පුරුෂසමාසයි—**සම්බොධිසම්පාපකධම්මජාතං** යන තන්හි සංපූර්වවූ "බුධ-අවගමනෙ" යන ධාතුයැ සංපපූර්වවූ "අප-පාපුණනෙ" යන ධාතුයැ, "ධර-ධාරණෙ" යන ධාතුයැ, "ජන-ජනනෙ" යන ධාතුයැ, කෘදන්තයෙන් තත්පුරුෂසමාස හා විශෙෂණසමාසයි—සම්බොධියා සම්පාපකං සම්බොධිසම්පාපකං, ධම්මානං ජාතං ධම්මජාතං, සම්බොධිසම්පාපකඤ්ච තං ධම්මජාතඤ්චෙති සම්බොධිසම්පාපකධම්මජාතං—**සමපූරයං** යනු සංපූර්වවූ "පූර-පූරණෙ" යන ධාතුයැ, කෘදන්තයෙන් අර්ථමාත්‍රයෙහි ප්‍රථමායි—ඒ "යො" යනු හා සමානාධිකරණයි—"භින්නනිමිත්තස්‍ය ශබ්දස්‍ය එකස්මින්නර්ථෙ ප්‍රවෘත්තිස්සාමානාධිකරණ්‍යම්, අථවා එකවිභක්ත්‍යන්තපදවාච්‍යත්වං සාමානාධිකරණ්‍යම්"—**දුක්ඛං** යනු දුපූර්වවූ "ඛන-ඛණ-අවදාරණෙ" යන ධාතුයැ, කෘදන්තයෙන් කර්‍මකාරකයෙහි ද්විතීයායි—**අනඤ්ඤරූපං** යන තන්හි "අම-ගම-ගමනෙ" යන

ධාතුයෑ, "රූප-රූප්පනෙ" යන ධාතුයෑ, කෘදන්තයෙන් බහුව්‍රීහිසමාසයි—නත්ථි අන්තං එතස්සාති අනන්තං, අනන්තං රූපං අස්සාති අනන්තරූපං—**අභින්නරූපො** යන තන්හි "භිද—අසහනෙ" යන ධාතුයෑ, "රූප—රූප්පනෙ" යන ධාතුයෑ, කෘදන්තයෙන් බහුව්‍රීහිසමාසයි—අභින්නං රූපං සභාවො අස්සාති අභින්නරූපො—**අනුභවී** යනු අනුපූර්වවූ "භූ—සත්තායං" යන ධාතුයෑ, ආඛ්‍යාතපදයි—**සුඛං** යනු සුපූර්වවූ "ඛන—ඛණු—අවදාරණෙ" යන ධාතුයෑ, කෘදන්තයෙන් කර්මයෙහි ද්විතීයායි—**ඉව** යනු උපමාද්‍යොතකඅසඞ්ඛ්‍යයි—මේ ආදි ක්‍රමයෙන් සෙසුගාථායෙහිද වෛයාකරණයන්විසින් ව්‍යුත්පත්ත්‍යර්ථවිභාග දතයුතු.

පදාර්ථ කියනුලැබේ.

(1) **යො**, යමෙක් ; **මහාදයො**, (දුඃඛාර්ණවනිමග්නවූ අනන්තප්‍රාණිසත්වයන් කෙරෙහි අභිව්‍යාප්ත වැ පවත්නා හෙයින්) මහාවිෂයවූ කරුණා ඇත්තේ ; නොහොත් (මහාකරුණාසමාපත්තිවශයෙන්ද අනන්‍යසාධාරණ වැ පවත්නා බැවින්) ප්‍රශස්තවූ කරුණා ඇත්තේ ; **ජනතා**, (කර්මක්ලේශයෙන් ජනිතවූහෙයින් ජන නම්වූ) සත්වලොකය හට ; **හිතාය**, අභිවෘද්ධියෑ පිණිසෑ ; හෙවත් (අවිඥාතපූර්වකොටිඇති සංසාරයෙහි වෘත්තදුඃඛප්‍රවෘත්තියෙන් මුදා) නිර්වාණසුඛභාක් කරනු පිණිසෑ ; **සම්බොධි**, (සවාසනා සර්වක්ලේශාත්‍යන්තසමුච්ඡෙදකරවූ) අර්හත්මාර්ගඥානයට ; (නොහොත් ආකාඞ්ක්ෂාප්‍රතිබද්ධ අනාවරණඥානසඞ්ඛ්‍යාත) සර්වඥතාඥානයට ; **සම්පාපක**, පමුණුවන්නාවූ ; **ධම්මජාතං**, (පඤ්චමහාපරිත්‍යාගානුගත දානශීලාදිසමත්‍රිංශත්පාරමී) ධර්මසමූහය ; **සම්පූරයං**, (සම්පූරයන්තො), සම්පූර්ණ කොටෑ නිෂ්පාදනයෑ කරන්නේ ; **අනන්තරූපං**, (කාරණවශයෙන්) අපරිමිතස්වභාවවූ ; **දුක්ඛං**, (කායික) දුඃඛයෑ ; **සුඛංව**, සුව (විඳිනාක්) මෙන් ; **අභින්නරූපො**, බෙදයට (පරිශ්‍රමයට) නොපැමිණියාවූ (චිත්ත) ප්‍රකෘති ඇත්තේ ; **අනුභවී**, අනුභවයෑ කෙළේද ; හෙවත් වින්දේද......

---

(1) මහාදයො යො ජනතාහිතාය සම්බොධිසම්පාපකධම්මජාතං,
සම්පූරයං දුක්ඛමනන්තරූපං අභින්නරූපො'නුභවී සුඛංව.

(1) **ජිතමාරවීරං**, අභිභවනයැ කරනලද වීරවූ [දෙවපුත්‍ර] මාරයා ඇති ; හෙවත් දෙවපුත්‍රමාරයාගේ බලවිධ්වංසනයැ කළාවූ ; **සුදන්තසොවණ්ණනිභං**, මොනවට පිඹ නඟනලද ස්වර්ණයකට බඳුවූ ශොභා ඇති ; නොහොත් මනාකොටැ උත්තප්තවූ කාඤ්චනප්‍රතිමාවක් හා සදෘශවූ ; **ධම්මරාජං**, (පරොපදෙශරහිත වැ ස්වයම්භූඥානයෙන් සමුත්පාදිතවූ ආගමාධිගම) ධර්මයට ස්වාමිභාවයෙන් රාජන්වූ ; **තං**, ඒ (සර්වඥයාද) ; **මොහන්ධතම**, (විතතාන්ධ්‍යලක්ෂණවූ) මොහනැමැති ගාඪාන්ධකාරයැ ; **පධංසිං**, ප්‍රකාරයෙන් විධ්වංසනයැ කරන සුලුවූ ; **ධම්මඤ්ච**, (වදාළපරිද්දෙන් පිළිපදනවුන් අපායාදි දුඃඛයෙහි නොහියදෙනු කොටැ ධරනහෙයින් ධර්ම නම් වූ :—

"සොතාපත්තාදයො මග්ගා චත්තාරො තප්ඵලානි ච
චත්තාරි අථ නිබ්බානං ධම්මා ලොකුත්තරා නව " යි

දක්වනලද සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර) සද්ධර්මයද ; **ගුණෙහි**, (ශීලසමාධිප්‍රඥාවිමුක්තිවිමුක්තිඥානාදිවූ) ගුණයෙන් ; **සමප්පිතං**, සඞ්ගතවූ (යුක්තවූ) ; **සඞ්ඝන්තථා**,

("චත්තාරො ච පටිපන්නා චත්තාරො ච ඵලෙ ඨිතා
එස සඞ්ඝො උජුභූතො පඤ්ඤාසීලසමාහිතො " යි

දක්වනලද සංවෘතිසඞ්ඝසහිතවූ අෂ්ටාර්‍ය්‍යපුද්ගල) සඞ්ඝයාද ; **නමිත්වා**, (කායාදි ද්වාරත්‍රයෙන් සකසා) වැඳ ; හෙවත් (මනොද්වාරගත භක්තිශ්‍රද්ධාතිශයෙන් ප්‍රෙරිත වැ වාග්ද්වාරයෙන් ස්තුති කොටැ කායද්වාරයෙන්) ප්‍රණත වැ——

(2) **ඉද්ධිමන්තෙසු**, (ලෞකික ලොකොත්තර) ඍද්ධිවිධාදීන් යුක්තවූ මහාශ්‍රාවකයන් අතුරෙහි ; **මහත්තපත්තෙන**, මහත් බවට පැමිණියාවූ ; හෙවත් "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ඉද්ධිමන්තානං යදිදං මහාමොග්ගල්ලානො " යි සර්වඥයන්විසින් ඍද්ධිමතුන් අතුරෙහි එතදග්‍රභාවයට පමුණු

---

(1) තං ධම්මරාජං ජිතමාරවීරං සුදන්තසොවණ්ණනිභං නමිත්වා,
ධම්මඤ්ච මොහන්ධතමප්පධංසිං සඞ්ඝන්තථා සමප්පිතං ගුණෙහි.

(2) යො ඉද්ධිමන්තෙසු මහත්තපත්තො
කතනාමධෙය්‍යො න තපොධනෙන,
යං සද්දසත්ථං රචිතං අනූනං
වුත්ති ච තස්සාථ කතා සමාසා.

වනලද මහාමෞද්ගල්‍යායනස්ථවිර නම්වූ ; **යො**, යම් (ද්විතීය අග්‍රශ්‍රාවකයෙක්) ඇද්ද ; **තන්නාමධෙය්‍යෙන**, ඔහුගේම නාමධෙය ඇත්තාවූ ; **තපොධනෙන**, යතීශ්වරයාවිසින් ; **අනූනං**, (අශෙෂලක්ෂ්‍යයැ පරිග්‍රහකළ හෙයින්) සම්පූර්ණවූ ; **යං සද්දසත්ථං**, (ප්‍රකෘතිප්‍රත්‍යයාදිවිභාගකල්පනාවශයෙන් ශබ්දානුශාසනයැ කරනලබනහෙයින් ශබ්දශාස්ත්‍ර නම්වූ ශබ්දලක්ෂණව්‍යාකරණාද්‍යපරනාමධෙය ඇති) යම් සූත්‍රපාඨයෙක් ; **රචිතං**, කරනලද්ද ; **අථ**, තදනන්තර වැ ; **තස්ස**, ඒ ශබ්දශාස්ත්‍රයට ; **වුත්ති ච**, (සූත්‍රවිවරණොදාහරණප්‍රත්‍යුදාහරණාදි ප්‍රකාශකවූ) වෘත්තියද ; **සමාසා**, සංක්ෂිප්ත වී ; **කතා**, කරනලද්දීය.

(1) **තස්සා'පි**, ඒ වෘත්තියටද ; **සංඛෙපනයෙන**, සංක්ෂෙප ක්‍රමයෙන් ; **සොව**, (යමෙක් ශබ්දශාස්ත්‍රයට හා වෘත්තියට කර්තෘද) ඒ ආචාර්‍ය්‍ය මැ ; **ඉදානි**, දැන් (ප්‍රාප්තාවසරයෙහි) ; **සංවණ්ණනං**, (ඒ වෘත්ත්‍යර්ථවර්ණනාලක්ෂණවූ) පඤ්චිකාව ; **සමාරභෙස්‍ය**, ප්‍රාරම්භ කරන්නේයැ (පටන්ගන්නේයැ) ; **සාරභූතං**, (ඵල්ගුපදපරිහාරයෙන් කියනලදහෙයින්) සපිරාංශවූ නොහොත් (ලෞකිකලොකොත්තරගුණාතිශය සාධනෛකසාධනභාවයෙන්) ශ්‍රෙෂ්ඨවූ ; **විපුලත්ථගාහිං**, (ග්‍රන්ථසඞ්ඛ්‍යාවෙන් සංක්ෂෙප කළ පමණක් මුත් න්‍යායානුසරණයෙන් අර්ථයැ නිරවශෙෂ කොටැ දක්වූහෙයින්) අනල්පාර්ථග්‍රහණයැ කරන්නාවූ ; **අනාකුලං**, (ව්‍යාකුල වර්ණනා ක්‍රමප්‍රතික්ෂෙපයෙන්) ආකුලරහිතවූ ; **තං**, ඒ (වෘත්තිවර්ණනාව) ; **සන්තො**, සත්පුරුෂ ශ්‍රොතෘජනයෝ ; **සාධු**, (අර්ථානුරූපව්‍යඤ්ජනයැ හා ව්‍යඤ්ජනානුරූපවූ අර්ථයැ සලකා සාවධාන වීමෙන්) මනා කොටැ ; **සුණන්තු**, (ස්වර්ණභාජනයෙහි නික්ෂිප්ත සිංහතෛලයක් මෙන් නොනස්නා කොටැ ලෙහිලා ධැරීමෙන්) ශ්‍රවණයැ කෙරෙත්වා ; හෙවත් ශ්‍රවණොද්ග්‍රහණ ධාරණපරිප්‍රශ්නචින්තනාදික්‍රමයෙන් ශික්ෂාව කෙරෙත්වා.

මෙහි පූර්වගාථාවයෙන් ඉෂ්ටදෙවතානමස්කාරයැ සන්දර්ශිතයැ, ඒ පූජ්‍යපූජානිෂ්පාදක කුශලචෙතනාවයෙන් විධූතාශෙෂකිල්විෂයන් ඇති චිත්තසන්තානයෙහි භවාන්තරයෙහිදු කරනලද

(1) තස්සා'පි සංඛෙපනයෙන සොව සංවණ්ණනංදානි සමාරභෙස්‍ය,
තං සාරභූතං විපුලත්ථගාහි මනාකුලං සාධු සුණන්තු සන්තො.

අන්තරායකරධර්මයන් ප්‍රත්‍යයවෛකල්‍යකරණයෙන් ප්‍රතිබාහනයැ කොටැ තබෙතුකවූ භයාද්‍යන්තරායනිවර්තනයෙන් යථාරබ්ධශාස්ත්‍රයැ නිර්විඝ්නයෙන් පරිසමාප්තියට පැමිණෙන පිණිසයි.

මෙහි පූජ්‍යයෝ නම් බුද්ධාදිරත්නත්‍රයයැ, ඔවුන්ට පූජා නම් ආමිෂප්‍රතිපත්තිවශයෙන් ද්විප්‍රකාර වේ—එහි පුෂ්පගන්ධාදීන්ද චතුර්විධප්‍රත්‍යයෙන්ද බුද්ධාදීන්ට කරනලද සත්කාර "ආමිෂපූජා" නම් වේ—අභිවාදනශරණගමනාදි ධර්මානුධර්මප්‍රතිපත්තියැ "ප්‍රතිපත්තිපූජා" නම් වේ—මෙහි ප්‍රතිපත්ත්‍යෙකදෙශවූ පූජා නොමෝ ස්තුතිප්‍රණාමවශයෙන් ද්විප්‍රකාර වේ—එහි ස්තුති භගවත්හට හෙතුඵලසත්වොපකාරවශයෙන් ත්‍රිවිධාකාරයෙන් කරනලදී—එහි හෙතුසම්පත්ති නම් මහාකරුණාසමායොගයැ බොධිසම්භාරසම්භරණයයි—ඵලසම්පත්ති නම් ඥානප්‍රහාණ අනුභාවරූපකායසම්පත්වශයෙන් චතුර්විධ වේ—එහි සර්වඥතාඥානයට පිහිටවූ මාර්ගඥානයද එ මැ මුල් කොටැ ඇති දශබල චතුර්වෛශාරද්‍යාදි ඥානයෝද "ඥානසම්පත්" නම් වේ—සවාසනාසකලක්ලෙශයන්ගේ අත්‍යන්තානුත්පාදස්වරූපබවට පැමිණීමැ "ප්‍රහාණසම්පත්" නම් වේ—කැමැති කැමැති වස්තූන් ඉපැදවීමෙහි ඉසුරුබව "අනුභාවසම්පත්" නම් වේ—සකල ලොකනයනරසායනවූ ද්වාත්‍රිංශද්වරමහාපුරුෂලක්ෂණාශීත්‍යනුව්‍යඤ්ජනයෙන් සමලඞ්කෘතවූ ආත්මභාවයතෙම "රූපකාය සම්පත්" නම් වේ—සත්වොපකාරසම්පත් නම් ආශයප්‍රයොග වශයෙන් ද්විවිධ වේ—එහි දෙවදත්තාදි නිත්‍යවිරොධිසත්වයන් කෙරෙහිදු නිත්‍යයෙන් හිතාධ්‍යශයබවද නොමුහුකල ඉඳුරන් ඇති භද්‍රජිස්ථවිරාදීන්ගේ ඉන්ද්‍රියපරිපාකකාලාවගමයද "ආශය" නම් වේ—මෙසින් පිටත් සෙසුසත්වයන්ට ලාභසත්කාරාදියෙහි නිරපෙක්ෂසිත්ඇති බුදුන්ගේ යානත්‍රයමුඛයෙන් සර්වදුඃඛනෛර්‍යාණිකධර්මදෙශනාව "ප්‍රයොග" නම් වේ—එහි ද්විවිධවූ හෙතුසම්පත්තීන් අතුරෙන් "මහාදයො" යන පදයෙන් මහාකරුණාසමායොගයැ දක්වනලද්දැ; "සම්බොධිසම්පාපකධම්මජාතං—පෙ—සුඛංච" යන වාක්‍යයෙන් බොධිසම්භාරසම්භරණයැ දක්වනලදී—චතුර්විධ ඵලසම්පත්තීන් අතුරෙන් "ජිතමාරවීරං" යන පදයෙන් ඥානප්‍රහාණ අනුභාවසම්පත්තියැ දක්වනලද්දැ; "සුද්ධන්තසොවණ්ණතිභං" යන පදයෙන් රූපකායසම්පත්තියැ දක්වනලදී—"ධම්ම

රජං" යන පදයෙන් විවිධවූ සත්වොපකාරසම්පත්තියැ දක්වනලදී.

"යං සද්දසත්ථං රචිතං" යනාදීන් ග්‍රන්ථිශ්‍රයසන්දර්ශනයැ සූත්‍රවෘත්ත්‍යාදීන්ගේ අනන්‍යකර්තෘකත්වයෙන් අභිප්‍රායශුද්ධියැ ඇතිබව දක්වන පිණිසයැ—"සංඛෙපනයෙන සාරභූතං විපුලත්ථගාහිං අනාකුලං" යන මේ කරණප්‍රකාරසන්දර්ශනයැ ශාස්ත්‍රාරම්භප්‍රතික්ෂෙපජනනිෂෙධයැ පිණිසයැ—"සංවණ්ණනං" යන අභිධෙයසඞ්ඛ්‍යාතප්‍රයොජනසන්දර්ශනයැ ප්‍රෙක්ෂාපූර්වකාරීන්ගේ ශාස්ත්‍රයෙහි ප්‍රවෘත්තියැ පිණිසයි.

සාධ්‍යසාධනලක්ෂණවූ සම්බන්ධයද අභිධෙයසඞ්ඛ්‍යාත ශබ්ද සංස්කාරණප්‍රයොජනයට අන්තර්ගතහෙයින් වෙන් කොටැ නොකියනලද්දැයි දතයුතු.

මෙ මැ කීහ චාන්ද්‍රපඤ්ජිකාකාර ආචාර්‍ය්‍ය රතනමතිපාදයෝ.

"ශාස්ත්‍රම්ප්‍රයොජනඤ්චෛව
සම්බන්ධස්‍යාශ්‍රයාවුභෞ
තදුක්ත්‍යන්තර්ගතාස්තස්මා-
දභිනෙනා නොක්තඃ ප්‍රයොජනාත්" යි.

මෙසේ ප්‍රකරණාරම්භයෙහි ඉෂ්ටදෙවතාපූජාද්‍යර්ථවූ ගාථා චතුෂ්කයක් දක්වා දැන් ප්‍රතිනියතකර්තෘනාධගවර්ණනීයග්‍රන්ථයට ආදිභූතවූ වාක්‍යය අනධිකෘතපරිහාරමුඛයෙන් උපන්‍යාස කොටැ "ඉධායං" යනාදි කීහු.

ඉධ, මේ මාගධව්‍යාකරණප්‍රස්තාවයෙහි—"අර්කෙ චෙන්මධු වින්දෙත කිමර්ථම්පර්වතං ව්‍රජෙත්" යන අර්කමධුන්‍යායයෙන් අනායාසවූ කායමනොමයප්‍රණාමයෙන් ජනිත පුණ්‍යාතිශයසම්පත්තියෙන් වාඤ්ඡිතපර්‍ය්‍යන්තයට පැමිණෙතුදු වාක්ප්‍රණාමයැ පිණිසැ කරනලද පද්‍යරචනාප්‍රයාසයෙන් ප්‍රයොජන කවරේද්දැයි යන අනන්තර්ලීනචොද්‍යයැ සිත්හි තබා තත්පරිහාරදර්ශනයැ සඳහා "තත්‍ර රතනත්තයප්පණාමසන්දස්සනං" යනාදි කීහු.

තප්පණාමකරණ, ඒ (බුද්ධාදිරත්නත්‍රයට) නමස්කාරකිරීමෙන්; අනුගුණ, ආනිසංසයන්ට අනුකූලවූ; පණීතතර, (රාගාදිමලාපගමයෙන් තීක්ෂණවිශදභාවයට පැමිණි ප්‍රඥාප්‍රභාව ඇතිහෙයින්) අතිශයෙන් උතුම්වූ; චිත්තසන්තානානං,

විත්තප්‍රබන්ධ ඇත්තාවූ ; අධිගත, (එහෙයින් මැ) පැමිණෙන ලද ; අනෙකානිසංසවිසෙසානං, ආයුස්සුඛවණ්ණබලප්‍රතිභානාදිවූ නොයෙක් ආනෘශංසප්‍රකර්ෂ ඇත්තාවූ ; සවිසෙස, විශෙෂසහිත වැ ; හෙවත් විනේතාවෙගාද්‍යුපද්‍රවලෙශයකුත් නොවනපරිද්දෙන් ; විසොසිතනන්තරායානං, විධ්වංසනය කරනලද විඝ්නයන් ඇත්තාවූ ; හෙවත් (දිවසකරකරනිකර විස්ඵුරණයෙන් සවිශෙෂවිශොෂිත තුෂාරකණිකානිකායක් මෙන්) ප්‍රලයප්‍රතිශරණතාවට පමුණුවනලද (ආධ්‍යාත්මික බාහ්‍යභයාදි) සකලොපද්‍රවයන් ඇත්තාවූ ; සොතූනං, (ප්‍රතිපන්නශාස්ත්‍රක අප්‍රතිපන්නශාස්ත්‍රක) ශ්‍රොතෘජනයන්ගේ ; අභිසමීහිත, කැමැතිවනලද ; නොහොත් කොටැ නිමවන ලද ; ගන්ථ, ශාස්ත්‍රයාගේ ; අවබොධඵලසංසිද්ධිං, පරිඥාත ප්‍රයොජනයැ මනාකොටැ සිඩවනපිණිසයි—එතදෙව, (ශ්‍රොතෘන්ගේ ශාස්ත්‍රාවබොධඵලසංසිද්ධියැ යන යමෙක් ඇත්ද) මෙ මැ ; තදුපදස්සනෙ, ඒ (රත්නත්‍රයප්‍රණාම) දර්ශනයෙහි—ආවරණමන්තනෙව, (ශාස්ත්‍රාරම්භයට පූර්වභාගයෙහි කායමය වූ) ඉෂ්ටදෙවතානමස්කාරපමණෙකින් මැ—බුද්ධිපුබ්බකාරීනං, ප්‍රෙක්ෂාපූර්වකාරීන්ගේ — අවතාරො, බැසගැන්මැ ; හෙවත් අධ්‍යයනපරිඥානාවරණව්‍යාඛ්‍යානාදිවූ ප්‍රවර්ත්තනයතෙම ; අභිධෙය්‍යාධිගමපුබ්බකො ඉති, අභිධෙයපරිඥානයැ පූර්ව කොටැ ඇත්තේයැයි කියායි—පච්ඡිමපාදෙන, (“මාගධං සද්දලක්ඛණං” යන මේ) පශ්චිමපාදයෙන් ; අභිධෙය්‍යං, සමුදිතශාස්ත්‍රයෙන් වාච්‍යාර්ථයැ — ප්‍රකෘතිප්‍රත්‍යයාදි විභාගකල්පනායෙන් මාගධශබ්දයන්ගේ සංස්කාරණයැ මෙහි අභිධෙය නම්— “යෙන ච යඃ ප්‍රතිපාද්‍යතෙ ස තස්‍යාර්ථො භවති” යි කීබැවින්ද “නාගෘහීතවිශෙෂණා බුද්ධිර්විශෙෂ්‍යෙ භවති” යි කීබැවින්ද මේ මාගධශබ්දලක්ෂණයෙන් මාගධශබ්දයෙන් විශිෂ්ටවූ ශබ්දයන්ගේ සංස්කාරණයැ ප්‍රතිපාද්‍යහෙයින් ආචාර්යයන්විසින් “පච්ඡිමපාදෙනාභිධෙය්‍යං” යි දක්වනලද ඍජුවූ අර්ථයැ යෙදෙයි. සාරත්ථවිලාසිනියෙහි පශ්චිමපාදයාගේ එකදෙශභූතවූ “සද්දලක්ඛණං” යන මෙයින් අභිධෙය දක්වීම යැයි “එකදෙසදස්සනෙන සමුදායො දිස්සොති විය” යනාදීන් කියනලද කල්පනාගෞරවයැ නිෂ්ප්‍රයොජනයැයි දතයුතු—සාධිය, ශබ්දයන්ගේ සංස්කාරණයැ ; සාධන, ව්‍යාකරණයැ යන මෙදෙක ; ලක්ඛණෙ, සවභාවකොටැ ඇත්තාවූ—“පයො

ජනනත්ථගගාතත්තා" යන තැන්හි "යස්‍ය හි යදුද්දිශ්‍ය
ප්‍රවෘත්තිරස්ති තත්තස්‍ය ප්‍රයොජනම්භවති" යි දක්වනලද
ශබ්දසංස්කාරණසඞ්ඛ්‍යාත සාක්‍ෂාත්ප්‍රයොජනයැ කීහයි දත
යුතු—උස්සුක්කං, සම්‍යග්ව්‍යායාමයට — බුද්ධත්තං, සර්‍වඥතා
ඥනයැ—ඉධ ලොකම්හි, මේ සත්වලොකයෙහි ; විපස්සිආදයො
මුනයො, විදර්ශීආදිවූ පූර්‍වබුද්ධවරයෝ ; යථෙව, යම් පරිද්දෙ
කින් (සියලු බුද්ධත්වකරධර්‍මයන් පුරා) ; සබ්බඤ්ඤුභාවං,
සර්‍වඥභාවයට ; අගතා, පැමිණියාහුද ; තථා, එපරිද්දෙන් ;
අයං සක්‍යමුනීපි, මේ ඉක්‍ෂ්වාකුවංශාවතීර්‍ණවූ සම්‍යක්සම්බු
ද්ධද ; ආගතො, සර්‍වඥත්වයට පැමිණියේයැ ; තෙන, ඒ කාරණ
යෙන් ; චක්ඛුමා, පසැස්ඇති මේ සර්‍වඥතෙමැ ; තථාගතො,
තථාගතයැයි ; වුච්චති, කියනුලැබේ—සො ගොතමො, (ගුරු
ගොත්‍රයෙන්) ගෞතම නම් වූ ඒ සර්‍වඥතෙමැ ; මුහුත්තජාතොව,
ජාතමුහූර්ත්තයක් ඇත්තේ මැ ; හෙවත් බ්‍රහ්මාදීන්විසින්
සුවර්ණජාලාදීන් පිළිගෙනැ වඩා සිටුවනලද්දේ මැ ; ගව
ම්පතී යථා, වෘෂභරාජයක්හු මෙන් ; සමෙහි පාදෙහි, සුප්‍රති
ෂ්ඨිතපාදතලයෙන් ; වසුන්ධරං, පෘථිවියැ ; ඵුසි, ස්පර්ශ කෙළේ
යැ ; සමා දිසා, දශදිශාවන් ; සමන්තතො, හාත්පසින් ; විලො
කෙසි, අවලොකනය කෙළේයැ ; මරූ, (අදෘශ්‍යමානස්වරූපවූ)
දෙවතාවෝ ; සෙතං ඡත්තඤ්ච, ධවලාතපත්‍රාදිවූ පඤ්චරාජකකුධ
භාණ්ඩයන් ; අනුධාරයුං, සමීප වැ ධැරූවාහුය ; (එකල්හි) ;
සත්තපදනි වීතික්කමී, (උත්තරදිශාභිමුඛ වැ) සත්පියවරක්
ගියේයැ ; සො ගොතමො, ඒ භගවත් ගෞතමසර්‍වඥතෙමැ ;
සත්තපදනි ගන්ත්වා, සත්පියවරක් ගොස් (සත්බුම් පියුම් මත්
තෙහි සිටැ) ; පබ්බතමුද්ධනිට්ඨිතො, පර්‍වතමස්තකයෙක්හි සිටියා
වූ ; සීහො යථා, (අභීතකෙශර) සිංහරාජයක්හු මෙන් ; අජ්ඣගු
පෙතං, ("විස්සට්ඨො මඤ්ජු විඤ්ඤෙය්‍යො" යනාදීන් දක්වනලද)
අෂ්ටාඞ්ගබ්‍රහ්මස්වරයෙන් සමුපෙතවූ ; ගිරං, ("අග්ගොහමස්මි
ලොකස්ස" යනාදි උත්තම) වචනයැ ; අබ්භුදීරයි, කීයේයි—
ලොකම්හි, සත්වලොකයෙහි ; විපස්සිආදයො, විදර්ශීආදිවූ ;
සබ්බඤ්ඤුබුද්ධා, සර්‍වඥබුද්ධවරයෝ ; අරියෙන සෙතුනා, (ශමථ
විදර්ශනාසඞ්ඛ්‍යාත) උත්තමමාර්ගයෙන් ; පාපං පහාය, රාග
ද්වෙෂාදිපාපප්‍රහාණියැ කොටැ ; කුසලං, ක්‍ෂෙමවූ ; සිවං,
අමෘතමහානිර්‍වාණයටැ ; යථෙව ගතා, යම්පරිද්දෙකින් පැමි
ණියාහුද ; අයම්පි, මේ භගවත් ශාක්‍යසිංහද ; තථා, තත්‍ර

කාරයෙන් ; ගතො, මොක්‍ෂයටැ ප්‍රාප්තයැ ; තතො, ඒ කාරණයෙන් ; තථාගතො, තථාගතනම් වන්නේයි.

ගුණීභූතානම්පි, අප්‍රධානවූවන්ගේද ; හෙවත් විශෙෂණවූවන්ගේද—සීලදිඨිසාමඤ්ඤෙහි, (ආයුෂ්මාගර්ගාගත) ශීලයෙන් හා දෘෂ්ටියෙන් සමානභාවයැ හෙතුකොට ගෙනැ ; සංහතත්තා, යුක්තබැවින්—"සද්දා ඝටපටාදයො" යන්නෙන් ස්ඵොටශබ්දයැ ධ්වනිශබ්දයැයි විවිධවූ වෛයාකරණයන්ගේ මතභෙදයෙන් චාන්ද්‍රමතානුසාරවූ වර්ණාත්මකධ්වනිය මැ ශබ්දයැයි ගත්හු—අන්වාඛ්‍යායන්තීති, අනුශාසනාකරනුලැබෙත්නුයි—පතීතියා, පරිඥනයැ පිණිසයි—අඤ්ඤථා, ලක්‍ෂණකථනයක් නැති වැ—වුච්චමානා, (ගො අසෙසා පුරිසො හත්‍ථී යනාදීන් ප්‍රතිපදපාඨයෙන්) කියනලබන්නාහු—උපදිසිතුං, උපදෙශ කරන්ට ; හෙවත් කියන්ට—සක්කතාදිභෙදෙන, සංස්කෘතප්‍රාකෘතාපභ්‍රංශපෛශාචිකශෞරසෙන්‍යාදිභෙදයෙන් ; විසෙසයතා, ව්‍යවච්ඡෙදයැ කරන්නාවූ වෘත්තිකාරයාවිසින් ; අත්‍ථතො, අන්‍යථානුපපත්තිලක්‍ෂණසාමර්ථ්‍යයෙන් ; හෙවත් අර්ථබලයෙන්—ව්‍යඤ්ජනානුරූපං, ශබ්දයට සුදුසුවූ—අයථාපටිපජ්ජමානො, (ශබ්දලක්‍ෂණ දන්නාහුවිසින්) යම්පරිද්දෙකින් ශබ්දාර්ථදෙක්හි පිළිපැද්දයුතුද එපරිද්දෙන් නොපිළිපදනේ ; හෙවත් වරදවා පිළිපදනේ—තාව, පළමුකොටැ ; තම්මූලිකං, ඒ ශබ්දලක්‍ෂණයැ මුල්කොටැ ඇත්තාවූ—පරියත්තිං, සාර්ථකථා පාලිලක්‍ෂණවූ පර්‍ය්‍යාප්තියැ~~~~~

මෙසින් පර්‍ය්‍යාප්තිධර්මයැ ප්‍රතිපත්තියට ප්‍රත්‍යය වෙයි යනුද ප්‍රතිපත්තියැ අධිගමයට ප්‍රත්‍යය වෙයි යනුද ව්‍යතිරෙකයෙන් කීවාහු වෙත්—යම්සේ මහත්වැවෙක්හි නියර තරකල්හි දිය සිටීද, දිය සිටිකල්හි මහනෙල් නෙළුම් ආදිවූ මල් පිපේද එපරිද්දෙන් සූත්‍රාභිධර්මවිනයසඞ්ඛ්‍යාත ත්‍රිපිටකබුද්ධවචනයැ ශබ්දලක්‍ෂණඥ ආචාර්‍ය්‍යස්ථවිරවරයන්කෙරෙහි අවිනෂ්ට වැ පවත්නාකල්හි ඔවුන්ගේ ශිෂ්‍යවූ තෙලෙස්දුහඟ තුදුස්කඳුවත් දෙයාසූමහවත් ආදිවූ ප්‍රතිපත්ති පූරන ශාසනාවචරකුලපුත්‍රයෝද ඇතිවෙති, ඔවුන් ඇතිවූකල්හි සතරමග සතර ඵලයැයි කියනලද ප්‍රතිවෙධශාසනයද හටගනියි දත යුතු—මෙ මැ දක්වන්නට අර්ථකථාචාර්‍ය්‍යවරයෝද කීහු. "යථා ච මහතො තළාකස්ස පාළියා ථිරාය උදකං න ඨස්සතීති න වත්තබ්බං, උදකෙ සති පදුමාදීනි පුප්ඵානි න පුප්ඵිස්සන්තීති

න වත්තබ්බං, එවමෙවං මහාතළාකස්ස පීරපාළිසදිසෙ තිපිටකෙ බුද්ධවචනෙ සති උදකසදිසා පටිපත්තිපූරකා කුලපුත්තා නත්ථීති න වත්තබ්බා, තෙසු සති මහාතළාකෙ පදුමාදීනි පුප්ඵානි විය සොතාපන්නාදයො අරියපුග්ගලා නත්ථීති න වත්තබ්බා, එවං එකන්තතො පරියත්ති එව පමාණං"—යි.

සම්මොසාය, ප්‍රමොෂයැ පිණිසැ; විනාශයැ පිණිසැ; අන්තරධානාය, අන්තර්ධානයැ පිණිසැ; අප්‍රකාශයැ පිණිසැ—දුන්නික්ඛිත්තං, (උත්පරිපාටියෙන් ගෘහීතහෙයින්) නපුරු කොටැ තබනලද; හෙවත් වරදවා කියනලද; පදබ්‍යඤ්ජනඤ්ච, පදව්‍යඤ්ජනසඞ්ඛ්‍යාතවූ පාළිවචනයද—පඤ්චිකාටීකායෙහි "පදඤ්ච බ්‍යඤ්ජනඤ්ච" යි චාර්ථවිග්‍රහ දක්වා පද නම් ස්‍යාද්‍යන්තත්‍යාද්‍යන්තයැ ව්‍යඤ්ජන නම් වාක්‍යයැයි කීහ—මනොරථපූරණී අටුවායෙහි "පාළිපදමෙව හි අත්ථස්ස ව්‍යඤ්ජනත්තා ව්‍යඤ්ජනන්ති වුච්චති උභයමෙතං පාළියාව නාමං" යි කීහු—දුන්නයො හොති, දුරවබොධයැ වන්නේයි—තදෙවං, කියනලද ප්‍රකාරයෙන්; නො හොත්; තං (තස්මා), ඒ (ශබ්දලක්ෂණපරිඥානයැ සඵල) හෙයින්; එවං සප්පයොජනං, මෙසේ සාර්ථකවූ—ලාඝවෙන, ලඝුභාවයෙන්—මෙයින් "ලාඝවත්ථං හි සඤ්ඤාකරණම්" යි මහාභාෂ්‍යයෙහි උක්තහෙයින් ශාස්ත්‍රලාඝවයැ පිණිසයැ සංඥා කරනලද්දැයි දක්වූහු—පරියත්තං, සම්පූර්ණවෙයි; හෙවත් නිෂ්ඨා වෙයි—"සඤ්ඤාවිධානං හොතෙව" යන අත්‍යන්තායොගව්‍යවච්ඡෙදක අවධාරණයෙන් වාඥවකරණයැ මෙන් සංඥා නැත්තේ නොවෙයි ග්‍රන්ථලාඝවප්‍රතිපත්තිලාඝවයැ පිණිසැ මෙහි සංඥා ඇත්තේමයැයි කී වෙත්.

එවකාරයැතෙමැ අයොගව්‍යවච්ඡෙදකයැ අන්‍යයොගව්‍යවච්ඡෙදකයැ අත්‍යන්තායොගව්‍යවච්ඡෙදකයැයි ත්‍රිවිධ වේ. "නන්දො වීතරාග එව" යන්නෙහි එවකාරය නන්දයාගේ වීතරාගත්වයැ හා අයුක්තත්වයැ වලකනබව මුත් සෙසු රාහුල භද්‍රාදීන්ගේ වීතරාගත්වයැ නොවළකානුයි "අයොගව්‍යවච්ඡෙදක" නම් වේ. "සුගත එව සර්වඥඃ" යන්නෙහි එවකාරයැ තෙමැ සුගතයාට මැ සර්වඥත්වයැ සාධා තදන්‍යවූ කණභක්ෂාක්ෂචරණ කපිල පතඤ්ජලි ජින ජෛමිනි ව්‍යාසප්‍රභෘතීන්ගේ සර්වඥත්වයොගයැ ව්‍යවච්ඡෙද කෙරේනුයි "අන්‍යයොගව්‍යවච්ඡෙදක" නම් වේ. "නීලොත්පලමස්ත්‍යෙව" යන්නෙහි එවකාරයැ නීලොත්පලයාගේ නාස්තිත්වයොගයැ අතිශයෙන්

වලකනහෙයින් "අත්‍යන්තායොගව්‍යවච්ඡේදක" නම් වේ. මෙසේ ත්‍රිවිධවූ එවකාරයන් අතුරෙන් "හොතෙව" යන් තෙහි එවකාරයැ අත්‍යන්තායොගව්‍යවච්ඡේදක නම් වේ.

සද්දසත්ථවවත්ථානත්ථං, ශබ්දශාස්ත්‍රව්‍යවස්ථාව පිණිසැ—ව්‍යව ස්ථාව නම් නියමයයි—පරිභාසායො, "පරිතො ව්‍යාපෘතා භාෂා පරිභාෂා"—උපයුජ්ජමානත්තා, යොදනලබනබවහෙයින්—සවිසයා, ලිඞ්ගාදිවිෂයසහිතවූ—ලිඞ්ගිකප්පච්චයා, ("ඉතාපීස මත්වා"[a] යනාදීන් දක්වනලද) සත්‍රීවිධීහු.

**අඅදයො**[b] ——— මේ සූත්‍රයැ සාවිකද නිරවිකදැයි විකල්ප වයක් කොටැ "අකාරාදයො" යනාදීන් වෘත්තියෙහි ව්‍යාඛ්‍යා මාණඅවිවශයෙන් සාවිකත්වය දක්වා නැවත මෙමැ සූත්‍රයැ "**කාලෙ වත්ත**[c]" යනාදිසූත්‍රයන් මෙන් සාධුශබ්දානුශාසනයැ පිණිසද, "**අභූතතබ්භාවෙ**"[d] යනාදීන් මෙන් ප්‍රයොගනිය මයැ පිණිසද, "**යවා සරෙ**"[e] යනාදිය මෙන් ස්ථාන්‍යාදෙශයැ පිණිසද, "**සුඤ්ඤ් සස්ස**"[f] යනාදිය මෙන් ආගමාගමිභාවයැ පිණිසද, "නීලමුප්පලං" යනාදිය මෙන් විශෙෂණවිශෙෂ්‍යභා වයැ පිණිසද, "සීහො මාණවකො" යනාදිය මෙන් තාද්‍රූ ණ්‍යාධ්‍යාරොපණයැ පිණිසද වන්නේයැයි මෙසේ කල්පනානන්ත රසම්භවයැ ඇත්තේ වේද එසේකලැ වෘත්ත්‍යුපදිෂ්ටවූ අර්ථ යෙන් මැ අර්ථවත්ත්වයැ කෙසේ අවධාරිත වේදැයි යන ආශඞ්කා වන්ගේ උපයොගාභාවයැ ක්‍රමයෙන් කියා පාරිශෙෂ්‍යන්‍යාය යෙන් සංඥාසංඥිසම්බන්ධයැ පිණිසයැයි ප්‍රතිපාදනයැ කරනුවැ "ඉදං වචනං" යනාදි කීහු.

කිඤ්චි උම්මත්තකාදිවාක්‍යං, ("දශදාඩිමාෂඩපූපාඃ කුණ්ඩ මජාජිනම්පලාලපිණ්ඩඃ" යනාදි) කිසි උන්මත්තකාදිවාක්‍ය යෙක්—අනර්ථකවාක්‍යයට ලක්ෂණ සරස්වතීකණ්ඨාභරණ යෙහි කීහ—"සමුදායාර්ථශූන්‍යං යත්තදපාර්ථං වචඃ ස්මෘතම්" යි.

එහිම උදාහරණද කීහ:—

"ජරද්ගවඃ කම්බලපාදුකාභ්‍යාං
ද්වාරි ස්ථිතො ගායති මඞ්ගලානි
තාම්බ්‍රාහ්මණී පෘච්ඡති පුත්‍රකාමා
රාජන් රුමායාං ලශුනස්‍ය කොऽර්ඝඃ ——— යි.

---

මොග්ගල්ලායන 3 වන කාණ්ඩයෙහි 26 වන සූත්‍රය. [b] 1, 1 සූ.
[c] 4, 100 සූ. [d] 4, 119 සූ. [e] 1, 30 සූ [f] 2, 53 සූ.

නෛයායිකයෝ වර්‍ණයන්ගේ අ ඊ ඌ යනාදි පාඨක්‍රමයැ මෙන් පදවිරහිතහෙයින් අර්‍ථශූන්‍යවූ වාක්‍යයැ නිරර්‍ථක නමැ පූර්‍වාපරසම්බන්‍ධ විශෙෂණවිශෙෂ්‍යභාවය හා නොයෙදීමෙන් අසම්බන්‍ධවූ අර්‍ථඇති වාක්‍යයැ අපාර්‍ථක නමැයි කීහු. ඔවුන්විසින් කියනලදමැයි :—

“ වර්‍ණක්‍රමනිර්‍දෙශවන්නිරර්‍ථකම්, යථා නිත්‍යශ්ශබ්දඃ
චටතකපානාම් ජබගඩදශ්ත්වාත් ඣභඝඪධවත්-
පෞර්‍වාපර්‍ය්‍යායොගාදප්‍රතිසම්බන්‍ධාර්‍ථමපාර්‍ථකම්, යථා
දශ දාඩිමානි ෂඩපූපාඃ කුණ්ඩමජාජිනමිත්‍යෙවමාදි ” යි.

“දශදාඩිමානි ෂඩපූපාඃ” යනු වාක්‍යයන්ගේ අසම්බන්‍ධත්වයට උදාහරණයැ, “කුණ්ඩමජාජිනම්” යනාදියැ පදයන්ගේ අසම්බන්‍ධත්වයට උදාහරණයි—මෙ මැ කීහ න්‍යායසාරපදපඤ්ජිකායෙහි—“තත්‍ර වාක්‍යයොරනන්විතත්වෙ උදාහරණමාහ යථා දශදාඩිමානි ෂඩපූපා ඉති, පදයොරනන්විතත්වෙ උදාහරණමාහ කුණ්ඩමජාජිනමිත්‍යෙවමාදීති” යි—මනොපුබ්බඞ්ගමා ධම්මා ඉති, මනොපුබ්බඞ්ගමා ධම්මා යන ; ආදි, මේ ආදිවූ ; වාක්‍යං යථා, (අවයවාර්‍ථයන්ගේ පරස්පරාභිසම්බන්‍ධයෙන් සමුදායාර්‍ථවත්වූ) වාක්‍යය මෙන්—දශදාඩිමාදිවාක්‍යයන් මෙන් අසම්බන්‍ධ නොවන ; විෂශමනයැ පිණිසැ තක්‍ෂකඵණරත්නාලඞ්කාරොපදෙශයක් මෙන් අශක්‍යොපාය නොවන ; කාකදන්තපරීක්‍ෂාවක් මෙන් නිෂ්ප්‍රයොජන නොවන ; පරීක්‍ෂිත විශුද්ධසුවර්‍ණයක් මෙන් ප්‍රත්‍යක්‍ෂානුමානයෙන් බාධාවට නොපැමිණි ; පදසමූහය සාර්‍ථකවාක්‍ය නම් වේ.

මෙ මැ කීහ සකලතාර්කිකචක්‍රචූඩාමණි ධර්ම්මකීර්ත්තිපාදයෝ.

“ සම්බන්‍ධ්‍යානුගුණොපායම්පුරුෂාර්‍ථාභිධායකම්
පරීක්‍ෂාධිකෘතං වාක්‍යමතො‘නධිකෘතම්පරම් ”—යි.

වක්ඛමානත්ථමෙව, (“අකාරාදයො නිග්ගහීතන්තා” යනාදීන් වෘත්තියෙහි) මතු කියනලබන්නාවූ අර්‍ථඇත්තේ මැයි—සාධවනුසාසනත්ථං, නිෂ්පන්නශබ්දයන්ගේ කථනයැ ප්‍රයොජන කොටැ ඇත්තේ ; න ඉති, නොවන්නේයැයි ; කුතො, කවරහෙයකින් ; අවසීයතීති චෙ, නිශ්චයකරනුලැබේදැයි යනහොත්—මේ ආශඞ්කාවද “ඉතොතෙතෙත්තාකුතො”[a]

---

[a] 4, 96 සූ.

යනාදීන් ශබ්දයන්ගේ නිෂ්පන්නබව බොහෝසේ වෙනතැන දුටුහෙයින් කීහු—සෙසු ආශඞ්කාහෙතුද මෙ මැ නියෙන් සිතා ගතයුතු—වුච්චතෙ, (එයට පරිහාර) කියනුලැබේ—"ඉදං තාව අආදීනං පදානං සාධුභාවාඛ්‍යානත්ථං න කස්මා ලක්ඛණන්තරෙන සාධුභාවස්ස අන්වාඛ්‍යාතත්තා" යනාදීන් ප්‍රතිඥ හෙතුප්‍රකාශකවාක්‍යයන්ගේ යොජනාක්‍රම දතයුතු—ලක්ඛණන්තරෙන, "දධාතවි"[a] යනාදි අන්‍යසූත්‍රයෙන්—සාධුභාවස්ස, (ආපූර්වවූ දා-දානෙ යන ධාතුහුකෙරෙන් පර වැ "දධාතවි" යන සූත්‍රයෙන් ඉප්‍රත්‍යයද, "සරො ලොපො සරෙ"[b] යන සූත්‍රයෙන් පූර්වස්වරලොප්ද, "ඝසිනං"[c] යන සූත්‍රයෙන් විභක්තිලොප්ද, "අ ආදි යෙසං තෙ අආදයො" යන වාක්‍යයෙහි "වා නෙකඤ්ඤත්ථෙ"[d] යන සූත්‍රයෙන් අන්‍ය පදාර්ථසමාසද, "ඉයුවණ්ණා ඣලා නාමස්සන්තෙ"[e] යන සූත්‍රයෙන් ඉවර්ණයාහට ඣසංඥද, යොවිභක්ති පරකල්හි ඣසංඥයහට "යොසු ඣිස්ස පුමෙ"[f] යන සූත්‍රයෙන් ටාදෙශද, විධාන කොටැ "අආදයො" යනාදීන්) ශිෂ්ටප්‍රයොග ස්වරූපයැ; අන්වාඛ්‍යාතත්තා කියනලදබැවින්—පයොගනියමත්ථම්පි, ("අභූතතබ්භාවෙ කරාසභූයොගෙ විකාරා චී"[g] යනාදි සූත්‍රවල්හි මෙන් තිතාලීසවණ්ණශබ්දයන් පරකල්හි අආදිශබ්දයැතෙමැ ප්‍රයොගකරනුලැබෙයි කියා මෙසේ) ප්‍රයොගනියමයැ පිණිසද—ඨානාදෙසත්ථං, (අආදි ශබ්දයන්ගේ ස්ථානයෙහි තිතාලීසවණ්ණශබ්දයෝ ආදෙශවෙති යනාදීන්) ස්ථානාදෙශයැ පිණිසද—තදනුරූපාය විභත්තියා, ඒ (ස්ථානාදෙශයට) සුදුසුවූ (ෂෂ්ඨී) විභක්තියෙන්—අතොයෙව, ඒ (ආගමාගමීන්ට අනුරූපවූ ෂෂ්ඨීහුගේ) අභාවයෙන් මැ; එතං, මේ සූත්‍රයැ—ආගමාගමිභාවත්ථම්පි, (අආදිශබ්දයහට තිතාලීසවණ්ණශබ්දයෝ ආගම වෙති යනාදීන්) ආගමාගමිභාවයැ පිණිසද—න ඝටතෙ, නොයෙදෙන්නේයි—කුමක්හෙයින්ද—ආගමලිඞ්ගාභාවතො, ආගමචිහ්නවූ ඤකාර කකාර මකාරයන්ගේ අභාවයැ හෙයිනි—විසෙසනවිසෙස්සභාවත්ථං, තිතාලීසවණ්ණශබ්දයන්ට අආදිශබ්දතෙමැ විශෙෂණ වන්නේයැ තිතාලීසවණ්ණශබ්දයෝ හෝ අආදිශබ්දයහට විශෙෂණ

[a] 5, 45 සූ. [b] 1, 26 සූ. [c] 2, 120 සූ. [d] 3, 17 සූ. [e] 1, 9 සූ [f] 2, 95 සූ. [g] 4, 119 සූ.

වත්නාහුයැ යන භෙදකභෙද්‍යභාවයැ පිණිසද—රූපවිසෙසූප ලක්ඛණභාවා, රූපවිශෙෂයක්හුගේ නිමිත්තයක් සකස්කිරීමක් නොවනහෙයින්; සද්දලක්ඛණානුපයොගතො, ("මාගධං සද්දලක්ඛණං" යී ප්‍රස්තුතවූ) ශබ්දසංස්කාරණයට ප්‍රයොජනක්‍රියාවක් නැතිහෙයිනි—"**යොසුජ්ඣිස්ස පුමෙ**"[a] යනාදි සූත්‍රයෙන් සංස්කාර කොටැ "අආදයො" යනාදි රූපවිශෙෂයන් නිපැදවූවාක් මෙන් විශෙෂණවිශෙෂ්‍යභාවප්‍රතිපාදනයැ කළකල්හි අආදිශබ්දයහටද තිතාලීසවණ්ණශබ්දයන්ටද සිබවන කිසිරූපවිශෙෂයෙක් නැත යනු භාවයි.

පකතානුපයොගිතාය, ප්‍රස්තුතවූ (ශබ්දසංස්කාරණයැ සම්බන්ධවූ) අභික්‍රියාකාරිත්වයක් නැතිබැවින්—තග්ගුණජ්ඣාරොපත්ථම්පි, ("සීහො'යං මාණවකො" යන තැන්හි මෙන් උපචාරයෙන්) තද්ගුණාධ්‍යාරොපණයැ පිණිසද—"අතත්ස්වභාවෙ තත්ස්වභාවාරොපණමුපචාරඃ"—අතත්ස්වභාවෙ, සිංහාදිස්වභාව නැත්තාවූ (මාණවකයා) කෙරෙහි; තත්ස්වභාවාරොපණම්, ඒ (සිංහාදීන් හා සදෘශවූ ශෞර්‍ය්‍යාදිගුණසන්දර්ශනයෙන් සිංහාදි) ස්වභාවයැ පැමිණවීම; උපචාරඃ, උපචාර නම් වේ.

මෙ මැ කීහ:—

"සාමීප්පෙනෙකදෙසෙන සහිතට්ඨානපාසිකා
තද්ධම්මභෙදගුණතො ඵලතාදත්ථ්‍යසාදිසා
සම්බන්ධෙනොපමෙය්‍යෙනොපචාරා හොන්ති තෙරස."

තත්ථ ගඞ්ගායං සස්සමිච්චාදිසු සමීපොපචාරෙන සද්දා පවත්තන්ති, තථා හි ගඞ්ගාසද්දො ගඞ්ගාසමීපෙ වත්තතෙ අජ්ඣුත්ථා ගඞ්ගාජලප්පවාහෙ සස්සානමවට්ඨානස්සාසම්භවා—රුක්ඛං ඡින්දති පටො දඩ්ඪොති ආදිසු එකදෙසෙන, එත්ථ හි සමුද්දයෙ පවත්තා රුක්ඛපටසද්දා තදෙකදෙසභූතෙ අවයවෙ'පි වත්තන්ති—සහිතෙනාති සහචරිතෙනාති අත්ථො, යට්ඨීයො පවෙසය කුන්තෙ පවෙසයාති ආදිසු යට්ඨ්‍යාදිසහචරිතා උපචාරතො ගය්හන්ති—මඤ්චා උක්කුට්ඨිං කරොන්තීති ආදිසු ඨානෙන, එත්ථ හි මඤ්චසද්දෙන මඤ්චට්ඨා පුරිසා ගය්හන්ති—නාගවනං ඛදිරවනන්ති ආදිසු තබ්බාහුල්ලෙන—සසවිසාණන්ති ආදිසු තබ්ධම්මවසෙන, තථා හි තස්ස විසාණභාවසංඛාතස්ස

---

[a] 2, 95 සූ.

විසාණධම්මස්ස වසෙන විසාණසද්දො ගය්හති—සිලාපුත්තකස්ස සරීරන්ති ආදිසු භෙදෙන, තථා හි අභිනෙන'පි වත්ථුම්හි සද්දත්ථමෙවොපනිස්සාය භෙදාභිධානවොහාරො සම්භවති—නීලො'යං පටොති ආදිසු ගුණවසෙන—සොම්හං ගුළොති ආදිසු එලොපචාරෙන—පදීපත්ථා මල්ලිකා පදීපොති ආදිසු තදත්ථභාවෙන ව්‍යපදෙසො—සීහො'යං මාණවකොති ආදිසු සණ්ඨානාදීහි තංසදිසත්තෙන—රාජකීයො පුරිසො රාජයම්ති තංසම්බන්ධෙන—ගො බාහීකො'යම්ති ආදිසු උපමෙය්‍යොපචාරෙන තබ්බ්‍යපදෙසො සම්භවතීති"—

යථොක්තලක්ෂණයෙන් යුක්ත තෙළෙස්වැදෑරුම්වූ උපචාර යන් අතුරෙන් "සීහො'යං මාණවකො" යනාදි තැන්හි සිංහයාගේ පරිපූර්ණසංස්ථානශූරවීරත්වාදිගුණයන් මාණවකයාකෙරෙහි ආරොපණයැ කොටැ මේ මාණවකතෙමැ සිංහයැයි කීබැවින් තද්ගුණාධ්‍යාරොපණයැ වෙයි දතයුතු.

සඤ්ඤාසඤ්ඤිසම්බන්ධත්ථං, වර්ණසාමාන්‍යලක්ෂණවූ සංඥායැ තත්තද්වර්ණව්‍යක්තිලක්ෂණවූ සංඥියැ යන මොවුන් දෙදෙනාගේ සම්බන්ධයැ පිණිසැ—හොති, (පාරිශෙෂ්‍යන්‍යායයෙන්) වන්නේයි—උපලක්ඛණත්තා, (උපලක්ෂ්‍යමාණවූ අකාරාදීන්ගේ ග්‍රහණයෙහි කාරණභාවයෙන්) අප්‍රධානබැවින්—උපසජ්ජනීභූතස්ස, අප්‍රධානවූවහුගේ—රූපං, තිතාලීසා යන ස්ත්‍රීලිඞ්ගශබ්දයයි—විප්පටිපත්තිනිරාසත්ථො, විරුද්ධග්‍රහණයාගේ නිරාකරණයැ ප්‍රයොජන කොටැ ඇත්තේයි—සක්කතානුසාරෙන, ("එඓඔඖ සන්ධ්‍යක්ෂරාණි, එෂාං හ්‍රස්වා න සන්ති" යන) සංස්කෘතානුසාරයෙන් ; කොචි, සමහර ආචාර්‍ය්‍යයෙක් ; හෙවත් ශාසනප්‍රසාදක චොළිය බුද්ධප්‍රියමහාස්ථවිරතෙම—"සංයොගපුබ්බා සංයොගතො පුබ්බා සංයොගං පරං කත්වා වුච්චමානා, රස්සා ඉවාති සභාවතො දීඝා රස්සා ඉව වුච්චන්ති කිඤ්චාපි එකාරඔකාරා රස්සා විය න සන්ති තථා'පි තෙසං සංයොගපරානං රස්සානං විය උච්චාරණං හොති, එත්ථාති කෙවලස්සෙසකාරස්ස, සෙය්‍යොති ව්‍යඤ්ජනෙන පටිච්ඡන්නස්ස පයොගදස්සනං, තථාඤ්ඤත්‍ර" යනු "සංයොගපුබ්බා" යනාදි පූර්වපක්ෂවාක්‍යයෙහි අර්ථයි—කච්චායනවුත්තිවණ්ණනායං, (විමලබුද්ධිමහාස්ථවිරයන් කළ කසයින්න්‍යාසයෙහි—"අථවා අක්ඛරපාදයොති වුත්තෙනයෙව අකාරාදීනං ගහණෙ සති එකවත්තා

ලීසන්ති කස්මා වුත්තන්ති චොදනා. ඉධ සුත්තනෙත්තාපකාරා එකචත්තාලීසං බහිද්ධා පන අඤ්ඤෙ'පි අක්ඛරා සන්තීති ඤාපනත්ථන්ති පරිහාරො" යනු න්‍යාසයි—

"තත්ථ ඉධාති ඉමස්මිං පකරණෙ, සුත්තනෙත්තාපකාරාති සුත්තන්තස්ස උපකාරා උපකරණභූතාති සුත්තනෙත්තාපකාරා, ජිනවචනොපකාරාති අත්ථො, අනෙනිධ නිද්දිට්ඨක්ඛරතො බාහිරක්ඛරවනත්තානි න බුද්ධවචනානීති දස්සෙති, කස්මාති චෙ? අනුපකාරත්තා, කථං තෙ අනුපකාරා නාම ජාතාති, අනන්තාපරිමිතපාරමිතාපුඤ්ඤොදයසම්භූතසබ්බඤ්ඤුතානාවරණසරණදෙසනාඤාණලීලාලද්ධකතජිනවරමුඛපද්මවිවරනිග්ගතත්තා, කථන්තං ඤායතීති චෙ? තථාගතෙරිතානුපචජ්ජිතානුද්දෙසම්භයචතුරාසීතිධම්මක්ඛන්ධසහස්සපරියත්තිසාසනෙ අදිස්සමානත්තා, බහිද්ධාති සද්දසත්ථෙ තිමුනිව්‍යාකරණාදිසූති අත්ථො, එකචත්තාලීසග්ගහණෙන කථම්මෙසං සුත්තනෙත්තාපකාරතා ඤායතීති චෙ? උපරි ජිනවචනයුත්තානං හිති ඉමස්ස ඉධාප්‍යනුවත්තනතො ච පිටකත්තයෙ දිස්සමානත්තා ච, හවතෙවං බහිද්ධා අඤ්ඤෙ'ප්‍යක්ඛරා සන්තීති අයමත්ථො කථං ඤායතීති? සබ්බක්ඛරානමන්තරෙ ජිනවචනොපකාරක්ඛරං දස්සෙන්තෙන ථෙරෙන ගණනපරිච්ඡෙදං කත්වා එකචත්තාලීසග්ගහණස්ස කතත්තා ජිනවචනෙ ච අදිස්සමානත්තා, කිමෙතෙන පයොගෙනාත්ථවයං දස්සෙතුං සක්කාති? සක්කා ච අම්බසෙචනගරුපීණනං වියාති"—යනු න්‍යාසප්‍රදීපිකායි.

එහි "අම්බසෙචනගරුපීණනං විය" යන දෘෂ්ටාන්තයැ අනුක්තයි. කුමක්හෙයින්ද යත්? බ්‍රාහ්මණාදි යම්කිසිවෙක් පිතෘතර්පණයකිරීමත් අම්‍රවෘක්ෂයාගේ විරූඪියත් කැමැතිද එතෙමැ ප්‍රයොජනවය මැ ඉෂ්ටහෙයින් එකවර තර්පණකරණයෙන් ජලසෙචනක්‍රියාවත් සිඬකෙරෙයි. එමෙන් එහි "එකචත්තාලීසං" යන ගණනපරිච්ඡෙදයෙන් මැ ත්‍රිපිටකපර්‍ය්‍යාපතිව්‍යාපි සමස්තාක්ෂරසන්දර්ශනයැ චරිතාර්ථවූහෙයින් තද්බාහ්‍යවූ ඍෲෂඎඏශෂාද්‍යක්ෂරයන්ගේ ඥාපනයෙන් සිඬවන ප්‍රයොජනයක් නැතිහෙයිනි—බහිද්ධා, (ත්‍රිමුනිව්‍යාකරණාදි) අන්‍යශාස්ත්‍රයෙහි—පාණිනි කාත්‍යායන පතඤ්ජලි යන ඍෂිවරුන් තුන්දෙනකුවිසින් සූත්‍ර වාර්ත්තික භාෂ්‍ය කළහෙයින් "ත්‍රිමුනිව්‍යාකරණ" නම් පාණිනීයව්‍යාකරණයි—ලඝුවෘත්තියෙහිද පාණිනීයව්‍යාකරණයට "ත්‍රිමුනිලක්ෂණ" යයි කීහු.

"නමො බුද්ධාය භාෂායාං යථාත්‍රිමුනිලක්‍ෂණම්
පුරුෂොත්තමදෙවෙන ලඝ්වී වෘත්තිර්විධීයතෙ" — යි.

අඤ්ඤෙසු'පි අක්ඛරා, ඍඎ ඏඐ ශෂාද්‍යක්‍ෂරයෝ.

"ස්තුතෞ විජාදෞ ශුක්ලාදෞ රූපභෙදෙ යශොගුණෙ
කුලෙ වර්ණඃ පුමාන් වර්ණං වා ස්නානවිලෙපනෙ'ක්‍ෂරෙ" —

යනුහෙයින් වර්ණශබ්දයැ ගුණාද්‍යනෙකාර්ථයෙහි වැටෙතුදු මෙතැනැ ශබ්දලක්‍ෂණකථනප්‍රස්තාවහෙයින් අකාරාදීහු ගන්නාලැබෙතියි කියා "වණ්ණීයති" යනාදි කීහු—ප්‍රකරණයත් අර්ථපරිඥනයට කාරණයෙකි.

කියනලදමැයි :—

"සංයොගා විප්පයොගා ච සාහචරියා විරොධතො
අත්ථා පකරණා ලිඞ්ගා සද්දන්තරසමීපතො —
සාමත්ථ්‍යචිත්‍යදෙසෙහි කාලව්‍යත්ත්‍යනුරූපතො
උපචාරකාකුභෙදසම්බන්ධෙහුපලක්ඛණා —
වචනා ච තදඞ්ගත්තා පධානත්තාති ආදිහි
සද්දත්ථා පවිභජ්ජන්ති න සද්දාදෙව කෙවලාංති" —

තත්ථ සංයොගතො සද්දත්ථප්පවිභාගෙ, යථා සකිසොරා ධෙනු දීයතූති වුත්තෙ අස්සපොතකවාචිකිසොරසද්දසංයොගතො වළවායෙව පතීයතෙ න ගාවී—විප්පයොගතො, අකිසොරා ධෙනු දීයතූති වුත්තෙ තප්පටිසෙධා වළවායෙව පතීයතෙ න ගාවී—සාහචරියතො සාරිපුත්තමොග්ගල්ලානාති වුත්තෙ සාරිපුත්තොති ධම්මසෙනාපතීති විඤ්ඤායතෙ න හත්ථකො සාරිපුත්තො, අඤ්ඤෙ පන රාමලක්ඛණා රාමකෙසවා යුධිට්ඨිලජ්ජුනාති උදාහරන්ති—විරොධතො, කුසලාකුසලන්ති වුත්තෙ කුසලන්ති ඉට්ඨවිපාකධම්මොව විඤ්ඤායති නඡෙකො, අඤ්ඤෙ රාමජ්ජුනාභිමඤ්ඤුලක්ඛණාති උදාහරන්ති—අත්ථතො, ගොපාලකමානය මාණවමජ්ඣාපයිස්සති සින්ධවමානය රණඞ්ගණං පවිසාමීති වුත්තෙ ගොපාලකොති එවන්නාමකො උපජ්ඣායො සින්ධවොති අස්සොති පයොජනතො පතීයතෙ—පකරණතො, භොජනඞ්ගෙසු උපසංහරියමානෙසු සින්ධවමානෙහීති වුත්තෙ ලවණන්ති පත්ථාවතො විඤ්ඤායති න අස්සො—ලිඞ්ගතො, දෙවදත්තං පඨමං නිවෙස්ස චතුබ්බෙදෙහි දෙවදත්තොති වුත්තෙ චතුබ්බෙදත්තෙන ලිඞ්ගසංඛාතෙන වත්ථුසාමත්ථියෙන තස්ස ඤාතිමන්තතා පතීයතෙ—සද්දන්තරසමීපතො,

ගච්ඡතො භයතො පතිතොති වුත්තෙන කිත්තනෙනාති විඤ්ඤායති, ගච්ඡතො පණ්ණපුප්ඵානි පතන්තීති වුත්තෙන බුද්ධරුක්ඛවාචකො රූළ්හිසද්දොති විඤ්ඤායති, අජ්ජුනො කතවීරියොති කෙචි—සාමත්ථියතො, සතොපි උදරස්ස අවිවච්ඡාය අනුදරා කඤ්ඤාති වුත්තෙන උදරස්සාභාවෙ කඤ්ඤායපි අභාවාපත්තිතො තනුමජ්ඣාති විඤ්ඤායති, තථා අලොමිකා එළිකෙති—ඔචිත්‍යතො, රාමසදිසො'යං අජ්ජුනසදිසො'යමිති වුත්තෙන වත්තුනො පරිචයා යුත්තිවසෙන රාමාදිසද්දා දසරථාදිඅත්ථවිසෙසං ජොතෙති—දෙසතොති, දෙසො පබ්බතවනරඤ්ඤාදි, කිස්මිචි දෙසෙ පසංසාවචනා අඤ්ඤත්‍ර අනොකාසවචනා, පොඨාදයො—කාලතො, දක්ඛිණපථෙකදෙසෙ පුබ්බණ්හෙ පචෙති වුත්තෙ යාගුපාකොති පතීයතෙ සායණ්හෙ ච ඔදනපාකොති—ව්‍යත්තිතො, ගාමස්සඩ්ඪං ලද්ධන්ති වුත්තෙන නපුංසකත්තා සමභාගොති ච, ගාමස්සඩ්ඪො ලද්ධොති වුත්තෙන පුල්ලිඞ්ගත්තා අසමභාගොතිච පතීයතෙ—අනුරූපතො, නරපති සාධු රක්ඛති ගොමණ්ඩලන්ති වුත්තෙන රඤ්ඤො ගොගණපරිපාලනස්ස අනනුරූපත්තා පථවිමණ්ඩලන්ති විඤ්ඤායති—උපචාරභෙදෙ තදඤ්ඤ තද්ධම්ම තංසහචරිත තංසමීපාදිවසෙන අනෙකවිධො, යථා මඤ්චා උක්කොසන්ති, අග්ගි මාණවො, යට්ඨියො පවෙසය, ගඞ්ගායං වජො ඉච්චාදි—කාකුභෙදතොති, කාකුසද්දො සොකභයාදිවසප්පවත්තස්ස සද්දස්ස නීචත්තාදිරූපෙ විකාරෙ වත්තතෙ, ඊසදත්ථෙ කුසද්දො තස්ස කාදෙසො කු භූමි හදයඤ්චත්ථුප්පතීතියා ඊසකං භූමි කාකූති වචනත්ථො. යථා වත්තු කායවිකාරා කිං ත්වං තං අකාසීති පුට්ඨො කොපෙන හමුභෙදා අහං කතවාති කථෙති සා ච තස්ස අකරණං සූචෙති—සම්බන්ධතො, මාතරි සම්මා වත්තිතබ්බං පිතරි සම්මා වත්තිතබ්බන්ති වුත්තෙන සකාය මාතරි සකෙ පිතරීති විඤ්ඤායති—උපලක්ඛණතො, කාකෙහි රක්ඛිතබ්බං දධීති වුත්තෙන උපලක්ඛණත්තා කාකග්ගහණස්ස තතො'ඤ්ඤෙහි සුනඛාදීහි'පි රක්ඛිතබ්බන්ති විඤ්ඤායති—වචනතො, දසාති වුත්තෙන දසාසද්දො වත්ථෙන වත්තමානො බහුවචනො අඤ්ඤත්‍ර අනියතවචනොති විඤ්ඤායති—තදඞ්ගතො, සජ්ජිතං භොජනන්ති වුත්තෙන සූපබ්‍යඤ්ජනාදයො'පි තදවයවත්තා සම්පාදිතානීති විඤ්ඤායන්ති—පධානතො, නිග්ගතො රාජාති වුත්තෙන සෙනා'පි නිග්ගතාති විඤ්ඤායතී ච්චෙවමාදි සමූහනීයං ''—

අනුගතත්‍ථං, ඛලාදීන් මෙන් රූඪිසංඥ නොවී අර්‍ථානුග තවූ—සද්ධිගමනීයස්ස, ශබ්දයෙහි දතයුතුවූ.

"අල්පාක්‍ෂරමසන්දිග්ධං සාරවද්විශ්වතොමුඛම්
අස්තොභමනවද්‍යඤ්ච සූත්‍රං සූත්‍රවිදො විදුඃ."

යනුහෙයින් "අආදයො" යන අක්‍ෂරබාහුල්‍යපරිත්‍යාග යෙන් "ආදයො තිතාලීසවණ්ණා" යි කීකල්හි සූත්‍රරචනාවට නියමකල "අල්පාක්‍ෂරම්" යන ලක්‍ෂණයැ සරි වෙයි එලෙස නොකීයේ කුමක් නිසාදයත්? 'ආදයො' යන තැනැ ස්වරලොප සන්ධිච්ඡේදයැ ඇසූවන්ට ආදිශබ්දපමණක් මුත් ලොප්කළ අකාරයැ නොවැටහෙනහෙයින් සැක උපදනේයැ. සූත්‍රයට "අල්පාක්‍ෂරම්" කීවා ලක්‍ෂණ වීනම් "අසන්දිග්ධම්" කීවාත් ලක්‍ෂණ නොවේද? එහෙයින් සන්දෙහනිරාසයැ පිණිසද "විවක්‍ෂිතස්තු සන්ධිර්භවති" යනුහෙයින් අවිවක්‍ෂිතත්වයෙන්ද සන්ධිකාර්‍ය්‍ය නොකරනලද්දැයි දතයුතු—'පටිසංඛායොනිසො' යන තැන්හි සලොපයැ "තදමිනා" දියෙන් සිද්ධවතුදු මෙයිත් වණ්ණලොපයට ප්‍රකාරාන්තරයෙකැයි සූත්‍රඥාපකයෙන් දක්වූහු.

**දසා**[a]—"අආදයොති වත්තතෙ" යන්නෙන් "යත්‍ර න සූත්‍රාක්‍ෂරෛඃ කාර්‍ය්‍යසිද්ධිස්තත්‍ර සර්වත්‍ර සූත්‍රාන්තරාත්පදාන්තරානුවෘත්තිර්‍ඥාතව්‍යා" යි සාරස්වතයන් කීතියෙන් සිංහගති මණ්ඩූකප්ලුති නදීස්‍රොතොගතියැ යන ත්‍රිවිධාධිකාරයන් අතුරෙන් මෙ තැන්හි නදීස්‍රොතොගතියෙන් යථානුපූර්විකවැ පූර්වසූත්‍රයෙන් 'අආදයො' යන පදයැ ගෙනැ පරසූත්‍රය හා සම්බන්ධකටයුතු යැයි දක්වූහු—අවසිතා, අවසපිතවූ; පිහිටියාවූ—ස්වරයන් උද කලාව සිටද අර්ථප්‍රතිපාදනයට සමර්ථවනබැවින් "සයං රාජ න්ති" යනාදි විග්‍රහ දක්වූහු—මෙ මැ අර්ථයැ දුර්ගසිංහවෘත්ති පඤ්චිකාකාර ත්‍රිලොචනදාසයෝද කීහ—"ස්වයං රාජන්ත ඉති ස්වරා එකාකිනො'ප්‍යර්ථප්‍රතිපාදනෙ සමර්ථාස්තථාහි ලිඞ්ගධාතු නිපාතානාමසහායානාමප්‍යර්ථප්‍රතිපාදනෙ සාමර්ථ්‍යමුපලභ්‍යතෙ නෛවං ව්‍යඤ්ජනානාමිති"—යි.

**මෙමෙච**[b]—තෙ ච, ඒ (අආදයො, දස, යන පදයෝ) දෙදෙනද—"වණ්ණවිෂයො'ප්‍යන්තස්ථාශබ්දස්සවභාවතඃ ස්ත්‍රීලිඞ්ග එව" යි පාත්‍රීකරණටීකාකාර බුද්ධනාගස්ථවිරයන්විසින්ද "හ

---

[a] 1, 2 සූ. [b] 1, 3 සූ.

කාරං පඤ්චමෙහෙව අන්තට්ඨාහි ච සංයුතං" යි රූපසිද්ධිකාරයන් විසින්ද "හකාරං පඤ්චමෛර්‍යුක්තමන්තස්ථාභිශ්ච සංයුතම්" යි රූපාවතාරකාර ධර්මකීර්තිපාදයන්විසින්ද "**සපරස්වරායාඃසම්ප්‍රසාරණමන්තඃස්ථායාඃ**"*යි කාතන්ත්‍රසූත්‍රකාර ශර්ව්වවර්ම්මයන් විසින්ද කියනලදබැවින් මෙතැන්හි අන්තට්ඨාශබ්දයැ ස්ත්‍රීලිඞ්ගහෙයින් 'අන්තට්ඨාහි' යනු යුක්තයැ. පඤ්චිකාපොත්වලැ "අන්තට්ඨෙහි" යීද, "අන්තට්ඨෙහීති වග්ගානමන්තෙ තිට්ඨන්තීති අන්තට්ඨා තෙහි" යි මෙමැ ටීකායෙහිද පෙනෙයි. ඒ වික්ෂෙප ජනිතමතිභ්‍රමඇති ලෙඛකයන්විසින් ලියනලද්ද. පුරාතනපාඨ නොවේයැයි හැඟේ.

**පුබ්බො**[a]—'නනු ච' යනාදි චොද්‍යයි—වත්තබ්බං නනු ච, කිය යුත්තේ නොවේද—'නෙස දෙසො' යනාදි පරිහාරයි—එසො දෙසො න, මේ වරදෙක් නොවේ. එකවචනයෙන් නිර්දිෂ්ටවූ පුබ්බශබ්දයෙන් පූර්ව්වවූ එකඅකාරයැ මුත් සෙසු ඉකාරාදීන් ප්‍රකාශනොවනහෙයින් "පුබ්බො" යි කීකල්හි "යො යො" යන වීප්සාව මැ සිද්ධවේ. කෙසේද? "යො යො පුබ්බො" යි කීකල්හි "තෙසු වීසු" යන්නෙහි "වීසු වීසු" යි වීප්සාව කෙසේ සිද්ධවේදැයි යනු අසිද්ධහෙයින් අසිද්ධසාධනයට ආශඞ්කාහෙතුයි.

**බින්දු**[b]—කරණං නිග්ගහෙත්වාන, කණ්ඨතාලවාදි කරණ හකුළුවා ; අවිවටෙන මුඛෙන, අවිවෘතවූ මුඛය කරණකොට ගෙනැ ; සරානුගං, හ්‍රස්වස්වරයා අනුවැ පවත්නාවූ ; යං, යමෙක් ; වුච්චතෙ, උච්චාරණය කරනුලැබේද ; තං බින්දු, ඒ බින්දුතෙමැ ; නිග්ගහීතන්ති වුත්තං, නිග්ගහීතයැයි කියනලදී.

**ඉසූ**[c]—'වත්ථුසමාසා' යනාදීන් "චන්වාතපරං ශ්‍රූයමාණං ප්‍රත්‍යෙකමභිසම්බධ්‍යතෙ" යනු දක්වූහු—අත්ථෙ, මුනිශබ්දාදියෙන් වාච්‍යවූ ඍෂියන් ; නමන්තීති, නමාහුයි.

මෙමැ කීහ :—

"යං සබ්බවචනං සබ්බලිඞ්ගං සබ්බවිභත්තියං
තං සබ්බත්ථ නමනතො විඤ්ඤූ නාමන්ති තබ්බිදූ"යි.

අන්වත්ථව්‍යපදෙසෙන, අර්ථානුගත ව්‍යවහාරයෙන්—නාමය නම් ප්‍රකෘතිරූපයයි.

---

* කා. 3. 4. 1.

a 1, 4 සූ. b 1, 8 සූ. c 1, 9 සූ.

මෙම්ම කීහ පදාවතාරකාර චෝළිය ශාරිපුත්‍රස්ථවිරයෝ—
"පුරිසොති ආදීනං හි පකතිපච්චයාදිවිභාගකප්පනාය නිප්ඵාදිතානං සද්දප්පතිරූපකානං නාමිකපදානං පඨමං ඨපෙතබ්බපකතිරූපස්ස නාමන්ති පුබ්බාචරියසඤ්ඤා," ...යි.

ස්‍යාද්‍යන්තපකතිරූපස්ස, ස්‍යාද්‍යන්තපදයන්ගේ මුනිශබ්දාදි ප්‍රකෘතිරූපයට—"**අර්ථවදධාතුරප්‍රත්‍යයඃ ප්‍රාතිපදිකම්,*** **කෘත්තද්ධිතසමාසාශ්ච**"† යි ධාතුව හා ප්‍රත්‍යයාන්තශබ්දරූපයද හැර අභිධෙයවත්වූ ශබ්දයාගේ මූලරූපයටද කෘත්තද්ධිතසමාසයන්ටද ප්‍රාතිපදිකයැයි පාණිනීයාදිපූර්වාචාර්‍ය්‍යයන්ගේ සංඥයි—විසෙසනෙන, (සූත්‍රයෙහි 'නාමස්සන්තෙ' කියා නාමයාගේ අන්තයෙහි ඉවර්ණ උවර්ණයන්ගේ) විශෙෂණයෙන්—ආඛ්‍යාතස්ස, (පචති ගච්ඡති යනාදි) ක්‍රියාපදයාගේද—ආදිමජ්ඣවත්තිනො, (ඉන්ද උදකාදි ශබ්දයන්ගේ) ආදියෙහිද (පථික පුට්ඨකාදි ශබ්දයන්ගේ) මධ්‍යයෙහිද පවත්නාවූ—තෙන ච, ඒ (ආඛ්‍යාතාන්තාදියෙහි ඉවර්ණඋවර්ණයන්ගේ) ඣලසංඥා නිවර්ත්තනයෙන්ද—පදෙසෙසු, ("**ඣලා සස්ස නො**"[a] යනාදි ඒ ඒ සූත්‍රප්‍රදෙශයෙහි—අනිට්ඨප්පසඞ්ගසඞ්කා, "පචතිනො" යනාදි) අනිෂ්ටරූපයන්ගේ ප්‍රාප්තිශඞ්කාව; නිවත්තෙතාති, වලකා—ගරුනා, මහත්වූ හෙවත් බහ්වක්ෂරයෙන් යුක්තවූ—ව්‍යාසනිද්දෙසෙන, අසමාසනිර්දේශයෙන්—තං, ඒ චෝද්‍යය—"සති හි" යනාදීන් අසමාසනිර්දේශයෙහි දෝෂ දක්වූහු—වීසුත්තරෙසු යොගෙසු, (**පිත්ථියං,**[b] **ඝා,**[c] යන) මතු සූත්‍රදෙක්හි—ඉත්ථියන්ති ඉදං, (**පිත්ථියං** යන සූත්‍රයෙහි) ඉත්ථියං යන මේ පදයැ—වණ්ණවිසෙසනං සියා (**පිත්ථියං** යන සූත්‍රයෙහි පූර්වසූත්‍රයෙන් "ඉයුවණ්ණා" යනු වැටෙනහෙයින් "ඉත්ථියං ඉවණ්ණුවණ්ණා" යි මෙසේ) ඉවර්ණ උවර්ණයන්ටද (**ඝා** යන සූත්‍රයෙහි "ඉත්ථියං ආ" කියා) ආවර්ණයහටද විශෙෂණ වන්නේයැ—"එවඤ්ච සති" යනාදීන් වර්ණවිශෙෂණසද්භාවයෙහි විරොධප්‍රවෘත්ති දක්වූහු—"ව්‍යාසනිද්දෙසෙ" යනාදීන් "නාමස්සන්තෙ" යි කියා අසමස්තනිර්දේශයෙහි නිර්දෝෂත්වය දක්වූහු—නාමවිසෙසනං, (ඉත්ථියං වත්තමානස්ස නාමස්සන්තෙ වත්තමානා ඉවණ්ණුවණ්ණා" යනාදි වක්ෂ්‍යමාණක්‍රමයෙන්) නාමවිශෙෂණයැ—"නාමස්ස අන්තෙ

---

* පා. 1. 2. 45. † පා. 1. 2. 46.
[a] 2, 83 සූ. [b] 1, 10 සූ. [c] 1, 11 සූ.

නාමස්සන්තො" යන තත්පුරුෂසමාසයැ උත්තරපදාර්ථප්‍රධාන බැවින් සමාසයෙහි අප්‍රධානවූ නාමශබ්දයට "ඉත්ථියං" යන මේ පදයැ විශෙෂණ කරන්ට නොහැකි වෙයි යනු භාවයි— වචනමනන්තරෙන, (පාණිනීයයන්ට මෙන් "යථාසංඛ්‍යමනුදෙශස්සමානාම්"* යන යථාසංඛ්‍යපරිභාෂා) සූත්‍රයක් නැති වැ—උද්දෙසිනො, පළමුවෙන් කියනලද්දාහුද ; අනුදෙසිනො, පසුවැ කියනලද්දාහුද—සමසංඛ්‍යකා, සමපරිපාටිතසංඛ්‍ය ඇත්තාහුද—'ඉති' යනු ප්‍රකාරාර්ථයෙහි වැටේ—"ඉති හෙතුප්‍රකාරාදිසමාපෙතෘ ච නිගද්‍යතෙ"—ඉති හලායුධඃ.

සා[a]........සතො, විද්‍යමානසංඥිහට—කාරියෙන, සංඥාකාය්‍ය්‍යයෙන් — සබ්බවම්මිකෙ, (ශර්වවර්මාචාය්‍ය්‍යයන්විසින් විරචිත) කාතන්ත්‍රව්‍යාකරණයෙහි........

සඤ්ඤාධිකාරෙ සමත්තො.

---

විධි[b]........යං, ("අතො ගොනං මාරෙ"[c] යනාදි වචනයෙහි විශෙෂණත්වයෙන් විවක්ෂිතවූ) යම් ('අතො' යනාදියෙක්)— විධි. විධියතෙ, විධියෙක්තෙමැ කරනුලැබේද — තෙන, ඒ (විශෙෂණත්වයෙන් උපාදියමානවූ 'අතො' යනාදිය) කරණකොටැ ගෙනැ—යථාකථඤ්චි තබ්බතො, යම්ක්සි පරිද්දෙකින් ('අත්පි හත්පි' යනාදි තන්හි ආදියෙහිද 'මාරජි ලොකජි' යනාදි තන්හි මධ්‍යයෙහිද 'බුධ සිධ' යනාදි තන්හි අන්තයෙහිද 'දසබල සකල' යනාදි තන්හි ආදිමධ්‍යාන්තයෙහිද 'අඛිල සඛිල' යනාදි තන්හි ආද්‍යන්තයෙහිද 'අජලි ජලධි' යනාදි තන්හි ආදිමධ්‍යයෙහිද 'සුගත ගොතම' යනාදි තන්හි මධ්‍යාන්තයෙහිද "අතො" යනාදි සූත්‍රයෙන් උපදිෂ්ටවූ අභෙදොපචාරයෙන්) ඒ අකාරවිශෙෂණ ඇත්තාවූ නාමාදියට—විධි, අප්‍රාප්තප්‍රාපණයක්හුගේ—තදන්තස්ස, ඒ අකාරාදිවිශෙෂණයා අන්තයෙහි ඇත්තාවූ නාමාදීන්ට ආදෙශාදිකාය්‍ය්‍යවිධානයැ පිණිසැ — තස්ස ච, ඒ වක්තෘහුගේද—සා, ඒ විවක්ෂාතොම— පයොගානුසාරෙන, සර්වඥවචනානුසාරයෙන්—ඉති යනු කාරණාර්ථයෙහි නිපාතයි—සබ්බත්ථ,

---

* පාණිනි 1, 3, 10.

[a] 1, 11 සූ. [b] 1, 13 සූ. [c] 2, 43 සූ.

සියලු (සංහිතාදි) විධියෙහි—"තත්‍ර ඉමෙ" යනාදිතන්හි 'සරෙ' යනු 'තත්‍ර' යනාදියට විශෙෂණහෙයින් යම්කිසි පරිද්දෙකින් ස්වරාදි ස්වරමධ්‍ය ස්වරාන්තවූ 'තත්‍ර' යනාදීන්ට ලොප් පත්තෙහි—"**විධිබ්බිසෙසනන්තස්ස**"[a] යන පරිභාෂා සූත්‍රසාමර්ථ්‍යයෙන් ස්වරයා අන්තකොටඇති පදයහට පැමිණි ලොප් "සරස්ස" කියා ෂෂ්ඨීවිභක්ති නොදක්වූහෙයින් ස්වරාන්තවූ සියලු තත්‍රශබ්දයහට පැමිණෑ 'ඉමෙ' යනාදි අනිෂ්ට ප්‍රසඞ්ග වෙයි, එබැවින් අනන්‍යසාධාරණනිරුක්තිප්‍රතිසම්භිදා වට පැමිණි අනන්‍යථාවාදීවූ සර්වඥයන්ගේ වචනානුසාරයෙන් තදන්තවිධිවිවක්‍ෂාව වෙයි යනු අභිප්‍රායයි.

**සත්ත**[b]~~~යත්ථ, ("**සරෙ ලොපො සරෙ**"[c] යනාදි) යම් ඒ සූත්‍රප්‍රදෙශයෙක්හි—සත්තමියා, ('සරෙ' යනාදි) සප්තමී විභක්තියෙන්—යස්ස, ('සරෙ' යනාදීන් නිර්දිෂ්ටවූ) යමක් හට—කාරියං, (ලොපාදි) කාර්යයෙක්තොමැ—සම්බන්ධවිසෙසා, පූර්වාපරසම්බන්ධයාගේ වෙනසක් නැතිහෙයින්—පරස්සාපි, (පූර්වයහට මැ නොවී) පරයැහටද—සංසත්තමී, සත් සප්තමීයි—"සතිවචසම්ං අථෙ සත්තමී සංසත්තමී" සී තත්පුරුෂසමාසයි—සූත්‍රයෙහි නොකී 'නිද්දෙසෙ' යනු වෘත්තියෙහි කීමට කාරණ දක්වනුවෝ "සත්තමී" යනාදි කීහු—"නිද්දෙසමන්තරෙන සත්තං න සම්භවති." සී සම්බන්ධයි—තං, ඒ ("**සරෙ ලොපො සරෙ**" යන) සූත්‍රයැ—උදාහරිත්වා, ගෙන හැරදක්වා — උකාරස්ස, (වෙළුශබ්දයාගේ) උකාරයහට—පුබ්බස්ස, (සප්තමීවිභක්තීන් දක්වනලද්දහු කෙරෙන්) පූර්වවූ; අනන්තරස්ස, අව්‍යවහිතවූ ස්වරයහට—"වුත්තං කිඤ්චි නත්ථි" සී සම්බන්ධයි—කිඤ්චි, "**තස්මින්නිති නිර්දිෂ්ටෙ පූර්වස්‍ය**"[*] යන පාණිනියසූත්‍රයෙහි නිර්දිෂ්ටග්‍රහණයෙන් ව්‍යවහිතනිවෘත්තියැ කරනලද්දක් මෙන්) කිසියන්තානන්තරයෙක් — භාෂ්‍යකාරයෝද කීහු—"අථ නිර්දිෂ්ටග්‍රහණං කිමර්ථම්? නිර්දිෂ්ටග්‍රහණමානන්තර්‍යාර්ථම්, නිර්දිෂ්ටග්‍රහණං ක්‍රියතෙ, ආනන්තර්‍යාර්ථම්, අනන්තර්‍යමාත්‍රෙ කාර්‍ය්‍යං යථා ස්‍යාත්, **ඉකො යණචි**[†] දධ්‍යත්‍ර, මධ්වත්‍ර, ඉහ මා භූත්, සමිධේ‍ය සමිධඃ, දෘෂදේ‍ය දෘෂදඃ" සී—නිරන්තරනද්‍රෂ්ට ඉති ප්‍රාදිසමාසඃ—තෙන, (එසේ යන්තානන්තර

---

* පා. 1, 1, 66. † පා. 6, 1, 77.

[a] 1, 13 සූ. [b] 1, 14 සූ. [c] 1, 26 සූ.

යෙක් නොකරනලද) හෙයින්—“චොදනං මනසි කරිත්වා” යන්නට ඉක්බිතිවැ “තං මනසිකතචොදනං දසෙසතුං” යනු අධ්‍යාහාර කොටැ “තමහනතීච්චාදි ආහ” සී යොදනු.

ව්‍යවධානෙ'පි, අනන්තරාලග්‍රාමාදීන් ව්‍යවහිතවිෂයෙහිද—“යස්මා සරෙති ඔපසිලෙසිකාධාරසත්තම්‍යන්තං තස්මා ව්‍යවධානෙ සරලොපො න හොති” සී සශෙෂ ව්‍යාඛ්‍යානයෙන් වෘත්තියෙහි අර්‍ථ දතයුතු—ආධාරෙයෙව යන තැන්හි 'භවති' සී අධ්‍යාහාරයි—සද්දස්ස, (ධ්වනිරූපවූ) ශබ්දයා තමා—වත්තිච්ඡානුවිධානතො, වක්තෘවිවක්‍ෂාවට අනුකූලභාවයෙන් අර්‍ථ කියනහෙයිනි—වත්තිච්ඡාපි, වක්තෘවූ සූත්‍රකාරයාගේ විවක්‍ෂාවද—“අතො උපදෙසතො අවසීයතෙ” සී සම්බන්ධයි—අතො, මේ වක්‍ෂ්‍යමාණ කාරණයෙන්—උපදෙසතො, අවිච්ඡින්න සම්ප්‍රදායයෙන්—“යස්මා අන්වයො අනිච්ඡීයතෙ අතො යො උපදෙසො ලද්ධො තතො'වසීයතෙ” සී යොජනායි—යස්මා, යම්කාරණයෙකින්—අන්වයො, ආම්නායතෙමැ; හෙවත් ගුරුපාරම්පයෙහිපදෙශයැතෙමැ — අනිච්ඡීයතෙ, (ගුරුකුලයට එළඹැ ප්‍රශ්නකරණාදීන්) සොයනුලැබේද—සාමත්ථියම්පි, අන්‍යථානුපපත්තිලක්‍ෂණවූ අර්‍ථබලයද කියනුලැබේ—ආධාරන්තරෙ, (සාමීප්‍යාදි) අන්‍යාධාරයෙහි—පසඞ්ගාභාවො, (වචනාන්තර) ප්‍රසඞ්ගයක්හුගේ අභාවයැතෙමැ; සියා, වත්තෙ'යි—කියැග කුමක් පිණිසැ මෙලෙස වර්‍ණනාකරනුලැබේද? ඖපශ්ලෙෂිකාධාරයෙහි මැ පූර්‍වාපරත්වයැ සම්භවවනහෙයින්. 'පුබ්බස්ස' යන වචනයැතෙමේ මැ ඖපශ්ලෙෂිකාධාරය හඟවයි කියා යමෙක් චොද්‍යකෙරේද එද අසඞ්ගතයැයි දක්වන පිණිසැ “පුබ්බස්සාති වචනතො” යනාදි කීහු—සාමීපිකෙ'පි, (“ගඞ්ගායං ඝොසො” යනාදි) සාමීපිකාධාරයෙහිද—අයුත්තං, (ව්‍යභිචාර දර්‍ශනයෙන් අනෛකාන්තිකහෙයින්) අයුක්තයි—තස්ස, ඒ පූර්‍වාපරත්වයාගේ—“අධිකං ව්‍යවහිතනිවත්තනාදි න වුච්චතෙ” කියා සම්බන්ධයි—ආදිශබ්දයෙන් ෂෂ්ඨීග්‍රහණයැ ගෘහීතයි—“ඡට්ඨීපකප්පනා'පි සාමත්ථියා කතා” සී සම්බන්ධයි—ඡට්ඨීපකප්පනා'පි, (පාණිනීයයෝ “**ෂෂ්ඨී ස්ථානෙයොගා**”* යන සූත්‍රයෙන් “**තස්මින්නිති නිර්දිෂ්ටෙ පූර්‍වස්‍ය**”† “**තස්මාදිත්‍යුත්තරස්‍ය**”‡ සී ෂෂ්ඨීවිධානයැ කෙරෙති) ඒ ෂෂ්ඨීකල්පනාවද—

---

* පා. 1, 1, 49. † පා. 1, 1, 66. ‡ පා. 1, 1, 67.

“ අඤ්ඤවිභත්තිනිද්දෙසො'පි පටිපජ්ජතෙ” යි සම්බන්ධයි—කාරිය යොගං, කාර්‍ය්‍යසම්බන්ධයැ—පරියායප්පසඞ්ග, වරින්වර පැමිණීමක් ඇතිකල්හි—පරියාති පවත්තතිනිවත්තතිං ඤාපෙතීති පරියායො—‘ යදා හි ’ යනාදීන් පර්‍ය්‍යායප්‍රාප්තික්‍රම දක්වත්—“ පුබ්බෙන සරෙන උපසිලිට්ඨො වත්තුමිච්ඡො ” යි සම්බන්ධයි—“ පරෙන උපසිලිට්ඨො වත්තුමිච්ඡො ” යි යොජනායි—පර්‍ය්‍යාය ප්‍රාප්තියක් ඇතිකල්හි නියමයැ පිණිස සූත්‍රයෙකැයි කියා කුමක්නිසා ව්‍යඤ්ජන කරනුලැබේද පූර්‍වපරයන් දෙදෙනාහට එකවිට පත්තෙහි ආචාර්‍ය්‍යවචනප්‍රාමාණ්‍යයෙන් අප්‍රතිපත්ති යක් ඇතිකල්හි විධිපිණිස කියනලද සූත්‍රයෙකැයි නොකීයේ කුමක් හෙයින්දැයි යන්නෙහි “යුගපදුපසිලිට්ඨානං ” යනාදි කීහු—“ යුගපදුපසිලිට්ඨානං අසම්භවො ” කියා සම්බන්ධයි—අතො, උපශ්ලිෂ්ටයන් දෙදෙනක්හුගේ එකවට පැමිණීමක් නැතිහෙයින්—වචනප්පමාණතාය, (“ **සරෙ ලොපො සරෙ** ”[a] යනාදි) ආචාර්‍ය්‍යවචනප්‍රාමාණ්‍යයෙන්—අප්පටිපත්තියං, (පූර්‍වය හටද පරයහටද පැමිණීම හෙතුකොටගෙනැ විෂයවිභාග) නොදැනීමක් ඇතිකල්හි—නොපකප්පතෙ, සම්පී නොවන් නේයි.

**පුබ්බ**[b]...... අවධිභාවෙන, (අතො යනාදි) අවධි ස්වභාවයෙන්—යස්ස, යම් (යොවිභත්තිආදියක්)හට—කාරියං, (ටාටෙ යනාදි) කාර්‍ය්‍ය—පුබ්බපරාපෙක්ඛත්තෙන අවිසෙසා, (“ ගාමා දෙවදත්තො ” යි කීකල්හි දෙවදත්තතෙමැ ගමින් පූර්‍ව හෝ වෙයි පර හෝ වෙයි කියා අවධිභාවයාගේ පූර්‍වපරාපෙක්ෂත්වයෙන් වෙනසෙක් නොපෙනේද එමෙන් “**අතො යොනං ටාටෙ**”[c] යි කීකල්හි අකාරයා කෙරෙන් පූර්‍වවූ යොවිභත්තීන්ටද නොහොත් පරවූ යොවිභත්තීන්ටදැයි) පූර්‍වපරාපෙක්ෂත්වයෙන් අවධිභාවයාගේ වෙනසක් නැතිහෙයින්—“පුරෙ විය” යනුයෙන් “ සත්තමියං ”යන තැන්හි කියනලද “ පඤ්චමියන්ති සංසත්තමීයම්භාවො භාවලක්ඛණන්ති සත්තමීච නානන්තරෙන නිද්දෙසං සම්භවතීති ආහ පඤ්චමීනිද්දෙසෙති ” යනු කීහයි දතයුතු—පුබ්බකො පරිහාරො, (ව්‍යවහිත නිවෘත්තියැ පිණිසැ) පූර්‍වසූත්‍රයෙහි කියනලද (“ සරෙතොපසිලෙසිකාධාරො ” යන) පරිහාරයැතෙමැ; න සම්භවති, (සප්තමීවිභක්තීන් දැක්වීමක් නැති

[a] 1, 26 සූ. [b] 1, 15 සූ. [c] 2, 43 සූ.

හෙයින්) නොලැබෙන්නේයි—වචනන්තරං, (පාණිනීයයන් ගේ නිර්දිෂ්ටග්‍රහණය මෙන් කිසිවචනාන්තරයෙක්—ඔහු වනා හි "**තස්මින්නිති නිර්දිෂ්ටෙ පූර්වස්‍ය**"* යන සූත්‍රයෙන් "**තස්මාදිත්‍යුත්තරස්‍ය**"† යන සූත්‍රයට "නිර්දිෂ්ටෙ" යනු අනුවර්තනයැ කොටැ ව්‍යවහිතනිවෘත්තිප්‍රතිපාදනයැ කෙරෙත්—"ජාතිං සන්නිස්සාය පච්චාසත්‍ය නිවත්තිමාහ" යි සම්බන්ධයි—ජාතිං සන්නිස්සාය, අව්‍යවහිතත්වසාමාන්‍යයැ ආශ්‍රය කොටැ—පච්චාසත්‍ය, ආසන්නතාව කරණ කොටැ ගෙනැ—නිවත්තිං, ව්‍යවහිතනිවෘත්තිය—"අනන්තරෙන" යන වචනයෙන් ප්‍රත්‍යාසත්තීහුගේ ආශ්‍රයකිරීම හැහෙයි "කත්‍යත්ථාය" යන වචනයෙන් ජාතීහුගේ ආශ්‍රයකිරීම හැගේ—"**අතො යොනං ටාටෙ**"[a] යන තැන්හි 'අතො' යන අකාරජාතිය "ඔස ධ්‍යෙ" යන ධකාරයෙන් ව්‍යවහිතවූ අකාරයැහට නොවී "සුගත යො" යනාදි අව්‍යවහිතවිෂයෙහි අකාරයැහට පැමිණීම ජාතියැ ආශ්‍රය කොටැ ප්‍රත්‍යාසත්තින්‍යායයෙන් සිද්ධයැයි දතයුතු—ජාති, සමානඥනාභිධානප්‍රසවාත්මිකවූ සාමාන්‍යයැ තෙමැ—කාමචාරතො, යථෙෂ්ටප්‍රවෘත්තියෙන්—යාවති විසයෙ, යම්පමණ ගවාදි විෂයෙක්හි—"භොජයෙ ඉති" යි පදච්ඡෙදයි—යාවදිද්ධං, "යාවනෙතා ඉද්ධා" යි විග්‍රහයි—කසිණෙ, සියලු; ජාත්‍යත්ථො, බ්‍රාහ්මණජාතිසඞ්ඛ්‍යාතවූ අර්ථයැතෙමැ—"ඡට්ඨීපකප්පනා'පි පුරෙචිය සාමත්ථියා" යනුයෙන් "පඨමීනිද්දෙසෙ කාරියං පරස්සාති වුත්තෙ යො සො පඨමීනිද්දිට්ඨො පරෙ සො'ඤ්ඤවිභත්තිනිද්දිට්ඨොපි කාරියයොගං ලභමානො අත්ථතො විභත්තිවිපරිණාමෙන ඡට්ඨීයන්තත්තං පටිපජ්ජතෙ" යනු දක්වූහු—ඡට්ඨීපකප්පනාපි, ෂෂ්ඨීවිධානයද.

**ආදිස්ස**[b] ...... කිඤ්චි, (යමෙක් ඞානුබන්ධ අනෙකවර්ණ තොවේද එබඳු) කිසිවෙක්—අන්තස්ස සම්පත්තං, ("**ඡට්ඨීයන්තස්ස**"[c] යන සූත්‍රයෙන්) අන්තයැහට සම්ප්‍රාප්තයැ—කිඤ්චි, (යමෙක් ඞානුබන්ධානෙකවර්ණ වේද එබඳු) කිසිවෙක්—සබ්බස්ස සම්පත්තං, "**ඞානුබන්ධානෙකවණ්ණා සබ්බස්ස**"[d] යන සූත්‍රයෙන් සියල්ලහට පැමිණියේයැ—තං, ඒ ("**ඡට්ඨීයන්තස්ස**" යන පරිභාෂාසූත්‍රයෙන් අන්තවර්ණයහට පැමිණි කාර්‍ය්‍යී)—යථා

---

* පා. 1. 1, 66. † පා. 1, 1, 67.

[a] 2, 43 සූ. [b] 1, 16 සූ. [c] 1, 17 සූ. [d] 1, 19 සූ.

සියාති, චේවයි කියා—විප්පටිසෙධා, අපවාද විප්‍රතිෂෙධයෙන්—"**ඡට්ඨියන්තස්ස**" යනු උත්සර්ගයැ, "**ආදිස්ස**" "**ටනුබන්ධානෙකවණ්ණා සබ්බස්ස**" යන සූත්‍රද්වය ඒ උත්සර්ගයට අපවාදයැ ඒ අපවාදයන් දෙදෙනාගේ විප්‍රතිෂෙධයෙන් සර්වාදෙශයැ වෙයි යනු භාවයි.

**ඡට්ඨි**[a]—පාණිනීන්විසින් "**අලො'න්ත්‍යස්‍ය**"[*] යන සූත්‍රයෙහි අල්ග්‍රහණයැ අන්ත්‍යවිශෙෂණයැ පිණිසැ උපදිෂ්ටයැ මෙහි ව්‍යවච්ඡෙද්‍යාභාවයෙන් අල්ප්‍රත්‍යාහාරයෙන් කී වර්ණග්‍රහණයැ ප්‍රත්‍යාඛ්‍යාතබව දක්වනපිණිසැ "සො ච වණ්ණො යෙවෙ ච්චාහ වණ්ණස්සාති" යනාදි කීහු.

"ෂෂ්ඨීනිර්දිෂ්ටස්‍ය ය උච්‍යතෙ ආදෙශස්සො'න්ත්‍යස්‍යාලඃ ස්ථානෙ වෙදිතව්‍යඃ" යනු ඒ "**අලො'න්ත්‍යස්‍ය**" යන සූත්‍රයෙහි විවරණයි.

**ඞනු**[b]—"**ටනුබන්ධානෙකවණ්ණා සබ්බස්ස**" යනු "**ඡට්ඨියන්තස්ස**" යන සූත්‍රයට බාධකයැ ඒ "**ටනුබන්ධානෙකවණ්ණා සබ්බස්ස**" යන සූත්‍රයට "**ඞනුබන්ධො**" යන සූත්‍රයැ බාධකයැ එබැවින් මේ පරිභාෂාසූත්‍රයැ බාධකබාධනයැ පිණිසැයැයි කියා වචනප්‍රයොජනයැ දක්වනුවෝ "**ටනුබන්ධානෙකවණ්ණා**" යනාදි කීහු—අන්ත්‍යාපවාදො, ("**ඡට්ඨියන්තස්ස**") යන සූත්‍රයට බාධකවිධියැ.

**ටනු**[c]—"**ඡට්ඨියන්තස්ස**"[d] යනාදි සූත්‍රාරම්භප්‍රයොජනකථනයෙන් මේ සූත්‍රයැ අන්ත්‍යාදෙශාපවාදපරිභාෂායයි දක්වූහු—පච්චෙකමභිසම්බන්ධො, ("සො ටකාරානුබන්ධො චාදෙසො අනෙකවණ්ණො චාදෙසො" ත්‍යා) වෙනවෙන මැ සම්බන්ධයි—උපලක්ඛියභාවමත්තාපෙක්ඛා, සලකුණු දක්වියයුතුබැව් පමණක් අපෙක්ෂා කොටැ ඇත්තේ—"උච්චාරිතප්‍රධ්වංසිනො'නුබන්ධාඃ" යනු අනුබන්ධලක්ෂණයි—උපදෙසෙයෙව, ප්‍රථමොච්චාරණාවස්ථායෙහි මැ—උපලක්ඛිය, ප්‍රත්‍යයාදියට ඇතුළත් නොවැ කාර්‍ය්‍යපමණක් දක්වා—මේ අභිප්‍රාය සාරස්වත ව්‍යාකරණයෙහි සුබොධ කොටැ කීහ—"**කාර්‍ය්‍යාර්ථෙෂ්**—ප්‍රත්‍යයාද්‍යතිරික්තඃ කශ්චිත් කාර්‍ය්‍යාර්ථොච්චාර්‍ය්‍යමාණො වර්ණ

---

* පා. 1, 1, 52.

[a] 1, 17 සූ. [b] 1, 18 සූ. [c] 1, 19 සූ. [d] 1, 19 සූ.

ඉත්සංඥකො භවති"—සී—"ඉමස්සානිත්ථියං ටෙ"[a] යන සූත්‍රයෙන් දර්‍ශිතවූ "ටෙ" යනාදෙශයද වර්‍ණණවයක් බැවින් අනෙකවර්‍ණයැයි ආශඞ්කා කොටැ "**නානුබන්ධකෘතමනෙකාල්ත්වම්**" යන පරිභාෂාව දක්වන්නාහු. "අතොයෙව" යනාදි කීහු.

**ඤකා**[b]—නියතාවයවවාචිනං, නිශ්චිතවූ දෙශාවයවයන් ප්‍රකාශකරන්නාවූ—අතොයෙව, ඒ (ආද්‍යන්තශබ්දයන් නියතාවයවවාචිබව) හෙයින් මැ—තග්ගහණෙන, ඒ අවයවිග්‍රහණයෙන්—කතාකතප්පසඞ්ගිත්තා, (ඔත්වය) කළකල්හිද නොකළකල්හිද (වුක් ආගම) ප්‍රසඞ්ගවනබැවින්—"කෘතාකෘතප්‍රසඞ්ගී යො විධිස්සනිත්‍යඃ" යනු හෙයින් වුක් ආගමයැ නිත්‍යවිධිවූයේ ඔත්වයට බාධා කොටැ පළමුවෙන් වේ.

**මනු**[c]—සුතත්තා, ('සරානං' සී) ශ්‍රුතබැවින්—"ශ්‍රුතානුමිතයොශ්ශ්‍රුතසම්බන්ධ එව බලීයාන්" යන න්‍යායයෙන් 'රුන්ධති' යන තැන්හි අනුච්චිතවූ ධකාරයැහට 'මං' ආගම නොවෙයි ශ්‍රුතවූ ස්වරයැහට මැ වෙයි යනු භාවයි—ඉධෙව, මේ ("**මනුබන්ධො**" යනාදි) සූත්‍රයෙහි මැ—මෙහිද "විසෙසනතො" යනු යොදනු.

**විප්පටි**[d]—කම්මව්‍යතිහාරෙ, ක්‍රියාපරිවර්ත්තනයෙහි; අඤ්ඤමඤ්ඤපටිසෙධො, අන්‍යාන්‍යප්‍රතිෂෙධයැතෙමැ; හෙවත් පරස්පරවිරොධයැතෙමැ—අභිහිතෙ, කියනලදකල්හි—"විප්පටිසිද්ධමිදං වුච්චතීති වත්තාරො භවන්ති" සී සම්බන්ධයි—අඤ්ඤඤ්ඤානජ්ඣාසිතෙ, පරස්පරානධ්‍යාසිතවූ; හෙවත් ඔවුනොවුන්විසින් නොමඩනාලද—අනුභයභාගිනි, උභය භයභාගී නොවන්නාවූ—සාමඤ්ඤවිසයප්පවත්තිප්පසඞ්ගෙ සති, (විධීන් දෙදෙනාට) සාධාරණවූ විෂයෙහි ප්‍රවෘත්තිප්‍රසඞ්ගයක් ඇතිකල්හි—"සො ච ජායති" සී සම්බන්ධයි—විෂය නම් ප්‍රවෘත්තිප්‍රසඞ්ගයැ විෂයී නම් විප්‍රතිෂෙධයැ යන විෂය විෂයී දෙදෙනාගේ අභෙදය විවක්ෂිතහෙයින් සූත්‍රයෙහි ප්‍රසඞ්ගයැමැ විප්‍රතිෂෙධවිෂය බැවින් 'විප්පටිසෙධෙ' සී කියනු ලැබෙයි යනු භාවයි.

---

[a] 2, 128 සූ. [b] 1, 20 සූ. [c] 1, 21 සූ. [d] 1, 22 සූ.

මෙ මැ කීහ ශ්‍රීධරාචාර්‍ය්‍යයෝ :—

"විප්‍රතිෂෙධ ඉති නිමිත්තනිමිත්තවතොරභෙදස්‍යවිවක්ෂිතත්වාත්නිමිත්තං නිමිත්තිවචනෙන ශබ්දෙනාභිධීයතෙ, යථා නඩ්වලොදකම්පාදරොග ඉති, නිමිත්තං යුගපත්ප්‍රාප්තිඃ නිමිත්තී විප්‍රතිෂෙධස්තයොරභෙදෙ විවක්ෂිත ඉති" සී.

පරෝ හොති, "ව්‍යවස්ථාන්‍යධිකෙෂ්ටෙෂු පරශබ්දස්සමීරිතඃ" යනුහෙයින් පරශබ්දයැ තෙමැ "පූර්වඃ පරඃ" යනාදි තැන්හි ව්‍යවස්ථායෙහි වැටෙයි. "පරපුත්‍රඃ පරභාර්‍ය්‍යා" යනාදි තැන්හි ඉතරාර්ථයෙහි වැටෙයි. "පරම්‍යම්බ්‍රාහ්මණ්‍යස්මින් කුටුම්බෙ" යනාදි තැන්හි ප්‍රධානභාවයෙහි වැටෙයි. "පරන්ධාමගතඃ" යනාදි තැන්හි ඉෂ්ටාර්ථයෙහි වැටෙයි. එමෙන් මෙතැන්හිද ඉෂ්ටාර්ථවෘත්තියයි දතයුතු.

"විධි දර්ශිතො" යන්නෙන් පාණිනියයන් මෙන් මේ සූත්‍රයැ ජාතිපක්ෂයෙහි විධි පිණිසද ව්‍යක්තිපක්ෂයෙහි නියමය පිණිසද නොදක්වනලද්ද, වැළිත් පක්ෂවයෙහි මැ සූත්‍රයන් දෙදෙනාගේ අප්‍රවෘත්තියක් ඇතිකල්හිද විධියැ පිණිසයැයි යනු වෘත්තිකාරයාගේ අභිප්‍රායයැයි දක්වූහු—ජාතිච, සාමාන්‍යයද—ව්‍යක්තිච, විශෙෂයද—"කාමචාරතො පරිසමාප්‍යතෙ" සී සම්බන්ධයි—"හි (යස්මා) උභයම්පි වචනං පමාණම් තෙසං විධායකම් තස්මා පවත්ති න භවෙය්‍ය" සී සම්බන්ධයි—හි (යස්මා), යම්හෙයකින්—"හි හෙතාවවධාරණෙ" යනු නිඝණ්ඩුයි—තෙසං, ඒ විධීන් දෙදෙනාගේ—යුගපත්ප්‍රාප්තවූ සූත්‍රයන් දෙදෙනාගේ තුල්‍යඵලත්වයද විරොධිත්වයද දක්වන්නාහු "අනුභයභාගිම්හි" යනාදි කීහු—"සමානබලා ඉති" යන තැන්හි ඉති ශබ්දයැ හෙතුයෙහි වැටේ—එහෙයින් කීහ අමරකොෂයෙහි—"ඉති හෙතුප්‍රකරණප්‍රකාරාදිසමාප්තිෂු" සී—"යතො ලද්ධාවකාසා තතො සමානබලා" සී යොදනු—"විරුද්ධා චාති" සී මෙතැන්හි ඉතිශබ්දයක් යොදා "අනුභයභාගිම්හි විසයෙකදෙසෙ ලද්ධාවකාසා එත්ථ පප්පොන්තීති සමානබලා පවත්තිසාපෙක්ඛත්තා අඤ්ඤමඤ්ඤවිබන්ධකාති විරුද්ධා චාති ද්වින්නං වචනානං පමාණත්තා උභින්නම්පි අප්පවත්ති" සී සම්බන්ධකරනු—"ලොකෙ ච" යනාදීන් තදර්ථසාධනයැ පිණිසැ ලෞකිකදෘෂ්ටාන්ත දක්වූහු.

භාෂ්‍යකාර පතඤ්ජලිමහර්ෂීහුවිසින් ජාතිපක්ෂයෙහි විධීන් දෙදෙනක්හුගේ යුගපත්ප්‍රාප්තියක් ඇතිකල්හි තෘජාදීන්ට

මෙන් කල්පිතවූ පර්‍ය්‍යායප්‍රසඞ්ගයැ අයුක්තයැයි දක්වනුවෝ ‘නචාපි’ යනාදි කීහු—ඒ භාෂ්‍යයෙහි කීපරිදි මෙසේ දත යුතු—“එවම සති තෘජාදිභිස්තුල්‍යඃ පර්‍ය්‍යායඃ ප්‍රාප්නොති තද්‍යථා තෘජාදයඃ පර්‍ය්‍යායෙණ භවන්ති එවමිහාපි පර්‍ය්‍යායඃ ස්‍යාත් කිම්පුනඃ කාරණං තෘජාදයඃ පර්‍ය්‍යායෙණ භවන්ති අනවයව ප්‍රසඞ්ගාත් ප්‍රතිපදවිධෙශව අනවයවෙ න ච ප්‍රසජ්‍යන්තෙ ප්‍රතිපදම විධීයන්තෙ අප්‍රතිපත්තිඡෙවාභයොස්තුල්‍යබලත්වාත් අප්‍රතිපත්තිඡ්වා පුනරුභයොශ්ශාස්ත්‍රයොස්ස්‍යාත් කිංකාරණං තුල්‍යබලත්වාත් තුල්‍යබලෙ හි උභෙ ශාස්ත්‍ර තද්‍යථා, ඩයො ස්තුල්‍යබලයොරෙකඃ ප්‍රෛෂ්‍යො භවති ස තයොඃ පර්‍ය්‍යායෙණ කාර්‍ය්‍යං කරොති යද්‍ය තමුභෞ යුගපත්ප්‍රෙෂයතඃ නානාදික්‍ෂු ච යුගපත්කාර්‍ය්‍යෙ භවතඃ, යද්‍යසාවවිරොධාර්ථී භවති තද්‍ද උභයොර්න කරොති කිම්පුනඃ කාරණමුභයොර්න කරොති යෞගපද්‍යාසම්භවාත් නාස්ති යෞගපද්‍යෙ සම්භවඃ තත්‍ර ප්‍රති පත්ත්‍යර්ථං වචනමිති” යි.

භින්නවිසයත්තා, (විධීන් දෙදෙනාට) භින්නවූ විෂයඇති බවහෙයින්—අනවයවෙන, (ධාතුමාත්‍රයාකෙරෙන් විධාන යැ හෙයින්) අවයවව්‍යතිරෙකයෙන්; හෙවත් සාකල්‍ය යෙන්—යත්‍ථ, යම් ධාත්වෙකදෙශයෙක්හි—“පවත්තා සමානා ලබ්ධාවකාසා සියුං තදෙකදෙසපරිහාරෙනාපි න විධීයන්තෙ ති” යි සම්බන්ධයි—“ලත්වාදීනං එකක්ඛණෙ අසම්භවා එකස්මිං වචනානත්ථක්‍යප්පසඞ්ගා ච පරියායෙන භවන්තීති යං තං යුත්තං” යි සම්බන්ධයි—එකක්ඛණෙ අසම්භවා, (ලත්වාදීන්ගේ) යුගපත්සම්භවයක් නැතිහෙයින්—එකස්මිං (කාලෙ),(ලත්වාදීන් අතුරෙන්) එක් ප්‍රත්‍යයක් (කලකල්හි); වචන, (ඉතර) වචන යන්ගේ; ආනත්ථක්‍යප්පසඞ්ගා ච, නිරර්ථකභාවයැ පැමිණෙ නහෙයින්ද—ඉහ, මේ යුගපත්ප්‍රාප්තියෙහි—ජාතිපද්‍යර්ථවිෂ යෙහි **“පුනඃ ප්‍රසඞ්ගවිඥානාත් සිද්ධම්” “සකෘද්ගතෙ විප්‍රති ෂෙධෙ යද්බාධිතන්තද්බාධිතමෙව”** යන මේ පරිභාෂාවන් දෙදෙනාගේ ප්‍රවෘත්තියැ ප්‍රතිපාදනයැ කරනුපිණිසැ “පර ස්මිං” යනාදි කීහු—පරස්මිං, ඉෂ්ටයැ—මේ සූත්‍රයැ ව්‍යක්තිපක්‍ෂ යෙහිද විධිපිණිස මැ වෙයි නියමයැ පිණිසැ නොවන්නේ යැයි දක්වන්නට “ව්‍යත්තියම්පි” යනාදි කීහු—පරිභාසානම්පි, (යථොක්ත)පරිභාෂාවන් දෙදෙනාගේද—චරිතත්ථා, පරිසමා ප්තවූ අර්ථඇත්තාහු—“සාමාන්‍යවිධිරුත්සර්ගඃ” යනුහෙයින්

"ඡට්ඨියන්තස්ස"[a] යනු උත්සර්ගයැ. "විශෙෂවිධිරපවාදඃ" යනුහෙයින් "ආදිස්ස"[b] "මනුබන්ධානෙකවණ්ණා සබ්බස්ස"[c] යන මේ විධිවය එයට අපවාදසඞ්ඛ්‍යාතවූ විශෙෂවිධියැ. ඒ අපවාදයන් දෙදෙනාගේ විප්‍රතිෂෙධයෙන් සර්වාදෙශයැ වන්නේයැයි යනාදීන් උදාහරණ දතයුතු.

**සඞ්කෙතො**[d] ~ පකරණතො, ප්‍රස්තාවහෙයින්—

"පසජ්ජප්පටිසෙධස්ස ලක්ඛණං වත්ථුනත්ථිතා
වත්ථුතො'ඤ්ඤත්‍ර යාවුත්ති පරියුදාසස්ස ලක්ඛණං." ~

යනුහෙයින් උත්තරපදාර්ථයැ ප්‍රතික්ෂෙප කොටැ තදන්‍යයෙහි කාර්‍ය්‍යප්‍රවෘත්තියැ පර්‍ය්‍යුදාසවෘත්ති නම් වේ—"කෙචි" යන්නෙන් පාණිනිඍෂිහු ගත්හු—වචනං, ("**තස්‍ය ලොපඃ**"* යන) සූත්‍රයක්.

**වණ්ණො**[e] ~ සබ්බත්ථෙව, සියලු සූත්‍රප්‍රදෙශයෙහි මැ—වෘත්ති නිර්දෙශ, (බුද්ධසිද්ධාදිවූ යම්කිසි ශබ්දයෙක්හි හ්‍රස්වඅකාරාදී) විශෙෂයක්හුගේ නිර්දෙශයක් ඇතිකල්හිද—රස්සජාතිනිර්දෙශ වා, (බුද්ධසිද්ධාදී සියලු අකාරාන්තයන්ගේද ලාක්ෂණික ගවාද්‍යකාරාන්තයන්ගේද) අකාරසාමාන්‍යයන්ගේ නිර්දෙශයක් ඇතිකල්හිද—ව්‍යත්තානන්තරත්තා, අන් වෙසෙසක් බැවින්—අඤ්ඤදත්ථා, (ස්වරූපග්‍රහණයැ පිණිසැ සූත්‍රයෙහි අපිශබ්දයැ) ප්‍රයොග නොකරනලද්දේ වීනම්—ගුණීභූතස්ස, අප්‍රධානවූ (අකාරඉකාරාදීහුගේ)—"ධනඤ්ඤාතිසු සංසද්දෙ තථාත්තාත්ත නියෙසුපි" යනු නිඝණ්ඩුහෙයින් මෙතැන්හි සංශබ්දයැ ආත්ම ආත්මීය දෙක්හි වැටෙයි. එහි ශබ්දයන්ගේ සාධාරණවූ ශබ්දරූපයැ ආත්ම නමැ අසාධාරණවූ ශබ්දරූපයැ ආත්මීය නමැ එසේකල්හි ආත්මීය රූපයැ නම් ආත්මසඞ්ඛ්‍යාත ශබ්දසම්බන්ධියැයි කියා "සං රූපං සද්දනාමසාධාරණං රූපං" යනාදි කීහු—"සං රූපං සද්දනමසාධාරණං රූපන්ති ඉදං දස්සෙති" කියා සම්බන්ධයි—තත්ථ, ඒ (සාධාරණ අසාධාරණ ශබ්දරූපයන් දෙදෙනා) අතුරෙන්–සද්දනං, සාර්ථක නිරර්ථකවූ යම්කිසි ශබ්දකෙනකුන්ගේ—සද්දත්තාදි, ශබ්දසාමාන්‍යාදිතෙ

---

* පා. 1, 3, 9.

[a] 1, 17 සූ. [b] 1, 16 සූ. [c] 1, 19 සූ.
[d] 1, 23 සූ. [e] 1, 24 සූ.

මැ—තංතංසද්දත්ථාදි පන, ඒ ඒ (බුධ අ ඉ ආදීන්ගේ) ශබ්දත්ථා
දිය වනාහි—දෙතැන්හි මැ ආදිශබ්දයෙන් අර්ථයැ සඞ්ගෘහීතයි—
එහෙයින් අර්ථයන්ගේ සාධාරණරූපයැ අසාධාරණරූපයැයි
කියා ස්වරූපයැ චතුර්විධයැයි දක්වූහු—මේ සතරවැදෑරුම්වූ ස්ව
රූපයන් අතුරෙන් අසාධාරණවූ ශබ්දරූපයාගේ මැ ග්‍රහණයැයි
කියා දක්වනු පිණිසැ "තඤ්ච" යනාදි කීහු—සාධාරණරූපව්‍යු
දසෙන, සාමාන්‍යරූපයාගේ පරිත්‍යාගයෙන්—"උපාදියනෙතා
රූපමෙව සද්දස්ස සං ඤාහොති ච දසෙසති" යි සම්බන්ධයි—
ඉතරම්පන, යම්කිසි ශබ්දකෙනකුන්ගේ ශබ්දත්ථාදියැ වනාහි—
පරස්සාපීති, අන්‍යවූ යම්කිසි ශබ්දයක්හටද වන්නේයැයි යන ;
ඉති ඉදං, මේ යථොක්තක්‍රමයැ ; ඉති (යස්මා), යම්හෙයකින් ;
පතීතං, ප්‍රසිද්ධ ; තස්මා—"උපදෙසතො උපාදියනෙතා" යි
ප්‍රස්තුතයි—උපදෙසතො, පූර්වාචාර්‍ය්‍යපරම්පරාගතවූ සම්ප්‍රදාය
යෙන්—ආසන්නං, (ශබ්දයාකෙරෙන් ශබ්දස්වභාවයැ අතිකක්
නොවනබැවින්) ප්‍රත්‍යාසන්නයැ—විපරියයතො, විපර්‍ය්‍යාස
යෙන් ; හෙවත් අනාසන්නභාවයෙන්—චක්ෂුරාදිවිෂයවූ අර්ථයැ
ශ්‍රොත්‍රවිෂයවූ ශබ්දයට ආසන්නනොවනහෙයින් ශබ්දස්වරූ
පයට අර්ථයැ අනාසන්නයැයි දතයුතු—අහෙය්‍යත්තා ච, අපරි
ත්‍යාජ්‍යබවහෙයින්ද—තං, ඒ ශබ්දරූපයැ ; නිච්චසම්බන්ධි,
නිරන්තරසංයොගියැ—විපරියයතො, හෙයබැවින්—"තථා
හි" යනාදියෙන් අර්ථයාගේ හෙයත්වය මැ දක්වත්—"අසා
ධාරණඤ්ච රූපං" යනාදියෙන් අන්‍යකාරණයක් කීහු—සාධා
රණෙ, (පර්‍ය්‍යායශබ්දයන්ට) සාධාරණ වන්නේයැ—පච්චෙ
තබ්බත්තා, දතයුතුබැවින් — කාරණාන්තරොපසංහාරයෙන්
රූපය මැ ශබ්දයට ස්ව නම්වනබවමුත් අර්ථයැ ස්ව නොවන්
නේයැයි නියමකොට දක්වනුවෝ "තදෙවං" යනාදි කීහු—
තදෙවං, යස්මා එවං තං තස්මා—සරූපප්පධානො නිද්දෙසො,
("**ඝොසස්සාවධි**"[a] යනාදියෙහි "ඝොසස" යන මේ ආදිවූ) ස්ව
රූපප්‍රධානනිර්දේශයෙහි.

**නතු**[b] ~ වනත්වවණ්ණා ; "**තමෙත්ථස්සත්ථීති මන්තු**"[c]
"**සබ්බා චාවන්තු**"[d] "**කතතාවි භූතෙ කතවන්තුකතාවී**"[e]
යන මෙයින් විහිතයෝ වන්තාදීහුයි.

පරිභාසායො සමත්තා.

[a] 1, 32 සු. [b] 1, 25 සු. [c] 4, 78 සු. [d] 4, 43 සු. [e] 5, 55 සු.

**සරෙ**[a] ~ ආධාරවිසෙස, ආධාරවිශෙෂක්හුගේ; හෙවත් ඖපශ්ලෙෂිකාධාරයාගේ; අපස්සයනං, ආශ්‍රය කිරීමැ—‘කෙචි’ යන්නෙන් බුද්ධප්‍රියාචාර්‍ය්‍යාදීන් දක්වූහු—ඔහු “නිමිත්තොපාදනසාමත්‍ථියතො වණ්ණකාලව්‍යවධානෙ සන්‍ධිකාරියං න භවති” “නිමිත්තොපාදනසාමත්‍ථියතොති යදි වණ්ණනකාලෙන ව්‍යවධානෙපි සන්‍ධි භවෙය්‍ය තදා සරෙති නිමිත්තසෙසොපාදනං නිරත්‍ථකං භවෙය්‍ය නච නිරත්‍ථකං තස්මා න භවතීති සිද්ධං” යි කීහු—තදයුත්තං, (ඔවුන් විසින් “නිමිත්තොපාදනසාමත්‍ථියතො” යනාදීන් යමෙක් කියනලදද) ඒ අයුක්තයි—ඔස්සග්ගිකත්තා, උත්සර්ගසම්බන්‍ධබව හෙයින්—අජ්ඣාසිතෙ, ප්‍රවිෂ්ටවූ—තෙහි, ඒ පරලොපාදීන් විසින්.

**පරෙ**[b] ~ ලොපනීයො හොතීති, ලොප්කටයුතු වෙයි යන මෙ වචනයැතෙමැ—පයොගානුසාරිතං, ශිෂ්ටප්‍රයොග යන් අනුවැ යනබව.

> “නිච්චානිච්චමසන්තඤ්ච විධිං දීපෙතයං ක්වචි,
> ‘හොන්ති ලතාව විරිසිඤ්ජියං’ තෙසං නිදස්සනං.” ~

තඤ්ච ඛො, ඒ (විපර්‍ය්‍යාසයෙන් වීම) ද—පටිපදං, පදයක් පද යක් පාසා—නචෙච්චමිඪං, මේ යථොක්තප්‍රකාරයෙන් (කියන ලද විකල්පවිධානයැ වෛයාකරණයන් විසින්) කැමතිවන ලද්දේ නොවේ—නනු ච, කියග—තථාහි, එ මැ දක්වත්—“වත්තුං නච සක්කා” යි සම්බන්ධයි—තථා ච සති, එසේද වනකල්හි.

**නවෙ**[c] ~ සජ්ජෙවං, එසේ වීනම්—තදභාවෙ ච, ඒ (උපශ්ලෙෂයාගේ) අභාවයැ ඇතිකල්හිද—කාලන්තරෙන, පූර්‍ව්වාපරවර්‍ණ්ණයන්ගේ උච්චාරණකාලයෙන් අන්‍යවූ මධ්‍යපතිත විශ්‍රාමකාලයෙකින්.

**සුව**[d]—“අවණ්ණෙ එව ලුත්තෙ” යනාදිය පරවිප්‍රතිපත්ති ප්‍රකාශයැ කිරීමයි-කීයේ මැනෙ? “**කාචාසවණ්ණං ලුත්තෙ**”* යන සූත්‍රයට රූපසිද්ධිය දක්වන්නාවූ සොළීබුද්ධප්‍රියාචාර්‍ය්‍යයන් විසින්—“එත්‍ථ ච සති’පි හෙඨා වාගහණෙ ක්වචිග්ගහණකරණතො අවණ්ණෙ එව ලුත්තෙ ඉධ වුත්තවිධි හොතීති දට්ඨබ්බං” “වුත්තියං අවණ්ණලොපෙ ඉකාරුකාරානං එකාරෙ

---

* කා. 1, 2, 3.

[a] 1, 26 සු. [b] 1, 27 සු. [c] 1, 28 සු. [d] 1, 29 සු.

කාරකරණතද්කරණතාවසෙනෙව මුලොදාහරණපච්චුදාහරණානං දස්සිතත්තා, ඉතරත්ථා අනිඪ්ඨප්පසඞ්ගතො නවාතිඪ්ඨෙත්ථා හි සුත්තාරම්භො" යි—"සුවණ්ණානං" යනු ස්ථානාදෙශ සම්බන්ධයෙහි ෂෂ්ඨියැ එහෙයින් ඉවර්ණ උවර්ණයන්ගේ ස්ථානයෙහියැ යන අර්ථයි—"දම්භාණං ස්ථානෙ ශෛරෙරාස්තරිතව්‍යම්" යන තැන්හි මෙන් මෙතැන්හි ස්ථානශබ්දයැ ප්‍රසඞ්ගවාචීයි—අර්ථකථනයැ පිණිසැ ප්‍රවෘත්ත ප්‍රස්තාව 'ප්‍රසඞ්ග' නම්.

**සරමහා**[a] ~~ වෙ රූපානි හොන්තීති, වෙ රූපානි හොන්ති යන මෙයින්—ආ දසහි, දසශබ්දයැ දක්වා—සංඛ්‍ය, සංඛ්‍ය තොම.

මෙ මැ කීහ :—

"එකප්පභුතිතො යාව දසකා යා පවත්තති
තා සංඛ්‍ය තාව සංඛෙය්‍යප්පධානාති ගරූ විදුං ~~
වීසතිතො යාව කොටි යා සංඛ්‍ය තාව සා පුන
සංඛ්‍යප්පධානා සංඛෙය්‍යප්පධානා වාති නිද්දිසෙ" ~~ යි.

"යෙසං දස පියානි දස තෙසං දුක්ඛානි" යනාදිය සංඛෙය්‍යප්‍රධානයට උදාහරණයැ—"භික්ඛූනං සතං ඉත්ථීනං සතං" යනාදිය සංඛ්‍යප්‍රධානයට උදාහරණයි—"න සරූපප්පධානොති දස්සිතං හොති" යි සම්බන්ධයි.

**චතු**[b] ~~ රූලෙහාති, (යම්හෙයකින්) ප්‍රසිද්ධ එහෙයින්—යථායොගං, (චතුර්ථාක්ෂරයා පරකල්හි චතුර්ථාක්ෂරයහට තෘතීයාක්ෂරාදෙශ වෙයි ද්විතීයාක්ෂරයා පරකල්හි ද්විතීයාක්ෂරයහට ප්‍රථමාක්ෂරාදෙශ වෙයි යන) සූත්‍රක්‍රමයැ නොඉක්මැ.

**විතිස්ස**[c] ~~ 'ඉති' යනු නිපාතයට අනුකරණපදයෙකි තත්ප්‍රතිරූපක සඞ්ඛ්‍යනාමපදයෙකැයි සේයි—අනුකරීයතෙ 'නෙනාති අනුකරණං ඉති නිපාතස්ස අනුකරණං.

**එඔ**[d] ~~ න නිමිත්තං, (අකාරතෙමැ එඔකාරයන්ට වකාරාදෙශවීමට) කාරණ නොවන්නේයි—අඤ්ඤත්ථා, අවර්ණයාගේ නිමිත්තත්වයක් ඇතිකල්හි—"ඔකාරං න පඨෙය්‍ය" කියා සම්බන්ධයි.

**නිග්ගහ**[e] ~~ ආගම නම් අවිද්‍යමානවර්ණයාගේ ප්‍රාදුර්භාව යැයි.

---

[a] 1, 34 සූ. [b] 1, 35 සූ. [c] 1, 36 සූ. [d] 1, 37 සූ. [e] 1, 38 සූ.

එහෙයින් කීහ ප්‍රයොගසිද්ධිකාර වනරතන මහාස්ථවිරයෝ.
“ලොපො අදස්සනං ඨානං යමාමඤ්ඤිය දිස්සති
ආදෙසො නාම සො යා තු අසන්තුප්පත්ති ආගමො ~”යි.
ව්‍යක්තත්වං, ව්‍යාඛ්‍යාන කරනුපිණිස.

**වන** [a] ~ නනුව, කියග—අනුවුත්තං, මේ වනාදි සූත්‍රය හා සම්බන්ධ කරනලද—“**ක්වචි ඔ බ්‍යඤ්ජනෙ**”* යන සූත්‍රයෙන් ඔකාරාගම කොට “**යවමදනතරලා චාගමා**”† යන සූත්‍රයෙහි චග්‍රහණයෙන් ගකාරාගම කොට සිද්ධකළ ගතිය හැර ප්‍රකාරාන්තරයෙන් සාධනු පිණිස “අතිප්පසඞ්ගතො” යනාදි කීහු.

**ෂාළො** [b] ~ පරිච්චත්තත්ථං, හරනාලද (විධිනිෂෙධස්වරූපවූ) අර්ථ ඇත්තේය—මෙතැන්හි ෂශබ්දයෙහි ෂට්සඞ්ඛ්‍යාවිශෙෂය පරිත්‍යක්තයි—අනුකාරියස්ස, අනුකරණ කටයුත්තහුගේ—උපපජ්ජන්ති, යුක්තවෙත්—තෙසම්පි, ඒ කාත්‍යායනයන් විසින්ද-අක්ඛරසඤ්ඤායං, (“**අක්ඛරාපාදයො එකචත්තාළීසං**”‡ යි විධීයමාන) අක්ෂරසංඥයෙහි.

**තද** [c] ~ තදමිනාදීනි සාධූනි භවන්ති—ඉධපාඨා, මේ තදමිනාදිගණයෙහි හඳුළහෙයින්—අස්ස, මේ තදමිනාදිගණයාගේ—එවමඤ්ඤ‘පීති, එවමඤ්ඤ‘පි යනු; වුත්තං, කියනලදී.

වණ්ණාගමො ~ පෙ ~ නිරුත්තං§ — මේ නිබන්ධකාරපඨිත නිරුක්තිලක්ෂණයි—වණ්ණාගමො, වර්ණසංඛ්‍යාතවූ අක්ෂරයක්හුගේ ආගමවනබවද; වණ්ණවිපරියයො ච, වර්ණස්ථානව්‍යත්‍යසයද; හෙවත් වර්ණයා උඩුයටියාවනබවද; වණ්ණවිකාර, (වණ්ණස්ස වණ්ණන්තං,) වර්ණයාගේ හෝ වර්ණයන්ගේ හෝ; විකාර, රූපාන්තරප්‍රාප්තිය; වණ්ණනාසා, වර්ණයාගේ ලොප්වනබවය යන; අපරෙවෙ ච, අනික් දෙකද; අත්ථාතිසයෙන, අර්ථ විශෙෂයක්හා; ධාතුස්ස යොගො, ධාතුහුගේ යෙදීමයයි; තං පඤ්චවිධං, ඒ (මේ) පඤ්චප්‍රකාරය තෙමේ; නිරුත්තං, නිර්වචනය; (අර්ථකථනවාක්‍යපූර්වකවූ උච්චාරණයයි); වුච්චතෙ, කියනුලැබේ—නිරුක්තියෙහි වර්ණ

---

* ක.1, 4, 7. † ක. 1, 4, 6. ‡ ක. 1, 1, 2.

§ වණ්ණාගමො වණ්ණවිපරියයොච ෙවෙවාපරෙ වණ්ණවිකාරනාසා
ධාතුස්ස අත්ථාතිසයෙන යොගො තං වුච්චතෙ පඤ්චවිධං නිරුත්තං.

[a] 1, 45 සූ. [b] 1, 46 සූ. [c] 1, 47 සූ.

විකාරමුත් පදවිකාර නොකියනලද්ද පෘෂොදරාදියෙහි උදක් වර්ණමාත්‍රයාගේ විකාර නොවෙයි වලාහකශබ්දයෙහි වාරි ශබ්දයට වාදෙශවනහෙයින් පදයටද විකාර වන්නේය; එහෙයින් මෙහි පදවිකාර අධිකයැයි චන්ද්‍රිකාකාරයන් විසින් කියනලද විරුඬකල්පනාව නිරාකරණය; කරනපිණිස; පදවිකාරයද "පඤ්චවිධං නිරුත්තං" යන සඞ්ඛ්‍යානියමයට ඇතුළත් කරන්නාහු "පදවිකාරො'පි වණ්ණවිකාරෙන සඞ්ගහීතො" යනාදි කීහු—"බාහිරකවෙය්‍යාකරණා" යන්නෙන් චන්ද්‍රපාණින්‍යාදීන් ගත්හු—"පිසොදරාදිපක්ඛෙපෙන, ("**පෘෂොදරාදීනි යථෝපදිෂ්ටම්**"* යන සූත්‍රයෙන්) පෘෂොදරාදියෙහි ප්‍රක්ෂෙප කිරීමෙන්.

"දෙවාරිකාදෙ වණ්ණනමාගමො තබ්බිපරියයො
සීහෙ විකාරො නියකෙ තලෙලාපො මෙඛලාදිසු
ධාත්වත්ථාතිසයෙනෙත්ථ මයූරෙ යොගම්රිතො"—

මේ පඤ්චවිධනිරුක්තියට උදාහරණයි.

**තවග්ග**[a]—වණ්ණමත්තාසෙසව, වර්ණසාමාන්‍යයක්හුගේ මැ—"ජීවමත්තං න හිංසෙය්‍ය" යන්නෙහි මෙන් මෙතැන්හි මත්තශබ්දය; සාමාන්‍යයෙහි වැටේ.

**විවක්ෂා**[b]—යං වත්තතෙති, යං වත්තතෙ යන්නෙහි අභි කියනුලැබේ—සම්භවාපෙක්ඛාය, සම්භවවන පදවාක්‍යයෙහි අපෙක්ෂාව හෙයින්—"පදං වා වාක්‍යං වා වත්තතෙ" කියා සම්බන්ධයි—විසයභාවෙන, ගොචරත්වයෙන්; හෙවත් අනන්‍යත්‍රභාවයෙන්—විසයශබ්දය; විපූර්වවූ "සි-බන්ධනෙ" යන ධාතුයෙහි කර්තෘකාරකයෙහි අප්‍රත්‍යයෙන් සිඬයි—මෙතැන්හි විසයශබ්දය; ගොචරයෙහි වැටේ.

කීයේ මැ නු අජයකොශයෙහි :—

"විෂයො ගොචරෙ දෙශෙ රූපාදෞ නිත්‍යසෙවිතෙ" යි.

අභිධායකත්තෙන ච, ප්‍රකාශකත්වයෙන්ද—"වෙ ඉච්චනෙන" යනාදියෙහි අභිප්‍රාය නම්, "**විවක්ඛාභිකඛ්ඛෙය්‍යසු**" යන තැන්හි ෂෂ්ඨ්‍යුච්චාරණය; නොකරනලද්ද එතකුදුළුවත්

---

* පා 6, 3, 109.

[a] 1, 48 සූ. [b] 1, 54 සූ.

පාණිනියෙහි මෙන් '**සර්වස්‍ය**'* යන අධිකාරවචනයක් නැති වැ ද ෂෂ්ඨ්‍යර්ථයැ හැඟෙයි, ඒ කෙසේද 'වෙ' යනු ආදෙශනිර්දේශයැ ආදෙශයද සම්බන්ධීහු අපෙක්ෂාකෙරෙයි "**විච්ඡාභික්ඛඤ්ඤෙසු**" යනුදු අර්ථනිර්දේශයැ අර්ථයාගේද ආදෙශයැ හා සම්බන්ධයැ නොයෙදෙන්නේයැ එහෙයින් වීප්සාභීක්ෂ්ණ්‍යයෙහි යම් ශබ්දයෙක් වැවේද ඕහට ද්විර්වචන වන්නේයැයි මෙසේ ෂෂ්ඨ්‍යර්ථප්‍රතීතියැ වන්නේයැයි සේසි—සද්දරූපෙ සංඛෙය්‍ය, ශබ්දරූපවූ සංඛ්‍යයයන් දෙදෙනා—මේ ද්විතීයාබහුවචනයි—"සද්දෙ වාක්‍යන්තරෙ'පි තදඤ්ඤස්මිම්පි යුජ්ජති" යනුහෙයින් "විසද්දෙ" යන මේ පදයැ මත්තෙහි වාක්‍යවයෙහිද "විසද්දෙ වුත්තො, විසද්දෙ න සරූපප්පධානො" සී යොදනු—මේ සූත්‍රයෙහි 'වෙ' සී කියා සාමාන්‍යයෙන් කියනලද බැවින් පදවාක්‍යයන්ගේ ස්ථානයෙහි ද්විර්වචන හෝ වෙයි එමැ පදවාක්‍යයන්ගේ ආවෘත්තිවනහෙයින් ද්විෂ්ප්‍රයොග හෝ වෙයි එසේ කල්හි "යං වත්තතෙ තස්ස" සී කුමක්හෙයින් ප්‍රථම පක්ෂය මැ ආශ්‍රය කොටැ වෘත්තියෙහි අර්කියනලද්දැයි යන අනන්තලීනචොද්‍යයට පරිහාර දක්වනු පිණිසැ "එවම්පි වචරණං" යනාදි කීහු—"යදා තු" යන තන්හි තුශබ්දයැ පූර්වපක්ෂයාකෙරෙන් වෙන්කිරීම හඟවා—ආවුත්ති, ආවෘත්තීහු දෙදෙන—"ආවෘත්ති" නම් කීශබ්දයැ ආයේ කීමයි—සමහර පොතෙකැ "ආවුත්තියං" යනු ඇතැ ඒ අවපාඨයි—සො පුන, (පාණිනීන්විසින් සමාශ්‍රිතවූ) ඒ පක්ෂයැ වනාහි—"නෛෂ දෝෂඃ ධර්මභෙදදුපචරිතො හි භෙදස්සචතස්සචභෙද එව අන්‍යථා හ්‍යාවෘත්තිරෙව න ස්‍යාදෙකස්‍ය හි වස්තුන ආවෘත්තිර්භවති තස්මාදභින්නන්‍ථාවස්තුන ඉහෛව සුතරාමෙකාන්තරතා යුජ්‍යත ඉති" යනාදීන් ජිනෙන්ද්‍රබුද්ධිපාදයන්විසින් කියනලද පරිහාරයද අයුක්තයැයි දක්වනුපිණිසැ "නානත්තරෙන" යනාදි කීහු—ධම්මභෙද, ආවෘත්තිධර්මභෙදයැ හෙතුකොට ගෙනැ—"සද්දස්ස භෙදෙ උපචරිතො න" සී සම්බන්ධයි—අඤ්ඤත්ථා, ධර්මභෙදයෙන් භෙදයැ ඇති කොටැ සිතාගැන්ම මුත් සාක්ෂාද්භෙදයැ නොවන්නේ වීනම්—උපචාරමත්තතො, උපචාරපමාණෙකින්—"කාරියමභවතීති එවං තව සක්කා වත්තුං." සී සම්බන්ධයි—"සභාවත්තිභෙදෙව" යන තැන්හි "සභාවතො

* පාණිනි—"සර්වස්‍ය ද්වෙ." 8, 1, 1.

අභෙදෙව" කියා පදච්ඡෙදයි—"සම්භවත්‍යභෙදෙව" කියා සමහර පොතෙකැ තිබෙයි ඒ ලිඛිතදොෂයි—අඥඥර්ථා, ඉදින් භෙදයැ වීනම්—ඉහාපි, මේ (විප්‍රයොගයැ විච්චනයැ යන) පක්ෂයෙහිද—අනාගතෙ භෙදෙ, ස්වගතභෙදයැ—ඨානිසදිස තතා, ස්ථානිවද්භාවයෙන්—මේ පදයෙන් "**ස්ථානිවද්දෙශඃ**" යන පරිභාෂාව දක්වූහු—සොයෙව, ඒ ස්ථානෙවිච්චනපක්ෂය මැ—නොත, (යම් බහුවචනනිර්දෙශයෙකින් එකවරෙකැ ව්‍යාපතුමිච්ඡාව ප්‍රකාශකරනුලැබේද) එහෙයින්—"අයම්බ ගාමො රමණීයො අයම්බ ගාමො රමණීයො" යනු ක්‍රමයෙන් ව්‍යාපතුමිච්ඡායැ. "සම්පන්නො යවො" යනු සම්පන්නගුණයෙන් යවජාතියගේ ව්‍යාපතුමිච්ඡායැ. "සොභනං ධවඛදිරං" යනු ශොභනගුණයෙන් ධවාදිද්‍රව්‍යයන්ගේ ව්‍යාපතුමිච්ඡාවයි—"කමෙන ව්‍යාපිතුමිච්ඡායං ජාතිආදිනම්භ ව්‍යාපිතුමිච්ඡායං" කියා සම්බන්ධයි—"අතිදිසීයතෙති තිද්දිසීයතෙ" යනු විවරණයි—අර්ථසාමර්ථ්‍යයා, (අතික්පරිද්දෙකින් නොපවත්නා ස්වභාවවූ) අර්ථබලයෙන්—ක්‍රියාදියොගං, ක්‍රියාගුණාදිසම්බන්ධයැ—යථාසකං, ස්ව නොඉක්මැ ; හෙවත් ස්වකීය ස්වකීයවූ—අභිසංහරිත්වා, එක්කොටැ—සද්දසත්තියා, ශබ්දයාගේ එබඳු අර්ථදූන්වීමෙහි සාමර්ථ්‍යයෙන්—යුගපදධිකරණතාය, යුගපදි අධිකරණං ධවාදිඅත්ථො යස්ස සො ධවඛදිරපලාසසද්දො යුගපදධිකරණො, තස්ස භාවො යුගපදධිකරණතා—වාර්තිකකාරයාවිසින් ආනුපුර්ව්‍යයෙහි වීප්සාවගේ අභාවයැ සිතා ඒ පිණිසැ "**ආනුපූර්ව්‍යෙ ච භවත ඉති වක්තව්‍යම්**" යි කියන ලද, එහිදු වීප්සා ඇතිබව ප්‍රතිපාදනයැ කරනුපිණිසැ "ආනුපුබ්බියං කමභාවො" යනාදි යුහු—න සන්නිවිට්ඨො, නොපිහිටියේද ; නැත්ද—මූලව්‍යපදෙසස්ස, මූලව්‍යවහාරයාගේ—උභයං, මූලාග්‍රදෙකැ—'පරස්ස' යනු 'මජ්ඣිමස්ස' යන්නට විශෙෂණයි — වත්තිච්ඡානිබන්ධනෙ, වක්තෘවිවක්ෂාව කාරණකොටැ ඇති—වත්ථුසභාවෙ, වස්තුතත්ත්වයෙහි—අභිනිවෙසො, දෘඪග්‍රාහයැතෙම—පඤ්චිකාටීකායෙහි "අභිනිවෙසො පවත්තති" යි කියනලදී—නාභිසම්භුණාති, නොපැමිණේ—"**ස්වාර්ථෙ'වධාර්‍යමාණෙ'නෙකස්මින් ච භවත ඉති වක්තව්‍යම්**" යි කියන ලදු. ඒ "සකත්ථෙ'වධාරියමානෙ" යනාදින් කීහු—සකත්ථෙ, (අර්ථප්‍රකරණාද්‍යනපෙක්ෂවූ) පදයාගේ අර්ථයැ—අවධාරියමානෙ,

මෙපමණයැයි ගම්‍යමානකල්හි—ඉදං, (පාණිනීයයන්ට) අභිමතයැ—තං, ඒ (විච්චනොදාහරණයැ)—පටිපාදෙතුං, (වීපසාශයෙහි මැ) විධියැ දක්වන පිණිසැ.

"චත්තාරො වීහයො ගුඤ්ජා ද්වෙ ගුඤ්ජා මාසකො භවෙ
ද්වෙ අක්ඛා මාසකා පඤ්චක්ඛානං ධරණමට්ඨකං"—යි

උක්තක්‍රමයෙන් මාෂකකාර්ෂාපණප්‍රමාණ දතයුතු—අවධාරණෙ, (කාර්ෂාපණයන් සම්බන්ධවූ මාෂකසමූහයෙහි මාෂකවය) නියමයක් — අවිසෙසෙන, සාමාන්‍යයෙන් — "මාසානං දෙහීති දානක්‍රියාය ව්‍යාපනාභාවා" යි සම්බන්ධයි—"සද්දනන්තරතො" යනාදියෙහි සාභිප්‍රාය අර්ථ කියනුපිණිසැ "පදෙන" යනාදි කීහු—පදෙන, (මාසකං යන) පදයෙන්—කතාභිසංඛරණසස, (මාසකං මාසකං යි) නිපදවනලද්දහුගේ—**"පූර්වප්‍රථමයොරර්ථාතිශයවිවක්ෂායාං ච භවත ඉති වක්තව්‍යම්"** යි කියනලද. ඒ "පුබ්බපඨමානං" යනාදීන් දක්වූහු—පුබ්බපඨමානං, පූර්වප්‍රථමශබ්දයන්ගේ; අත්‍යාතිසයවචනිච්ඡායං, වාච්‍යවූ අර්ථවිශෙෂවිවක්ෂාවක් ඇතිකල්හි—විකසනක්‍රියාය, විකසනක්‍රියායෙන්—**"ධාතරධාතමයොසසමසමප්‍රධාරණායාං සන්නිගදභාවෙ ච භවත ඉති වක්තව්‍යම්"** යි කියනලද. ඒ "රතරරතමනත්තානං" යනාදීන් දක්වූහු — සමසමපධාරණවිසයෙ, සමවූ (ආඪ්‍යත්වාදිගුණයෙන් "ඉමෙ උභො අඩ්ඪා" යනාදි ස්වරූප ඇත්තාවූ) අවබොධනිරූපණවිෂයෙහි—"ආඛ්‍යාතාදිවිසයත්තා" යනු පරව්‍යවහාරයෙන් කීහු—"අතිසයවිසිට්ඨං" යන්නෙන් පපවතිශබ්දයෙහි පකාරයැ ප්‍රකර්ෂාර්ථද්‍යොතකවූ උපසර්ගයැයි දක්වත්—විධිමහි, විධියෙහි; හි, හිප්‍රත්‍යය වේ—ඉහ, මේ උදාහරණයෙහි—"ආභික්ඛඤ්ඤෙ ඉච්චෙව" යන්නෙන් "**ධාච් ච භවත ඉති වක්තව්‍යම්**" යි පාණිනීයයෝ සූත්‍රාන්තරයෙන් විධිප්‍රතිපාදනයැ කෙරෙති, මෙහි එබඳු වචනයෙන් ප්‍රයොජන නැතැ ආභීක්ෂ්ණ්‍යයෙහි මැ විච්චනයැයි දක්වූහු—අනිතිසම්ං, ඉතිශබ්දයා අවිද්‍යමාන කල්හි.

බහු[a]—මෙහි බහුලංවිධානයැ චතුර්විධ වේ—

---

[a] 1, 58 සූ.

කීයේ මැ නෝ :—

“ ක්වචිත්ප්‍රවෘත්තිඃ ක්වචිදප්‍රවෘත්තිඃ
ක්වචිද්විභාෂා ක්වචිදන්‍යදෙව
විධෙර්විධානම්බහුධා සමීක්ෂ්‍ය
චතුර්විධම්බාහුලකං වදන්ති ”* ~ යි.

ඉති මොග්ගල්ලානෙ ව්‍යාකරණෙ පඤ්චිකාපදීපෙ
සඤ්ඤාදිකණ්ඩො පඨමො.

---

වෙ වෙ“ ~ අවයව සම්බන්ධෙ, (සියො අංයො යනාදි වෘව සවයෙන් යුක්ත අවයවිසමුදායස්වරූපයෙන් “ වෙ වෙ ” යි කියනලද සියැ යොයැ යනාදි) අවයවයන්ගේ සම්බන්ධයෙහි—“ හොන්තීති වුත්තං ” යි සම්බන්ධයි—තෙ ච, ඒ ස්‍යාදිහුද— පච්චයතො පඨමං කරීයතීති පකති, තස්සා විසෙසනං පකති විසෙසනං, යි ෂෂ්ඨීතත්පුරුෂයි—තෙන, (යම්හෙයකින් පඤ්ච නාමාර්ථයැ අභිෂ්ටද ඒකානෙකාර්ථයන් ද්‍යෝත්‍යකල්හි ස්‍යාදීහු කරනුලැබෙත්ද) එහෙයින්—සබ්බත්‍ථ, (අංයො ආදිවූ) සියලු විකයෙහි—“ සංඛ්‍යාපි ස්‍යාදීනමත්‍ථො න ඉති ” යි සම්බන්ධයි— උදක් ස්වාර්ථද්‍රව්‍යාදිය මැ ස්‍යාදීන්ගේ අර්ථ නොවන්නේ නො වෙයි වැළිත් සංඛ්‍යාවද අර්ථ නොවෙයි යනු අපිශබ්දයෙහි ඵලයි—මෙයින් සංඛ්‍යා විභක්ත්‍යර්ථයැ යන චතුෂ්කනාමාර්ථ පක්ෂයැ නිරස්තයි—පඤ්චකනාමාර්ථදර්ශනයෙහි සංඛ්‍යාකර්මාදී න්ට විභක්තීහු ද්‍යෝතක වෙති ත්‍රිකනාමාර්ථදර්ශනයෙහි සංඛ්‍යා කර්මාදීහු විභක්තිවාච්‍ය වෙත්—පඤ්චකනාමාර්ථපක්ෂයෙහි අර්ථ පඤ්චකයැ ප්‍රාතිපදිකවාච්‍යයැ ස්ත්‍රීප්‍රත්‍යයවිභක්තීහු ලිඞ්ගසංඛ්‍යා කර්මාදීන්ට ද්‍යෝතකයෝයි — එහි වාර්ත්තිකකාර ශෙලාක වාර්ත්තිකකාර භාෂ්‍යකාරයන්ටද පඤ්චකනාමාර්ථය මැ අභිමත හෙයින් මෙහිද ඒ මැ පක්ෂයැ ආශ්‍රිතයි—ඉධ, මේ නාම විෂයෙහි—“ තිකො නාමත්‍ථොති දස්සනං ” යි සම්බන්ධයි— “ සකත්‍ථො ” යනාදිතැන්හි ශබ්දයට ප්‍රවෘත්තිනිමිත්තවූ ජාතිගුණක්‍රියාද්‍රව්‍යලක්ෂණවූ විශෙෂණයැ ස්වාර්ථ නම් වෙයි,

---

* “ ක්වචිප්පවත්‍යප්පවත්ති ක්වචඤ්ඤං ක්වචි වා ක්වචි
සියා බහුලසද්දෙන විධි සබ්බො යථාගමං.” (සාරත්‍ථවිලාසිනී.)
2, 1 සූ.

එසේ මැ ජාතිගුණක්‍රියාලක්‍ෂණවූ විශෙෂ්‍යයැ ද්‍රව්‍ය නම් වෙයි, තවද යම්කලෙකැ "ගො අස්සො" යනාදි ප්‍රකාරයෙන් ජාතිවිශිෂ්ටවූ පදාර්ථයැ කියනුලැබේද එකල්හි ජාතියැ විශෙෂණත්වයෙන් ස්වාමී වෙයි, යම්කලෙක්හි "සෙතො පටො" යනාදීන් ගුණවිශිෂ්ටවූ පටාදිද්‍රව්‍යයැ කියනුලැබේද එකල්හි විශෙෂණවූ ගුණයැ ස්වාමී වෙයි විශෙෂ්‍යවූ පටාදියැ ද්‍රව්‍ය වෙයි, යම්කලෙක්හි "පටස්ස සෙතො ගුණො" යනාදීන් ජාති විශිෂ්ටවූ ගුණයැ කියනුලැබේද එකල්හි ජාතිතොම විශෙෂණත්වයෙන් ස්වාමී වෙයි ගුණයැ විශෙෂ්‍යත්වයෙන් ද්‍රව්‍ය වෙයි, යම්කලෙක්හි "යට්ඨියො පවෙසය කුන්තෙ පවෙසය" යනාදි තැන්හි ද්‍රව්‍යයත් අන්‍යද්‍රව්‍යයකට විශෙෂණ වේද එකල්හි විශෙෂණභාවයට පැමිණියාවූ යෂ්ට්‍යාදිද්‍රව්‍යයැ ස්වාමී වෙයි විශෙෂ්‍යභාවයට පැමිණි පුරුෂාදිද්‍රව්‍යාන්තරයැ ද්‍රව්‍ය වෙයි, යම්තැනෙක්හි "දණ්ඩී විසාණී" යනාදීන් සම්බන්ධිනිමිත්තවූ ඊප්‍රත්‍යයාදියැ වේද එතැන්හි සම්බන්ධයද ස්වාමී වෙයි, යම් තැනෙක්හි 'පාචකො' යනාදීන් ක්‍රියාව නිමිත්ත කොටැ ඇති ණකාදි ප්‍රත්‍යය වේද එතැන්හි ක්‍රියාවද ස්වාමී වෙයි, මෙහි ක්‍රියා කාරකසම්බන්ධයත් ස්වාමීයැයි ඇතැම්කෙනෙක් කියති, ලිඞ්ග නම් ස්ත්‍රීපුන්නපුංසකත්වයයැ, සංඛ්‍යා නම් එකත්ව බහුත්වයැ, කර්මාදීහු නම් වක්‍ෂ්‍යමාණකාරකවිශෙෂයෝයැ, යනාදීන් චාන්ද්‍රමතයෙහි ස්වාමිද්‍රව්‍යලිඞ්ගසංඛ්‍යාකර්මාදීන්ගේ විභාග දතයුතු—විසෙසීයතෙ යෙන තං විසෙසනං—සරූප, (අභිප්‍රකාශකවූ බුඬසිඬාදි) ශබ්දස්වරූපයැ—එහෙයින් කීහ.

"සරූපං සද්දරූපංච ජාතියා යං විසෙසනං" ....යි.

යම්කලෙක්හි ජාතිතොමෝ "ගො අස්සො" යි කියා ජාති ශබ්දයෙන් වෙසෙසනුලැබේද එකල්හි ශබ්දයැ විශෙෂණයැ ජාතිතොමෝ වෙසෙසනුලැබේනුයි ද්‍රව්‍ය නම් වන්නීයැ යන අභිප්‍රායයි—දබ්බං, ද්‍රව්‍ය නම්; විසෙස්සං, විශෙෂ්‍යයි.

එහෙයින් කියනලදී :—

"යද්‍යද්විශෙෂ්‍යතෙ කිඤ්චිත්තත්තද්ද්‍රව්‍යමිහෙෂ්‍යතෙ
ජාත්‍යාදෙරප්‍යතස්තාදෘශද්‍රව්‍යත්වමුපකල්පතෙ" ....යි.

විසෙස්සන්තා, (ජාතිමාත්‍රවාචිවූ ගොශබ්දයෙන්) වෙසෙසිය යුතුබැවින් — ජාතියා විසිඨො, (ශෙවතත්වාදිජාතියැවිසින්) වෙසෙසනලද—යම්කලෙක්හි ශෙවතත්වාදිජාතියැවිසින් ශෙවතාදිගුණයැතෙම නීලාදිගුණයන්කෙරෙන් වෙසෙසනුලැබේද

එකල්හි ජාතියැ විශෙෂණයැ ගුණයැ විශෙෂ්‍යයැ යනු භාවයි—සම්බන්ධනිමිත්තෙනා, සම්බන්ධයැ කාරණ කොටැ ඇත් තාවූ—ක්‍රියාපදාර්ථයද ශබ්දප්‍රවෘත්තිනිමිත්තවූ ජාත්‍යාදීන් දක්වූ තැන්හි නොකියා "පාචකො" යන මෙහි ක්‍රියාකාරකසම්බන්ධ සංඛ්‍යාත පරාභිමතස්වාර්ථයද අන්‍යපදෙශයෙන් උපදෙශකරනු කැමැති වැ මේ සම්බන්ධස්වාර්ථප්‍රස්තාවයෙහි ක්‍රියාස්වාර්ථයැ දක් වනපිණිසැ "කත්ථචි ක්‍රියා'පි" යනාදි කීහු—අත්‍ර, මේ ('පාච කො' යන) ප්‍රයොගයෙහි—තත්‍ර, ඒ (පූර්වොක්තපඤ්චකත්‍රික දර්ශනයන් දෙදෙනා) අතුරෙහි—අභිධායකතෙනන, ප්‍රකාශ කත්වයෙන් — ඉකාරන්තතො, ඉකාරාන්ත (මුනිශබ්දයා) කෙ රෙන්—අඤ්ඤථා, අන්‍යප්‍රකාරවූ (අකාරාන්තාදීන්කෙරෙන් වේ) නම්—අතො, ඒ (ආදෙශවීම) හෙතුකොටැ ගෙනැ— "ඵලං දස්සිතං න සියා" කියා සම්බන්ධයි—වචනෙ, (පාණිනීය යෙහි මෙන් "**විභක්තිශච**"* යන) සූත්‍රයක්—අඤ්ඤමඤ්ඤ විවෙකෙන, ඔවුනොවුන් කෙරෙන් තේරීමෙන්.

**කාමෙම** [a]~ "වාක්‍යෙකදෙසෙන" යන මෙයින් වෙළෙ කාදිවාක්‍යයාගේද "**කාමෙම දූතියා**" යනාදීන්ගේද එක වාක්‍යත්වයැ සූචනයැ කළාහුයි—ප්‍රකරණ නම් මහාවාක්‍යරූප බවහෙයින් දූරස්ථවාක්‍යයෝද ආකාඞ්ක්‍ෂාදිසද්භාවයෙහි පර ස්පරසම්බන්ධානුභාවයෙන් එකවාක්‍යභාවයට පැමිණෙත්.

කීයේ මැයි :—

"ආකාඞ්ක්‍ෂා යොග්‍යතා සත්තා සන්නිධෙර්බීජමස්‍යතඃ
විප්‍රකෘෂ්ටානි වාක්‍යානි මහාවාක්‍යම්ප්‍රතන්වතෙ"~යි.

සාමඤ්ඤෙන, කර්මාද්‍යවිශෙෂයෙන්—විසිබෙසු, කර්මාදීන් වෙසෙසනලද—"තිවිධං කම්මං" යි ස්වසිද්ධාන්තප්‍රසිද්ධියෙන් කීහු—අන්‍යයෝ කර්මයැ සප්තවිධ කොටැ කියත්.

"නිර්වර්ත්‍යඤ්ච විකාර්‍ය්‍යඤ්ච ප්‍රාප්‍යඤ්චෙති ත්‍රිධා මතම්
තත්‍රෙප්සිතතමං කර්ම චතුර්ධා'න්‍යත්තු කල්පිතම්~
†ඖදාසීන්‍යෙන යත්ප්‍රාප්‍යං(1) යච්ච කර්තුරනීප්සිතම්(2)
සංඥාන්තරෛරනාඛ්‍යාතං(3)යද්‍යච්චාප්‍යන්‍යපූර්වකම්"(4)~යි.

---

* පා. 1, 4, 104.

† මෙහි මිශ්‍රතව තුබූ වචන අධොලිපිස්වරූපහෙයින් පහත දක්වනු ලැබේ.

(1) "ගාමං ගච්ඡන්තො රුක්ඛමූලං." (2) "විෂාදි."
(3) "අපාදනාදිභිඃ." (4) "අභිසිධාකානං පයොගෙ." [a] 2, 2 සූ.

නිබ්බත්තීයති, (විද්‍යමානයා) ජාතියෙන් ප්‍රකාශකරනු ලැබේද—උප්පාදීයති, (අවිද්‍යමානයා) ජාතියෙන් පහළකරනු ලැබේද—අසතො, අවිද්‍යමානවූ.

"සතී වා'විද්‍යමානා වා ප්‍රකෘතිඃ පරිණාමිනී
යස්‍ය නාශ්‍රියතෙ තස්‍ය නිර්වර්ත්‍යත්වමප්‍රචක්‍ෂතෙ "

යස්‍ය, යම් (කටාදි විකාරයක්)හුගේ ; සතී වා, විද්‍යමානවූ හෝ ; ප්‍රකෘතිඃ, (කටොත්පත්තියට සමවායිකාරණවූ කාශ තෘණාදි) මූලප්‍රකෘතිතොමැ ; පරිණාමිනී, (පූර්වාකාරයාගේ අපරිත්‍යාගයෙන්) ආකාරාන්තරයට පැමිණෙන්නී ; නාශ්‍රියතෙ, ("කටං කරොති" යනාදි ප්‍රයොගයෙහි අශ්‍රූයමාණත්වයෙන්) ආශ්‍රය නොකරනුලැබේද, අවිද්‍යමානා වා, (විකාරරහිතවූ සංයොගවිභාගවත් ද්‍රව්‍යයන්කෙරෙන් උපදනාහෙයින්) අවිද්‍යමානවූ හෝ ; ප්‍රකෘතිඃ, ප්‍රකෘතිතොම ; නාශ්‍රියතෙ, ("සංයොගං ජනයති" යනාදි ප්‍රයොගයෙහි අවිද්‍යමානත්වයෙන්) ඇසුරු නොකරනුලැබේද ; තස්‍ය, ඒ අනාශ්‍රිතප්‍රකෘතිඇත්තාවූද අවිද්‍යමානප්‍රකෘති ඇත්තාවූද කාර්‍ය්‍යයට, නිර්වර්ත්‍යත්වම්, නිර්වර්ත්‍යභාවයැ ; ප්‍රචක්‍ෂතෙ, (වෛයාකරණයෝ) කියති—එහෙයින් මැ "තණ්ඩුලානොදනම්පචතීති ව්‍යර්ථඃ පචිඃ" යනු භාෂ්‍යකාරයෝ කීහු—යම්හෙයකින් ප්‍රකෘතියැ ආශ්‍රය නොකළකල්හි නිර්වර්ත්‍යත්වය වේද ප්‍රකෘතියැ ආශ්‍රය කළකල්හි විකාර්‍ය්‍යත්වයැ වේද එහෙයින් 'පච' යන ධාතුහුගේ අර්ථද්වයක්ඇතිබව දතයුතු—"තණ්ඩුලානොදනමපචතීති ව්‍යර්ථඃ පචිඃ තණ්ඩුලාන් පචති ඔදනමපචතීති, තණ්ඩුලාන් පචතීති විකාරාර්ථඃ, ඔදනමපචතීති නිර්වර්ත්තනාර්ථඃ, තතො'යමර්ථඃ තණ්ඩුලාන් විකාරයනෙනාදනං නිර්වර්ත්තයතීති" යනු භාෂ්‍යපාඨයි.

"යදසජ්ජායතෙ සද්වා ජන්මනා යත්ප්‍රකාශතෙ
තන්නිර්වර්ත්‍යං විකාර්‍ය්‍යන්තු කර්ම්ම ද්වෙධා ව්‍යවස්ථිතම් "

යත්, ("සුඛං ජනයති" යනාදි ප්‍රයොගයෙහි) යමෙක් ; අසත්, අස්ථිතපූර්ව වූයේ ; ජායතෙ, උපදීද ; යත්, ("පුත්‍රං විජායති" ගනාදි ප්‍රයොගයෙහි) යමෙක් ; අසද්වා, (පළමුයෙන්) අප්‍රකාශවූයේ හෝ ; ජන්මනා, උත්පත්තියෙන් ; ප්‍රකාශතෙ, පහළවේද ; තත්, ඒ ; නිර්වර්ත්‍යම්, නිර්වර්ත්‍ය නම් වන්නේයැ ; විකාර්‍ය්‍යන්තු කර්ම්ම, විකාර්‍ය්‍යකර්ම්මයැ වනාහි ; ද්වෙධා, දෙපරිද්දෙකින් ; ව්‍යවස්ථිතම්, පිහිටියේයි.

ඒ මෙසේයි :—

"ප්‍රකෘත්‍යුච්ඡේදසම්භූතං කිඤ්චිත්කාෂ්ඨාදිභස්මවත්
කිඤ්චිද්ගුණාන්තරොත්පත්ත්‍යා සුවර්ණාදිවිකාරවත්" —යි.

අපි සුබොධයි.

"ක්‍රියාකෘතා* විශෙෂාණාං සිද්ධිර්‍යත්‍ර න ගම්‍යතෙ
දර්ශනාදනුමානාවා තත්ප්‍රාප්‍යමිති කථ්‍යතෙ" —

යත්‍ර, ("ආදිච්චං පස්සති, වෙදමධීතෙ" යනාදි) යම් ප්‍රයොගයෙක්හි ; ක්‍රියාකෘතා, ක්‍රියාවෙන් සම්පාදිතවූ ; විශෙෂාණම්, අතිශයයන්ගේ ; සිද්ධිඃ, නිෂ්පත්තියෙක් ; දර්ශනාවා, ("සුවණ්ණං කෙයූරං කරොති" යනාදියෙහි කෙයූරාදිය මෙන්) ප්‍රත්‍යක්ෂපරිඥානයෙන් හෝ ; අනුමානාවා, ("දෙවදත්තං පසාදයති" යනාදියෙහි මෙන් විශිෂ්ටමුඛවර්ණාදි) කාර්ය්‍ය හෙතුකොටැගෙනැ (ප්‍රසාදාදි) කාරණදර්ශනයෙන් හෝ ; න ගම්‍යතෙ, නොදත්නාලැබේද ; තත්ප්‍රාප්‍යමිති, ඒ ප්‍රාප්‍යකර්ම්මයැයි ; කථ්‍යතෙ, කියනුලැබේ.

මෙසේ අකිඤ්චිත්කරයාගේ කාරකත්වයැ කෙසේ වේදයත්?

"ආභාසොපගමො ව්‍යක්තිඃ සොඪත්වමිති කර්ම්මණඃ
විශෙෂාඃ ප්‍රාප්‍යමාණස්‍ය ක්‍රියාසිද්ධෞ විවක්ෂිතාඃ" —

ආභාසොපගමඃ, (චක්ෂුරාදීන්ට) විෂයභාවයට පැමිණීමද ; ව්‍යක්තිඃ, (අවබොධවශයෙන්) ප්‍රකාශවීමද ; සොඪත්වම්, (දර්ශන) සහිෂ්ණුත්වයද ; හෙවත් දැකීම ඉවසනබවද ; නොහොත් දකින්ට පිළිවන්බවද යන ; ඉති විශෙෂාඃ, මෙබඳු ප්‍රකාරඇති විශෙෂයෝ ; ප්‍රාප්‍යමාණස්‍ය, ප්‍රාප්‍යකර්මයාගේ ; ක්‍රියාසිද්ධෞ, දර්ශනාදික්‍රියානිෂ්පත්තියෙහි ; විවක්ෂිතාඃ, කියනු කැමැතිවනලද්දාහුයි.

මේ යුක්තීන් කාරකත්වයැ සිද්ධයැයි දතයුතු—අවත්ථන්තරං, ඔදනාදීන්ගේ විකොලදනාදිලක්ෂණවූ අන්‍යාවස්ථාවට—අපාදියති, පමුණුවනුලැබේද—පත්තිව්‍යතිරෙකෙන, ප්‍රාප්තිපමණකට වැඩියෙන්—න විභාවීයතෙන, නොදන්නාලැබෙත්ද—විසෙසානුපාදානතො, ("**කම්මෙ දුතියා**"[a] යි සාමාන්‍යයෙන් කීබව මුත් විශෙෂස්විකාරයක් නොකිරීමෙන්—තත්‍ර, ඒ විතීයා විභත්තිවිධානයෙහි ; ඉදං, මේ (චොද්‍යය) ; සියා, වන්නේයි—

---

* "ක්‍රියාකෘතවිශෙෂාණං" යි කලිකාත පොත්හි.

[a] 2, 2 සූ.

අනභිහිතකම්මාදිනිස්සයෙසු, අනුක්තවූ කර්මකර්තෘාදීන් ආශ්‍රය කොටැ ඇති—යථා සියුත්ති, (ස්වාර්ථද්‍රව්‍යලිඞ්ගසඞ්ඛ්‍යාකර්මා ද්‍යාත්මකවූ පඤ්චකපක්ෂයෙහි ද්‍යොතනයැ පිණිසද ස්වාර්ථද්‍රව්‍යලිඞ්ගා ත්මක ත්‍රිකපක්ෂයෙහි අභිධානයැ පිණිසද) වෙත්වයි කියා—අනභිහිතෙති, (පාණිනීයයෙහි මෙන්) "**අනභිහිතෙ**"* යන සූත්‍රයක්—ඔවුන් විසින් "**අනභිහිතෙ**" යන සූත්‍රයැ කියා කවරක්හුවිසින් අනභිහිතදැයි යන ආශඞ්කාවෙහි "තිඞ්කෘ ත්තතද්ධිතසමාසෛඃ" සී පිරිසිදිනාලදී—දුතියාදීනං, (අනභිහිත කර්මාද්‍යාශ්‍රයවූ එකත්වාදියෙහි) ද්විතීයාදීන්ගේ—"ආසංකිය" යන පූර්වක්‍රියාවට "වුත්තං" යනු අපරක්‍රියාවයි—පඤ්චකපක්ෂ ත්‍රිකපක්ෂයෙහි අභිහිතයෙහි ද්විතීයාදිප්‍රාප්තියැ ආශඞ්කාවශ යෙන් දක්වා චතුෂ්කවාදීන්ගේ පක්ෂයැ උද්භාවනා කොටැ පරිහාරකරනු පිණිසැ "යදි" යනාදි කීහු—යදි, ඉදින් (ස්වාර්ථ ද්‍රව්‍යලිඞ්ගකර්මාදීන් ස්වාර්ථයැයි ගත්කල්හි); සංඛ්‍යා, (එක ත්වාදි) සංඛ්‍යාතොම; විභත්ත්‍යත්ථො, විභක්තිවාච්‍ය වේද; අථාපි, නොහොත් (ස්වාර්ථද්‍රව්‍යලිඞ්ගසංඛ්‍යාවන් ප්‍රාතිපදිකාර්ථ යැයි ගත්කල්හි); කම්මාදිකො, කර්මයැ ආදිකොට ඇති (කර්තෘාදි)තෙමැ; විභත්ත්‍යත්ථො, විභක්තිවාච්‍ය වේද—සබ්බථා, සර්වප්‍රකාරයෙන්; හෙවත් පඤ්චකත්‍රිකවාදීන්ගේද චතුෂ්කවාදී න්ගේද මතවශයෙන්—සඅත්ථාව්‍යතිරිත්ත, ස්වාර්ථයෙන් අභි න්නවූ—අත්ථමත්තො එව, අර්ථසාමාන්‍යයක් ඇත්තේ මැ—අපි තු ති, වැළි කිමෙක්දැයි යන—අනෙන, මේ යථොක්තවාක්‍ය යෙන්—තප්පේතිකායො, ඒ සංඛ්‍යාකර්මාදීන් ප්‍රකාශකරන් නාහු—"ඔදනාදිසද්දා කම්මාදිවුත්ති න" සී සම්බන්ධයි—විනා'පි, නැතිවැ මැ—අපිශබ්ද අවධාරණයෙහි වැටේ—"අනභිහිතාධිකාරෙ යඔ ඵලං මඤ්ඤතෙ" කියා සම්බන්ධයි—ච, තවද (කියයුත්තෙක් ඇති)—අනභිහිතාධිකාරෙ, (**කම්ම ණි ද්විතීයා**"† යනාදි සූත්‍රයන්ට) "**අනභිහිතෙ**"‡ යන සූත්‍රයැ සම්බන්ධකිරීමෙහි—යං ඵලං මඤ්ඤතෙ, (ආචාර්‍ය පාණිනි තෙමැ) යම් ප්‍රයොජනයක් සිතාද—"**කොතා භාවකම්මෙසු**" ⁿ යන ලක්ෂණයෙන් විහිත ක්තප්‍රත්‍යයෙන් කර්මයැ උක්තබැවින් යම්සේ ද්විතීයා නොවේද එසේ මැ "කටං කරොති විපුලං

* පා. 2, 3, 1. † පා 2, 3, 2. ‡ පා. 2, 3, 1.
ⁿ 5, 56 සු.

දස්සනීයං" යන තැන්හි කටශබ්දයෙන් උපන් ද්විතීයාවිභක්තියෙන් කර්මයැ උක්තබැවින් විපුලාදිවිශෙෂණයැ කෙරෙනුත් ද්විතීයා නොවීමැ ප්‍රසඞ්ග වෙයි එහෙයින් මෙහි අබ්‍යාතකෘත්තද්ධිතසමාසයන්විසින් කර්මයැ අනුක්තබැවින් විපුලාදීන් කෙරෙන්ද ද්විතීයා සිඩ වෙයි යනු මෙහි ප්‍රයොජනයි—පචෙචකං, ("කටං කරොති විපුලං කරොති දස්සනීයං කරොති" සී) වෙන වෙන මැ—කම්මතා, කර්මත්වයැ (ඇතැ)—තදභිව්‍යක්තියා, ඒ කර්මත්වයාගේ ප්‍රකාශවීමැ පිණිසැ—"නනෙවවං" යනාදි චොද්‍යයි—එවං, මෙසේ (ගුණයුක්තයහට කර්මත්වයැ ඇතිකල්හි)—පපෙපාති, (කටප්‍රතිබද්ධකර්මයැ කියයුතුකල්හි "කතො" යන ප්‍රයොගයෙහි ක්තප්‍රත්‍යය විහිතබැවින් කරොත්‍යභිසම්බන්ධයැ හෙතු කොටැ ගෙනැ උදාරාදීන් කෙරෙන්ද ද්විතීයාවිභක්ති) පැමිණේ—"එවං මඤ්ඤතෙ" යනාදි පරිහාරයි—"අවයවෙන කම්මං න වදති" සී සම්බන්ධයි—අවයවෙන, වෙනවෙන—"කතාසද්දතො'පි අත්ථමත්තෙ පඨමාව" සී සම්බන්ධයි—සො අත්ථො, ඒ (කර්මලක්ෂණවූ) අර්ථයැතෙමැ—"අනඤ්ඤාභූතනාමත්ථො" යන්නෙන් ප්‍රථමාවට නිමිත්තසද්භාවයැ දක්වූහු—අනඤ්ඤාභූතො නාමස්ස සද්දස්ස අත්ථො යස්මිං කම්මලක්ඛණෙ'ත්ථෙ" සී බහුව්‍රීහිසමාසයි—අනන්තර්භූතවූ ශබ්දාර්ථ ඇති—"අභිහිතො සම්පන්නො" සී සම්බන්ධයි—අභිහිතො සම්පන්නො, කියනල්ද්දේ වන්නේයැ—අපිතු, වැළි කෙසේ කියාද—අපිතු යනු උත්තරවාක්‍යකථනයෙහි වැටේ—"අපි තූත්තරවාක්‍යෙ" ඉති වොපාලිතඃ—සාමඤ්ඤෙන, (වෙන වෙන කථාදි) සාමාන්‍යයෙන්—පාණිනීයයෝ කර්තෲහුගේ ක්‍රියාවෙන් යමෙක් සම්බන්ධකරන්නට අතිශයෙන් ඉෂ්ටද ඒ ඊප්සිතතමයෙහි "**කර්තුරීප්සිතතමං කර්ම**"° යන සූත්‍රයෙන් කර්මසංඥා කොටැ "**කර්මණි ද්විතීයා**"† යන සූත්‍රයෙන් ඊප්සිතතමවූ ඔදනපයඃප්‍රභෘතීන්ට ද්විතීයාවිධානයැ කෙරෙති තදුපදර්ශනයැ පිණිසැ "යං කර්තු ක්‍රියාය" යනාදි කීහු—"විභත්තිං විධාය දුතියා'භිමතා" සී සම්බන්ධයි—පයඃප්‍රභෘතීන්ගේ නිෂ්පත්තියට කාරණවූ දොහනාදික්‍රියාවෙන් යුක්ත කරණාදිරූපයෙන් අකථිත යම්කිසි ගවාදිඊප්සිතයෙක් ඇත්ද එහිද "**අකථිතඤ්ච**"‡ යන සූත්‍රයෙන් කර්මසංඥා

° පා. 1, 4, 49. † පා. 2, 3, 2. ‡ පා. 1, 4, 51.

කොට ඒයින් මැ විතීයාවිධානයැ කෙරෙති ඒ දක්වන පිණිසැ " උපයුජ්ජමාන " යනාදි කීහු—උපයුජ්ජමාන, වනපා යදිමාණවූ—පකුතිශබ්දයෙන් ගවාදීන්ගේ ග්‍රහණයයි—ගවාදිනො, ගොගොමනන්වාදීන්ගේ—කරණදි, කරණාධිකරණාදි—දුහාදි, දුහයාවනාදි—" පධානසාධනෙන ධම්මාදිකෙන යුත්තෙ සති බ්‍රවිසාසීනම දුතියාවිධානං අභිමතං " යි යොදනු—ධම්මාදිකෙන, ධර්මවිනයාදියෙන්—විධානං, (විතීයා) විධානයැ ; අභිමතං, ඉෂ්ටයි—වාතීතිකකාරයන්විසින් මෙසේ අකථිතනියමයැ කරනලදී.

" දුහියාචිරුධිප්‍රජිභික්ෂිචිඤ්ඤු-
මුපයොගනිමිත්තමපූර්වවිධෞ,
බ්‍රැවිශාසිගුණෙන ච යත් සචතෙ
තදකීර්තිතමාචරිතං කවිනා "—යි.

අපූර්වවිධෞ, (අපාදනාධිකරණාදි) පූර්වවිධීන්ගේ විවක්ෂාවක් නැතිකල්හි ; දුහියාචිරුධිප්‍රජිභික්ෂිචිඤ්ඤුම්, දුහි-යාචි-රුධි-ප්‍රජි-භික්ෂි-චි-යන මේ ධාතූන්ගේ ; යත්, යම් ; උපයොග, (ඉෂ්ටාපිසිබියෙහි) යොදනලබන්නාවූ (පයඃප්‍රභෘතීන්ට) ; නිමිත්තම්, කාරණවූ (ගවාදියෙක් ඇත්ද) ; යත්, යමෙක් ; බ්‍රැවිශාසි, බ්‍රැවි-ශාසි-යන ධාතූන්ගේ ; ගුණෙන, (ධර්මාදිප්‍රධාන) සාධනයෙන් ; සචතෙ, සම්බන්ධවේද ; තත්, ඒ ; කවිනා, සූත්‍රකාරයාවිසින් ; අකීර්තිතම්, අකථිතයැයි ; ආචරිතම්, කියනලදී.

පාණිනීන්විසින් " **තථා යුක්තඤ්චානීප්සිතම්** "* යන මේ සූත්‍රයෙන් කර්මසංඥා කොටැ විතීයාවිධානයැ කරනලද්ද හෙද දක්වන පිණිසැ " යෙනෙව පකාරෙන " යනාදි කියනලදී—" කත්තු ඉච්ඡිතතමං ක්‍රියාය යුජ්ජතෙ " ක්‍රියා සම්බන්ධයි—යං, යම් (අභිවිශාදියෙක්) ; යුත්තං, (ක්‍රියාව හා) සම්බන්ධද.

" යදුබුධනාභිලඩකාදි තදූහනදිමනිච්ඡිතං,
යදු ලජ්ජාභයාදීහි තදෙච්ඡිතතමං මතං "—

යනු මෙහි විශෙෂයි—" **තථා යුක්තඤ්චානීප්සිතම්** " යන සූත්‍රයෙන් නැද්ගු පර්‍ය්‍යුදසවෘත්තිහෙයින් ඊප්සිතයෙන් අන්‍යවූ අනභිමතයද උදාසීනයද අනීප්සිතයැ එහෙයින් නෛවෙප්සිත

* පා. 1, 4, 50.

නානීප්සිත වෘක්ෂමූලයටද කර්මසංඥ සිද්ධකොටැ ද්විතීයා විධාන කෙරෙති තත්ප්‍රදර්ශනයැ පිණිසැ “ නෙවිච්ඡිත ” යනාදි කියනලදී—යම්කලෙකැ ග්‍රාමගමනයට ප්‍රවෘත්තවූයේ අබුද්ධිපූර්වක වැ මාර්ගාසපිතවෘක්ෂමූලයට එළඹෙයි යනු විවක්ෂිතද එකල්හි මේ උදාහරණයැ යෙදෙන්නේයැ යම් කලෙක විශ්‍රාමාර්ථී වැ එළඹේද එකල්හි කර්තෲහුගේ ඊප්සිතතමත්වයෙන් පූර්වසූත්‍රයෙන් මැ සංඥ සිද්ධයැයි සිතියයුතු.

මෙ මැ කීහ :—

“ නෙවිච්ඡිතානිච්ඡිතනත්තමබුද්ධියුපසප්පනෙ,
මූලං විස්සමනත්ථන්තු තමිච්ඡිතතමං සියා ”——යි.

පාසඞ්ගිකං, ප්‍රසඞ්ගාගතයැ—“ දුහ්‍යාදිවනනයත්‍යාදෙ කර්ම ත්වමකථාශ්‍රයම් ”* යි දක්වනලද අකථිතසංඥීවූ ග්‍රාමදෙව දත්තගර්ගාදීන්ටද කර්මත්වයෙන් මැ ද්විතීයා සිද්ධයැයි දක් වන පිණිසැ “ එවං ” යනාදි කීහු—ආදිශබ්දයෙන් “ **කාලභා වාධවගන්තව්‍යාඃ කර්මසංඥ්‍යාහ්‍යකර්මණාම්** ” “ **දෙශශ්චාකර්ම කාණාං කර්මසංඥා භවතීති වක්තව්‍යම්** ” කියා අකර්මකධා තූන්ගේ ප්‍රයොගයෙහි කාලභාවාධවදෙශයන්ට කළ කර්ම සංඥවද සඞ්ග්‍රහ කෙරෙත්—කාලෙ, මාසමාසති—භාවෙ, ගොදෝහං සුපති—අද්ධනි, ක්‍රොශං සයති—දෙශෙ, කුරූ සුපති—පාණිනීන්විසින් “ **අධිශීඞ්ස්ථාසාං කර්ම** ”† යන සූත්‍රයෙන් අධිපූර්වවූ ශීඞාදීන්ගේ ආධාරයෙහි කර්මසංඥ කොටැ ද්විතීයාවිධානයැ කළබව දක්වන පිණිසැ “ අධිපුබ්බ ” යනාදි කීහු—යාය වත්තිච්ඡාය දුතියා සියා තාය වත්තිච්ඡාය කම්මතා කථංහි නාම සියා ” යි සම්බන්ධයි — “ කාරකානි වත්තිච්ඡාය එව කත්ථචි පයොගෙ න උපලබ්භන්තීති කස්සචි කදාචි සියා ” යි සම්බන්ධයි—ඉදං වුත්තං හොති, (මෙයින්) මේ කියනලද්දේ වේ—“ වලාහකස්සෙති කථං සම්බන්ධි භවති ”යි අන්වයයි — කත්තා, කර්තෲවූයේ — “ තංතංකාරකවචනිච්ඡායං ” යන තැන්හි කාරකශබ්දයට සාධකයැ නිර්වර්තකයැ ක්‍රියානිමිත්තයැ යනු අර්ථයි—හෙද දණ්ඩයැ ධවලයැ පචනයැ චෛත්‍රයැ ගවයැයි ද්‍රව්‍යගුණක්‍රියානාමජාතිභෙදයෙන් පඤ්චවිධ වේ—නැවත කර්මයැ කර්තෲයැ කරණයැ සම්ප්‍රදානයැ අව

* “ අකථිතනිමිත්තම් ” යනු අධොලිපිස්වරූපයි. † පා. 1, 4, 46.

ධියැ ආධාරයැයි සයෙක් වේ—එහි ශක්තියැ කාරකයැ තදා ධාරවූ ද්‍රව්‍යාදීහු තත්‍රස්ථබැවින් කාරකනම් වෙති මුඛ්‍යහෙයින් නොවෙත්, මුඛ්‍යහෙයින් වෙත් නම් ඔවුන් අන්‍යොන්‍යව්‍ය වෘත්තරූප වනබැවින් යමෙක් ආධාර වේද ඒ ආධාර නම් මැ වෙයි කිසිකලෙක්හි කරණරූපවූයේ හෝ කර්තෘරූපවූයේ හෝ නොවේ, එසේකල්හි "ථාලී පචති, ථාලියා පචති, ථාලියං පචති" යනාදියෙහි එකක්හට කර්තෘකරණාධාරභෙදයැ නොවන්නේයැ ශක්තිපක්ෂයෙහි වනාහි ද්‍රව්‍යාදීන් නොයෙක් ශක්තියට ආධාරබැවින් යම් යම් ශක්තියෙකින් ද්‍රව්‍යාදීහු විවක්ෂිතයෝද ඒ ඒ කාරක වේනුයි ද්‍රව්‍යාදීන්ගේ අභෙදයෙහිදු කාරකභෙදයැ යෙදෙන්නේයි—එහෙයින් මැ කීහ වෘත්තියෙහි "වත්තිච්ඡාතො හි කාරකානි හොන්ති" යී—කර්තෘ ආදීහු ක්‍රියාවට කෙසේ කාරක වෙත්දයත්, එහි කර්තෘතෙමේ තමා හා සමවාසීවූ ක්‍රියාවට කාරණභාවයට පැමිණෙන්නේ "හසති නච්චති" යනාදි ක්‍රියාවට නිමිත්තවෙයි කර්මයද තමා හා සමවාසීවූ ක්‍රියාවට තදර්ථවූ ඉන්ධනාදීන් පවත්වන්නේ "ඔදනම්පචති දෙවදත්තො" යනාදියෙහි නිමිත්තවෙයි, "කට්ඨෙහි පචති" යනාදියෙහි කාෂ්ඨයෝ ජ්වලනක්‍රියායෙන් සාධ්‍යවූ පාකයට අඞ්ගභාවයෙන් නිමිත්තවෙති "පරසුනා ඡින්දති" යනාදියෙහි පොරෙවද කාෂ්ඨයන්ගේ ද්විධාප්‍රාප්තියට නිමිත්තවෙයි, කර්මයද ක්‍රියායෙන් සම්බන්ධමානවූයේ ව්‍යාප්තියෙහි නිමිත්තභාවයෙන් ක්‍රියාවට නිමිත්තවෙයි එසේ මැ සම්ප්‍රදානාවධිආධාරයෝ "බ්‍රාහ්මණානං ගාවො දදාති, ගාමස්මා අපනයති, ථාලියං පචති" යන මෙහි ගොදානාපනයන ධාරණ ක්‍රියාවට නිමිත්තභාවයෙන් ක්‍රියාවට නිමිත්ත වෙති ඔවුන් ස්වකීයස්වකීයක්‍රියායෙහි පවත්වන්නේ කර්තෘයැ එබැවින් එ මැ ප්‍රාධාන්‍යයෙන් කර්තෘව්‍යපදෙශයැ ලැබෙයි අන්‍යයැ කර්තෘභාවයැ ඇතද අප්‍රධානබැවින් නොලැබේ.

මෙ මැ කීහ :—

"විචිත්තකත්තුආදීහි සංයොගා එකවත්ථුනො
නානත්තං යුජ්ජතෙ නාට්ටභෙදෙන නටකස්සිව" ~ යී.

කරොති කිරියං නිබ්බත්තයති නිමිත්තභාවෙනාති කාරකං, කත්තාදි—"කාරකශබ්දෙ නිමිත්තපර්‍ය්‍යායඃ කාරකං නිමිත්තං හෙතුරිත්‍යනර්ථාන්තරම්" යී සාරසඞ්ග්‍රහකාරයෝ කියති, භාග වෘත්තිකාරයෝ ඒ සහනයැ නොකෙරෙත්, එහෙයින් මැ

කීහ—"කාරකශබ්දශ්ච නිමිත්තපර්‍ය්‍යාය ඉත්‍යත්‍ර භවත එවෙය මාහොපුරුෂිකා නාත්‍රාගමො න ශබ්දාර්ථඃ" යි—සාරසඞ්ග්‍රහකාරයන්ගේ අභිප්‍රාය නම් කර්තෘවාචිවූ කාරකශබ්දයැ ගත්කල්හි ස්වතන්ත්‍රකර්තෘයෙහි මුත් අස්වතන්ත්‍රවූ අපාදානාදියෙහි කාරකශබ්දයැ ප්‍රවෘත්ත නොවෙයි එසේකල්හි ඔවුන් කාරකව්‍යවහාරයට ඇතුළත් නොවන බැවින් කාරකශබ්දයැ නිමිත්තවාචීවූකල්හි නිර්දෝෂයැ යනුයි—නො වෙ, (එසේ වක්තෘවිවක්ෂාවෙන් විතීයා) නොවේනම්—ඉධාපි, මේ ('වලාහකා' යනාදි) ප්‍රයොගයෙහිද—පසතිතබ්බං, (අන්‍යසූත්‍රයක්) ආරම්භ කටයුත්තේයි—පාණිනිහු අභිනිපූර්වවූ විශතීහුගේ ආධාරයෙහි "**අභිනිවිශශ්ච**"* යන සූත්‍රයෙන් කර්මසංඥා කොටැ විකල්පයෙන් ද්විතීයාවිධානයැ කෙරෙති තදුපදර්ශනයැ පිණිසැ වෘත්තියෙහි "එවමභිනිවිසස්ස" යනාදි කියනලදී—උප අනු අධි ආඞ් පූර්වවූ වසතීහුගේ ආධාරයෙහි "**උපාන්වධ්‍යාඞ්වසඃ**"† යන සූත්‍රයෙන් කර්මසංඥා කොටැ භොජනනිවෘත්ත්‍යර්ථ වසතීහුගේ ප්‍රතිෂෙධයැ පිණිසැ "**වසෙරශ්‍යර්ථස්‍ය ප්‍රතිෂෙධො වක්තව්‍යඃ**" යි කියනලද්ද තදුපදර්ශනයැ පිණිසැ වෘත්තියෙහි "තථා උපවජ්ඣාවසස්ස" යනාදි කියනලදී—රූපසිද්ධිකාරයන්විසින් "**තතියාසත්තමීනඤ්ච**"‡ යන සූත්‍රයැ දක්වා සප්තම්‍යර්ථයෙහි "තප්පානාචාරෙ ච දුතියා" යි කියා "නදිම්පිවති ගාමඤ්චරති" යි උදාහරණ දක්වනලද්ද. තදුපදර්ශනයැ පිණිසැ "පානත්ථචාරත්ථානං" යනාදි කියනලදී—එත්ථ පන, මේ ආධාරවිවක්ෂාපක්ෂයෙහි වනාහි—කාත්‍යායනයෙහි "**තතියා සත්තමීනඤ්ච**" යන සූත්‍රයෙන් තෘතීයාර්ථයෙහි ද්විතීයාවිධානයැ කළබව දක්වනුපිණිසැ "සචෙ මං නාලපිස්සතීති" යනාදි කීහු—පාණිනීයයෙහි "**-සමයානිකෂාහාප්‍රතියොගෙෂු ච දෘශ්‍යතෙ**"§ යන සූත්‍රයෙන් ප්‍රතියොගයෙහි ද්විතීයාවිහිතබව දක්වනපිණිසැ "පතිසද්දයොගෙ" යනාදි කීහු—වෘත්තියෙහි "තෙන" යනු තශබ්දයා හැරයැ යන අර්ථයි—"දිවිස්ස කරණෙ" යනාදියෙන් පාණිනීයයෙහි දිවධාතුහුගේ කරණකාරකයෙහි "**දිවඃ කර්ම ච**"‖ යන සූත්‍රයෙන් කර්මසංඥද කරණසංඥද කරනලද බව දක්වූහු—තා ච, ඒ (අපිශබ්දොපසඞ්ගෘහීත තෘතීයායැ අනන්තරොක්ත ද්විතීයායැ යන) දෙදෙනද.

* පා. 1. 4. 47. † පා. 1. 4. 48. ‡ක. 2, 6, 37.
§ පා. (2, 3, 2.) වාර්තික. ‖ පා. 2, 3. 6.

**කාල**[a] ~ " යං සමයං භගවා කරුණාවිහාරෙන විහාසි තං එකං සමයං " සී සබඳ—" පුබ්බණ්හසමයං, පෙරවරුවේලෙහි ; නිවාසෙත්වා, හැඳ පෙරෙවැ " යනු පුරාතන අපිකථනයයි—අප වර්ගීයක් ගම්‍යමානකල්හි කාලාධ්වවාචිශබ්දයන්කෙරෙන් අත්‍යන්තසංයොගයෙහි " **අපවර්ගෙ තෘතීයා** "* යන සූත්‍රයෙන් තෘතීයාවිධානයැ පාණිනීයයන්ට අභිමතබව දක්වන පිණිසැ වෘත්තියෙහි " එලපත්තියං " යනාදි කියනලදී—" තථාච " යනු අධිකාරයෙහි වැටේ—කරණං භවන්ති, සාධකතම වෙත්—යදිපි එවං, කිසිසේත් උක්තප්‍රකාරයෙන් කරණත්වයැ ඇත්හෙයින් තෘතීයාතොමැ සිඬවන්නීයැ ; තථාපි, එතකුදු උවත්—" අපවග්ගෙති වක්ඛාමි " සී කියා නොකීමෙහි කවර දෘෂයෙක්දැයි යන ආශඞ්කාවෙහි " අඤ්ඤථා " යනාදි කීහු—සියාති, (තෘතීයා) වන්නීයැයි—අධිප්පෙතා, (උදක් අපවිසින් කැමැතිවනලද්දී නොවෙයි භාගවෘත්තිකාරයන්විසින්ද "කරණෙ තෘතියායාඃ ප්‍රපඤ්චඃ" කියා) කැමැතිවනලද්දීයැ—තඤ්ච, ඒ කරණයද—පාණිනීන් විසින් " **කාලාධ්වනොඃ** " යනු වැටෙනුයෙහි " **සප්තමීපඤ්චම්‍යෞ කාරකමධ්‍යෙ** "† යන වචනාන්තරයෙකින් කාරකමධ්‍යයෙහි කාලාධ්වදෙදෙනාකෙරෙන් සප්තමි පඤ්චමී විහිතබව දක්වන පිණිසැ වෘත්තියෙහි " කාරක මජ්ඣෙ " යනාදි කීහු—චින්තනං කත්තුසත්තීනං, (දෙවදත්ත සමවෙත) කර්තෘශක්තීන්දෙදෙනාගේ—එකාභ්, එක (දෙව දත්තශබ්දයා) කෙරෙහි—වීහෙ'තීතෙ සාධනං " සී සම්බන්ධයි—කොසමහා, අඬසනකින්.

" චතුෂ්කාධිකවිංශත්‍යා අඞ්ගුලෛර්හස්තකල්පනා
සහස්‍රෛද්වාභ්‍යාං ධ්‍යාතං හස්තකෛඃ ක්‍රොශමානකම් " ~

යනුද—" ධනුපඤ්චසතං කොසො " යනුද ක්‍රොශලක්ෂණයි—ෂෂ්ඨියා සම්පත්තායං, (" කොසසෙසකදෙසෙ " සී) ෂෂ්ඨී පැමිණි කල්හි—" එවම්මඤ්ඤන්තෙ " යනාදිය " නනු " යනාදීන් කී චොද්‍යයට පරිහාරයි—මුත්තසංසයෙන, නිස්සංශයවූ (අවධාන දිය හා)—" ඉදං වත්තුං න සක්කා " සී අධ්‍යාහාරයි.

**ගති**[b] ~ " අඤ්ඤපදත්ථෙ වුත්ති යෙසං " සී ව්‍යධිකරණාන්‍ය පදාර්ථසමාසයි—ආදිශබ්දයෙන් බොධාදීන්ගේ ග්‍රහණයැයි—

* පා. 2, 3, 6.
† පා. 2, 3, 7.
[a] 2, 3 සූ.
[b] 2, 4 සූ.

ගත්‍යත්ථානං, ගමනාදියැ පිණිසැ—තක්කිරියා සමත්ථාව නියුජ්‍යතෙ, ඒ ගත්‍යාදිවූ ක්‍රියායෙහි සමර්‍ථවූයේ මැ නියොගකරනු ලැබේ—දුතියාය සිඬාය, (වක්‍ෂ්‍යමාණක්‍රමයෙන් ප්‍රයොජ්‍යකර්‍තෘහුගේ කර්‍මත්‍වසිඬියැ පිණිසැ "කම්මෙ දුතියා" යන සූත්‍රයෙන් මැ කර්‍මයෙහි) ද්විතීයාවිභක්ති සිඬවූකල්හි—පච්චුදාහරීයිස්සතෙ, ("පාචෙති ඔදනං දෙවදත්තෙන යඤ්ඤදත්තො" යි) ප්‍රත්‍යුදාහරණ කරනුලැබෙන්නේයි—"තථාච" යනු අධිකාරයෙහි වැටේ—තථාච, එසේමැ; හෙවත් ප්‍රයොජ්‍යකර්‍තෘහෙයින් කර්‍මත්‍වය නැතැයි ගිවිස—විචටං, අවි කියනලද—"බොධත්ථස්ස උදාහරණං" යි ශෙෂයි—ව්‍යවත්ථිතත්තා, නිවෘත්ති කරනලදබැවින් — "**ගතිබුඬිප්‍රත්‍යවසානාර්‍ථශබ්ද කර්‍මාකර්‍මකාණාමණිකර්‍තා ස ණෞ**" යි ප්‍රයොජ්‍යකර්‍තෘහට කර්‍මසංඥාවිධායක පාණිනීය වචනයෙහි "අණිකර්‍තා" යි විශෙෂස්වීකාර කරනලද්ද තදුපදර්‍ශීනයැ පිණිසැ "ගත්‍යත්ථානං" යනාදි කීහු—අස්මිං උද්දෙසෙ, මේ වචන සමීපයෙහි—'යාවතා' යනු යස්මාදර්‍ථයෙහි අසංඛ්‍යයි—යාවතා, යම් හෙයකින් (ද්විතීයා පැමිණේද එහෙයින්); "යඤ්ඤදත්තෙන නෙති භවිතබ්බං" යි සම්බන්ධයි.

**හරා**[a] ~ සාපි, ඒ තෘතීයාද—උභයත්ථ, (ද්විතීයාවගේ නිවෘත්තිප්‍රාප්ති) දෙක්හි—විභාසා, විකල්පයි.

**නාථා**[b] ~ නියන්තා, සාරථි—එහෙයින් කියනලදී.

"සව්‍යෙෂ්ඨා දක්‍ෂිණස්ථශ්ච සූතඃ ක්‍ෂත්තා තථෛවච
නියන්තා චෙති පඤ්චෛතෙ ශබ්දාස්සාරථි වාචකාඃ" ~ යි.

ක්‍රියාඞ්ගං, (බලීවර්‍දාදි) ක්‍රියාකාරණයැ—නියමෙත්‍වා, එක ක්‍රියාවිශෙෂයෙක පිහිටුවා.

**භක්ඛ**[c] ~ සබ්බෙ, සියලු වෘක්‍ෂාදිවූ—භාවා, පදාර්‍ථයෝ. උක්ත මැ නු පරිව්‍රාජක යාදවප්‍රකාශයන්විසින්.

"භාවො ලීලාක්‍රියාචෙෂ්ටා භූත්‍යභිප්‍රායජන්තුෂු
පදාර්‍ථමාත්‍රෙ සත්තායාං දශස්වර්‍ථෙෂු දෘශ්‍යතෙ" ~ යි.

"දුහාදීනං" යනාදීන් ප්‍රධාන අප්‍රධාන උභයත්‍ර යන මේ තුන්තැන්හි භාෂ්‍යකාරාද්‍යනුමතක්‍රමයෙන් ත්‍යාදිවිධිප්‍රතිපාදන

---

[a] 2. 5 සු. [b] 2, 6 සු. [c] 2, 8 සු.

යැ කෙරෙත්—දුහාදීනං, දුහි යාචි ප්‍රකාරයන්ගේ—කම්මවයුත්තානං, ද්විකර්මකයන් අතුරෙන්—ගේ නියමකරනලද මැයි.

“ නීචහ්‍යහෘතයශ්චාපි ගත්‍යර්ථානාන්තථෛව ච
ද්විකර්මකෙෂු ග්‍රහණං ද්‍රෂ්ටව්‍යමිති නිශ්චයඃ” ~ යි.

“පයොආදිකම්මුද්දිස්ස උපාදානතො දුහාදීනමප්පධානෙ'පි ගවාදෙ කම්මෙ ත්‍යාදිප්පභූතයො” යි යොදනු—“ඉච්චාදි” යන තැන්හි ආදිශබ්දයෙන් “අවරුන්ධති වජං ගාවං අවරුධ්‍යතෙ වජං ගො” යන මේ ආදීන්ගේ පරිග්‍රහයයි—පුරිසක්‍රියාතුල්‍යඵලත්තා, පුරුෂයාගේ ගමනක්‍රියාසම්බන්ධ ප්‍රාප්තිලක්ෂණඵලයැ (ග්‍රාමපුරුෂදෙදෙනාට) සමානබැවින්—ව්‍යපදෙසහෙතු භවති, කර්තෘව්‍යපදෙශයට කාරණ වේ—“ආගතො ගාමො පත්තො ගාමො” යි ග්‍රාමයැ ආසන්නවූ කල්හි ගමනීහුගේ වචනයෙන් උදාහරණ දක්වීමයි—අතො, මේ (දුහාදිගමනාද්‍යර්ථයන්) කෙරෙන්—පධානෙ කම්මෙ, (අජාදි) ප්‍රධානකර්මයෙහි—ත්‍යාදිප්පභූතයො, ත්‍යාදි තව්‍යාදීහු—නීචහාදි ද්විකර්මක ධාතූන්ගේ ප්‍රධානවූ ඊප්සිතතමකර්මයෙහි ත්‍යාදීහු වෙති; දුහාදිධාතූන්ගේ අප්‍රධානකර්මයෙහි ත්‍යාදීහු වෙති; ගතිබොධාදිධාතූන්ගේ ප්‍රයොගයෙහි ප්‍රධානකර්මයෙහිද අප්‍රධාන කර්මයෙහිද ත්‍යාදීහු වෙත්— මෙ මැ අර්ථයැ ගාථායෙනුත් කීහු.

“ද්විකම්මකෙසු චෙතෙසු අප්පධානෙ දුහාදිනං
ත්‍යාදිප්පභූතයො හොන්ති පධානෙ නීචහාදිනං
උභයත්ථ පයොගානුසාරා ගත්‍යත්ථආදිනං” ~ යි.

**ධාත්වාදීහි**[a] ~ උපපදසන්නිස්සයෙන, (ධාත්වාදිවූ) අන්‍යපදයන්ගේ සමාශ්‍රයකරණයෙන්—“සමීපොච්චාරිතම්පදං උපපදං” යි විග්‍රහයි—සමාධානං විනා, ඒකාග්‍රතාවක් නැතිවැ.

**ලක්ඛ**[b] ~ තෙන, (යම්හෙයකින් අභි යන උපසර්ගයා හා යුක්තවූ ශබ්දයට මෙතෙමැ අභිනිර්දේශයද) එහෙයින්—සමුපලක්ඛකං, චිහ්නමාත්‍රයෙකැ; හෙවත් ඥාපකහෙතුයැ—“ජනකො ඤාපකො චෙති දුවිධා හෙතවො සියුං” යනුහෙයින් ජනකහෙතුයැ ඥාපකහෙතුයැයි කියා හෙතූහු ද්විප්‍රකාර වෙත්—එහි ශාල්‍යඞ්කුරාදියට ශාලිබීජාදියැ සේ ජන්‍යයාට

---

[a] 2, 9 සූ. [b] 2, 10 සූ.

අන්‍යෙන්‍යාපකාරක වන්නේ ජනකහෙතුයැ විද්‍යමානවූ වහ්නි
ආදියට ධූමාදියැ සේ කිසිවකුගේ අස්තිත්වයැ ඥාපනයැ කරන්
නේ ඥාපකහෙතුයි—කිඤ්චි පකාරං, කිසිවෙනසකට—"දෙව
භූතො" යන්නෙහි මෙන් මෙතැන්හි භූතශබ්දය ප්‍රාප්තවා
චියි—ලක්ඛණං, ඥාපකහෙතුයැ—ලක්ඛියං, ඥාප්‍යයි—අඤ්ඤද
ත්‍ථු, ජිනෙන්ද්‍රබුද්ධිප්‍රභෘතීහු වනාහි—අභිහුවිසින් සම්බන්ධයැ
ප්‍රකාශකරනුලැබෙයි යනු ඔහුගේ අභිප්‍රායයි.

කියනලදමැයි වාක්‍යකාණ්ඩයෙහි.

"ක්‍රියායා ද්‍යෝතකො නායං සම්බන්ධස්‍ය න වාචකඃ
නාපි ක්‍රියාන්තරාපෙක්ෂී සම්බන්ධස්‍ය තු භෙදකඃ" ~සී.

අයං, මේ (අභිශබ්දයැ) තෙමැ ; ක්‍රියායාද්‍යෝතකො න, ("අභි
නන්දති යනාදි තැන්හි උපසර්ගයන් මෙන්) ධාත්වර්ථයැ ප්‍රකාශ
නොකරන්නේයැ ; සම්බන්ධස්‍ය වාචකො න, (ෂෂ්ඨීවිභක්තියැ
මෙන්) සම්බන්ධයද කියන්නේ නොවෙයි ; ක්‍රියාන්තරාපෙක්ෂ්‍ය
පි න, ("නික්කොසම්බි" යනාදි තැන්හි නිරාදීන් මෙන්) අන්‍ය
ක්‍රියාවක්ද අපෙක්ෂා නොකරන්නේයැ ; තු, වැළි (කුමක්
කෙරේද) ; සම්බන්ධස්‍ය භෙදකඃ, ලක්ෂ්‍යලක්ෂණභාව සම්බන්ධ
යැහට විශෙෂක වන්නේයි ; හෙවත් සම්බන්ධවිශෙෂයැ
ප්‍රකාශකෙරෙයි සේයි—"තථා ච" යනාදියෙන් පූර්වපක්ෂ
යෙහි ලැබෙන දොෂ පහළකෙරෙත්—"තත්‍රායං" යනාදීන්
පූර්වවාදීහු කියන පරිහාර දක්වත්—මේ පක්ෂයැ නිරාකරණ
නොකළහෙයින් අඞ්ගීකෘතයැයි දතයුතු—විසයභාවෙන, (දෙව
දත්තයාගේ සාධුත්වප්‍රකාරයට පැමිණීමයැයි කියනලද ඉත්ථ
මප්‍රකාරප්‍රාප්තියට) විෂයභාවයෙන්—"විසයවිසයීභාවලක්ඛ
ණෙ මාතුසම්බන්ධො" යි යොදනු—ඉත්ථම්පත්තියා, ඉත්ථම්භූත
ලක්ෂණවූ ක්‍රියාව කරණකොටැ ගෙනැ—විසයවිසයීභාවලක්ඛ
ණෙ සම්බන්ධො, (මාතෘතොම විෂයභාවයෙන් ඉත්ථම්භූතයෙහි
ප්‍රවෘත්තවූවායැ දෙවදත්තද එහි විෂයිභාවයෙන් ප්‍රවෘත්ත
යැ ඔවුන් දෙදෙනාගේ) විෂයවිෂයිභාවලක්ෂණවූ ඉත්ථම්ප්‍රාප්ති
ලක්ෂණක්‍රියායෙන් උපන් සම්බන්ධයැතෙමැ—තෙන, ඒ
(අභිහු) හා—"තං ඛො පන භගවන්තං ගොතමං එවං කල්‍යා
ණො කිත්තිසද්දො අබ්භුග්ගතො" යනාදීන් ඉත්ථම්භූතාඛ්‍යා
නාර්ථයෙහි උදාහරණ දතයුතු—එහි "උග්ගතො" යනු "සාධු"
යනු මෙනැ "කිත්තිසද්දො" යනු "දෙවදත්තො" යනු මෙනැ

“තං ඛො පන භගවන්තං ගොතමං” යනු “මාතරං” යනු මෙති—අභිශබ්ද ඉත්ථම්භූතාඛ්‍යානාර්ථද්‍යෝතකයි—“රුක්ඛො රුක්ඛො තිට්ඨති” යි සබඳ—“එසං රුක්ඛානං යො ච සම්බන්ධො” යි යොජනාවයි—සාධ්‍යසාධනලක්ඛණෙ, ක්‍රියාකාරකලක්‍ෂණවූ.

**පති**[a] ⁓ උපාදියමානො, සවික්‍රියමාණවූ—තගර, තුවරලාසි—කුඬ, උපුල් කොළයි; කොට්ටම්—මමාභජති, (මං අභජති), මාගේ කොටස් වේ.

**අනු**[b] ⁓ කප්පතෙ, සමපිවේද—අද්දක්ඛි අපි, දුටුයේද—“අපි” යනු ප්‍රශ්නාර්ථයෙහි වැටේ—පුබ්බවිප්පටිසෙධෙන, අපවාදපූර්වවිප්‍රතිෂෙධයෙන්.

**සහ** ⁓ තෙන, ඒ (අනු යන උපසර්ගය) හා.

**හීනෙ**[d] ⁓ තත්‍ර, ඒ (‘හීනත්‍රෙ’ යනාදීන්) කියනලද්දෙහි—යතො, (උත්කෘෂ්ට ශාරීපුත්‍රාදී) යමක්හුකෙරෙන්—හීනො, (ප්‍රඥාදී) නිකෘෂ්ටවූයේ—සො, ඒ (ශාරීපුත්‍රාදී)තෙමැ—හීනත්‍රී විසයො ජායතෙ, (ඒ ප්‍රඥාවතුන්විෂයෙහි ඔහුගේ උත්කෘෂ්ටතාප්‍රවෘත්තියැ හෙයින්) හීනාර්ථයහට විෂය වන්නේයි—හීනුක්කට්ඨසම්බන්ධො, (අතිශයනාදී කිසික්‍රියායෙකින් කරනලද) හීනොත්කෘෂ්ටසම්බන්ධයැ තෙමැ—එසං, මේ දෙදෙනාගේ.

**සත්ත**[e] ⁓ තං අධික්‍යං, ඒ අධිකභාවයැ—උපසද්දෙන, උපශබ්දයා හා; යොගොති, (අධිකීහුගේ) එක්වීම වේනුයි කියා—“අධිකම්හා ද්‍රොණෙ තු සත්තම්‍යභාවො” යි සම්බන්ධයි—තුශබ්දයෙන් සම්බන්ධයැ උභයාධිෂ්ඨානබැවින් අධිකයාටත් උපශබ්දයා හා එක්වීම ඇතද විශෙෂයක් ඇති බව කී නු ලක්ඛිතා විය, (එක මැ විභක්තියෙන් උභයගතසම්බන්ධයැ ද්‍යෝතිතබැවින්) විද්‍යුත්සංඛ්‍යාතලක්‍ෂිතයාකෙරෙන් (සප්තම්‍යභාවයැ) මෙන්—වෘත්තියෙහි “උපඛාරියං ද්‍රොණෙ” යන්නෙහි; ඛාරියං, අමුණක් මත්තෙහි; ද්‍රොණෙ, තිඹෙක්; උප, අධිකයැ; (යි අර්ථයි).

ගණිතශාස්ත්‍රයෙහිද කීහු.

“වාහො විංශතිඛාරීභිඃ ඛාරිකා සත්‍දශෙන තු
ප්‍රවෘත්තඃ පඤ්චඛාරීභිඃ සඞ්ඛ්‍යමානඃ ප්‍රකීර්තිතඃ ⁓
නිකුඤ්චං යාවදාඪකඃ පාදපාදාවශෙෂිතම්
මානීද්‍රෝණාඪකප්‍රස්ථ කුඩුබෙෂු තථා භවෙත්” ⁓ යි.

---

[a] 2, 11 සූ. [b] 2, 12 සූ. [c] 2, 13 සූ. [d] 2, 14 සූ. [e] 2, 16 සූ.

සතරලාස්සෙක් ද්‍රෝණයෙකැ, සොළොස් ද්‍රෝණයෙක් ඛාරියෙකැ, විසිඛාරියෙක් වාහයෙකැ, ඛාරියෙන් පාදයෙක් මානියෙකැ, ඒ සතරද්‍රෝණයයි. මානියෙන් පාදයෙක් ද්‍රෝණයෙකැ, ඒ සතරලාස්සෙකි. ද්‍රෝණයෙන් පාදයෙක් අඪකයෙකැ, ඒ ලාස්සෙකි. අඪකයෙන් පාදයෙක් ප්‍රස්ථයෙකැ, ඒ නැළියෙකි. ප්‍රස්ථයෙන් පාදයෙක් කුඩුබයෙකැ, ඒ පතෙකි. කුඩුබයෙන් පාදයෙක් නිකුඹයෙකැ, ඒ අඩකුළුඳුලෙකි. කුළුඳුලෙක් නම් මානාමාහිමියන්ගේ මතයෙන් එක්දස් දෙසිය පස්විසි වියැටෙකැ. ඛයාමලුන්ගේ මතයෙන් දෙදස් දෙසිය පනැස් වියැටෙකි.

**සාමි**[a]—සාමිත්තං, ස්වාම්‍ය නම් වේ—ඒ කවරේද—පරිපාලනක්‍රියාජනිතො සස්සාමිසම්බන්ධො" යි යොදනු—තඬ, ඒ ස්වාමිත්වයද—"ප්‍රසිද්ධස්‍යානුවාදඃ අප්‍රසිද්ධස්‍ය විධිඃ" යනුහෙයින් කුණ්ඩලිත්වයැ ප්‍රසිද්ධයැ දෙවදත්තත්වයැ අප්‍රසිද්ධයැයි කියා "කුණ්ඩලිත්තානුවාදෙන" යනාදි කීහු—සං, (පඤ්චාලාදි) ස්වතෙමැ—ව්‍යතිරෙකං, (කාරකෂට්කයෙන් ව්‍යතිරික්තවූහෙයින්) ව්‍යතිරෙකනම්වූ සම්බන්ධයට—"අධි බ්‍රහ්මදත්තෙ" යනු සමාසපදයැ වීනම් ඊශ්වරවූ බ්‍රහ්මදත්තයාකෙරෙහි පාඤ්චාලයෝ යැයි අනභිමතප්‍රසඞ්ගයැ වෙයි එහෙයින් ව්‍යස්තවශයෙන් "ගොසු ඉස්සරො" යන්නෙහි මෙන් "ඉස්සරා බ්‍රහ්මදත්තෙ පඤ්චාලා" යි අර්‍ථ දතයුතු—කසයින්න්‍යාසයෙහි "බ්‍රහ්මදත්තිස්සරා පඤ්චාලා" යි අර්‍ථ කීහ. තදනුසාරයෙන් විරිතසන්‍යයෙහිද "පඤ්චාලා, පඤ්චාලයෝ ; අධි බ්‍රහ්මදත්තෙ, බ්‍රහ්මදත්තයා ඊශ්වර කොටැ ඇත්තාහුයැ" යි ලීහු.

**කත්තු**[b]—කත්තරි, ("සයති දෙවදත්තො" යනාදියෙහි) කර්‍තෘයෙහි හෝ ; කම්මෙ වා, ("පචතෞදනං දෙවදත්තො" යනාදියෙහි) කර්‍මයෙහි හෝ—"**ස්වතන්ත්‍රඃ කර්‍තා**"[*] යි කර්‍තෘසංඥා නොකළද "කරොතීති කත්තා" යන අන්වර්‍ථ ව්‍යපදෙශයෙන් කර්‍තෘව්‍යවහාරයැ සිද්ධයැයි දක්වනු පිණිසැ "කරොති" යනාදි කීහු—කර්‍තෘකාරකලක්‍ෂණ දක්වන්නට පූර්‍වවෛයාකරණයෝද කීහු—

"යඃ ක්‍රියාං ව්‍යාප්‍යකර්‍තෘස්ථාං කුරුතෙ මුඛ්‍යභාවතඃ
අප්‍රයුක්තඃ ප්‍රයුක්තො වා ස කර්‍තා නාම කාරකම්"—යි.

---

[*] පා. 1, 4, 54.

[a] 2, 17 සූ. [b] 2, 18 සූ.

යඃ, (දෙවදත්තාදි) යමෙක්තෙමෙ; අප්‍රයුක්තඃ, (යඥදත්තාදි කිසිවකුහුවිසින්) නොමෙහෙයනලද්දේ හෝ; ප්‍රයුක්තො වා, මෙහෙයනලද්දේ හෝ; ව්‍යාප්‍යකර්තෘස්ථාම්, ("පචත්‍යොදනං දෙවදත්තො" යනාදි තැන්හි) කර්මස්ථවූද ("සයති දෙවදත්තො" යනාදි තැන්හි) කර්තෘස්ථවූද; ක්‍රියාම්, (පචනශයනාදි) ක්‍රියාව; මුඛ්‍යභාවතඃ, ස්වප්‍රධානභාවයෙන්; කුරුතෙ, නිෂ්පාදනයැ කෙරේද; සඃ, එතෙමෙ; කර්තා නාම කාරකම්, කර්තෘකාරකනම් (වන්නේයි)—"යො පන" යනාදීන් "**සාධකතමං කරණම්**"* කියා කරණසංඥ නොකළද "කරොත්‍යනෙනෙති කරණං" යන අන්වර්ථව්‍යපදෙශයෙන් සිද්ධයැයි දක්වත්—කරණලක්ෂණද කීහු—

"ක්‍රියායාඃ පරිනිෂ්පත්තිර්‍යද්ව්‍යාපාරාදනන්තරම්
විවක්ෂ්‍යතෙ යදා තත්‍ර කරණත්වන්තදා† ස්මෘතම්"——යි.

යදා, යම්කලෙක්හි; යද්ව්‍යාපාරාත්, යම් කාරකයක්හුගේ ක්‍රියායෙන්; අනන්තරම්, අනතුරුව; හෙවත් අන්‍යකාරක ව්‍යවධානයක් නැතිව; ක්‍රියායාඃ පරිනිෂ්පත්තිඃ, ක්‍රියාවගේ සංසිද්ධිතොම; හෙවත් ආත්මලාභයැතෙමෙ; විවක්ෂ්‍යතෙ, කියනුකැමැතිවනු ලැබේද; තදා, එකල්හි; තත්‍ර, ඒ ක්‍රියා නිෂ්පත්තිකාරණයෙහි; කරණත්වම්, කරණභාවයැතෙමෙ; ස්මෘතම්, දන්නාලදී; "පරසු ඡින්දති, පරසුමහි ඡින්දති" කියා කාරකාන්තරද පෙනෙනහෙයින් නිත්‍යනොවන්නේයයි සේසි.

"**තෘතීයාවිධානෙ ප්‍රකෘත්‍යාදිභ්‍යඃ‡ උපසංඛ්‍යානම්**" යන වාර්තිකකාරමතදර්ශනයැ පිණිසැ "පකති ආදීහි" යනාදි කීහු—"යත්ථෙසං කරණභාවොති තං කිරියං කථයති" සී අධ්‍යාස සම්බන්ධයි—යත්ථ, යම් ක්‍රියාවෙක්හි; එසං, මේ ප්‍රකෘත්‍යාදීන්ගේ; කරණභාවො, කරණත්වයැතෙමෙ ඇත්ද; තං කිරියං, ඒ ක්‍රියාව—"යං යස්මා අඤ්ඤගොත්තො ගොතමො න අත්තො ච ගොතමො භවති" සී සම්බන්ධයි—තාදර්ථ්‍යයා, තදර්ථභාවයෙන්—"ද්වෙදොණෙන ධඤ්ඤං කිණාති; දෙදෙතිඹක් කොටැ ධාන්‍යය ගනී; පඤ්චකෙන පසවො කිණාති, පසක් පසක්

* පා. 1, 4, 42. † "තත්‍ර කරණං තත්තදා" සරලා.
‡ "ප්‍රකෘත්‍යාදිනාම්" කාශිකා.

කොටැ පශුන් ගනී" යනු පුරාතන අපිකීමයි—වෘත්තියෙහි "කිණාතීති" යන තැන්හි ඉතිශබ්දයැ ආදිවාචකයැ එහෙයින් "සිප්පෙන නළකාරො සො, එකූනතිංසො වයසා සුභද්ද, විජ්ජය සාධු, තපසා උත්තමො, යෙභුය්‍යෙන චම්පෙය්‍යකා බ්‍රාහ්මණගහපතිකා භගවන්තං දස්සනාය උපසංකමිංසු" යනාදියැ සඞ්ගෘහීතයි.

**සහ**[a]—"පධානෙ කාරියාවගමා" යන මෙයින් "**ගෞණමුඛ්‍යයොඃ මුඛ්‍යෙ'පිසම්ප්‍රත්‍යයඃ**" යන න්‍යාය දක්වූහු—"තතියා'පි ඡඨී ච අප්පධානෙ එව භවති" යි මෙහි මැ වක්ෂ්‍යමාණ බැවින් "අප්පධානෙ— පෙ —පටිපාදයිස්සතෙ" යි කීහු—අනෙන යොගෙන, ("**සහත්ථෙන**" යන) මේ සූත්‍රයෙන්—'පරියායත්ථං' යන තැන්හි අවධාරණයැ නුදුටුහෙයින් සහ ශබ්දප්‍රයොගයැ හා තත්පය්‍ර්‍යාය 'සඞ්ඝං' යනාදි ප්‍රයොගයද හැර සහාර්ථයැ හැඟෙන තැන්හිදු "**සහාදි සහාදිනෙකත්ථං**"[b] "න සන්ථවං කාපුරිසෙන කයිරා" යනාදියෙහි මෙන් තෘතීයා අනවද්‍යයැයි දතයුතු—කාශිකාවෘත්තිකාර ජයාදිත්‍යයන්විසින්ද මෙ මැ කියනලදී—"සහාර්ථෙන ච යොගෙ විධානාත්තය්‍ර්‍යාය ප්‍රයොගෙ'පි භවති පුත්‍රෙණ සාකම් පුත්‍රෙණ සාර්ධම් විනා'පි සහශබ්දෙන භවති වෘද්ධො යූනෙති" යි—"සහ වචනා ච පන භගවතො සුප්පවාසා කොළියධීතා අරොගා අරොගං පුත්තං විජායි" "සහ සච්චක තෙ මය්හං" යනාදියෙහි බහුලං විධානයෙන් සහාර්ථයෙහි පඤ්චමීෂෂ්ඨීවිභක්තිද ඇතැයි දතයුතු—විශෙසානුපාදනතො, ("**සහයුක්තෙ 'ප්‍රධානෙ**"* යන පාණිනීයසූත්‍රයෙහි මෙන් 'අප්‍රධානෙ' යන විශෙෂග්‍රහණයක් නැතිහෙයින්.

**ලක්ඛ**[c]—උපාතෙතා, ගෘහීතද—තස්ස වාචකා, ඒ (උපලක්ෂණභාවයැ) ප්‍රකාශකරන්නාවූ (ශබ්දයා) කෙරෙන්—උපලක්ඛණභාවෙන, චිහ්නභාවයෙන්—"රුක්ඛමපති විජ්ජොතනං" යන මේ ලක්ෂණමාත්‍රයෙහි නොවැ කිසි විශෙෂයකට ප්‍රාප්තයක්හුගේ ලක්ෂණයෙහි තෘතීයාවන පිණිසැ පාණිනීන් විසින් "**ඉත්ථම්භූතලක්ෂණෙ**"† යි කියා ඉත්ථම්භූතග්‍රහණයෙන් වෙසෙසනලද්ද, ඒ බුද්ධිස්ථකොටැ "නණ්විත්ථම්භූතස්ස" යනාදීන්

* පා. 2. 3, 19. † පා. 2, 3, 21.

[a] 2, 19, සු. [b] 3, 1, සු. [c] 2, 20 සු.

චොද්‍යකළාහුයි—“ නයිදමත්‍ථි ” යනාදි පරිහාරයි—“ අවසසං ” යනාදීන් ප්‍රතිවාදීහු ගිවිස්වත්—අඤ්ඤථා, මෙලෙස නොගිවිසැ (“ **ඉත්‍ථම්භූතලක්ඛණෙ** ” යන සූත්‍රකරණය ඇතිකල්හි)—“ වතත්‍ථං නව සත්‍තා ” සී සාධ්‍යාහාරසම්බන්ධයි—වශබ්ද අව ධාරණයෙහි වැටේ—ද්‍ධිතීයාවිධාන සාමත්‍ථියා, (“ **පතිපරීහි භාගෙ ච** ” [a] යන සූත්‍රයෙන් විතීයාකල සාමර්ථ්‍යයෙන්—“ කමණ්ඩ ලුස්ස සෙතස්ස ච උපලක්ඛණභාවෙන අනුපාදානතො ” සී සම්බන්ධයි—අප්පසඩ්ගා, (තෘතීයා) ප්‍රසඞ්ගයැ නොවේ—විසි ෂ්ටාවයවාධෙය්‍යන, (කමණ්ඩලු) විශිෂ්ටාවයවවූ (පාණි) හුගේ ආධෙයවූ (කමණ්ඩලු)යෙන්—වෘත්තියෙහි “ තිදණ්ඩකෙන පරිබ්බාජකමද්දක්ඛි ” යන උදාහරණයැ සංස්කෘතවාක්‍යකරණ නුසාරයෙන් සමානාධිකරණපද නැතිවැ දක්වනලද්ද. බුද්ධ වචනයෙහි වනාහි “ ඌනපඤ්චබන්ධනෙන පත්තෙන අඤ්ඤං නවං පත්තං චෙතාපෙය්‍ය ” යනාදි සමානාධිකරණපදදෙකක් ඇතිවැ මැ ඉත්‍ථම්භූතලක්ඛණ වනබව දතයුතු—“යෙනඞ්ගෙන විකතෙන අඞ්ගිනො විකාරො ලක්ඛීයතෙ තතො තතියා යථා සියාති පරෙහි යෙනඞ්ගවිකාරොත්‍යරබ්ධං ” යනු ටීකායෙහි ලියයුතු පාඨයි—ටීකාපොත්වලැ “ යෙනඞ්ගවිකාරොත්‍යරබ්ධං ” යන පමණෙක් මැ පෙනෙයි එසේ කීකල්හි අවතාරිකාවාක්‍ය යැ සාවශෙෂ වනහෙයින් නොයෙදෙන්නේයැයි දතයුතු—විකාරයෙන් යුක්තවූ යම් නෙත්‍රාදි අවයවයක් කරණකොටැ ගෙනැ ශරීරයාගේ අන්‍යථාභාවයැ දක්නාලැබේද ඔහුකෙරෙන් “ **යෙනාඞ්ගවිකාරඃ** ”* යන සූත්‍රයෙන් තෘතීයාවිධානයැ පාණිනාද්‍යදීන්ට අභිමතබව “ යෙන ” යනාදීන් දක්වූහු—“ හෙතුභූතෙන ” කියා කාශිකාවෘත්තිකාරමතයෙන් අපිකීමයැ භාෂ්‍යකාරයෝ වනාහි “ යෙන ” යනු කරණයෙහි තෘතීයායැයි කීහ—“ අඞ්ගශබ්දෙසං සමුදායශබ්දඃ, යෙනෙති ච කරණ එෂා තෘතීයෙති ” සී—“ අක්ඛිනා කාණෙ භත්‍ථෙන කුණී පිඨියා ඛුජ්ජෝ ” යනාදි තැන්හි සමානාධිකරණපද යක් නැතිවැද කෙවලප්‍රයොග ඇතැයි දතයුතු

**හෙතු** [b] —හෙතු නම් ඵලසාධනයොග්‍යවූ පදාර්ථයි.

---

* පා. 2, 3, 20.

[a] 2, 11 සූ. [b] 2, 21 සූ.

**පඤ්චමී**[a]——"**අකත්තර්‍ය්‍යෘණෙ පඤ්චමී**"* යනු පාණිනීයසූත්‍ර හෙයින් කර්ත්තෘවර්ජිතවූ බන්ධනයට කාරණවූ යම් ඍණයෙක් ඇත්ද ඔහුකෙරෙන් පඤ්චමීවිභක්තිවනුපිණිසැ කර්ත්තෘප්‍රතිෂෙධ කටයුතුයැ මේ සූත්‍රයෙහි එසේ "අකර්ත්තරි" යන විශෙෂොපාදනයක් නැතද "සතෙන බද්ධො" යන තැන්හි ප්‍රයොජ්‍යකර්ත්තෘවූ ශතයාවිසින් බඳවනලද්දයි කියා කර්ත්තෘයෙහි තෘතීයාවිභක්ති මුත් ඍණහෙතුයෙහි විභක්ති නොපැමිණීම පූර්‍වවිප්‍රතිෂෙධයෙනැයි දතයුතු.

**ගුණෙ**[b]——"ගුණගහණං තස්ස උපාධි" යි සම්බන්ධයි—උපාධි, විශෙෂණයි—වෘත්තියෙහි "පරාඞ්ගභූතෙ" යන්නෙහි පරසංබන්ධබද්ධභාවඅග්නිමත්ත්වාදීන්ගේ විධානයට කාරණවූ ජාඩ්‍යධූමාදිහෙතුයෙහියැ යන අර්ථයි—මෙහි ගුණශබ්දයැ අප්‍රධානවාචීයැ ද්‍රව්‍යාශ්‍රිතශුක්ලාදි ගුණවාචී නොවන්නේයි—ඉහ ගුණසද්දෙන පරත්ථරූපාපන්නානං ජළත්තාදීනං සම්බන්ධිමත්ත මෙව උපාත්තං දබ්බනිස්සිතං නෙති සම්බන්ධො—පරත්ථරූපාපන්නානං, (පරාබද්ධබද්ධභාවාදීන්ගේ විධියැ පිණිසැ ජළත්තාදීන් අනුවාදස්වරූපයෙන් ගෘහීතබැවින්) පරාර්ථස්වරූපයට පැමිණියාවූ—"අග්ගි එත්ථ ධූමාති අද්දෙ" යන මෙහි ආදිශබ්දයෙන් "රුක්ඛො'යං සිංසපත්තා" යනාදියැ පරිග්‍රහ කළහ—ඉෂ්ටං, ("**විභාෂා ගුණෙ'ස්ත්‍රියාම්**"† යන සූත්‍රයෙන් පාණිනීන්ට) අභිමතයැ—"ඉමිනා සුත්තෙන පඤ්චමියා විනා" යි සම්බන්ධයි.

**ඡට්ඨී**[c]——සද්දසත්තිසාමත්ථියා, ශබ්දශක්තිසංබන්ධතාවූ සාමර්ථ්‍යයෙන්—"හෙතුවචනකෙහි අනන්තරෙන" කියා සම්බන්ධයි—සමානාධිකරණෙහි, (හෙතුවචී) සමානාධිකරණ (උදරාදි)වූ—තජ්ජොතනාය, ඒ (හෙතුවිය) ප්‍රකාශකිරීමට—අලං, සමර්ථද—"සා චායං ඡට්ඨී යත්ථ පන භවන්ති සමානාධිකරණෙහි හෙතුවචෙහි අනන්තරෙන තජ්ජොතනාය නාලං" කියා සම්බන්ධයි—"එකස්ස කාරණා මයං හිංසෙය්‍යු, බහුකො ජනො උදරස්ස හෙතු උදරස්ස කාරණා" යනු සමානාධිකරණ හෙතුවචවාචීනු කෙරෙන් ෂෂ්ඨීනොවූ තැනට උදාහරණයැ. "වසෙ ධම්මස්ස හෙතුනො" යනු සමානාධිකරණ හෙතුශබ්දයාකෙරෙන් ෂෂ්ඨීවූ තැනට උදාහරණයි.

---

* පා. 2, 3, 24. † පා. 2, 3, 25.
[a] 2, 22 සූ. [b] 2, 23 සූ. [c] 2, 24 සූ.

**සබ්බා**[a] ~ නාමභූතෙහි, (සබ්බයැ කතරයැ යනාදීන් නාම කරණවශයෙන් සත්‍යයන්ට) නම්වූද—අප්පධානභූතෙහි, ("පියසබ්බා" යනාදීන්) අප්‍රධානවූද.

**චතුත්ථී**[b] ~ "පූජාබුද්ධියා" යනාදීන් සම්ප්‍රදානලක්ෂණ දක්වත්.

කීයේ මැ නෝ අභිධම්මකොශයෙහි.

"දීයතෙ යෙන තදූනම්පූජානුග්‍රහකාම්‍යයා
කායවාක්කම්මසොත්ථානම්මහාභොගඵලම තත්" ~ යි.

චාගඞ්ගං, ත්‍යාගකාරණයෙක් ඇත්ද—වුත්තං හි, (නිරුක්ති මඤ්ජූෂාකාරයන්විසින්) කියනලද්දේ මැයි.

අනිරා—පෙ—භික්ඛවො* ~ අනිරාකරණ, (දීයමානවස්තුහු) ප්‍රතික්ෂෙප නොකිරීමයැ ; හෙවත් නොවැලකීමයැ ; ආරාධන, ආයාචනයැ ; අබ්භනුඤ්ඤවසෙන, අනුමතියැ යන මොවුන්ගේ වශයෙන් ; සම්පදානං, සම්ප්‍රදාන කාරකයැතෙමැ ; තිධා වුත්තං, තුන්පරිද්දෙකින් කියනලද ; රුක්ඛයාචකභික්ඛවො, වෘක්ෂයැ යාචකයැ භික්ෂුයැ (යන මෙ එහි උදාහරණයි.)

කාත්‍යායනයෙහි "**සම්පදානෙ ච**"† යන සූත්‍රයෙන් සම්ප්‍රදානාර්ථයෙහි සප්තමීවිභක්තියැයි පෙනෙයි. මෙහි චනාහි සර්වඥදිශිෂ්ටයන්ගේ ව්‍යවහාර වූපරිද්දෙන් විභක්තීන්ගේ පැවැත්මහෙයින් ඒ ඒ විභක්තීන් මැ තත්තත් අර්ථයැ ද්‍යොතනයැ කෙරෙතියි යනු අවිරුද්ධහෙයින් "සංඝෙ දෙහි" යනු ආධාරවිවක්ෂායෙහි සප්තමීයැයි කියනලදි—සංඝෙ, සඞ්ඝය හට ; දෙහි, දේ ; යි පූර්වව්‍යාඛ්‍යානකාරයෝ අර්ථ කියති, සඞ්ඝයා විෂයෙහි දේ යි යනු මෙ ව්‍යාකරණයැ ඉගැනැ අර්ථ කියන ගුරුවරයන්ගේ වාචොයුක්තියයි.

**තාදත්ථ්‍ය**[c] ~ සො අත්ථො, ඒ (විකෘතිසංඛ්‍යාතවූ) අර්ථයැ තෙමැ—තතො, ඒ (තදර්ථශබ්දයා) කෙරෙන්—නිමිත්තනිමිත්ති සම්බන්ධො, හෙතුහෙතුමද්භාවසම්බන්ධයැතෙමැ—යූපාදිවිකෘති නිමිත්තයැ දාර්වාදිප්‍රකෘති නිමිත්තීයි — පධානාවච්ඡෙද

---

* අනිරාකරණාරාධනාබ්භනුඤ්ඤවසෙන හි
සම්පදානං තිධා වුත්තං රුක්ඛයාචකභික්ඛවො.

† ක. 2, 6, 41.

[a] 2, 25 සූ. [b] 2, 26 සූ. [c] 2, 27 සූ.

ගුණස්සමා, (විධීයමානත්වයෙන්) ප්‍රධානවූ පුරුෂයාහට විශෙෂකවූ අනුද්‍යමානත්වයෙන් අප්‍රධානවූ ශබ්දයාකෙරෙන්.

"නිමිත්තං යද් නිමිත්‍යාවච්ඡෙදකතෙනුපාදීයතෙ යථා සුපාය ද්‍රව්‍ය සූපනිමිත්තං ද්‍රව්‍ය නාඤ්ඤනිමිත්තනති තතො අවච්ඡෙදකතෙන නිමිත්තස්ස උපාත්තත්තා නිමිත්තනිමිත්තිනං සම්බන්ධස්සාභිමුඛභාවෙන පවත්ති තස්සෙව නිමිත්තෙන භවතීති නිමිත්තසද්දතොව චතුත්ථී සායෙව නිමිත්තිගතම්පි සම්බන්ධමාසෙවතීති නිමිත්තිසද්දතො'පි චතුත්ථී න භවති කෙවලමත්ථමත්තෙන පඨමායෙවාවතිඨ්ඨතෙ නිමිත්තිසද්දතො හෙතුත්තියා'පි නාසංකනීයා නිමිත්තසද්දතො උප්පන්නතාය චතුත්ථියා හෙතුසම්බන්ධස්ස උපගුත්තත්තා" යි සම්බන්ධයි.

තතො ඒ (අන්‍යනිමිත්තයා)කෙරෙන්—"අඤ්ඤද් නිමිත්තං යස්ස ද්‍රව්‍යතො" යි අන්‍යපීසමාසයි—උභයත්‍ර, (සූපාය, පාකාය, යන) දෙතැන්හි—අඤ්ඤකත්තුකො, ("දෙවදත්තාය රොචතෙ මොදකො" යනාදි තැන්හි ප්‍රීයමාණවූ දෙවදත්තාදීන් කෙරෙන් අන්‍යවූ මොදකාදිකර්තෲහු ඇති—තදත්ථානං, ඒ රුච්‍යර්ථධාතූන්ගේ (කාරකයෙහි)—පීණියමානස්ස, පිනවන ලබන්නාහට—සම්පදානසඤ්ඤං විධාය, ("රුච්‍යර්ථානාම්ප්‍රීයමාණඃ"* යන සූත්‍රයෙන්)—පරෙහි, පාණිනීයයන්විසින්—"සර්ව්වා හ්‍යුපපදවිභක්තිඃ ෂෂ්ඨ්‍යපවාද" යනු භාගවෘත්තිපාඨයි—කාරකවිභක්තියැ හැර සෙසු පදන්තරයොගයෙහි විහිත සියලු විභක්ති උපපදවිභක්ති නම් වෙයි ඒ සියල්ලම ෂෂ්ඨියට අපවාදයැ යනු භාවයි—තෙසං, ඒ පාණිනීයයන්ටද—ඉහාපි, ('ත්වං' යන) මේ පදයෙහිද—ව්‍යභිචාරදස්සනත්ථං, අන්‍යත්‍ර ප්‍රවෘත්තිදර්ශනයැ පිණිසැ—අතිප්පසඞ්ගා වාති කස්ස වා ත්වං ධම්මං රොචෙසීති අද්දෙ තවාති අනභිමතඨානපත්ති'පි—උත්තමිණෙ යැයි සේයැ ; ධනසාමි යැයි සේයැ ; පයොත්තා, ධනිකතෙමැ—උත්තමං ඉණං යස්ස සො උත්තමිණෙ—සම්පදානසඤ්ඤං විධාය, ("**සිලාඝහනුඨාසපධාරපිහකුධදුභිස්සාසුයරාධිකඛපච්චාසුණ අනුපතිගිණ පුබ්බකත්තාරොචනත්ථකදත්තුමත්ථාලමත්ථමඤ්ඤානාදරප්පාණිනි ගත්‍යත්ථකම්මනි සංසස්ඨසම්මුතිභිය්‍යසත්තම්‍යත්ථෙසු ච**"† යන සූත්‍රයෙන්) සම්ප්‍රදානසංඥ කොටැ—සතං, සියයක් ; ධරති, ණය දරයි—

* පා. 1, 4, 33. † ක. 2, 6, 7.

"**ශ්ලාඝහ්නුඞ්ස්ථාශපාං ඥීප්ස්‍යමානඃ*** ~ ශ්ලාඝ හ්නුඞ් ස්ථා ශප ඉත්‍යෙතෙෂාං ඥීප්ස්‍යමානො යො'ර්ථස්තත්කාරකං සම්ප්‍රදානසංඥමභවති—ඥීප්ස්‍යමානො ඥපයිතුමිෂ්‍යමාණඃ බොධයිතුමභිප්‍රෙතඃ—දෙවදත්තාය ශ්ලාඝතෙ, දෙවදත්තාය හ්නුතෙ, තිෂ්ඨතෙ කුමාරීච්ඡාත්‍රෙභ්‍යඃ, දෙවදත්තාය ශපතෙ"—"**ස්පෘහෙරීප්සිතඃ†** ~ ස්පෘහ ඊප්සායාං, චුරාදාව දන්තඃ පඨ්‍යතෙ, තස්‍ය ඊප්සිතො යො'ර්ථස්තත්කාරකං සම්ප්‍රදානසංඥමභවති—පුෂ්පෙභ්‍යඃ ස්පෘහයති—**ක්‍රුධද්‍රුහෙර්ෂ්‍යාසූයාර්ථානාං යම්ප්‍රති කොපඃ‡** ~ අමර්ෂඃ ක්‍රොධඃ, අපකාරො ද්‍රොහඃ, අක්ෂමා ඊර්ෂ්‍යා, ගුණෙෂු දොෂාවිෂ්කරණමසූයා—ක්‍රුධාද්‍යර්ථානාං ධාතූනාම්ප්‍රයොගෙ යම්ප්‍රති කොපස්තත්කාරකං සම්ප්‍රදානසංඥමභවති—දෙවදත්තාය ක්‍රුධ්‍යති, ඊර්ෂ්‍යයෙර්ෂ්‍යති, බාන්ධවායාසූයතෙ" — "**රාධීක්ෂ්‍යොර්යස්‍ය විප්‍රශ්නඃ§** ~ රාධෙරීක්ෂෙශ්ච යත්කාරකං තත්සම්ප්‍රදානසංඥමභවති—දෙවදත්තාය රාධ්‍යති, දෙවදත්තායෙක්ෂතෙ—**ප්‍රත්‍යාඞ්භ්‍යාං ශ්‍රුවඃ පූර්වස්‍ය කර්තා‖** ~ ප්‍රත්‍යාඞ්භ්‍යාමුත්තරස්‍ය ශෘණොතෙඃ කාරකෙෂු පූර්වස්‍ය ව්‍යාපාරස්‍ය යඃ කර්තා තස්‍ය සම්ප්‍රදානසංඥා භවති—දෙවදත්තාය ගාම්ප්‍රතිශෘණොති, ආශෘණොති, ප්‍රතිජානීත ඉත්‍යර්ථඃ—**අනුප්‍රතිගෘණශ්ච¶** ~ අනුපූර්වස්‍ය ප්‍රතිපූර්වස්‍ය ච ගෘණාතෙඃ කාරකම්පූර්වස්‍යාඃ ක්‍රියායාඃ (කර්තෘභූතං) සම්ප්‍රදානසංඥමභවති—හොත්‍රෙ අනුගෘණාති, හොත්‍රෙ ප්‍රතිගෘණාති" යනාදි වෛයාකරණමතදර්ශනයැ පිණිසැ "සිලාඝහනුඨාසපාතං" යනාදි කීහු—අභ්‍යුපගමවුත්තිත්තා, ප්‍රතිඥාවෙහි පවත්නාබවහෙයින්—"**මන්‍යව්‍යාප්‍යෙ කුත්සායාමනාවාදෞ වා**** ~ මන්‍යතෙර්ව්‍යාප්‍යෙ නාවාදිවර්ජිතෙ කුත්සායාං ගම්‍යමානායාං චතුර්ථී වා භවති—න ත්වා තෘණාය මන්‍යෙ, න ත්වා තෘණම්මන්‍යෙ"—යන මේ ආදි දක්වන පිණිසැ "මඤ්ඤතිප්පයොගෙ" යනාදි කීහු.

"ඛීයෙය්‍යසොමත්තාය" සී විභත්ත්‍යන්තපදප්‍රතිරූපක නිපාතපදයෙකැයි යනු ආචාර්‍ය්‍යයන්ගේ අභිප්‍රාය වුවද 'මත්තාය' යන තැන්හි "මත්තාසුඛපරිච්චාගා" යනාදියෙහි මෙන් ස්ත්‍රීලිඞ්ගයෙහි වැටෙන්නාවූ මත්තාශබ්දයා කෙරෙන් පඨමීවිභත්ති

---

* පා. 1, 4, 34. † පා. 1, 4, 36. ‡ පා. 1, 4, 37. § පා. 1, 4, 39.
‖ පා. 1, 4, 40. ¶ පා. 1, 4, 41. ** ව්‍යාකරණාන්තරයෙක්හි.

වුත්තැති—"භීය්‍යොසොති ඉදං භීය්‍යොසද්දෙන අතිරෙකත්ථ වාචකෙන නිපාතෙන සමානත්ථං නිපාතපදං." යි පුරාතනයන් කීහෙයින් "භීය්‍යොසො" යනුද අතිරෙකාර්ථවාචකවූ භීය්‍යො ශබ්දයා හා සමාන නිපාතපදයෙකැයි යනු යුක්තයි—මාත්‍ර යෙන් අධිකයැයි අර්ථ කියයුතු—පුරාතනාර්ථකථාචාර්‍ය්‍යවර යෝද "භීය්‍යොසොමත්තායාති අතිරෙකප්පමාණෙන" යි කීහු—රූපසිද්ධිසන්න්‍යගැටපදකාරයෝ "මත්තාය, පමණට; සො, එතෙමැ; භීය්‍යො, බොහෝ වියැ" යි අර්ථ කීහ. එසේ කීකල්හි මෙහි "එත්ථ භීය්‍යොසොමත්තාය" යනාදීන් දක්වන ලද පුනරුක්තදෝෂයැ පැමිණෙයි දතයුතු—"ආවිකරණපාතු භවනාදියොගෙ සති සත්තම්‍යන්තෙ'පි" යි සම්බන්ධයි—චග්ගහ ණෙන, (සිලාඝාදි සූත්‍රයෙහි) චග්‍රහණයෙන්—පහිණාදිශබ්ද යෙන් "කප්පති, පහොති, කරිස්සාමි, පගණ්හාමි" යනාදියද ආසුආදිශබ්දයෙන් "මණ්නා මෙ අත්ථො" යනාදියෙහි අත්ථ ශබ්දයද සඞ්ගෘහීතයි—චතුත්ථී අභිමතා, ("**නමොයොගාදිස්ව පි ච**"* යන සූත්‍රයෙන්)—සත්තො, ප්‍රබලයැ යන අර්ථයි.

**පච**[a]—විසෙසානුපාදානතො, ('අවධිසමා' යි සාමාන්‍ය යෙන් විහිතබවමුත් අසවල්දෙයකට අවධිවූයේයි) විශෙෂ ග්‍රහණයක් නොකිරීමෙන්ද.

"යතො'වධීයතෙ කිඤ්චිත්ක්‍රියාපූර්වං කුතශ්චන
විශ්ලිෂ්‍යතෙ චලමාන්‍යමවධිං තම්ප්‍රචක්ෂතෙ—
නිර්දිෂ්ටවිෂයඃ කශ්චිදුපාත්තවිෂයස්තථා
අපෙක්ෂිතක්‍රියශ්චෙති ත්‍රිධා'වධිරිහොච්‍යතෙ"—

යනු අවධිලක්ෂණකාරිකායි.

යතඃ කුතශ්චන, යම්කිසි අර්ථයකින්; කිඤ්චිත්, කිසි වස්තු යෙක්; ක්‍රියාපූර්වම්, ක්‍රියාව පූර්වඞ්ගම කොටැ; (ගමනාදානාදි ක්‍රියා නිමිත්ත කොටැ;) අවධීයතෙ, (අතිකත්හු විසින්) වෙන් කරනුලැබේද; විශ්ලිෂ්‍යතෙ, (තෙමේ තමාවිසින්) වෙන්කරනු ලැබේද; චලම්, චලවූද; අන්‍යම්, අචලවූද; තම්, ඔහු; අව ධිම්, අවධියැයි; ප්‍රචක්ෂතෙ, කියත්.

කශ්චිත්, කිසි අවධියෙක්; නිර්දිෂ්ටවිෂයඃ, ("ගාමා අපෙ න්ති" යනාදියෙහි මෙන්) දක්වනලද ක්‍රියාව විෂය කොටැ

---

* ක 2, 6, 24.    [a] 2, 28 සූ.

ඇත්තේයැ ; කශ්චිත්, කිසි අවධියෙක් ; උපාත්තවිෂයඃ, ("වලාහකා විජ්ජෝතතෙ" යනාදියෙහි මෙන්) අධ්‍යාහාර කරනලද ක්‍රියාව විෂය කොටැ ඇත්තේයැ ; තථා, එසේමැ ; කශ්චිත්, කිසි අවධියෙක් ; අපෙක්ෂිතක්‍රියශ්චෙති, ("මාධුරා පාටලිපුත්තකෙහි අභිරූපා" යනාදියෙහි මෙන්) සිතාගන්නා ලද ක්‍රියාව ඇත්තේයැයි කියා ; ඉහ, මේ ශාස්ත්‍රයෙහි ; අවධිඃ, අවධිතෙමැ ; ත්‍රිධා, තුන්පරිද්දෙකින් ; උච්‍යතෙ, කියනු ලැබේ.

"**භීත්‍රාර්ථානාම්භයහෙතුඃ**"* යනාදීන් ප්‍රපඤ්ච පිණිසැ පාණිනියෙහි අපාදානසංඥාවිධානවචනයෙන් සිඬකරනලද ප්‍රයොගද ශිෂ්‍යානුග්‍රහය පිණිසැ "එවං චොරස්මා භායති" යනාදි උදාහරණවශයෙන් දක්වූහු — තතො, ඒ භයහෙතුහු කෙරෙන් — තෙසං, ඒ භයත්‍රාණ දෙදෙනා — "පරාපුබ්බස්ස" යනාදීන් "**පරාජෙරසොඪඃ**" † යන සංඥාසූත්‍රයැ ප්‍රත්‍යාඛ්‍යාන කෙරෙත් — "**වාරණාර්ථානාමීප්සිතඃ**"‡ යන සංඥාසූත්‍රයද "වාරණත්ථානං" යනාදීන් ප්‍රතික්ෂෙප කෙරෙත් — වාරණත්ථානමිච්ඡිතො පවත්තිවිඝාතලක්ඛණස්ස වාරණස්ස අවධියෙචෙති සම්බන්ධො — පවත්තිවිඝාතලක්ඛණස්ස, (ගවයන් යවයන් කරා) පැමිණීමැ වැලැක්මස්වභාව කොටැ ඇති — "ඉච්ඡිතතමා ගාවො කම්මභූතා ඉති වාරණස්ස අවධිභූතා න ඉති" යී සම්බන්ධයි — කම්මභූතා ඉති, (යම්හෙයකින්) ක්‍රියාප්‍රාප්‍යවූවාහුද එහෙයින් — විසෙසවිධානෙ, ("ඊප්සිතඃ" යන) විශෙෂවිධානයක් ඇතිකල්හි — පඤමීහිමතා, ("**රක්ඛණත්ථානමිච්ඡිතං**"§ යන සූත්‍රයෙන්) — ආමනන්ති, කියත් — "**අන්තර්ධෞ යෙනාදර්ශනමිච්ඡති**"‖ යන සංඥාසූත්‍රයෙක් ප්‍රාරබ්ධයැ එහෙයින් "අන්තරධා" යනාදි කීහු — ව්‍යවධානනිමිත්තං, මුවහවීමට කාරණයි — "අයමුපජ්ඣායො යදි මං පස්සති" යී සම්බන්ධයි — යෙන උපජ්ඣායෙන, යම් උපාධ්‍යායයක්හු විසින් — "අන්තරධායති කිම්, චොරාන් න දිදෘක්ෂතෙ" යී ප්‍රත්‍යුදාහරණ කරනලද, තත්ප්‍රතිපාදනයැ පිණිසැ "යථා අදස්සනං" යනාදි යුහු — "උපඝාතනිවත්තියා ඉච්ඡිතං" යී සම්බන්ධයි — උපඝාතනිවත්තියා, උපද්‍රවනිවාරණයැ පිණිසැ — වත්තුමිච්ඡිතාති, විවක්ෂිතයැයි

* පා. 1, 4, 25. † පා. 1, 4, 26. ‡ පා. 1, 4, 27.
§ ක. 2, 6, 3. ‖ පා. 1, 4, 28

කියා—චොරෙ, සොරුන්—"ඉච්ඡතිග්‍රහණං කිමර්ථම්, අදර්ශනෙච්ඡායාං සත්‍යාං සත්‍යපි දර්ශනෙ යථා ස්‍යාත්" යි කියනලද්ද, තත්ප්‍රතිපාදනයැ පිණිසැ "අදස්සනිච්ඡායං" යනාදි කීහු—සතිපි දස්සනෙ, (උපාධ්‍යායයා විසින්) දැකීමැ ඇතිකල්හිද—තතො, ඒ (උපාධ්‍යායයා) කෙරෙන්—අවධිරූපතා එව, (උපාධ්‍යායයාගේ) අවධිස්වරූපයැ මැ වේ—"උපයොගෙ" යනාදීන් "**ආඛ්‍යාතොපයොගෙ**"* යන පාණිනියසූත්‍රයෙන් දක්වන ලද අපාදානසංඥද අවධියට මැ ඇතුළත් කෙරෙත්—තතො, ඒ ආඛ්‍යාතෘහු කෙරෙන්—"**ජනිකර්තුඃ ප්‍රකෘතිඃ**"† යන සංඥසූත්‍රයෙහි අර්ථයැ "ජන්‍යත්ථස්ස" යනාදීන් දක්වත්—ජන්‍යත්ථස්ස, යැයි සේයැ; ජාතියා, ජනමයැ සම්බන්ධ වැ—තතො, ඒ (ජනිකර්තෘහෙතුහු) කෙරෙන්—ජාතිපටිලාභා, ඉපැදීම ලබනහෙයින්—තත්‍රට්ඨානං ගහණං, (මඤ්චශබ්දයෙන් මඤ්චස්ථයන්ගේ ග්‍රහණයැ මෙන් තත්‍රශබ්දයෙන්) තත්‍රස්ථයන්ගේ ග්‍රහණයයි—උපයොගො, නියමපූර්වක විද්‍යාග්‍රහණයෙක්—ලොකියාච, අනන්‍යථාවාදි ව්‍යවහර්තෘජනප්‍රතිබද්ධ වන්නේමයැ—"ඉහොභයෙ ලොකාඃ ශාස්ත්‍රකාරා ඉතරෙ'පි" යනුහෙයින් ශාස්ත්‍රකාරයෝද ඉතරජනයෝද ලොකනම් වෙති, මෙහි ප්‍රමාණභූතවූ ශාස්ත්‍රකාරයන්ට ලොකයයි කීහු—"ලොකෙ භවා ලොකියා" යි විග්‍රහයි—තස්සා, ඒ වක්තෘප්‍රතිබද්ධවූ ස්වෙච්ඡාවිවක්ෂාව තමා—අනවට්ඨානතො, අව්‍යවස්ථානහෙයින්—'භවතිස්ස' යනාදියෙන් "**භුවඃ ප්‍රභවඃ**"‡ යන සූත්‍රාර්ථයැ දැක්වූහු—පභවතො, පළමුවෙන් පහළවනතැනින්—'විරමණත්ථ' යනාදියෙන් "**ජුගුප්සාවිරාමප්‍රමාදාර්ථානාමුපසංඛ්‍යානම්**" යි කියනලද වාක්‍යාර්ථයැ කීහු—"**අන්‍යාරාදිතරර්තෙදික්ශබ්දාඤ්චූත්තරපදාජාහියුක්තෙ**" §යි සූත්‍රිතයැ 'අඤ්ඤදාදිසද්දයොගෙ" යනාදීන් තද්‍යුක්තයි—"ආරාද්දූරසමීපයොඃ" යනුහෙයින් මෙතැන්හි ආරාශබ්දය දූරාර්ථවාචීයි—"නිද්දිස්සමානපටියොගී" යන්නෙහි "දෙවදත්තතො සූරො" යනාදීන් නිර්දිශ්‍යමානවූ කිසිවක්හට දෙවැනිවූ "ඉතරො කතරො" යනාදීන් ඉතරාදිශබ්දයෙන් වාච්‍යවූ යම් එකෙක් ඇත්ද එතෙමැ ප්‍රතියොගී නම් වේ—දිසාදෙසකාලවාචීනං, (අන්‍යාදි

* පා. 1, 4, 29. † පා. 1, 4; 30.
‡ පා. 1, 4, 31. § පා. 2, 3, 29.

ශබ්දයෙහි දික්ශබ්දත්වයෙන් පරිගෘහීතවූ) දිග්දෙශකාල වාචීන්ගේ—පඤ්චම්භිමතා, (“**ල්‍යබ්ලොපෙ කම්මණ්‍යුපසංඛ්‍යා නම්**” “**අධිකරණෙ චොපසංඛ්‍යානම්**” යන මෙයින් වාර්ත්තික කාරයන්ට) පඤ්චමී අභිමතයැ—තතො, ඒ (ප්‍රාසාදයෙන්)—තං දස්සනං, ඒ (ප්‍රෙක්ෂකයාගේ) චක්ෂුරින්ද්‍රියයැ—මෙතැන්හි ‘දස්සනං’ යනු දැකීම නොවෙයි චක්ෂුරින්ද්‍රියයි—උක්ත මැ නෝ භාෂ්‍යප්‍රදීපයෙහි කය්‍යටයන්විසින්—“අපක්‍රාමති තත්තාසමා දිති, දර්ශනචක්ෂුරින්ද්‍රියනෙත්‍රාජෝ රූපම්ප්‍රාප්‍ය විෂයග්‍රාහිත්වාත්ප්‍රා සාදදෙශාදපක්‍රම්‍ය විෂයං ගච්ඡතීත්‍යර්ථඃ” යි—යෙසං, (යම් නෛයායික වෛශෙෂික) කෙනකුන්ට—අධිඨානදෙසං, ඉන්ද්‍රියාධිෂ්ඨානවූ (චක්ෂුර්ගෝලක) දෙශයැ—විසයප්පවත්ති, රූපාදිගොචරයෙහි පැවැත්මැ—සන්තතියා, ඉන්ද්‍රියප්‍රබන්ධ යෙන්—“අධිඨානං අනින්ද්‍රියං නාපජ්ජතෙ” යි සම්බන්ධයි—තතො, ඒ ප්‍රාසාදයෙන්—අපක්කන්තත්‍ය, පහවීමෙන්—ඵුටො, ව්‍යක්තයි ; ප්‍රකාශයැයි සේයි—ඛණිකාති, ක්ෂණභඞ්ගයෝද—පත්තකාරීනි, ප්‍රාප්තවිෂයයෙහි විඥානලක්ෂණවූ කාර්‍ය්‍ය කරන සුලුවූවාහු—නානින්ද්‍රියාධිඨානදෝසොති අධිඨානං අනින්ද්‍රියං ආපජ්ජතීති අයං දෝසො නත්‍ථෙව—සියලු ශබ්දශාස්ත්‍ර යෙහි දක්වනලද උදාහරණදර්ශනයැ පිණිස “සබ්බමෙතං පරසමයෙ” යනාදි කියනලදි—යොගගදෙසෙ, දර්ශන යොග්‍යප්‍රදෙශයෙහි—“**ප්‍රශ්නාඛ්‍යානයොශ්ච පඤ්චමී වක්තව්‍යා**” යි කීහෙයින් “පුච්ඡනසද්දතො” යනාදි කීහු—අව ධිස්ස (“කුතො පාටලිපුත්තස්මා” යන) අවධියැ—‘කස්ස’ යනු ප්‍රශ්නයැ ‘දෙවදත්තස්ස’ යනු ආඛ්‍යානයැයි—“කො සො යඤ්ඤදත්තො” යනු විධිරූප ප්‍රශ්නයැ “යො‘ඞ්ගදී” යනාදි අනුවාදරූප විසජ්ජනයැයි—අඞ්ගදී, කෙයූරාභරණ ඇත් තේද—‘කෙයූර’ නම් බාහුපූරියයි—“**යතශ්චාධ්වකාලනිර්මාණං තත්‍ර පඤ්චමී වක්තව්‍යා**” යි සූබැවින් “අධා” යනාදිකීහු—“සත්තයොජනානි” යනාදීන් “**අධ්වනඃ ප්‍රථමා සප්තමී ච වක්තව්‍යා**” යන වචනයැ නිරර්ථකයැයි දක්වත්—“සම්බන්ධෙ ඡඨී”, යන මෙයින් “**තද්‍යුක්තාත්කාලෙ සප්තමී වක්තව්‍යා**” යන වචනයැ ප්‍රතික්ෂිප්තයි—“යදා” යනාදීන් “**කාරණෙ ච ස්තොකාල්පකෘච්ඡ්‍රකතිපයස්‍යාසත්ත්වවචනස්‍ය**”* යන පරසූත්‍රාභිප්‍රාය

---

* පා. 2, 3, 33.

දක්වත් — අසත්තරූපං, අද්‍රව්‍යරූපවූ — තබ්බති, ඒ ගුණයෙන් යුක්තවූ—යථාවුත්තවිධානෙන, ("ගුණෙ" [a] යන සූත්‍රයෙහි) කියනලද ක්‍රමයෙන්—"කරණෙ තතියාපඤ්චමීවිධානං න කාතබ්බං" යි සම්බන්ධයි.

"අබ්‍යත්තෙනොච්චමානස්ස කත්තබ්බරූපස්ස චලනස්ස ථොකගුණෙන සමානාධිකරණත්තෙන විසෙසනං" යි සම්බන්ධයි—"ථොකං චලති" යන මෙහි "සර්වෝ හි ධාත්වර්ථඃ කරොත්‍යර්ථෙන ව්‍යාප්තඃ" යනු හෙයින් "චලනං කරොති" යනු අර්ථයැ එහෙයින් 'චලනං' යනුද "කර-කරණෙ" යන ධාතුහුගේ ක්‍රියාවට කර්මයැ ඒ 'චලනං' යන කර්මපද යද භාවයෙහි වූ අනප්‍රත්‍යයන්ගේ නපුංසකලිඞ්ගබව හෙතු කොට ගෙනැ නපුංසකලිඞ්ග වෙයි චලනමාත්‍රයාගේ අනෙකත්වයෙහි යෙදීමක් නැතිහෙයින් එකවචනාන්තද වෙයි 'ථොකං' යනුද ඒ 'චලනං' යන්නට විශෙෂණහෙයින් ක්‍රියා විශෙෂණ නම් වී.

එහෙයින් මැ කීහ සම්බන්ධචින්තායෙහි.

"ක්‍රියාවිසෙසනං යන්තු තං සබ්බම්පි නපුංසකෙ
දුතියායෙකවචනං ගති තස්ස හි තාදිසී" — යි.

"දූරන්තිකත්ථෙ" යනාදීන් 'පඤ්චමී' යනු වැටෙන්නෙහි "**දූරාන්තිකාර්ථෛඃෂෂ්ඨ්‍යන්‍යතරස්‍යාම්**" * යන සූත්‍රයෙහි අභිප්‍රාය දක්වූහු—දූරාන්තිකාර්ථශබ්දයන්කෙරෙන් ප්‍රාතිපදිකාර්ථයෙහි "**දූරාන්තිකාර්ථෙභ්‍යො ද්විතීයා ච**" † යන සූත්‍රයෙන් ද්විතීයා තෘතීයාපඤ්චමීවිභක්තිද "**සප්තම්‍යධිකරණෙ ච**" ‡ යන සූත්‍රයෙහි චකාරයෙන් සප්තමීවිභක්තිද විහිතයැ. "දූරං ග්‍රාමස්‍ය, දූරෙණ ග්‍රාමස්‍ය, දූරාද්ග්‍රාමස්‍ය, දූරෙ ග්‍රාමස්‍ය" යනු එහි උදාහරණයැ. තදුපදර්ශනයැ පිණිසැ වෘත්තියෙහි "කෙචි" යනාදි කීහු—"දූරා පානාවසෙචනා" යන තෙක් කියා "අයං තෙසං පටික්ඛෙපනයො" යි සම්බන්ධකරනු—"කප්පෙතුං නච සක්කා" යි සම්බන්ධයි—තං, ඒ අසද්‍රූපවූ දූරාදියැ—"(නහි තං ගම්‍යතෙ)§ නහි තතො ගම්‍යතෙ, නහි තෙන ගම්‍යතෙ, නහි තස්මිං සීයතෙ" යි වෙන වෙන සම්බන්ධයි—තශබ්ද සත

* පා. 2, 3, 34. † පා. 2, 3, 35. ‡ පා. 2, 3, 36.

§ මේ ද්විතීයා පක්ෂය පඤ්චිකාටීකාගත නයින් ප්‍රයුක්තයි.

[a] 2, 23, ස.

රින් මැ අසත්වරූපවූ දූරාදියැ විවක්ෂිතයි—“දූරං ගාමස්සාති ආදිවාක්‍යතො ඉමෙ කම්මාදයො අත්‍ථා පතීයන්තෙ ච” යි සම්බන්ධයි—“අතො ච” යන්නෙන් වක්ෂ්‍යමාණ හෙතුපරාමර්ශයැ කෙරේ—යං (යස්මා), යම්හෙයකින්—වාක්‍යකාරෙ, වරරුචිතෙමැ—තං සමානාධිකරණ්‍යතො, ඒ (දූරාදි) සමානාධිකරණභාවයාකෙරෙත්—තංයුත්තාතොපි, ඒ දූරාදියුක්තවූ (ග්‍රාමාදි ශබ්දයන්) කෙරෙන්ද—පච්චක්ඛනෙත්තා, (වාක්‍යකාර වචනයැ) නිරාකරණයැ කරන්නේ—“දූරාන්තිකාර්ථෙභ්‍යඃ පඤ්චමීවිධානෙ තද්‍යුක්තාත්පඤ්චම්‍යාඃ ප්‍රතිෂෙධො වක්තව්‍යඃ, දූරාද්ග්‍රාමස්‍ය, න වා තත්‍රාපි දර්ශනාදප්‍රතිෂෙධඃ, අනර්ථකඃ ප්‍රතිෂෙධො'ප්‍රතිෂෙධඃ, න වා තත්‍රාපි දර්ශනාත්පඤ්චම්‍යාඃ ප්‍රතිෂෙධො'නර්ථකඃ, තත්‍රාපි හි පඤ්චමී දෘශ්‍යතෙ,

දූරාදාවසථාන්මූත්‍රං දූරාත්පානාවසෙචනාත්,
දූරාච්ච භාව්‍යං දස්‍යුභ්‍යො දූරාච්ච කුපිතාද්ගුරොඃ”

යනු මෙතැන්හි භාෂ්‍යපාඨයි—මේ පාඨයෙහි “දූරාන්තිකාර්ථෙභ්‍යඃ—පෙ—වක්තව්‍යඃ” යනු වාක්‍යකාරවචනයැ. “දූරාද්ග්‍රාමස්‍ය” යනු එහි උදාහරණයැ, “තත්‍රාපි දර්ශනාත්” යනාදියැ ප්‍රත්‍යාඛ්‍යානභාෂ්‍යයි—“දූරාදාවසථාදිති ආවසථස්‍ය දූර ඉත්‍යර්ථඃ” යනු භාෂ්‍යප්‍රදීපයෙහි කෛය්‍යටාචාර්‍ය්‍යයන්විසින් කියනලද අර්ථයි—පටිවිධාතුං, පරිහාර කියනු පිණිසැ—භවති, භූධාතු තෙමැ—නාතිපතතීති, ඉක්මැ නොපවතීනුයි—“**දූරන්තිකද්ධකාලනිම්මානත්වාලොපදිසායොගවිභත්තාරප්පයොගසුද්ධප්පමොචනහෙතුවිවිත්තප්පමාණපුබ්බයොගබන්ධනගුණවචනපඤ්හකථනථොකාකත්තූසු ච**”* යන කසයින් සූත්‍රයෙන් සුද්ධප්පමොචනාදියොගයෙහිද “**ධාතුනාමානමුපසග්ගයොගාදීස්වපි ච**”† යන සූත්‍රයෙහි චග්‍රහණයෙන් පභුතියොගයෙහිද එම දූරන්තිකාදිසූත්‍රයෙහි චශබ්දයෙන් ප්‍රමාණාර්ථයෙහි තෘතීයාද; විධීයතෙ.

**අප**[a] ~ වජ්ජනෙ සම්බන්ධෙ, වජ්ජනසංඛ්‍යාත සම්බන්ධයෙහි—වත්තමානෙහි, වැටෙන්නාවූ (අප පරි යන උපසර්ගයන්) දෙදෙනා හා—යදත්ථො, යම් ශාලාදියක් ප්‍රයොජන කොටැ ඇති; ක්‍රියාරම්භො, යම් වර්ජනක්‍රියාරම්භයෙක්

* ක. 2, 6, 5. † ක. 2, 6, 2.
[a] 2, 29 සූ.

ඇත්ද—"**පඤ්චම්‍යපාඞ්පරිභිඃ**"* යන සූත්‍රයෙන් අඞ්යුක්තයැ හටද පාණිනීයෙහි පඤ්චමී විහිතයැ, "මරියාදායං" යනාදි තද් පදර්ශනයයි—යං ආඅසංඛ්‍යං, යම් ආ යන අව්‍යයෙක්—අවධි මත්, අවධිමත්හුවිසින්—මරියාද, සීමායැ ; අවධි, අභිව්‍යාප්තියැ (යන මේ දෙදෙනාගේ.)

**පති**[a]—දිඨසම්බන්ධස්ස, ප්‍රසිද්ධවශයෙන් දක්වනලද කාර්‍ය්‍ය කාරණසම්බන්ධ ඇති—"තස්මිං පටිනිධිම්හි පටිදානෙ ච වත්ත මානෙන පටිනා" යි සම්බන්ධයි—යො පටිනිධි, යම් මුඛ්‍යසදෘශ යෙක් ඇත්ද—විනිමයෙ, ද්‍රව්‍යපරිවර්ත්තනයැ නිමිත්තකොටැ ගෙනැ—"පතිනා තස්ස යොගො" යි සම්බන්ධයි.

**රිතෙ**[b]—පටිපදවිධානා, සාක්ෂාදුච්චාරිතවිධාන ඇති හෙවත් විශෙෂවිධානවත්වූ—මෙහි විශෙෂවිහිතවූ පඤ්චමීවිභ ක්තියෙන් ද්විතියාවිභක්තියට බාධානොවීම මැ දුතියාවචනයට ප්‍රයොජන වීනම් "**රිතෙ වා**" යි කියා සූත්‍ර බැඳිකල්හි පක්ෂ යෙකැ ද්විතීයාත් පැමිණෙයි සූත්‍රයත් ලඝුකොටැ කියනලද්දේ වෙයි යන චොද්‍යයැ ආශඞ්කා කොටැ "උත්තරත්ථං" යනාදි කීහු—අතො එව, ඒ උත්තරාර්ත්ථත්වයෙන් මැ—ආහච්චවචනං, කණ්ඨතාල්වාදි ව්‍යාපාරයෙන් කීමැ ; හෙවත් සාක්ෂාද්වචනයැ; ඉදුරා කීමැ—විභත්ත්‍යන්තරව්‍යුදාසත්ථං, ෂෂ්ඨීවිභක්තිනිරාසය පිණිසද (වේ)—අඤ්ඤදා, විභත්තිපි, (ද්විතීයායෙන්) අන්‍යවූ (ෂෂ්ඨී) විභක්තිද—පකතසම්බන්ධනත්ථා, ප්‍රස්තුතවූ (පඤ්චමී) සම්බන්ධයැ කිරීමැ ප්‍රයොජන කොටැ ඇත්තේයි.

**විනා**[c]—මේ සූත්‍රයට "**රිතෙ**" යන අනුවර්ත්තනයෙන් රිතෙශබ්දයාගේ යොගයෙහිද "රිතෙ සද්ධම්මෙන" යනාදීන් තෘතීයාවිභක්ති කටයුතු.

**පුථු**[d]—යොගවිභාගතො, ("විනාඤ්ඤත්‍රපුථුනානාහි තති යා ච" යි එකයොග නොකොටැ) සූත්‍ර වෙන්කිරීමෙන්—හෙ දෘපාදානං, ("විනාදීහි" යි නොකියා) වෙන වෙන නාම ග්‍රහණයැ—"**පෘථග්නානාභ්‍යාම්**†—එතාභ්‍යාං යොගෙ තෘතී යා ච භවති පඤ්චමී ච—පෘථග් දෙවදත්තෙන, පෘථග් දෙව දත්තාත්, නානා දෙවදත්තෙන, නානා දෙවදත්තාත්"—යන

---

* පා. 2, 3, 10. † චාන්ද්‍ර.

[a] 2, 30 සු. [b] 2, 31 සු. [c] 2, 32 සු. [d] 2, 33 සු.

චාන්ද්‍රවෘත්තිපාඨයැ ව්‍යාඛ්‍යාන කරන රත්නමතිපාදයන්විසින් “ තෘතීයා චෙති වර්ත්තතෙ, තත්‍ර චකාරෙණ ප්‍රකෘතා පඤ්චම්‍යපි සම්බධ්‍යතෙ න විතීයා'පි පූර්ව්වත් යොගවිභාගාත් විනාදය ශෙෂවතෙ අසහායෙ වර්ත්තනෙත භෙදෙපාදනතත්‍ර පර්ය්‍යාය නිවෘත්ත්‍යර්ථම් ” යන ක්‍රමයැ ආශ්‍රය කොටැ මේ පඤ්චිකාකාර ආචාර්ය්‍යයන්විසින්ද “ භෙදෙපාදනතත්‍ර පරියායනිවත්තනත්‍ථං ” සී කියනලද්ද එසේ කීමැ පෘථක්පර්ය්‍යායවූ හිරුක්ශබ්දදීන්ගේ යොගයෙහි “ හිරුක් දෙවදත්තස්‍ය, විශ්වක් දෙවදත්තස්‍ය ” සී ෂෂ්ඨීවිභක්තිවනබව මුත් පඤ්චමීතෘතීයා නොවන හෙයින් සංස්කෘතයට යෙදෙයි මගධභාෂායෙහි පෘථක්පර්ය්‍යායවූ විසුංශබ්දයාගේ යොගයෙහිද “ තෙහි විසුං, තතො විසුං ” සී පඤ්චමීවිභක්ති පෙනෙයි එහෙයින් ආචාර්ය්‍යයන්ගේ අභිප්‍රාය යුක්තායුක්තවශයෙන් පරීක්ෂාකොටැ ගතයුතු—“ භෙදෙපාදනං ” යනාදි වාක්‍යාරම්භයට අභිප්‍රාය දක්වන සඞ්ඝරක්ෂිත මහාස්වාමීන්විසින් “ අසහායත්තත්‍යෙ සති විනාත්‍යෙඨිතෝ‍යවමවත්‍ථා කිං විසුං සුත්තාරචනායෙත්‍යාහ භෙදෙපාදනතත්‍රිච්චාදි ” යන ස්වවචනයෙහි මැ ‘ විසුං ’ යන පෘථක්පර්ය්‍යායශබ්දයට පඤ්චමීප්‍රයොග ඇතිනැතිබව කල්පනා නොකොටැ ශ්‍රීශාරීපුත්‍රමහාස්වාමිපාදයන් රත්නමතිපඤ්චිකාලඞ්කාරයෙහි “ යද්‍යසහායාර්ථා එතෙ විනාදයඃ, එවං තර්හි විනාශෛපීරිත්‍යෙව වක්තව්‍යම්, කිං භෙදෙපාදනෙනෙත්‍යාහ භෙදෙපාදනමිත්‍යාදි ” සී සංස්කෘතයට වදාළ ව්‍යාඛ්‍යානපදාභිප්‍රාය භාෂාව පෙරළා කියනලද්දයි දතයුතු.

**සත්ත** [a]—— ආධාරෙ, “ කත්තාරං කම්මඤ්ච ක්‍රියානිස්සයභූතමාධාරයතීත්‍යාධාරෙ ” සී කර්ත්තෘයෙහි ඝඤ්ප්‍රත්‍යයෙන් සිඩයි.

එහෙයින් කීහ :—

“ ආධාරයති යඃ කර්ත්තෘ ව්‍යාප්‍ය ව්‍යාපාරසදමනි
ආධාරං කාරකමප්‍රාහුස්තච්චතුර්ව්විධමෙව ච ” —— සී.

යඃ, යම් (අර්ථයෙක්) තෙමැ ; ව්‍යාපාරසදමනි, ක්‍රියාවට ආශ්‍රය වූ; කර්ත්තෘව්‍යාප්‍ය, කර්ත්තෘකර්ම්ම දෙදෙනා; ආධාරයති, ධරාද ; තම, ඒ පදාර්ථයැ ; ආධාරං කාරකමප්‍රාහුඃ, ආධාරකාරකයැයි

[a] 2, 34 සූ.

කියති ; තඤ්චතුබ්බිධමෙවච, ඒ ආධාරකාරකයද චතුබ්බිධවූ වා මැ කියත්.

සමහරකෙනෙක් "ආධාරීයන්තෙ කත්තුකම්මසමවෙතා ක්‍රියා අස්මිං ආධාරෙ" කියා අධිකරණසාධනයෙන්ද වාක්‍ය ගත්හු—ක්‍රියානිමිත්තස්සෙව, (කර්තෘකර්මසමවායිනිවූ) ක්‍රියාවගේ නිමිත්තය මැ—"ක්‍රියම්පි ධාරෙතියෙව" යන්නෙහි "කටෙ නිසීදති දෙවදත්තො, ථාලියං ඔදනං පචති" යනාදියෙහි කටථාල්‍යාදිතෙමැ කර්තෘකර්මවූ දෙවදත්තතණ්ඩුලාදීන් ධැරීමෙන් ඔවුන් සම්බන්ධවූ ආසනපචනාදි ක්‍රියාවද ධරන්නේ නම් වෙයි යනු භාවයි—ගඞ්ගාසමීපස්ස ආධෙය්‍යස්ස අපෙක්ඛාය ගඞ්ගාය අධිකරණභාවො සම්භවතො න" යි සම්බයි—ගඞ්ගාසමීපස්ස, ගඞ්ගාසමීපස්ථවූ.

**නිමිත්තෙ**[a] ~ ඉච්ඡන්ති, ("**නිමිත්තාත්කර්මසංයොගෙ**" "**නිමිත්තාච්‍යපේ‍ය**" යනාදි වචනයෙන්) කැමැති වෙති.

**සභා**[b] ~ යස්ස ක්‍රියා, යම් (ගවාද්‍යර්ථයක්හු) සම්බන්ධවූ (දෝහනාදි) ක්‍රියාතොම—ක්‍රියාන්තරස්ස, (ගමනාදි) ක්‍රියාන්තරයක්හට ; උපලක්ඛණං, චිහ්නද—"කාලභෙළුහි" යනාදීන් කාත්‍යායනයෙහි "**කාලභාවෙසු ච**"* යන සූත්‍රයෙන්ද කාතන්ත්‍රයෙහි "**කාලභාවයොස්සප්තමී**"† යන සූත්‍රයෙන්ද කාලාර්ථයෙහි සප්තමීවිහිතබව දක්වත්.

**ජටසී**[c] ~ ආකොටයන්තො—පෙ— පෙක්ඛතො ~ සිවිරාජස්ස, සිවිරාජයා ; පෙක්ඛතො, බලබලාසිටියදී ; සො, එතෙමැ ; ආකොටයන්තො, තළමින් ; නෙති, ගෙනයෙයි ; කියාද අපි කියැයුතු—අභිමතා, ("**ස්වාමීශ්වරාධිපතිදායාදසාක්ෂිප්‍රතිභූප්‍රසූතෛශ්ච**"‡ යන සූත්‍රයෙන් පාණිනීන්ට)—"සාමිස්සරාධිපතීනං—පෙ—රාජෙති" යනු ජිනෙන්ද්‍රබුද්ධිපාදයන්ගේ මත දර්ශනයයි—සත්තමී ච, ("ගාමෙ රාජා" යි කියා) සප්තමීවිභක්තිද—අභිමතා, ("**ආයුක්තකුශලාභ්‍යාංචාසෙවායාම්**"§ යන සූත්‍රයෙන් පාණිනීන්ට)—තෙනෙව, (කාත්‍යායනසූත්‍රයෙහි පසූතශබ්දයට අනතුරුකොටැ) කුසලශබ්දනිර්දේශයැ කළහෙයින් මැ ; ඉධාපි, මේ වෘත්තියෙහිද—අභිමතා, ("**කාමම**

---

* ක. 2, 6, 43. † කා. 2, 4, 34. ‡ පා. 2, 3, 39. § පා. 2, 3, 40.

[a] 2, 35 සු. [b] 2, 36 සු. 2. 37 සු.

**කරණනිමිත්තලක්ඛණෙසු සත්තමී**"* "**පඤ්චම්‍යත්ථෙ ච**"† යන සූත්‍ර දෙකින්)—භික්ඛුසු, භික්ෂූන්; අභිවාදෙන්ති, වඳිත්; මුද්ධනි චුම්බිත්වා, මුදුන සිඹැ; බාහාසු, අත්; ගහෙත්වා, ගෙනැ; නොහොත්; බාහාසු, බාහූන්; ගහෙත්වා, ගෙනැ; භික්ඛුසු, භික්ෂූන්; අභිවාදෙන්ති, වඳිත්; හත්ථෙසු, හස්තවය කරණ කොටැ ගෙන; පිණ්ඩාය චරන්ති, පිඬු පිණිසැ හැසිරෙත්; කදලීසු, කෙහෙල්වෙනෙන්; ගජෙ, ඇතුන්; රක්ඛන්ති, වල කත්—මෙසේ බහුලංවිධානයෙන් විභක්තිවිපර්‍ය්‍යාස කොටැ ද අපි කියැයුතු—උස්සුක්කත්ථෙ ච, උත්සාහාර්‍ථයෙහිද—තතියා සත්තමියො'භිමතා, ("**මණ්ඩිතුස්සුක්කෙසු තතියා ච**"‡ යන සූත්‍රයෙන්.

**යතො** [a] ...විසුංකරණං, පෘථක්කරණයෙක් ඇත්ද—"න සාලියො—පෙ—රුක්ඛස්ස සාඛාති" යන මේ නිර්ද්ධාර්‍ය්‍යමාණ අවයවයැ සමුදායාන්තර්ගතහෙයින් සමුදය අධිකරණත්ව යෙන් විවක්ෂිතකල්හි "වෘක්ෂෙ ශාඛා" යනු මෙන් සප්තමී සිඬ යැ අවයවසම්බන්ධයැ විවක්ෂිතකල්හි "වෘක්ෂස්‍ය ශාඛා" යනු මෙන් ෂෂ්ඨී සිඬයැ එහෙයින් "**යතශ්ච නිර්ද්ධාරණම්**"§ යන සූත්‍රයැ ප්‍රපඤ්චපිණිසැ විරචිතයැයි කියනලද ජිනෙන්ද්‍රබුද්ධිපාද යන්ගේ මතදූෂණයැ කිරීමයි—සුකධෙණුසු, බූඇති විශෙෂි-අභිතා, පිහිටියාහු; ආධෙයවූවාහු—යතො, යම් (ආහිතත්ව) කාරණයෙකින්—තතො, (යථොක්තක්‍රමයෙන් යුක්තියුක්ත නොවන) හෙයින්—අභිමතා, ("**පඤ්චමී විභත්තෙ**"‖ යන සූත්‍ර යෙන් පාණිනීන්ට)—"සබ්බං සීලං සබ්බං සුතඤ්ච සෙය්‍යො සුතතො සීලං අතිසයෙන සෙය්‍යො" සී සම්බන්ධයි—මෙහි සෙය්‍යශබ්දයා "එකාහං ජීවිතං සෙය්‍යො" යනාදියෙහි මෙන් නපුංසකලිඟුයි—නිර්ද්ධාරණයෙහි ෂෂ්ඨීසප්තමී පත්තෙහි මේ සූත්‍රයැ එයට අපවාදයැයි යන පරමතයට "ජාතිආදීහි නිද්ධාරණං අත්‍ර නෙති ඡට්ඨීසත්තමීනං අප්පත්ති" සී පරිහාරයි—හි, (ජාත්‍යාදියෙන් නිර්ද්ධාරණනැතිබව) එසේමැයි—ජච්චාදීනං, ජාති ක්‍රියාගුණයන් අතුරෙන්—අනව්‍යපදෙසතො, ශීලත්වාදිව්‍යව හාරයැ නැතිහෙයින්—අචාර්‍ය්‍ය පාණිනීන් විසින් "**සාධුනි**

* ක. 2, 6, 40. † ක. 2, 6, 41. ‡ ක. 2, 6, 45.
§ පා. 2, 3, 41. ‖ පා. 2, 3, 42.
2, 38 සූ.

පුණාභ්‍යාමර්ච්චායාං සප්තම්‍යප්‍රතෙඃ,* ප්‍රසිතොත්සුකාභ්‍යාං තෘතීයා ච,† නක්‍ෂත්‍රෙ ච ලුපි "‡ යන ඒ ඒ සූත්‍රයෙන් සාධන ලද කාරකයන් තත්තත්කාරකවිවක්‍ෂායෙන් මැ සාධනපිණිසැ "මාතරි සාධු" යනාදි කීහ—කෙසෙසු, කෙශයන් කරණ කොටැ ගෙනැ; පසිතො, බැඳුණේසි—පුසෙසන, (සඳ හා යුක්තවූ) පුසනකතින් විභක්තිවූ කාලයැ කරණ කොටැ ගෙනැ.

**පඨ්** [a]— වෘක්‍ෂාදිශබ්දයෝ ශාස්ත්‍රව්‍යවස්ථානුවිධායිවූ ප්‍රකෘතිභාගාඛ්‍යවූ රූපයෙන් අනපෙක්‍ෂිත විභක්තිවිශෙෂඇත් තාහු යම්අර්ථයක් කියත්ද ඒ ප්‍රාතිපදිකාර්ථ නම් වෙයි යනු "අභිධීයති" යනාදි වාක්‍යයෙහි අභිප්‍රායයි—පකතිරූපෙන, නාමයෙන්; තස්ස, ඒ අභිධෙයයාගේ—ඉදං වුත්තං හොති, ("නාමස්ස අභිධෙය්‍යමත්තෙන" යනු හෙයින්) මේ වක්‍ෂ්‍යමාණ අර්ථයැ කියනලද්දේ වේ—"ජොතනීයෙ පඨමා විභත්ති හොති" යි අධ්‍යාහාර කරනු—"ලිඞ්ගපරිමාණසංඛ්‍යාසු" යනාදීන් "**ප්‍රාතිපදිකාර්ථලිඞ්ගපරිමාණවචනමාත්‍රෙ ප්‍රථමා**"§ යන සූත්‍රයෙන් පාණිනීන්ට අභිමතවූ ප්‍රථමාවිධානක්‍රමයැ දක්වත්—තබ්බනෙතාපි, ඒ ලිඞ්ගාදිමත්වූයේද—තංයුත්තම, ඒ (ලිඞ්ගාදීන්) යුක්තවූයේද.

**ආමන්ත** [b]— නාමත්ථෙ, ශබ්දාර්ථයෙහි—"නච තං වාක්‍යත්ථො" යනාදීන් "සම්බොධනං න වාක්‍යාර්ථ ඉති පූර්වෙභ්‍ය ආගමඃ" යනු හෙයින් සම්බොධනයැ වාක්‍යාර්ථ නොවෙයි පදාර්ථමයැයි යන පූර්වාචාර්යසම්ප්‍රදාය දක්වත්—කාත්‍යායනයෙහි "**භො ගෙ තු**"‖ යන සූත්‍රයෙන් භවන්තශබ්දයහට භොආදෙශ කොටැ 'භො' යන රූපයැ දක්වූහ. මේ ආචාර්යයෝ නිරුක්තිමඤ්ජූෂායෙහි "භොතිදං ආමන්තනත්ථෙ නිපාතො" යි කියනලද ගතිය ආශ්‍රයකොටැ "භො ඉති ආමන්තනෙ" යනාදි කීහු—"ගච්ඡථ භො සරණියො තාතම වදෙථ බණ්ඩහාලම" "එවමෙහා පුරිස ජානාහි" යනාදි පාළි පෙනෙනහෙයින් "ලිඞ්ගත්තයෙ'පි එකරූපතා" යනු කීහයි දතයුතු.

---

* පා. 2, 3, 43. † පා. 2, 3, 44. ‡ පා. 2, 3, 45.
§ පා. 2. 3, 46. ‖ කා. 2, 4, 33.
[a] 2, 39 සූ. [b] 2, 40 සූ.

ජමසී[a] "———යස්මිං ඡඨී විධියති අයං සම්බන්ධො නාමකොති ක්‍රියාකාරකෙච්චාදි ආහ" සී සම්බන්ධයි.

"සම්බන්ධඃ කාරකෙභ්‍යො'න්‍යඃ ක්‍රියාකාරකපූර්වකඃ,
ශ්‍රුතායාමශ්‍රුතායාං වා ක්‍රියායාං සො'භිධීයතෙ" ———

කාරකෙභ්‍යඃ, (කර්මකර්ත්‍රාදි) කාරකයන්කෙරෙන් ; අන්‍යඃ, ව්‍යතිරික්තවූ ; ක්‍රියාකාරකපූර්වකඃ, ක්‍රියා කාරක දෙදෙනා පූර්වකොටැ ඇති (අස්‍යෙදම්භාවරූපවූ පදාර්ථයැ) තෙමැ ; සම්බන්ධඃ, සම්බන්ධ (නම් වන්නේයැ); ක්‍රියායාම් අශ්‍රුතායාං වා, ("රඤ්ඤො පුරිසො" යනාදි තැන්හි) ක්‍රියාව උච්චාරණයැ නොකරනලද කල්හිද ; ක්‍රියායාං ශ්‍රුතායාං වා, ("සරති රජ්ජස්ස" යනාදිතැන්හි) ක්‍රියාව උච්චාරණයැ කරනලද කල්හිද ; සඃ, ඒ (ස්වස්වාමිභාවාදිසම්බන්ධයැ) තෙමැ ; අභිධීයතෙ, කියනු ලැබේ—යනු සම්බන්ධලක්ෂණයි.

"ක්‍රියාකාරකසඤ්ජාතො සම්බන්ධො භවතීති රාජා භත්තඤ්ච වෙතනඤ්ච සෙවකස්ස දදාති රඤ්ඤො දින්නධනස්ස පටිග්ගාහකත්තා සො රාජපුරිසොති ඤායති තෙන දානපටිග්ගාහක සංඛාතෙහි ක්‍රියාකාරකෙහි පුරිමසිද්ධෙහි ඵලභාවෙන නිප්ඵාදිතො සම්බන්ධො නාම භවතීත්‍යත්ථො—අස්සෙදම්භාවහෙතුකොති අස්ස වත්ථුනො ඉදං වත්ථු සම්බන්ධීති එවං පවත්තබුද්ධ්‍යභිධානානං විසෙසනවිසෙසිතබ්බභාවස්ස නිමිත්තභූතොති අත්ථො."

පාණිනීයෙහි මෙන් "ශෙෂෙ ෂෂ්ඨී"* යන සූත්‍රයක් නැති කල්හි සම්බන්ධයාගේ උභයාධිෂ්ඨානබව හෙතුකොටැ ගෙනැ විශෙෂ්‍යපුරුෂාදීන්කෙරෙන්ද ෂෂ්ඨී පැමිණෙයි යනාදි චොද්‍යාවකාශ දක්වනු පිණිසැ "නනු ච" යනාදි කීහු—සච්චං, (ඒ) සැබැවැ ; සී යථොක්ත චොද්‍යයැ අඞ්ගීකාරකොටැ චොදකයැහට මෙසීන් අන්‍යවූ ස්ථානයෙහිද ෂෂ්ඨීප්‍රසඞ්ගයැ දක්වනුවෝ "දෙවදත්තො" යනාදි කියත්—රූපෙ ච, ශබ්දයෙහිද — "අථ" යනු චොදනාභිප්‍රායප්‍රකාශනාරම්භයෙහි නිපාතයෙකි—"අථෙවං" යනාදීන් චොදකයැහට මේ වක්ෂ්‍යමාණ ක්‍රමයැ අභිමතවිනම් විශෙෂ්‍යයාකෙරෙන් ෂෂ්ඨී නොවීමටද එමැ යුක්තියැයි දක්වත්—අථ, ඉදින් ; එවං වත්තබ්බං,

[a] පාණිනීයසූත්‍රපාඨයෙහි අනිර්දිෂ්ටත්වයෙන් පරිකල්පිතයි. * 2, 41 සූ.

මෙසේ කියනුලැබේද—කත්තාදිනො, කර්තෘ කරණ අධාර කර්මාදිවූ—පටිපාදෙතබ්බතාය, දක්වියයුතුබැවින්—"කුතො ඡට්ඨිප්පසඞ්ගොති එවං වත්තබ්බං" යි සම්බන්ධයි—සම්බන්ධො, ("රඤ්ඤො පුරිසො" යන මෙහි පරිපාල්‍යපරිපාලනලක්ෂණ) සම්බන්ධයැ තෙමැ; සදි, ඉදින්; විජ්ජොපි, (පාලනක්‍රියා තොමැ රජහුවිසින් කරනලබනහෙයින් රජ සම්බන්ධද වෙයි පුරුෂයා විෂය කොටැ පවත්නාහෙයින් පුරුෂයා සම්බන්ධද වෙයි එහෙයින් සම්බන්ධීන්) දෙදෙනාකෙරෙහි පිහිටියද; හෙදකා තු, (විශෙෂණයාකෙරෙන් වූ ෂෂ්ඨීයවිසින් උභයගතසම්බන්ධයැ ප්‍රකාශවනහෙයින් පුරුෂයා ස්වාම්‍යන්තරයෙන්) පිරිසිඳිනාවූ (රාජශබ්දයා) කෙරෙන් වනාහි; ඡට්ඨුප්පත්ති, (සම්බන්ධප්‍රකාශක) ෂෂ්ඨීවිභක්ති උපදනේයි; විශෙෂ්‍යවූ පුරුෂශබ්දයාකෙරෙන් ප්‍රථමා වේ—වෙපි, රාජ පුරුෂ දෙදෙන මැ; තතියෙ, තුන්වැනි (ගෙහසංඛ්‍යාතවූ)—අභිමතා, ("**අධීගර්ථදයෙශාං කර්මණි**"* යන සූත්‍රයෙන් පාණිනීන්ට)— "පුබ්බාචරියසඤ්ඤා" යනු "**කෘදතිඞ්**"† යන සූත්‍රයෙන් තිඞ් වර්ජිතවූ ධාතුවිහිතප්‍රත්‍යයන්ට කෘත්සංඥා කළහෙයින් කීහු— ශබ්දනීතිකාරයන්විසින් "අප්පො සග්ගාය ගච්ඡති" යන මෙහි "අප්පො සග්ගං ගච්ඡති" යි කර්මාර්ථයැ විද්‍යමානකල්හිද ක්‍රියාභිසම්බන්ධයැ ලැබෙනහෙයින් යම්සේ සම්ප්‍රදානයාගේ කාරකත්වයැ වේද එසේ මැ සම්බන්ධයාගේ කාරකභාවයැ කැමැතිවියයුත්තේයැ පුරාතනයන්විසින් ෂට්කාරකයැයි නියමකළහෙයින් නොකීම්හ යහපත් වැ පරීක්ෂා කටයුත්තේ යැයි කියනලද්ද ඒ වනාහි බුධප්‍රියාචාර්‍ය්‍යයන්විසින් "සාමිස්මිං නිබ්බත්තනාදික්‍රියාභිසම්බන්ධාභාවා ක්‍රියාභියොගස්ස අසම්භවතො කාරකභාවො න සම්භවති" යි නිශ්චිතයි.

**තුල්‍ය**[a] —— අනභිමතා, ("**තුල්‍යාර්ථෛරතුලොපමාභ්‍යාං තෘතීයා'න්‍යතරස්‍යාම්**"‡ යන සූත්‍රයෙන් තුලොපමාශබ්දයන් දෙදෙනාගෙන් අන්‍යවූ තුල්‍යාර්ථශබ්දයන් හා යොගයෙහි තෘතීයා විධීයමානබැවින් පාණිනීන්ට) අනභිමතයි—"නෙසං පන සො සදිසො නත්ථීති අජ්ජුනස්ස තුලා නත්ථි කෙසවස්සු

* පා. 2, 3, 52. † පා. 3, 1, 93. ‡ පා. 2, 3, 72.
[a] 2, 42, සු.

පමා නවෙති වුච්චතෙ" යි සම්බන්ධයි—තුල්‍යෙසු සන්තෙසු, සදෘශයන් දෙදෙනක්හු ඇතහොත්—තථා වුත්තා, ("අජ්ජුනස්ස තුලා නත්ථි" යනාදි) තත්ප්‍රකාරයෙන් කියනලද්දාහුයි.

**අතො**[a] ~ "ආදෙසා භවන්ති" යි ශෙෂයි — "තනන" යනාදි පරිහාරයි—"නිච්චං පරලොපොයෙවාති නව සඞ්ඛ්‍යා මනත්තං" යි සම්බන්ධයි—"එවං සන්තෙ" යනාදීන් නිත්‍යයෙන් පරලොපපක්ෂයෙහි දොෂ දක්වත්—සබ්බාදෙසෙ කාචි සඞ්ඛා න සියා" යි සම්බන්ධයි—අනිට්ඨත්තා, අනභිමතබැවින්—අකරණං, අකාරකරණයැ තෙමැ—ඉමස්ස, මේ ("**අතො යොනං ටාටෙ**"[a] යන) සූත්‍රයට—උපරි සම්බන්ධෙය්‍ය, ("ඣිස්මා" යි පරිකල්පිතසූත්‍රයෙහි ඉකාරාන්තබවහෙයින් පූර්වසූත්‍රයෙහි "අතො" යන පදයැ මණ්ඩූකප්ලුතිනායයෙන් මත්තෙහි තුන්වෙනි සූත්‍රයැ හා සම්බන්ධකරත්නේයැ—තාදිසස්ස පයොගස්ස, ("අග්ගා අග්ගෙ" යන) එබඳු ප්‍රයොගයක්හුගේ— "බාලෙ ච පණ්ඩිතෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති" යනාදි පාඨ පෙනෙනහෙයින් ප්‍රථමායොවිභක්තිහටද එකාරාදෙශ වෙයි. මේ වනාහි ප්‍රචුරප්‍රයොග නොවනහෙයින් ආචාර්‍ය්‍යයන්විසින් සූත්‍රවෘත්තිපඤ්චිකායෙහි කිසිසේත් නොදක්වුවද "බහුලාධිකාරං කප්පද්දුමම්ව මඤ්ඤන්ති සද්දිකා" යනුහෙයින් බහුලංවිධානයෙන් මැ සිද්ධයැයි දතයුතු.

**නීනං**[b] ~ වුත්තියං, ("**නීනං වා**" යන) සූත්‍රවිවරණයෙහි—පකරණවසා, (යොහට කාර්‍ය්‍යවිධාන) ප්‍රස්තාවහෙයින්.

**සස්සාය**[c] ~ "කත්ථචියෙව සම්පදානචතුත්ථියා" යනු නිරුක්තිපිටකයෙහි "අත්ථායාති සම්පදානවචනං" යන වාක්‍යයෙන් ආයාදෙශ සහිත ශබ්දරූපයැ දක්වූනිසා කීහු—නිරුක්තිපිටකයෙහි "පුරිසස්ස දීයතෙ බුද්ධස්ස දීයතෙ" යන ආදෙශරහිත රූපයන් මැ දානාදික්‍රියාපෙක්ෂායෙහි යොදා "අත්ථාය" යන වචනයැ සම්ප්‍රදානයැයි නිර්දිෂ්ටපමණක් මුත් දානක්‍රියාවක් නොයෙදූහෙයින් පාළිඅටුවායෙහි දානක්‍රියා නිමිත්ත කොටැ ආයාදෙශසහිත ප්‍රයොග නැතැයි යනු උපදෙශාගතයි—තාදත්ථ්‍යතො අඤ්ඤස්මිං අත්ථෙ, තාදර්ථ්‍යයෙන් පිටත් ගත්‍යර්ථකර්ම්ම නයත්‍යර්ථකර්ම්ම විභක්තිවිපර්‍ය්‍යාසයෙහි—"මූලාය

---

[a] 2, 43 සු.  [b] 2, 44, සු.  [c] 2, 45, සු.

පටිකසෙසය්‍ය, අපෙපා සඟහාය ගච්ඡති" යන තැන්හි ගත්‍යර්‍ථ කර්‍මයෙහි ආයාදෙශ පෙනෙයි. " මූලං පටිකසෙසය්‍ය සඟහං ගච්ඡති" යන අර්‍ථයි—"යො මං ගහෙත්‍වාන දකාය නෙති" යන තැන්හි නයත්‍යර්‍ථකර්‍මයෙහි ආයාදෙශ පෙනෙයි. "දකං නෙති" යන අර්‍ථයි—මූලාය, සඟහාය, දකාය, යනු මෞදගලෲයනයෝ තාදර්‍ථ්‍යයයි කියත්—" අසක්කතා ච'සම ධනජ ය්‍යාය, විරමථායසම්ඉනෙතා මම වචනාය, මහාගණාය භත්තා, සිතසස පාතුකම්මාය" යනු තෘතීයා පඤ්චමී ෂෂ්ඨී අර්‍ථයෙහි ආයාදෙශවූ තැනි—ධනජයෙන, මම වචනතො, මහතො ගණිසස, සිතසස පාතුකම්මසස, යන අර්‍ථයි.

එහෙයින් කියනලදි :—

" ආයො ගත්‍යත්‍ථකම්මස්‍මිං නයනත්‍ථසස කම්මනි
විභත්තියා විපල්ලාසෙ කච් තාදත්‍ථියෙ බහු "——යි.

තයො නෙව ච සබ්බනාමෙහිති, " **තයො නෙව ච සබ්බනාමෙහි** "* යන; පටිසෙධවචනං, ප්‍රතිෂෙධසූත්‍රයෙක්—" අකාරනෙතහි සබ්බනාමෙහි පරෙසං සමා සම්ං ඉච්චෙතෙසං චතුත්‍ථෙකවචනසස ච ආ ඒ ආය ඉච්චෙතෙ ආදෙසා නෙව හොන්ති" යනු ඒ සූත්‍රයෙහි වෘත්තියයි—වෘත්තියෙහි " නිරුත්ති කාරානුමතත්තා" යනු චූලනිරුක්තිකාර යමකමහාස්‍ථවිරයන් විසින් පුංනපුංසකලිඞ්ගවිෂයෙහි සබ්බකතරකතමාදීන්ට පඤ්චමී සප්තමියෙහි " සබ්බා සබ්බෙ" යනාදි රූපයන් දක්වූහෙයින් කීහු.

**නම්හි**[a]——" අගමා තග්ගුණීභූතා" යනාදීන් " **අගමා සතාදගුණීභූතාසතාදග්‍රහණෙන ගෘහ්‍යන්තෙ** " යන පරිභාෂාව දක්වූහු—තග්ගුණීභූතා, ඒ අගමීහට (අවයවවශයෙන් පසුව වනහෙයින්) අප්‍රධාන වූවාහු; තග්ගහණෙන, අගමීභූතවූ නං යන්නහුගේ ග්‍රහණයෙන්—පඤ්චිකාටීකාකාරයන් විසින් " නම්හි විභත්තිමහීති වුත්තියං වුත්තං නම්හි විභත්ති යාති තු වත්තබ්බං" කියා ස්වකීය ආහොපුරුෂිකා ප්‍රකාශිතයැ ඒ එසේ කීමැ විභත්තිශබ්දයාකෙරෙන් පරවූ සම්ංවිභක්තිහට " **සමාස්මිසම්නනං මහාභිමක්** "[b] යන උත්සර්‍ගසූත්‍රයෙන් පැමිණි 'මහි' යනාදෙශයට " **ඝපතො ස්සම්ං නාදීනං යයා** "[c]

* ක. 2, 1, 59.

[a] 2, 49, සූ. [b] 2, 99, සූ. [c] 2, 47, සූ.

ගත අපවාදසූත්‍රයෙන් පැමිණි ‘ යා ’ යනාදෙශ බාධකයැයි සිතායැ. එයට පරිහාර ආචාය්‍ය්‍යීයන්විසින් මැ “ බහුලාධිකාරා පවාදවිසයෙපි, දසසහස්සිම්හි ධාතුයා ” සී වෘත්තියෙහි මැ දක්‍ෂි තයැ අටුවායෙහිදු “ සම්මාදිට්ඨිම්හි ” යනාදි ප්‍රයොග පෙනෙයි එහෙයින් “ විභත්තිම්හි ” යන පදය මැ අනවද්‍යයැයි දතයුතු.

**සුඤ්ඤ** [a]—යුත්තිමග්ගනෙන, යුක්ති සෙවීමෙන්—අලඞ්භුතා සියා, ප්‍රතිපත්තිගෞරවයැ වන්නේයැ—විභත්තිසුත්තෙන, වෙවෙකාදි සූත්‍රයෙහි—අලඞ්භුතා සියා, ග්‍රන්ථගෞරවයැ වන් නේයි.

**ලඤ්ඤ** [b]—තදවිනාභාවිත්තා, (“ **විධිග්ගහණෙ යස්මා තස්ස විහිතස්සාදෛ‍යාදෙස්සාදන්තස්ස ච ග්ගහණම්** ” යන න්‍යායයෙන්) ඒ ප්‍රත්‍යය හැර නොපවත්නාසුලු බැවින්.

**ගෙ අ** [c]—ආකාරෙ ච අභිමතො යදි, ආකාරයැ ද අභිමත වී නම්.

**සබ්‍බ** [d]—අඤ්ඤත්‍ර, (ලතුපිතාදීන්) පිටත් “ භො පුරිස භො පුරිසා ” යනාදියෙහි—නිරුත්තියං නිද්දිට්ඨත්තා, (ප්‍රභින්න ප්‍රතිසම්භිදාවෙන් යුක්තවූ මහාශ්‍රාවක කච්චායන්මහතෙරුන් වහන්සේවිසින්) මහානිරුක්තියෙහි (“ භොති සබ්බා ” සී එක වචනයෙහි ආකාරාන්තරූපය) නිර්දිෂ්ටබැවින්—භො බ්‍රහ්මා යන පදයැ—“ තථා නිරුත්තියං නිද්දිට්ඨත්තා ” සී සම්බන්ධයි—විවරන්ති, ව්‍යාඛ්‍යාන කෙරෙත්—“ අ ච ආ ච ඉ ච ඊ ච එ ච ” සී ද්වන්ද්වසමාසයෙහි පූර්වස්වර ලොප්කොටැ ඒ යනු .උපශ්ලෙෂ නිර්දෙශයැයි කියත්—“ හරෙ සබ්‍බා කිස්ස නු මං ජහාසි ” යනාදි පාළියෙහි ‘ සබ්‍බා ’ යන සම්බුද්ධියැ පෙනෙනහෙයින් “ නනු ච ” යනාදි චොද්‍ය කෙරෙත්.

**රස්සා** [e]—අප්පත්තවිභාසා, (පූර්වසූත්‍රයෙන් දීර්ඝ අනිර්දිෂ්ට හෙයින්) අප්‍රාප්තවිභාෂායි.

**ඝො ස්සං** [f]—“ සස්‍ස සසාච සසායොච අඹ තිඹ ” සී ඉතරෙතරයොගයෙහි චාර්ථ සමාසයි.

**එකා** [g]—එත්තාවතා, ‘ ඉත්ථිං ’ සී විතීයෛකවචනයැහට උදාහරණ දැක්වූ පමණෙකින් මැ.

---

[a] 2, 53, සූ. [b] 2, 59, සූ. [c] 2, 60. සූ. [d] 2, 62 සූ.
[e] 2, සූ. [f] 2, 65 සූ. [g] 2, 66 සූ.

**ගොස්සා**[a] — ලක්ඛණිකස්ස අකාරස්සාපි, ("**ලක්‍ෂණප්‍රතිපදෝක්තයෝඃ ප්‍රතිපදෝක්තස්‍යෛව ග්‍රහණම්, න ලාක්‍ෂණිකස්‍ය**" යන මේ ව්‍යක්තිපක්‍ෂයැ නොතකා 'අතො' යි හ්‍රස්වාකාරජාතීන් නිර්දිෂ්ටහෙයින්) ලාක්‍ෂණිකවූ අකාරයාගේද.

**ගාවු**[b] — ගොණාදෙසො විහිතො, ("**සුහිනාසු ච**"* යන සූත්‍රයෙහි චග්‍රහණයෙන් සියලුවිභක්තීන් පරකල්හි ගො ශබ්දයහට විකල්පයෙන්) ගොණාදෙශ විහිතයැ—'විසුංයෙව සද්දො' යන මෙහි ගොශබ්දයැ ස්වභාව ඔකාරාන්තයැ ගොණ ශබ්දයැ ස්වභාවඅකාරාන්තයැ එහෙයින් වෙන මැ ශබ්දයෙකැයි යනු භාවයි—ශබ්දනීතියෙහිද "පබ්බජිතො ගහට්ඨො ච ගොණො ඔට්ඨො ච ගද්‍රභො" යනාදීන් වෙන මැ අකාරාන්ත ශබ්දයෙකැයි සඞ්ග්‍රහකළබව දතයුතු—"සද්දන්තරත්තා, කොචි දෙසො න" යි සම්බන්ධයි.

**සිං**[c] — වත්තතෙ, (නදීසොතොන්‍යායයෙන් ක්‍රමයෙන්) අනුවර්ත්තනයැ වේ.

**කූ**[d] — "**චකාරාකෘෂ්ටං නොත්තරත්‍ර වර්ත්තතෙ**" යන පරිභාෂාක්‍රමයෙන් අනන්තරසූත්‍රයෙහි චකාරාකෘෂ්ටවූ ආදෙශයැ මේ සූත්‍රයට නොවැටෙනබව දක්වනු පිණිසැ "චානුකඩ්ඪිතං" යනාදි කථිතයි.

**චෙවො**[e] — සහචරිතඤායස්ස, "**තත්සහචරිතාසත්තද්ග්‍රහණෙන ගෘහ්‍යතෙ**" යන සහචරිතන්‍යාය—අනිස්සිතත්තා, අනාශ්‍රිතබවහෙයින්.

**යොමහි**[f] — ප්‍රකෘතිසම්බන්ධිවූ කාර්‍ය්‍ය අන්තරඞ්ග නමැ ප්‍රත්‍යයසම්බන්ධිවූ කාර්‍ය්‍ය බහිරඞ්ග නමැ එදෙකින් "**අන්තරඞ්ගබහිරඞ්ගයොරන්තරඞ්ගවිධිර්බලවාන්**" යනු න්‍යායහෙයින් පළමුවෙන් ටාදෙශප්‍රාප්තියැ දක්වනු පිණිසැ "ඉමිනා පඨමං" යනාදි පඨිතයි.

**සමාහි**[g] — සමාවෙසො, ප්‍රවෙශකිරීමැ—"දසසහස්සිම්හි ධාතුයා" යන උදාහරණයැ ගාථාපාදයෙන් දර්ශිතහෙයින්

---

* ක. 2, 1, 30.

[a] 2, 69 සූ. [b] 2, 74 සූ. [c] 2, 79 සූ. [d] 2, 87 සූ. [e] 2, 96 සූ. [f] 2, 97 සූ. [g] 2, 99 සූ.

ගාථානොවනතැන බොහෝසේ ප්‍රයොගනැතිබව සූචිතයි—"යථා බලාකයොනිම්හි, කුසාවතිම්හි නගරෙ" යනුද මෙසේ මැයි.

**සබ්බා**[a]—අධංසො, නොගිළිහිමයි—සාභිධෙය්‍යාපෙක්ඛා, (දිග්දෙශකාලස්වරූපවූ) ස්වකීය අර්ථයැ අපෙක්ෂාකොටැ ඇති—නිමිත්තෙන, කුශලශබ්දයාගේ ප්‍රවෘත්තිනිමිත්තාවූ; කොසල්ලෙන, කුශලභාවයෙන්—අවාචීත්‍ථා, දක්ෂිණදිශාව අර්‍ථ කොටැ ඇත්තී—උත්තරා කුරවො, උත්තරකුරුද්වීපවාසීහු.

**කාවචෙ**[b]—"නපුංසකලිඞ්ගෙ එකාරෙන න භවිතබ්බං" යි සම්බන්ධයි—"නත්‍ථි අත්තකාරෙ නත්‍ථි පරකාරෙ නත්‍ථි පුරිසකාරෙ පරියන්තකටසංසාරෙ සත්තමෙ නහෙව වත්තබ්බෙ" යනුද සිහට එකාරාදෙශවූ තැනි.

**ලොපො**[c]—පාකතං, ප්‍රකෘතිසම්බන්ධිවූ.

**ජන්තු**[d]—අප්පත්තවිභාසත්‍ථං, පළමු ඝපයන්කෙරෙන් පරවූ යොනට ලොප් නොහඳුලහෙයින් ඝපග්‍රහණයැ අප්‍රාප්ත විභාෂා පිණිසයි.

**අසං**[e]—පාණිනීයයෝ "තස්‍යාං ශාලායාම්" යන විවක්ෂායෙහි "තත්‍ර ශාලායාම්" කියා සිඬවන පිණිසැ "තත්‍ර" යන අව්‍යයාකෙරෙහ් ඩාප්ප්‍රත්‍යය කොටැ "**අව්‍යයාදාප්සුපඃ**"* යන සූත්‍රයෙන් එ මැ ආප්‍රත්‍යය ලොප්කෙරෙති එහෙයින් "අසංඛ්‍යෙහි ඉත්‍ථියමාපපච්චයස්සාපි කෙචි ලොපමිච්ඡන්ති" යනු ආරබ්ධයි—ඉත්‍ථත්තාවසායො පන, ස්ත්‍රීත්වයාගේ නිශ්චය වනාහි—"පදතො ඉත්‍ථත්තං සියාති යොපි ආහ" යි සම්බන්ධයි—"යදිපි—පෙ—ඉත්‍ථත්තං සියා" යනු ජිනෙන්ද්‍රබුද්ධිවාක්‍ය දර්‍ශනයයි—තස්සායුත්තං, මෙසේ කියන ඒ ජිනෙන්ද්‍රබුද්ධිපාදයන්ගේ වචනයැ අයුක්තයි—ආපච්චයාදීනං නාඩගං" යි සම්බන්ධයි.

**නාතො**[f]—"ලොපපටිසෙධස්ස නාතොති පුබ්බවාක්‍යෙන වුත්තස්ස අයං පටිසෙධො න" යි සම්බන්ධයි—

---

* පා. 2, 4, 82.

2, 101 සූ. [b] 2, 113 සූ. [c] 2, 117 සූ. [d] 2, 118 සූ.
[e] 2, 121 සූ. [f] 2, 124 සූ.

"**අනන්තරස්‍ය විධිර්වා භවති ප්‍රතිෂෙධො වා**" යනු න්‍යායපරිභාෂායි—"අපඤ්චමියා අමාදෙසො එව නාලොපොති සාමත්‍ථියා ලබ්ධං අමුමෙවත්‍ථං ජොතෙති" යි සම්බන්‍ධයි—"වෙයෙව වාක්‍යානි" යන මෙහි "නාතො" යනු ප්‍රතිෂෙධවිධායක එක් වාක්‍යයෙකැ "අමපඤ්චමියා" යනු අංවිධායක දෙවැනි වාක්‍යයැ යනු අභිප්‍රායයි—සන්‍ධිලොපයැ ප්‍රාප්තකල්හි මැ අංවිධානයැ හෙයින් "**යෙන නාප්‍රාප්තෙ යො විධිරාරභ්‍යතෙ ස තස්‍ය බාධකො භවති**" යන පරිභාෂාව උපලක්ෂිතයි—"පඤ්චන්නං පූලානං සමාහාරො" යි වාක්‍යයි—"**නද්‍යාදිතො ඊ**" [a] යි ඊප්‍රත්‍යය වේ—ගුණීභූත, අප්‍රධානවූ; දබ්බාපෙක්ඛා, (පූලාඛ්‍ය) ද්‍රව්‍යයැ අපෙක්ෂාකොටැ ඇති.

**ඉම** [b]—"**නාමග්‍රහණෙ ලිඞ්ගවිශිෂ්ටස්‍යාපි ග්‍රහණම්**" යනු පරිභාෂායි—"අනිත්‍ථියන්ති" යනාදීන් ස්ත්‍රීලිඞ්ගප්‍රතිෂෙධයෙන් නාමග්‍රහණයෙහි ලිඞ්ගවිශිෂ්ටයාගේද ග්‍රහණයැ ඥාපිතයි.

**දුති** [c]—ඉමං පරිභාසඤ්, ("**එකයොගනිද්දිට්ඨානාමපේ‍යකදෙසො'නුවත්තතෙ නහෙවකාවිභත්තියුත්තානාම්**" යන) මේ පරිභාෂාවද.

**තති** [d]—කරොතිමයි, කරධාතුහු ගම්‍යමානකල්හි.

**මනා** [e]—වෘත්තියෙහි "සයං අයං වයං ජඤ්ඤා" යනාදියෙහි මෙන් ව්‍යයවාචිවූ වයශබ්දයැ මනාදියට අන්තර්ගත නොවනහෙයින් ගණසූත්‍රයෙහි "අක්ඛයෙසු" යි යුහු—හෙම ශබ්දයෙන් හෙමවිකාරයැ අභෙදයෙන් ගෘහීතයැයි "හෙමමයානි" යනු කීහු—"සකාපෙ'පි යථාගමමභවන්ති" යි සම්බන්‍ධයි—"බාණාදිසු අභිධෙයේ‍යසු මනාදිසු න පඨීයන්ති" යි යොදනු—අභරහසද්දාපි, අභරහශබ්දයෝ දෙදෙනද; මනාදිසු පඨිතා,

("එවං වචො වයො තෙජො තපො චෙතො තමො යසො අයො පයො සිරො සරො උරො රහො අහො'පි ච" යි)

මනාදීන්කෙරෙහි හදුරනලද්දාහුයි—අහසද්දස්ස මනාදිසු කාරියාසම්භවා අහසද්දො මනාදිසු න දස්සෙබ්බා රහසිති

---

[a] 3, 27 සූ. [b] 2, 128 සූ. [c] 2, 137 සූ.
[d] 2, 143 සූ. [e] 2, 147 සූ.

නිපාතත්තා ඉකාරස්ස ච අසම්භවා රහසද්දෙ මනාදිසු න දට්ඨබ්බො" යි සාධ්‍යාහාරසම්බන්ධයි—'ඡාන්දසො' යන තද්ධිත ප්‍රයොගයෑ දක්වන තැනෑ ආචාර්‍ය්‍යයන් විසින් මෑ "**මනාදීනං සක්**" [a] යන සූත්‍රයෙන් සකාරාගම දක්වූහෙයින් ඡන්දශබ්දයද මනාදියෙහි දක්කයුතු—"රහසා රහසො රහසි අහසා අහසො අහසි" කියා ශබ්දනීතිකාරයන් රූපක්‍රම දක්වූහෙයින් ඔවුන්ගේ මතයෙන් මේ දෙකද මනාදිගණයට ඇතුළතැයි දතයුතු—"රහොසද්දෙ" යන තැන්හි පොතෙහි ලී හයන් ගේ කොම්බු ඇලපිලි පමණක් හැරීමෙන් 'රහ' යනු සිද්ධවතුදු ටීකාකාරයන්විසින් ලෙඛකදොෂයට ආචාර්‍ය්‍යප්‍රමාද හඟවනු පිණිසැ "රහොසද්දෙති එත්ථ රහසද්දෙති පාඨො'වගන්තබ්බො" යි කීමැ අහොපුරුෂිකාමාත්‍රයෙකැයි දතයුතු—තෙන, (යම්හෙයකින් අහශබ්දයට මනාදිකාර්‍ය්‍ය නැත්ද 'රහසි' යනු නිපාතද) එහෙයින්.

**භවතො** [b]—ආදීඪං, ආදෙශ කරනලදු.

**සතො** [c]—"සබ්භි" යනු 'සන්ත' යන අකාරාන්ත ප්‍රකෘතියෙන් සිද්ධවූ තෘතීයාපඤ්චමීබහුවචනයෑ. "අසම්මොද කො එධො අසබ්භිරූපො" යි ප්‍රයොග පෙනෙනහෙයින් ඉකාරාන්ත සබ්භිශබ්දයෙක්ද ඇතැයි හැඟේ.

**සිස්සාග්ගි** [d]—"අග්ගිනිං සම්පජ්ජලිතං පවිස්සන්ති" යනාදී ද්විතීයාවිභක්තිආදියද "අග්ගිනිසමාසු සමුජ්ජලවාසො" යි සමාසවිෂයෙහිද පාළියෙහි අග්ගිනිශබ්දයෑ පෙනෙනහෙයින් "අග්ගිනි අග්ගිනිං අග්ගිනිනො අග්ගිනියා අග්ගිනීහි" යනාදීන් සියලු විභක්තියෙහි මෑ යෙදෙයි, ආචාර්‍ය්‍යයන්විසින් කාත්‍යායනයෙහි "**අග්ගිස්සිනි**"* යන සූත්‍රයෑ ප්‍රමාණකොටැ "**සිස්සාග්ගිතො නි**" [e] යි සූත්‍ර රචනාකරනලදූයි දතයුතු.

**ඤාත** [f]—සුතත්තා, ශ්‍රොත්‍රවිඥානගෘහීතබැවින්; හෙවත් ප්‍රත්‍යක්ෂබැවින්—අනුමිතස්ස, ("ලිඞ්ගාදර්ථදර්ශනමනුමානම්" යනුහෙයින් "විධිබ්බිසෙසනන්තස්ස" යන ලිඞ්ගයෙන් තදනන්තාසම්බන්ධ අර්ථදර්ශනයැයි කියනලද) අනුමානවිඥානයෙන් දන්නාලද්දහුගේ.

---

* ක 2, 2, 35.

[a] 4, 128 සූ. [b] 2, 150 සූ. [c] 2, 149 සූ. [d] 2, 151 සූ. [e] 2, 151 සූ. [f] 2, 152 සූ.

**ලතු** [a]—"පච්චයග්ගහණෙ" යනාදීන් "**ප්‍රත්‍යයග්‍රහණෙ යස්මාත්‍ස විහිත්‍යස්තදාදෙස්තදන්තස්‍ය ච ග්‍රහණම්**" යන පරිභාෂාව දක්වූහු—පිතාදයො ඉති, පිතාදයො යන; ඉමිනා, මේ සූත්‍රයෙන්—පිතු මාතු භාතු ධීතු දුහිතු ජාමාතු නත්තු හොතු පොතු යන මේ ආදීහු පිතාදීහුයි.

**සලො** [b]—"ලභන්තෙතා මන්ධාතුස්සෙද අප්පිති සකමන්ධාතුස්සෙද'පි ලභන්තෙතා" යි සාධ්‍යාහාර පදසම්බන්ධයි.

**ම** [c]—සංඛ්‍යානවාරෙන, සංඛ්‍යානමාර්ගයෙන්.

**මො** [d]—සති, (මොග්‍රහණයැ) ඇතිකල්හි.

**දිවා** [e]—නාමාධිකාරතො ච, නාමප්‍රස්තාවහෙයින්ද—"නාමාති ච" යන්නටද 'සනති' යි යොදනු.

**රස්සා** [f]—පරියුද්දසො, (අනන්තාවාදීනං යන) පර්‍ය්‍යුදාසයැ තෙමැ.

**යොනං** [g]—දුතියාග්ගහණෙන, ("දුතියා යොස්ස නෙවා" යි) දුතියාග්‍රහණයෙන්.

**නාමකි** [h]—එනාදෙසස්සාසම්භවා, (නාහු ස්‍යාවිභක්තිහට කළ ආදෙශබැවින්)—"ස්‍යාදෙසනාස්සාපි ගහණං න" යි සම්බන්ධයි.

**ගස්සං** [i]—උභයවිකප්පො, සමාසාසමාසපක්ෂවය—"ඉත්‍ථිපුමනපුංසකසමූහො" යන තැන්හි චන්ද්වන්ද්‍වසමාස කොටැ "ඉත්‍ථිපුමනපුංසකසමූහො" යි තිබූකල්හි "**සමාසෙ ච විභාසා**"* යි පුමන්තයහට අමාදෙශද "**වග්ගන්තං වා වග්ගෙ**"† යි නිග්ගහීතයහට වර්ගාන්තාදෙශද කොටැ කාත්‍යායනයෝ රූපසාධනයැ කෙරෙත්.

**නාමකි** [j]—අනන්තරසුත්තෙපි, (පුමකම්මථාදි) අනන්තර සූත්‍රයෙහිද.

**පුම** [k]—එනස්සාපි, ("**නාස්සෙනො**"[l] යි කම්මාදීන්කෙරෙන් පරයහට කරනලද) එනාදෙශයාගේද.

---

* ක. 2, 2, 35. † ක 1, 4, 2.

[a] 2, 168 සූ. [b] 2, 171 සූ. [c] 2, 175 සූ. [d] 2, 178 සූ. [e] 2, 181 සූ. [f] 2, 182 සූ. [g] 2, 187 සූ. [h] 2, 191 සූ. 2, 193 සූ. [j] 2, 197 සූ. [k] 2, 197 සූ. [l] 2, 82 සූ.

**ඉමෙ** [a]~~~~ "කෙනචි විසෙසනන්තරයොගෙන ගහිතස්ස අනුකඩ්ඪනං අන්වාදෙසො" යි සම්බන්ධයි—විසෙසනන්තරයොගෙන, අන්‍යවිශෙෂසම්බන්ධයෙකින්—අඤ්ඤත්‍ථා, කිසි විශෙෂාන්තරයොගයෙක් නැත්තේ වීනම්.

**කිස්ස** [b]~~~~

"කෙ ගන්ධබ්බෙ ච රක්ඛසෙ
නාගෙ කිම්පුරිසෙ ච මානුසෙ
කෙ පණ්ඩිතෙ සබ්බකාමදෙ
දීඝරත්තං මෙ භත්තා භවිස්සති"

යනාදි පාළියෙහි කිංශබ්දයහට කිසිතැනෙක්හි ප්‍රථමෛක වචනයෙහි එකාරාදෙශ පෙනෙයි ඒ "**කාවෙච වා**" [o] යන සූත්‍රයෙන් සිඬයැයි දතයුතු.

**නමේහි** [d]~~~~ චූළනිරුක්තියෙහි ස්ත්‍රීලිඞ්ග කියන තැනැ "චතුන්නං" කියාද, නිරුක්තිපිටකයෙහි "චතුන්නං කඤ්ඤානං" කියාද, සොණදණ්ඩසූත්‍රාදියෙහි "චතුන්නං පරිසානං පියො මනාපො" කියාද, සූත්‍රඅටුවායෙහි "චතූහි අච්ඡරියබ්භුතධම්මෙහි සමන්නාගතො චතුන්නං පරිසානං පියො මනාපො" කියාද, සත්තිලංඝජාතකඅටුවායෙහි "ආචරියො පන'ස්ස චතුන්නං සත්තීනං ලංඝනසිප්පං ජානාති" කියාද, ස්ත්‍රීලිඞ්ගයෙහි "චතුන්නං" යන පදයැ සාක්ෂාත්ප්‍රයොග කළහෙයින් ස්ත්‍රීලිඞ්ගවිෂයෙහි නැතැයි ප්‍රත්‍යුදාහරණ කොටැ දක්වීම භූයොවෘත්ත්‍යග්‍රයෙනැයි දතයුතු—"කො තෙ බලං මහාරාජ" යනාදි පාළියෙහි 'කො' යනු කිංශබ්දාර්ථයෙහි වැටෙයි. "කො නු ත්වං සාම ජීවසි" යනාදියෙහි කථම්ථියෙහි වැටෙයි. එහෙයින් කියනලදි.

"කථං කිං ඉති අත්‍ථෙසු දිස්සො කො ඉච්චයං රවො
නිපාතොති ගහෙතබ්බො සුතිසාමඤ්ඤතො තතො" යි.

**ඉම** [e]~~~~ චූළනිරුක්තියෙහිද නිරුක්තිපිටකයෙහිද ඉදංශබ්දය මැ ප්‍රකෘතිභාවයෙන් කියනලද්ද. කච්චායනෙහි "**ඉමස්සි දමංසිසු නපුංසකෙ**"* කියාද, තදනුසාරයෙන් මෙහි "**ඉමස්සි**

---

* ක 2, 2, 10.

[a] 2, 203 සූ. [b] 2, 204 සූ. [c] 2, 114 සූ. [d] 2, 210 සූ. [e] 2, 207 සූ.

දං වා" [a] සිද්ධ සූත්‍රිතයැ. ආගමයෙහි "ඉමෙසං පච්චයා ඉදප්පච්චයා ඉදප්පච්චයා එව ඉදප්පච්චයතා" යනාදීන් ප්‍රයොග පෙනෙනහෙයින් ඉමශබ්දයැ ප්‍රකෘතිභාවයෙන් කීමට කාරණ පරීක්‍ෂාකටයුතු.

අමු [b] — "දුස්ස මෙ ඛෙත්තපාලස්ස රත්තිභත්තං අපාභතං" යනු සසජාතකපාළියෙහි පෙනෙනහෙයින් ෂෂ්ඨී විභක්ති පරකල්හි අමුශබ්දයහට තදමිනාදීන් දුආදෙශද ඉෂ්ටයි.

නං සෙ [c] — චූලනිරුක්තියෙහිද නිරුක්තිපිටකයෙහිද "තුම්හ අම්හ" කියා චතුර්ථිබහුවචන දර්ශිතයැ ඒ ප්‍රචුර ප්‍රයොග නොවනහෙයින් ආචාර්‍ය්‍යයන්විසින් අනාදෘතයි.

සිමහ [d] — ප්‍රථමෙකවචනයෙහි "අහකං" යන රූපාන්තරයෙක්ද ඇත්—"අහකඤ්ච චිත්තවසානුගා සියං" යනු මෙහි උදාහරණයි.

නන [e] — "බලවන්තායෙව කාරිසින්තෙන ගය්හන්තෙ" කියා සම්බන්ධයි—"න තදනන්තත්තා දුබ්බලා" යි ව්‍යතිරෙක දක්වා "අනුමිතත්තා" යි තබෙතු දක්වූහු.

සමා [f] — කාත්‍යායනවෘත්තියෙහි හා රූපසිද්ධියෙහි "රාජෙන රාජෙහි රාජෙසු" යන පදප්‍රයොග පෙනෙයි ඒ පද චූලනිරුක්ති යෙහිද නිරුක්තිපිටකයෙහිද නොආයේයැ එබඳු පද "ධම්මරාජෙන සිවිරාජෙන" යනාදීන් සමාසවිෂයෙහිමුත් කෙවල ප්‍රයොගයෙහි දුර්ලභයැයි දතයුතු.

නාස්මා [g] — පකතවසෙන, තුම්හාමහශබ්දයන්ගේ ප්‍රස්තුත වශයෙන්.

ඛං [h] — බහුත්තවචනිච්ඡා, ("ආත්මනි ගුරෑණුච බහුවචනම්" යනුහෙයින් ආත්මගුර්වාදිවිෂයෙහි) බහුත්වවිවක්‍ෂාව වේ.

අපා [i] — නෙන, නකාරයෙන් — පදසඤ්ඤාවිධායකවචනාභාවෙපි, ("සුප්තිඞන්තම්පදම්" [*] යනාදීන්) පදසංඥාවිධායකසූත්‍රයක් නැතිකල්හිද—"ආඛ්‍යාතං සාව්‍යයකාරකවිශෙෂණං වාක්‍යම්" යන වාර්තිකකාරකාත්‍යායනමතයද "එක

---

[*] පා. 1, 4, 14.

[a] 2, 207 සූ. [b] 2, 208 සූ. [c] 2, 216 සූ. [d] 2, 217 සූ. [e] 2, 221 සූ. [f] 2, 231 සූ. [g] 2, 234 සූ. [h] 2, 236 සූ. [i] 2, 238 සූ.

තිඩපදසමූහො වාක්‍යම්" යන ස්මෘත්‍යන්තරයද දක්වනුවෝ"
"සාව්‍යයකාරකවිශෙෂණං" යනාදි කීහු—ලෞකිකවාක්‍යයැ
අනියතරූපබැවින් "පදසමූහො වාක්‍යං" යන සර්වසඞ්ග්‍රා
හිකවාක්‍යලක්ෂණයැ කිවද "වත්තුමිච්ඡිතත්ථ—පෙ—නාන.
ත්තනති භාවො" යනුයෙන් "එකාර්ථපරඃ පදසමූහො වාක්‍ය
ම්" යන භාෂ්‍යකාරමතයැ අභ්‍යුපගමයැ කරනලද්දැයි දත
යුතු—අභ්‍යජ, මෙහෙයැ—ගාවිමභ්‍යජ කණ්හං—පෙ—පයො
විචිත්වා අජ්ඣාපයිස්සතීති, අජ්ඣාපයිස්සති යන මේ අනෙකා
ඛ්‍යාතිකවූ පදසමූහයෙහි; වත්තුමිච්ඡිතත්ථපරිසමත්තියා, විව
ක්ෂිතාර්ථපරිසමාප්තියැ හෙතුකොටැ ගෙනැ; යථා වාක්‍යනාන
ත්තං, (ප්‍රධානගුණභාවයෙන් උපකාරවීම කරණකොටැ ගෙ
නැ එකවාක්‍යබවට පැමිණීමෙන්) වාක්‍යභෙදත්වයැ යම්සේ
(හැගේද); ඉහාපි, මේ "පදසමූහො වාක්‍යං" යන වාක්‍ය
ලක්ෂණයෙහිද; තථා, එසේමැ (විවක්ෂිතාර්ථපරිසමාප්තියැ හෙතු
කොටැ ගෙනැ වාක්‍යනානාත්වයැ සිද්ධයි)—"පදසමූහො වාක්‍යං"
යන වාක්‍යස්වරූපදර්ශිතවාක්‍යයෙහි ආඛ්‍යාතාදිග්‍රහණයැ
නොකොටැ "පදසමූහො වාක්‍යං" සී කීකල්හි ලොකශාස්ත්‍රදෙ
ක්හි සකලවාකප්‍රබන්ධයැ එකවාක්‍යභාවයට පැමිණෙන්නේයැ
වැළිත් මේ එක්වැනි වාක්‍යයැ දෙවැනි වාක්‍යයැ තුන්වැනි
වාක්‍යයැයි යන වාක්‍යභෙදපරිඥනයැ කවරහෙතුවෙකින්
වේද්දැයි යන අනන්තලීලීනචොද්‍යයට "වත්තුමිච්ඡිතත්ථපරිසම
ත්තියා" යන හෙතු දැක්වූහ. ඒ විවක්ෂිතාර්ථපරිසමාප්තියෙන්
වාක්‍යනානාත්වයැ කොතැන්හි දක්නාලදද යන උදාහරණ
විෂයවූ ආශඞ්කානිවෘත්තියැ පිණිසැ "යථා ගාවිමභ්‍යජ" යනා
දින් ලොකප්‍රසිද්ධ දෘෂ්ටාන්ත දැක්වූහ. "ඉහාපි" යනුයෙන් පද
සමූහයැ වාක්‍යයැයි යන පක්ෂයැ දැක්වූහ.

"දෘෂ්ටාන්තාපෙක්ෂයා පක්ෂ හෙතොර්ව්‍යාප්තිප්‍රකාශනම්
වචනං ස්‍යාදුපනයස්තථෙති න තථෙති වා"

යනුහෙයින් 'තථා' යන්නෙන් "ගාවිමභ්‍යජ කණ්හං" යන
දෘෂ්ටාන්තයෙහි ප්‍රසිද්ධාවිනාභාව ඇති විවක්ෂිතාර්ථපරිසමාප්ති
සංඛ්‍යාත සාධනයාගේ දෘෂ්ටාන්තොපමානයෙන් පදසමූහ
සංඛ්‍යාතපක්ෂයෙහි ව්‍යාප්තියැ ප්‍රකාශ කොටැ දැක්වූහු—නනු ච
පදසමූහො වාක්‍යමිති වුත්තෙ න විඤ්ඤායතෙ වාක්‍යභෙදො ඉද
මෙකං වාක්‍යමිදං දුතියමිත්‍යතො ආහ වත්තුමිච්ඡිතත්ථෙච්චාදි—

යෙන පදසමුදායෙන යො'ත්‍ථො වත්තුමිච්ඡිතො තස්ස පරිසම ත්තිං යාවතෙකං වාක්‍යමිති මඤ්ඤන්තෙ—ඉහාපීති, පදසමුහො වාක්‍යමිත්‍යත්‍රාපි—තථෙති, වත්තුමිච්ඡිතත්ථපරිසමත්තියා වාක්‍ය නානත්තං සමහවතීත්‍යතිදිසති.

**න ච** [a]—යොගත්ථං, සම්බන්ධාපීයැ.

**දස්ස** [b]—භාවසත්තමියා නිද්දෙසා, සත්සප්තමීනිර්දේශයැ හෙතුකොටැ ගෙනැ—"ගාමො තව කම්බලමුද්දිස්සාගතො" යන තැන්හි කම්බලයැ දෘශ්‍යාර්ථයෙන් යුක්තයැ 'තව' යනු ඒ කම්බලයැ හා යුක්තබැවින් යුක්තයුක්ත නම් වේ.

**න සා** [c]—"දෙවදත්තාදි සාමඤ්ඤවචනෙ මාණවකෙ මාණවකසද්දෙ පරභූතෙ සති" යී සාධ්‍යහාර පදසම්බන්ධයි—දෙවදත්තාදිසාමඤ්ඤවචනෙ, දෙවදත්තශබ්දයා ආදිකොටැ ඇති සාමාන්‍යවාචීවූ ; මාණවකෙ, මාණවකශබ්දයා පරකල්හි.

ඉති මොග්ගල්ලානෙ ව්‍යාකරණෙ පඤ්චිකාපදීපෙ
නාමකණ්ඩො දුතියො.

---

**ස්‍යාදි** [a]—යස්ස, (ක්‍රමාවස්ථිතවූ යො ආදි) යම් (අක්ෂරසමුදා යක්) හටද—"**ස්‍යාදි ස්‍යාදිනෙකත්ථං**" [d] යී සාමාන්‍යයෙන් කී කල්හි යම්කිසි ස්‍යාද්‍යන්තයෙක් යම්කිසි ස්‍යාද්‍යන්තයක් හා එක් වැ සමාසවීමට සුදුසු වෙයි එසේකල්හි "පස්ස දෙවදත්ත ගාමං, ගතො ධනමිත්තො ගුරුකුලං" "කුසලො ත්වං දානෙ, සොණ්ඩො පිවති පානාගාරෙ" යන මෙහිදු සමාසවන්නේ යැයි ආශඞ්කා කොටැ "සාමඤ්ඤෙන වුත්තෙ'පි" යනාදි කපිතයි—සාමඤ්ඤෙන, ("**ස්‍යාදි ස්‍යාදිනෙකත්ථං**"යී) සාමාන්‍ය යෙන්—"යස්ස ස්‍යාද්‍යන්තස්ස යෙන ස්‍යාද්‍යන්තෙන සම්බන්ධො තෙන ස්‍යාද්‍යන්තෙන සහ තං ස්‍යාද්‍යන්තමෙකත්ථමහවතීති" යනාදීන් ව්‍යාඛ්‍යානකරනු—"ගාමං ගතො" යන මේ ස්‍යාද්‍යන්ත යන් දෙදෙනාගේ පරස්පරව්‍යපෙක්ෂාලක්ෂණවූ සම්බන්ධයැ ඇතිහෙයින් "ගාමගතො" යී එකාර්ථීභාවයැ වූයේයි, ඒ එසේ මැයි. 'ගාමං' යන මේ සාධනයැ සාධ්‍යවූ තව්‍යපදෙශ ජනන යොග්‍යවූ ක්‍රියාව අපෙක්ෂා කෙරෙයි 'ගතො' කීකල්හි

---

[a] 2, 243 සූ. [b] 2, 244 සූ. [c] 2, 246 සූ. [d] 3, 1 සූ.

ගතො ' යන ක්‍රියාව ' කිං ගතො ' යි සාධනසාකාඞ්ක්ෂ වෙයි එහෙයින් යම්සේ සාධනයැ සාධ්‍යවූ ක්‍රියාවෙහි නියතද එසේ මැ ක්‍රියාවද නියතසාධනයැයි කියා මේ සාධ්‍යසාධනපදයන් දෙදෙනාගේ නියමයැ සන්නිධානමාත්‍රයෙන් මැ ඔවුනොවුන් ගෙන් ප්‍රකාශවන්නේයැ ' ගාමං ' යන සාධනයැ ' පස්ස ' යන සාධ්‍යයැ අපෙක්ෂාකෙරෙයි ' ගතො ' යන ගමනක්‍රියාව ගුරු කුලයැ අපෙක්ෂාකෙරෙයි එහෙයින් වාක්‍යන්තරාවයවවූ " ගාම, ගත " දෙදෙනාගේ අපෙක්ෂාව නැතිහෙයින් සමාස නොවෙයි යනු භාවයි.

මෙ මැ කීහ.

" නියතං සාධනං සාධ්‍යෙ ක්‍රියා නියතසාධනා
සසන්නිධානමාත්‍රෙණ නියමස්සම්ප්‍රකාශතෙ " —යි.

" සූපාය දූරු " යනාදි පදයන් සම්බන්ධකරන්ට පූර්වභාග යෙහි ' සූපාය ' යන මේ සාමාන්‍යයැ " සූපාය ගතො සූපාය තිඨති සූපාය දූරු " යන විශෙෂයැ සාකාඞ්ක්ෂ කොටැ පවත් නේයැ ' දූරු ' යන මේ සාමාන්‍යයද " සූපාය, ශරාය, දූභාය " යන විශෙෂයැ සාකාඞ්ක්ෂ කොටැ පවත්නේයැ මෙසේ ඇම තැන්හි මැ උපසර්ජනපදයාගේද ප්‍රධානපදයාගේද සම්බන්ධ නියමයැ දන්නා පිණිසැ භෙදයැ කැමැතිවන්නහුගේ අන වස්ථිතත්වයැ සම්බන්ධ්‍යන්තරයෙන් ව්‍යවච්ඡෙදයැ කොටැ විශෙෂයෙහි පිහිටිවීමට සමර්ථවූ කිසිතැනෙක්හි සාධ්‍යසාධන ලක්ෂණවූද කිසිතැනෙක්හි ප්‍රකෘතිවිකාරස්වරූපවූද කිසි තැනෙක්හි ස්වස්වාමිසම්බන්ධස්වරූපවූද අනෙකප්‍රකාරවූ සම්බ න්ධයෙන් පරස්පරසම්ප්‍රෙක්ෂිතාර්ථත්වයක් ඇතිකල්හි " සූප දූරු, සවරභයං, රාජපුරිසො " යනාදි සමාසප්‍රාප්තියැ වන් නේයි.

මෙ මැ කීහ.

" භෙදූනාකාඞ්ක්ෂතාසතස්‍ය යා පරිප්ලවමානතා
අවච්ඡින්නත්ති සම්බන්ධසත්තාං විශෙෂෙ නිවෙශයන් " —යි.

යම්තැනෙක්හි ව්‍යපෙක්ෂා නැත්ද එතැන්හි " ගච්ඡ සූපාය; දූරු දෙවදත්තස්ස " යනාදියෙහි මෙන් සමාස නොවේ— අව්‍යුත්පන්නයන්ගේ සාධුශබ්දප්‍රතිපත්තියැ පිණිසැ සමාස විධානපූර්වකවූ විභක්තිලොපාදි උපාය දක්වනලද්දු. පර මාර්ථයෙන් වනාහි වාක්‍යයෙන් අත්‍යන්තභින්නවූ තුල්‍යරූ පත්වය මැ ඇති සමාසසංඥක අන්‍යශබ්දයෙක් මැයි.

මෙ මැ කීහ.

" අබුධාන් ප්‍රත්‍යුපායාශ්ච විචිත්‍රාඃ ප්‍රතිපත්තයෙ
ශබ්දාන්තරත්වාදන්‍යත්වං භෙදෙ, වාක්‍යසමාසයොඃ "—යි.

අතො එව, (යම්හෙයකින් "සඞාදි සඞාදිනෛකාර්ථං"* යි සාමාන්‍යයෙන් කීකල්හිද යමක්හු හා යමෙක් සම්බන්ධද ඔහු හා ඒ සමාසවන්නේයැයි සම්බන්ධවශයෙන් දන්නාලැබේනුයි කියා අනිෂ්ටප්‍රසඞ්ගයෙක් නැත්ද) එහෙයින් මැ—ව්‍යපෙක්ෂාසාමර්ථ්‍යපරිග්‍රහාය, (පදයන්ගේ) පරස්පරාකාඞ්ක්ෂාලක්ෂණවූ සාමර්ථ්‍යයාගේ ග්‍රහණයැ පිණිසැ—" පත්නී පරිජනාදාන මූලශාපාඃ පරිග්‍රහාඃ " යනු නිඝණ්ඩුයි—සමර්ථවචනං න කෘතං, (යම්සේ ආචාර්‍ය්‍ය පාණිනීන්විසින් " සමර්ථඃ පදවිධිඃ " * යන සූත්‍රයෙන් සමර්ථවචනයැ අශ්‍රය කරනලද්ද එපරිද්දෙන් මේ ශාස්ත්‍රයෙහි) සමර්ථවචනයැ අශ්‍රය නොකරනලදි—" යඃ කශ්චිදිහ ශාස්ත්‍රෙ පදවිධිස්ස සමර්ථො වෙදිතව්‍ය ඉත්‍යර්ථඃ, විධි යත ඉති විධිඃ, පදානාං විධිඃ පදවිධිඃ, සමාසාදිඃ සමර්ථො විග්‍රහ වාක්‍යාර්ථාභිධානෙ ශක්තඃ යෙෂාං පදානාං විධිරුච්‍යතෙ තානි යදි සමෙප්‍රක්ෂිතාර්ථානි භවන්ති පරස්පරසම්බන්ධාර්ථානි තදා‘සෞ විධිර්භවති නාන්‍යථෙති " යනාදි මේ සූත්‍රයෙහි අර්ථයි—මේ පරිභාෂාව්‍යාපාරයෙන් මැ " පස්ස දෙවදත්ත ගාමං, ගච්ඡ යඤ්ඤදත්තො ගුරුකුලං " යන මේ ආදියෙහි අනිෂ්ටප්‍රාප්ති නිවෘත්තියැ කෙරෙත්—සාමර්ථ්‍යය තමාත් වෘත්තියෙහි එකාර්ථිභාවයැ වාක්‍යයෙහි ව්‍යපෙක්ෂායැයි කියා දෙවැදෑරුම් වේ—එහෙයින් මැ කීහ භාෂ්‍යකාරයෝ—" එකාර්ථිභාවො වා සාමර්ථ්‍යං ස්‍යාත් ව්‍යපෙක්ෂා ච " † යි—" එකත්ථිභාවො පන " යන්නෙහි එකාර්ථිභාවය නම් භින්නවූ අර්ථඇති නාමයන්ගේ සාධාරණාර්ථඇති අවස්ථාවිශෙෂයෙකැ වාක්‍යයෙහි වනාහි භින්නාර්ථබැවින් සාධාරණාර්ථතාව නැතැ එහෙයින් මැ වාක්‍යයෙහි " රඤ්ඤො පුරිසො " යි භෙදහෙතුකවූ ෂෂ්ඨීවිභක්ති උපදනේයැ සමාසයෙහි වනාහි උභයපදව්‍යවච්ඡින්නවූ අර්ථයාගේ කථනයැ හෙතුකොටැ ගෙනැ සාධාරණාර්ථතාව වන්නේයි—

මෙහි තාත්පර්‍ය්‍යාර්ථ නම් සමාසයෙහි විශෙෂණයැ විශෙෂ්‍ය

---

* පා. 2, 1, 1.

† " එකාර්ථීභාවො වා සාමර්ථ්‍යං ව්‍යපෙක්ෂා වෙති " (මුද්‍රිත) මහාභාෂ්‍ය. 3, 1 සූ.

යැ හා එක්වෙයි සමස්තවූ කලැ දෙක කැපී වැ එක අර්ථයක් කියයි වාක්‍යයෙහි වනාහි විශෙෂණයැ විශෙෂ්‍යයාකෙරෙන් වෙන් වැ සිටිනේයැ යනුයි—ද්වන්ද්වසමාසයැ සකලපදාර්ථ ප්‍රධානබැවින් පදයන්ගේ විශෙෂණවිශෙෂ්‍යභාවයැ නැතැ එහි තමාත් වාක්‍යයෙන් වෙනස්වූ එකාර්ථීභාවලක්ෂණයැ වේ මයැ ඒ එසේමයැ එකාර්ථීභාවයැ නැතිකල්හි වාක්‍යයෙහි "රඤ්ඤො ගො ච අස්සො ච පුරිසො ච" යි කියා භින්නාර්ථ කාරණසමුච්චයප්‍රතිපාදනයැ පිණිසැ චශබ්දයැ ප්‍රයොග කරනලැබෙයි සමාසයෙහි වනාහි එකාර්ථීභාවයැ ඇතිකල්හි "රඤ්ඤො ගවාස්සපුරිසා" යි වනහෙයින් චශබ්දප්‍රයොග නො කරනුලැබෙයි සේයි — එකත්ථවචනෙනෙව, "**ස්‍යාදි ස්‍යාදිනෙකත්ථං**" යන එකාර්ථවචනයෙන් මැ—"එකත්ථීභාවො එව භවති" යි කියා ශෙෂයි—එවකාරයැ අන්‍යයොගව්‍යවච්ඡෙද හෙයින් වාක්‍යයෙහි තත්ප්‍රකාරයෙන් නොවෙයි යනු හඟවා—වාක්‍යෙ, ("රඤ්ඤො පුරිසො" යන) විග්‍රහවාක්‍යයෙහි—ව්‍යපෙක්ඛා, පදයන් ඔවුනොවුන් උදෙසා සිටීමැ—ආදිශබ්ද යෙන් සංසග්ගයැ භෙදසංසග්ගයැ යන මොවුන් දෙදෙනාගේ ග්‍රහණයයි—ස්වාමිවිශෙෂයා හා එක් වැ ස්වවිශෙෂයාගේද ස්වවිශෙෂයා හා එක් වැ ස්වාමිවිශෙෂයාගේද සම්බන්ධයැ සංසග්ගනම් වෙයි. ස්වාන්තරයන්කෙරෙන් ස්වාම්‍යන්තරයන්කෙරෙන්ද ව්‍යාවෘත්තියැ භෙදනම් වෙයි එදෙක්හි යම් හෙයකින් සම්බන්ධ්‍යන්තරයෙන් අව්‍යාවෘත්තවූ ස්වස්වාමිවිශෙෂයන්ගේ සංසග්ගයැ යුක්තනොවන්නේද එහෙයින් සංසග්ගවාදිහට සංසග්ගයැ වාක්‍යාර්ථයැ ව්‍යාවෘත්තියැ අර්ථ ගෘහීතයි—යම්හෙයකින් සම්බන්ධ්‍යන්තරයක් හා අසම්බන්ධවූ ව්‍යාවෘත්තස්වාදීහුගේ අවස්ථානයෙක් නැත්ද එහෙයින් භෙදවාදිහට ව්‍යාවෘත්තියැ වාක්‍යාර්ථයැ සංසග්ගයැ අර්ථගෘහීතයි—උභයවාදිහට භෙදසංසග්ගදෙක මැ වාක්‍යාර්ථයි—භෙදකො, ව්‍යාවත්තිකයැ; හෙවත්වෙන්කරන්නේයැ—"භෙදො වාක්‍යත්ථො" යි යොදනු — අත්ථගහිතො, කාරණවශයෙන් (භෙදවාදීහු විසින්) ගෘහීතයි—අවඨානං, පිහිටීමැ—"සංසග්ගො වාක්‍යත්ථො" යි යොදනු—සමාසව්‍යපදෙසො'භිමතො, ("**ප්‍රාක්කඩාරාත්සමාසඃ**"* යන මේ සූත්‍රයෙන් පාණිනීන්ට) සමාස

* පා. 2, 1, 3.

සංඥා අභිමතයැ—“ පුථු අඤ්ඤෙ යෙසං පදානං තානි පුථගඤ්ඤානි ” කියා බහුබ්‍රීහි සමාසයි—“ රඤ්ඤො පුරිසො ” යන වාක්‍යයෙහි රාජශබ්දයැ තෙමැ රාජාර්ථය මැ කියයි පුරිසශබ්දයද පුරුෂාර්ථය මැ කියයි “ රාජපුරිසො ” යන සමාසවිෂයෙහි වනාහි රාජශබ්දයද පුරුෂාර්ථය මැ කියනහෙයින් රාජ පුරිස ශබ්දයන් දෙදෙනාගේ ඒකාර්ථීභාවයැ වෙයි අවයවාර්ථානුගතවූ වෙන මැ සමුදායාර්ථයෙක් පහළවන්නේයැයි කියා පදාපෙක්ෂාව හෙතු කොටැ ගෙනැ ඒකාර්ථීභාවයැයි කියනුලැබේ—ජහත්ස්වාර්ථවෘත්තියැ අභ්‍යුපගමයැ කොටැ “ විසෙසනස්ස සකත්ථපරිච්චාගෙන ” යනාදී කීහු. එහෙයින් මැ “ නනු ච ” යනාදියෙන් අජහත්ස්වාර්ථවෘත්තිවාදීතෙමැ චොදනාකෙරේ—“ ජහමානානි පදානි සකත්ථං යස්සා සා ජහමානසකත්ථා ” යි අන්‍යාර්ථසමාසයි—අත්ථං, (රාජශබ්ද) වාච්‍යයැ—අර්ථනතාය, අත්‍යර්ථයෙන් ; න ජහාති, නොහරී—පරිත්‍යාගමාත්‍රයක් පිණිසැ ජහත්ස්වාර්ථයැයි කියනුලැබෙයි සර්වප්‍රකාරයෙන් ත්‍යාගයැ සඳහා නොකියනුලැබෙයි කුමක්හෙයින්ද ? ඒ රාජශබ්දාදීන් තමා පරොපකාරයැ පිණිසැ ස්වීකාර කළහෙයිනි—සර්වප්‍රකාරයෙන් ස්වාර්ථත්‍යාගයක් ඇතිකල්හි පරොපකාරයාගේ අසම්පාදනයැ හෙතු කොටැ ගෙනැ ප්‍රයොජනභාවයෙන් අනුපාදානයැ වන්නේයැ යනු අභිප්‍රායයි—ස්වාර්ථයාගේ අත්‍යන්තත්‍යාගයෙහිද නිර්දෝෂත්වයැ හඟවන පිණිසැ “ අථවා ” යනාදී කීහු—අන්වයතො, “ ස එවායම් ” යන අධ්‍යවසායයෙන් හෙවත් යම් රාජශබ්දයෙක් වාක්‍යාවස්ථාවෙහි දෘෂ්ටද මේ එමැ රාජශබ්දයැයි යන ප්‍රත්‍යභිඥාවෙන් ව්‍යවහාරිකයන්ගේ ඒකත්වාධ්‍යවසාය හෙතු කොටැ ගෙනැ අර්ථභාවයෙහිදු පුරිසශබ්දයහට විශෙෂණවෙයි යනු භාවයි.

අසං[a]—විභත්ත්‍යන්තෙ උදාහරිත්වා, විභක්ත්‍යර්ථවිෂයෙහි (වැටෙන්නාවූ අසංඛ්‍යයහට ඉත්ථිශබ්දයා හා සමාස “ අධිත්ථි ” යි) උදාහරණ කොටැ—“ **නිත්‍යසමාසානාමවිග්‍රහො ’ස්වපද විග්‍රහො වා** ” යන න්‍යායාපෙක්ෂාවෙන් “ නිච්චසමාසත්තා ” යනාදී කීහු—අසකපදවිග්ගහෙන, අන්‍යපදවිග්‍රහයෙන්— “ ඉත්ථීසු ” යන තැන්හි අධිශබ්දයෙන් වාච්‍යවූ ආධාරාර්ථයැ

---

[a] 3, 2 සූ.

සප්තමියෙන් කියනලද බැවින් අධිශබ්දයැ ප්‍රයොග නොක
රනුලැබෙයි. එහෙයින් “ඉජ්ජිසු” යි අන්‍යපදයෙන් වාක්‍ය
දක්වීමයි—රූපසිද්ධිකාරයෝ “ඉජ්ජිසු අධිකිච්ච පවත්තා අධි
ච්චි” යි වාක්‍ය ගත්හ; එහි “අධිකිච්ච” යි කීකල්හි කවරක්
අධිකාර කොටැ හෙවත් කුමක් උදෙසාදැයි නොදැනෙන
හෙයින් ඒ අසඞ්ගතයැයි හැඟේ—මෙ මැ කීහ න්‍යාසකාර
යෝ—“ස්ත්‍රීෂ්වධිකෘත්‍ය ඉති ප්‍රායශො න්‍යසෙෂ්වස්ති තත්‍රාධි
කෘත්‍යෙතදසඞ්ගතමිත්‍යාහුඃ කිමධිකෘත්‍යෙත්‍යවිඥානාත්” යි—
තෙන, ඒ (අධිශබ්දයා) හා—සප්තම්‍යන්තවූ ස්ත්‍රීශබ්දයද ප්‍රථ
මාන්තවූ අධිශබ්දයද සමාසකරනුලැබෙයි කියා ජිනෙන්ද්‍රබුද්ධි
පාදයෝ කීහු—“ස්ත්‍රීශබ්දස්සප්තම්‍යන්තස්සමස්‍යතෙ'ධිශබ්දස්තු
ප්‍රථමාන්තඃ” යනු න්‍යාසයි—පරිග්ගහාපෙක්ඛාය, සවිකාර
පෙක්ෂායෙන්.

“සවිකාරෙ ශපථෙ චෛව මූලෙ පරිජනෙ'පිච
දූරෙෂු ච විපශ්චිදභිස්සම්බන්‍යතඃ පරිග්‍රහඃ”—යනු නිඝණ්ඩුයි.

“තිණ්ණං සාකල්‍යං” යි විග්‍රහයි—තතො, (යම්හෙයකින්
සකලසකලයෙහි නොවැටේද) එහෙයින්—“පරිග්ගහා
පෙක්ඛාය සමත්තියා සාකල්‍යං න භිජ්ජති” යි සම්බන්ධකරනු—
සමත්තියා, අන්තයාකෙරෙන්—“සමත්තියම්පි උදාහරණං” යි
ශෙෂයි—“**අව්‍යයං විභක්තිසමීපසමෘද්ධිව්‍යෘද්ධ්‍යර්ථාභාවාත්‍යයා
සම්ප්‍රතිශබ්දප්‍රාදුර්භාවපශ්චාද්‍යථානුපූර්ව්‍යයෞගපද්‍යසාදෘශ්‍යස
ම්පත්තිසාකල්‍යාන්තවචනෙෂු**”* යන පාණිනීයසූත්‍රයෙහි
පරිග්‍රහාපෙක්ෂාවෙන් සමාප්තිග්‍රහණයැ පිණිසැ අන්තවච
නොපාදනයැ කරනලද එද සාකල්‍යයට ඇතුළත් කොටැ
“සාග්න්‍යධීතෙ” යි උදාහරණ දක්වූහු—“සාකල්‍යෙ එව” යි
පදච්ඡේදයි—“අග්ගිපරියන්තං” යන්නෙහි අග්න්‍යර්ථවූ ග්‍රන්
යැතෙමැ තාදර්ථ්‍යයෙන් ‘අග්ගි’ නම් වේ—සම්බන්ධිභෙදැති,
(සෘද්ධ්‍යර්ථාදි) සම්බන්ධිභෙදයැ හෙතුකොටැ ගෙනයැයි කියායි—
නිරූපතාය, ස්වරූපරහිතබැවින්—ධම්මාභාවෙ ච, (බ්‍රාහ්මණ
ත්වාදි) ධර්මියාගේ අභාවයෙහිද—“පරතන්තා” යනාදීන් විප්‍රති
ෂෙධවිෂය දක්වූහු—“උප්පන්නස්ස පච්ඡා අභාවො න” කියා
සම්බන්ධකරනු—“කිත්ති මක්කටස්‍යාභිධානම්” යි රත්නමති

* පා. 2, 1, 6.

පළිකාලඞ්කාරයෙහි පෙනෙනහෙයින්ද තදනුසාරයෙන් මැ සාරත්ථවිලාසිනියෙහිද "කිට්ඨි මක්කටස්සාභිධානං" කියා අර්ථ දක්වූහෙයින්ද මකීටයා හා සදෘශවූයේයැයි අර්ථ කීයැ යුතුයැ. වැළිත් විරිතසන්‍යෙහි "ක්ඛියා, කෘෂණ් වෘශ්චික ධෙනුව හා ; සදිසො, සදෘශවූයේ ; සකිඛි, සකිඛිනම් වේ" යි යථාප්‍රතිභාසයෙන් කියනලද අර්ථ නොගතයුතු.

**යථා**[a]—යථාතෙථති, අසංඛ්‍යසමාසවිධානසූත්‍රයෙහි "යථා තෙථ" යන්නෙන්—සදිසතෙත, සාදෘශ්‍යයෙහි—"සාපෙක්ඛම සමත්ථමහවති" යනුයෙන් "**සාපෙක්ෂමසමර්ථම්**" යන න්‍යාය පරිභාෂාව දක්වූහු—තස්ස, ඒ සමුදායයාගේ.

**යාව**[b]—"අමත්තානං යත්තකො පරිචෙජ්ජෙද" යි විග්‍රහයි—අවධාරණේ, ඉයත්තාවයෙහි.

**පය්‍යපා**[c]—පය්‍යපාදිසූත්‍රයෙහි "පඨමන්ත" යනු කුමක් හෙයින් කීයේද ඒ පදයැ නොකිවත් "අපපරිහි වජ්ජනෙ" යනාදි පළිකායෙහි වක්‍ෂ්‍යමාණක්‍රමයෙන් පඨමන්‍යන්තබැවින් පඨමන්‍යන්තයන් හා මැ සමාස දනුණේ නොවේදැයි අශඞ්කා කරනුවෝ "යදිපි" යනාදි කීහු—"තථා'පි" යනාදිය විශෙෂාභිධානපරිහාරයි—"ආ චත්තාරො" යන තැන්හි ආශබ්දයැ තෙමැ වාක්‍යර්ථයෙහිද සමරණයෙහිද වැටේ—"ආ එවනනු මඤ්‍යසෙ" යන තැන්හි ප්‍රයුක්ත ආකාරයැ පූර්වප්‍රක්‍රාන්ත වාක්‍යර්ථයාගේ අන්‍යථාකරණයෙහි වැටෙනහෙයින් වාක්‍යර්ථ විෂය වෙයි. "ආ එවං කිල තත්" යන තැන්හි මෙසේ දන්නාලද සිහිකරනලද්ද යන අර්ථයෙහි වැටෙයි මෙහිද එසේමැයි—"ගාමො බහි තිඨති" යි සම්බන්ධයි—"පරිපබ්බතං" යනාදි තැන්හි "පබ්බතස්මා සමන්තතො" යනාදීන් වාක්‍ය ගතයුතු.

**සමී**[d]—මෙතැන්හි "**අනුයත්සමයා**"* "**යස්‍ය චායාමඃ**"† යි සූත්‍රවයෙක් පාණිනීන් විසින් විරචිතයි—"සමයා සමීපම්, අනුයත්ස්‍ය සමයා සමීපවාචී තෙන සහ සමස්‍යතෙ" "අනුයත්ස්‍යායාමවාචී තෙන සුබන්තෙන සහ සමස්‍යතෙ" යනු ක්‍රමයෙන් ඒ සූත්‍රවයෙහි අර්ථයි—ආයාමො, දීර්ඝත්වයද—පුනස්ස මීපවචනයැ "**අසංඛ්‍යං**"[e] යනාදි සූත්‍රයෙන් විහිත නිත්‍ය

---

* පා. 2, 1, 15.   † පා. 2, 1, 16.

[a] 3, 3 සූ.   [b] 3, 4 සූ.   [c] 3, 5 සූ.   [d] 3, 6 සූ.   [e] 3, 2 සූ.

සමාසයාගේ විකල්ප පිණිසයි—එහෙයින් “වනස්ස අනු” “ගඞ්ගාය අනු” සී කියා වාක්‍යද වේ—“අනුගඞ්ගං බාරාණසියා” යන්නෙහි බාරාණසියට ගඞ්ගායාමයැ ලක්ෂණයැ යන අර්ථයි—“ලක්ඛණෙනෙති වත්තතෙ, යස්සායාමවාචී අනුසෙන ච ලක්ඛණෙන සමස්‍යතෙ, අනුගඞ්ගං බාරාණසී, ගඞ්ගයා ලක්ඛණභූතයා ප්‍රසිද්ධායාමගුණයා බාරාණසී ලක්ෂ්‍යතෙ යාවද් යතා ගඞ්ගා තාවදීයමපීති සවභාවාදුපමානොපමෙයභාවස්ස මාසෙ ප්‍රතීයතෙ ගඞ්ගාවද්දීඝෙති” යන භාගවෘත්තිමතයෙහි “බාරාණසී” යන ප්‍රථමාන්තයැ නොයෙදෙන්නේයැයි සිතා “ගඞ්ගායාමෙන යුත්තා” යනාදි කීහු.

**තිට්ඨ**[a] ~ “අකතසමාසා ච” යන්නෙන් මේ තිට්ඨගවාදි සූත්‍රයෙන් අසංඛ්‍යසමාස කරනලදබව කීහු — තිට්ඨන්ති දොහාය අස්මිං ඨානෙ කාලෙ වා තං සො තිට්ඨගු—සංහටා යවා යස්මිං කාලෙ සංහටයවං—“උම්මත්තගඞ්ගං නාම දෙසො” සී සංඥා විෂයෙහි නිත්‍යසමාසයි—“උම්මත්තා ගඞ්ගා යස්මිං දෙසෙ උම්මත්තගඞ්ගං” කියා ව්‍යුත්පත්තිමාත්‍රයට වාක්‍ය ගතයුතු—“ලොහිතගඞ්ගං” යනාදියද මෙසේමැයි—ආදිශබ්දයෙන් “සමත්තං භූමියා සම්මභූමි, සමත්තං පදෘතිනො සම්මපදෘති, සමස්ස සොභනත්තං සුසමං” යනාදීන්ගේ සඞ්ග්‍රහයයි.

**ඔරෙ**[b] ~ “පාරෙගඞ්ගං” සී අලුක්සප්තමීසමාසයෙන් සිද්ධයැ එහෙයින් “එකාරන්තත්තං නිපාතනතො” යනු වෘත්තිකාරයන් විසින් කුමක් පිණිසැ කියනලදදයත්? ඒ සැබැවැ අන්‍යවිභක්තියෙන් සමාසකළ කල්හි “පාරං ගඞ්ගාය පාරෙගඞ්ගං” කියා සමාසනොවෙයි ඒ පිණිසයි—තස්ස, ඒ ෂෂ්ඨී සමාසයට.

**තං**[c] ~ “අලිඞ්ගත්තායං” යන තැන්හිද “සම්පත්තායං” කියා සම්බන්ධකටයුතු—“**පූර්වං වාච්‍යං භවෙද්‍යස්‍ය සො'ව්‍යයීභාව ඉෂ්‍යතෙ**”* යනුහෙයින් පරයෝ මේ අසංඛ්‍යසමාසයට අව්‍යයීභාවයැයි සංඥා කෙරෙත්.

**අමා**[d] ~ “සො ච එකත්ථීභාවො විසිට්ඨො'භිමතො” සී සම්බන්ධයි—“මුහුත්තං සුඛං” යනු අත්‍යන්තසංයොගයෙහි

---

* කා. 2, 5, 14.

[a] 3, 7 සූ. [b] 3, 8 සූ. [c] 3, 9 සූ. [d] 3, 10 සූ.

ද්විතීයාවිභක්තියි—"සරණගතො" යන තැන්හි ගතශබ්දයා හා 'සරණං' යන ද්විතීයාන්තයාගේ සමාසයැ රූපසිද්ධියෙහි "**අමාදයො පරපදෙහි**"* යන කාතන්ත්‍රයනසූත්‍රයෙන් "සො සරණගතො" යනාදි ද්විතීයාතත්පුරුෂසමාසප්‍රයොගද එසේ මැ පදාවතාර ප්‍රයොගසිද්ධි ආදියෙහිද පෙනෙනහෙයින් "**ද්විතීයා ශ්‍රිතාතීතපතිතගතාත්‍යස්තප්‍රාප්තාපන්නෛඃ**"† යන ආචාර්‍ය්‍යපාණිනිප්‍රණීත විශෙෂවිධානසූත්‍රයට අනුකූලවූ ද්විතීයාතත්පුරුෂසමාසය මැ ගතයුතුයැ ශබ්දනීතිකාරයන් විසින් "කත්ථචි දුතියා න භවති සරණං ඉති ගතො සරණ ගතො" කියාද "**ඉතිලොපෙ පඨමාය**,‡ ඉතිසද්දස්ස ලොපඨානෙ විභත්‍යන්තං පදං පඨමාවිභත්‍යන්තෙන සමාසීයති සො'පි සමාසො තප්පුරිසසඞ්ඛො හොති" යනාදීන් ප්‍රථමා තත්පුරුෂසාධනයැ පිණිසැ යම් තුෂඛණ්ඩනප්‍රයාසයෙක් කරනලදද එය වෛයාකරණයන්ට අනභිමතහෙයින් නිරස්තයැයි දතයුතු—තවද "බුද්ධං සරණං ගච්ඡාමි, උපෙමි බුද්ධං සරණං, යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ" යනාදි පාඨයෙහි ගම්ධාතුව,

"යස්මා න ගම්සද්දො'යං නීදයොව විකම්මකො
ගච්ඡාමි සරණන්තිති වත්තබ්බන්තං විජානතා."

යනුහෙයින් නීදිධාතූන් මෙන් විකර්ම්මක නොවෙයි එහෙයින් "අජං ගාමං නෙති" යනු මෙන් "බුද්ධං සරණං ගච්ඡාමි" යි කියන්ට නොපිළිවනැ "සරණන්ති ගච්ඡාමි"යි කීයයුතුයැ එබැවින් මෙහි ඉතිශබ්දයැ ලුප්තනිර්ද්දිෂ්ටයැ සරණශබ්දයද ප්‍රථමාන්තයැයි දතයුතු—සංස්කාර්‍ය්‍යවූ ඔදනයට දධි සංස්කාරකයැ එහෙයින් මිශ්‍රීකරණයැ නැති වැ සංස්කාරක නොවනහෙයින් "**අන්නෙන ව්‍යඤ්ජනම්**"§ "**භක්ෂ්‍යෙණ මිශ්‍රීකරණම්**"‖ යනාදි සූත්‍ර නැති වැ ද සාමර්ත්‍ය්‍යයෙන් උපසෙක ප්‍රතීතියැ වනහෙයින් "වුත්තිපදෙන කිරියා බ්‍යාපෙතෙ" යනාදි කීහු—තදපෙක්ඛාය, ඒ ගම්‍යමානොපසෙචනාදි ක්‍රියාපෙක්ෂාවෙන්—අස්සෙන යුත්තො රථො අස්සරථො, මග්ගෙන සම්පයුත්තං චිත්තං මග්ගචිත්තං, ජම්බුයා පඤ්ඤාතො දීපො

---

* කා. 2, 7, 12. † පා. 2, 1, 24. ‡ ශබ්දනීතිසූත්‍ර.
§ පා. 2, 1, 34. ‖ පා. 2, 1, 35.

ජම්බුදීපෙ පූතිමුත්තෙන පරිභාවිතං භෙසජ්ජං පූතිමුත්ත භෙසජ්ජං" යනාදිද මෙ මැ නයෙන් දතයුතු—කෙචි ඉච්ඡන්ති, ("**අර්ථෙන නිත්‍යසමාසස්සර්වලිඞ්ගතා ච**"* යන වචනයෙන් පාණිනීයාදි සමහරකෙනෙක් කැමැති වෙත්—"විධානං න කතන්ති එවමම්ඤ්ඤතෙ" කියා සම්බන්ධයි—"අනුපාද පරිනිබ්බානනිමිත්තං යො ච වායාමො යා ච කථා යඤ්ච සොතාවධානං" යී සම්බන්ධයි—සොතාවධානං, කන්නතුකිරීමෙක්; ශ්‍රවණමයඥානයෙක්; යා ච කථා, යම් විනයකථාවෙක් ඇත්ද—"යො වායාමො" යනාදීන් කීහෙයින් "තෙසං කථාදීනං" යන තැන්හි "වායාමාදීනං" කියා ලියාගතයුතු—"සවරෙහි භයං" යනාදි තැන්හි "සවරෙහි උප්පන්නං භයං" යනාදීන් යෙදියැයුතු—පාණිනීන්විසින් "**කර්තෘකරණෙ කෘතා බහුලම්**"† යන සූත්‍රයෙන් කෘදන්තයා හා එක් වැ තෘතීයාසමාසවිධානයැ හෙයින් එහි මැ බහුලග්‍රහණයෙන් ග්‍රාමනිර්ගතාදි ප්‍රයොගයෙහි සමාස කියනලද්ද එහෙයින් වෘත්තියෙහි අන්‍යොදාහරණයන් දෙදෙනාගේ ආධික්‍යයැ වූයේයැයි දතයුතු—සමාසභාවො'භිමතො, (පාණිනීන්විසින් "**පූරණගුණසුහිතාර්ථසදව්‍යයතව්‍යසමානාධිකරණෙන**"‡ යන සූත්‍රයෙහි ගුණවචනයෙන්) අභිමතයි—ගුණත්තනියෙ එව, ගුණස්වභාවයෙහි මැ—අභිමතොව, ("**තත්ස්ථෛශ්ච ගුණෛඃ**" යන වචනයෙන් වාර්තිකකාරයහට) අභිමත මැයි—සබ්බො සම්බන්ධිසද්දො, (දෙවදත්තාදි ශබ්දයන්කෙරෙහි) සම්බන්ධඇති (ගුරුදාසාදි) හැම ශබ්ද (මැ); නිච්චං, නිත්‍යයෙන්; සාපෙක්ඛො, ('දෙවදත්තස්ස' යනාදි ෂෂ්ඨීවිභක්තියැ ගුරුදාසාදිශබ්දයෙන් මැ අපෙක්ෂාකරනහෙයින්) අපෙක්ෂාසහිතවූයේ; පවත්තතෙ, පවත්නේයැ; අස්ස, මේ (ගුර්වාදි) සම්බන්ධිශබ්දයාගේ; සාමත්ථෙව, (සාමර්ථ්‍යද්‍යොතනාපෙක්ෂවූ "ගුරුනො කුලං" යනාදි) පදයන්ගේ අර්ථයෙහි මෙන්; වුත්තියම්පි, සමාසයෙහිද; සා ව්‍යපෙක්ඛා, ඒ ඔවුනොවුන්කෙරෙහි අපෙක්ෂාතොමැ; න හීයති, නොපිරිහෙන්නීයි.

මෙ මැ කීහ.

"සම්බන්ධිශබ්දස්සාපෙක්ෂා නිත්‍යං සර්වඃ ප්‍රවර්තතෙ
ස්වාර්ථවත් සා ව්‍යපෙක්ෂා'ස්‍ය වෘත්තාවපි න හීයතෙ" ____යි.

* පා. 2, 1, 36 වාර්තික. † පා. 2, 1, 32. ‡ පා. 2, 2, 11.

සාමත්‍ථියං (පදයන්ගේ අඤ්ඤොන්‍යාපෙක්‍ෂාලක්‍ෂණ) සාමර්‍ථ්‍ය යද—ගමකත්‍වය, අර්‍ථප්‍රතීතියැ කරනබවද—"**අභිධානලක්‍ෂණාහි කෘත්තද්ධිතසමාසාඃ**" යනුහෙයින් කෘත් තද්ධිත සමාසයැ යන මොහු අර්‍ථකථනය මැ නිමිත්ත කොටැ වෙති එහෙයින් යම් තැනෙක්හි සාපෙක්‍ෂබවක් ඇතද අර්‍ථප්‍රතීතියෙක් වේනම් ඒ 'ගමකත්‍ව' නම් වෙයි යනු භාවයි—සාමත්‍ථ්‍යාදිනො තු, සාමර්‍ථ්‍ය ගමකත්‍වයන්ගේ වනාහි ; භාවාභාවා, වීමයැ නොවීමයැ යන මොහු දෙදෙනැ—අභිමතො, (පුරණාදි සූත්‍රයෙහි සමානාධිකරණග්‍රහණයෙන්)—නාභිමතො, ("**ච ශුශ්‍රෙණ්‍යාශ්ච ශ්‍රෙෂ්ඨ රසමශ්‍රෙණ්‍යාක්‍ෂෂ්ඨීසමාසප්‍රතිෂෙධො වක්තව්‍යඃ**" යන වක්තව්‍යයෙන්)—"ගවාදීනමසමාසෙ" යනු "භින්නත්‍ථතායං" යන්නට විවරණයි—වෘත්තියෙහිත් පඤ්චිකායෙහිත් "භින්නත්‍ථතායං" කියා මැ පාඨහෙයින් සාරත්‍ථවිලාසිනියෙහි "පුථගත්‍ථතායං" යන පාඨයැ රත්නමතිපඤ්චිකාලඞ්කාරයෙහි "පෘථගර්‍ථතායාමිත්‍යස්‍ය" යන පදයැ බලා ලිවා විනා ආචාර්‍ය්‍යයන් කී පාඨයට කල උලලිඞ්ගාපදයෙක් නොවෙයි දතයුතු—"එවමස්සාදීනං සමාසෙන" කියා සම්බන්ධයි—යොගිනං, ඉතරෙතරයොගින්ගේ—ජඪීසමාසො භවති" යනු "වුත්ති හොති" යන්නට විවරණයි—"ගවාදිනං චත්‍ථසමාසෙ සති" යනු "එකත්‍ථීභාවෙ" යන්නට විවරණයි—ජඪීසමාසො, (පාණිනියෙහි මෙන් "**නිත්‍යං ක්‍රීඩාජීවිකයොඃ**"* යන සූත්‍රයක් නැති වැ ද ණකප්‍රත්‍යයාන්තයා හා) ෂෂ්ඨීසමාස වේ—"එවමාදිකං" යන ආදිශබ්දයෙන් "**යාජකාදිභිශ්ච**"† යනාදි සූත්‍රයෙන් සාධිතවූ "බ්‍රාහ්මණයාජකො, ආචරියපූජකො" යනාදි ෂෂ්ඨී සමාසගත්හු.

> "**විභත්තයො විතීයාද්‍යා නාමනා පරපදෙන තු**
> **සමස්‍යන්තෙ සමාසො හි ඥෙයස්තත්පුරුෂස්ස ච.**"‡—

යනාදීන් පරයෝ මේ අමාදිසමාසයට තත්පුරුෂයැයි සංඥ කෙරෙත්.

**විසෙසන** ª—"විසෙස්සතෙ" යනාදීන් 'විසෙසන' ශබ්දයැ

---

* පා. 2, 2, 17. † පා. 2, 2, 9. ‡ කා. 2, 5, 8.
ª 3, 11, සු.

ඝට ව්‍යුත්පත්ති දක්වුහු—"යං අවත්ථාපයති තං වුච්චති" යි සම්බන්ධයි—යං, යම් (නීලාදියෙක්) තෙමැ—සාමඤ්ඤාකාරෙන පවත්තං, (උත්පලාදි) සාමාන්‍යාකාරයෙන් ප්‍රවෘත්තවූ—අනෙකප්පකාරවන්තං, (නීලශ්වෙතාදි) අනෙකප්‍රකාරවත්වූ—වත්ථුං, (උත්පලාදි) වස්තුව—පකාරන්තරෙහි, ශ්වෙතාදි) ප්‍රකාරාන්තරයෙන්—අවච්ඡිජ්ජ (ව්‍යවච්ඡෙත්වා), වෙන්කොටැ; පිරිසිඳැ; වෙසෙසා—එකස්මිං පකාරෙ, (නීලාදීන් අතුරෙන්) එක්තරා ප්‍රකාරයෙක්හි—අවත්ථාපයති, අවස්ථාපනයැ කෙරේද; පිහිටුවාද—තං වුච්චති, ඒ (අවච්ඡේදකයැ විශෙෂණයැයි) කියනුලැබේ—"යං අවත්ථාපීයතෙ තමභිධීයතෙ" කියා සම්බන්ධයි—අනෙකප්පකාරවන්තං යං වත්ථු, නීලාද්‍යනෙක ප්‍රකාරවත්වූ යම් (උත්පලාදි) වස්තුවෙක්—පකාරන්තරෙහි, (ශ්වෙතාදි) ප්‍රකාරාන්තරයෙන්—අවච්ඡිජ්ජ, සම්බන්ධදූරීකරණයැ කොටැ—එකස්මිං පකාරෙ, එක් (නීලාදි) ප්‍රකාරයෙක්හි—අවත්ථාපීයතෙ, පිහිටුවනලැබේද; තං, ඒ (අවච්ඡේද්‍යයැ); අභිධීයතෙ, විශෙෂ්‍යයැයි කියනුලැබේ—න වුත්තං, (පාණිනීන් මෙන් "**විශෙෂණං විශෙෂ්‍යෙණ බහුලම්**" [*] යි සූත්‍රයෙහි මැ "විශෙෂ්‍යෙණ" යන පදයෙක් නොකියනලද්—"විසෙසනස්ස ආකඩ්ඪිතවිසෙසස්සාය සම්බන්ධිසද්දත්තා සාමත්ථියා ලබ්භති" කියා සම්බන්ධයි—විවරිතවා, ("විසෙසෙසන සහෙත්ත" යනාදීන්) විවරණයැ කෙළේයි—එවං සාමත්ථිය ලද්ධස්ස තස්ස ඉදං විසෙසනම එකත්ථෙන" යි සම්බන්ධයි—"එකත්ථෙන" යන තැන්හි "විසෙසෙසන සහ සමාසො හොති" කියා අධ්‍යාහාර කොටැ අපි කීයැයුතු—එවං, මේ යථොක්තප්‍රකාරයෙන්—තස්ස, ඒ විශෙෂ්‍යයාගේ—තෙනාති අත්ථො, ඒ (සමානාධිකරණයා) හා (එක්ව යැ) යන අර්ථයි—විසෙස්සස්ස සමානාධිකරණත්තම විසෙසනාපෙක්ඛං" කියා අන්වයයි—කුතො ඉච්චාහ සම්බන්ධාති—සම්බන්ධා ඉති, විසෙස්සස්ස විසෙසනෙන සහ සම්බන්ධතොති අත්ථො—විශෙෂ්‍ය ශබ්දයාගේ විශෙෂණශබ්දයා හා එක්වැ සාමානාධිකරණ්‍යයැ විශෙෂණශබ්දයැ අපෙක්ෂා කොටැ ඇත්තේයැ යනු භාවයි—අතොයෙව, (යම්හෙයකින් විශෙෂ්‍යයාගේ සාමානාධිකරණ්‍යයැ විශෙෂණාපෙක්ෂද) එහෙයින් මැ.

---

[*] පා. 2, 1, 57.

" සාමානාධිකරණ්‍යඤ්ච විශෙෂණවිශෙෂ්‍යතාම්
අපියොඃ කෙචිදිච්ඡන්ති ශබ්දයොරිති කෙචන "—

යනුහෙයින් සමානාධිකරණවාදීහු විවිධ වෙත්—"තනනු සමානාධිකරණත්තං සද්දානමෙව කෙචි ඉච්ඡන්ති වීහි සද්දෙහි භින්නප්පවත්තිනිමිත්තෙහි එකස්ස අධිකරණස්සාභිධෙය්‍යස්ස පටිපාදනතො විසෙසනවිසෙස්සපටිපාදනෙන විසෙසන විසෙස්සත්තඤ්ච අඤ්ඤෙ තු නීලමුප්පලන්ති පවත්තිනිමිත්තානං ජාතිගුණානමෙකමධිකරණං තිස්සයොති සමානාධිකර ණත්තං විසෙසනවිසෙස්සභාවඤ්ච විනානමත්ථානමෙව මඤ්ඤන්ති තත්‍ර පුබ්බකං දස්සනමවලම්බියාහ භින්නනිමිත්තප්ප යුත්තානමිච්චාදි" යනු ටීකායෙහි ප්‍රක්ෂෙප්‍යඋපන්‍යසයි— භින්නනිමිත්තප්පයුත්තානමෙව, (නීලශබ්දයා සාමාන්‍යයෙන් නීලගුණාධාරද්‍රව්‍යයෙහිද නොහොත් ගුණයෙහිද උත්පල ශබ්දයා සාමාන්‍යයෙන් ගුණවත්ද්‍රව්‍යයෙහිද වැටෙන බැවින්) පරස්පරභින්නවූ ශබ්දප්‍රවෘත්තිකාරණයෙහි ප්‍රයොගකරන ලද්දාවූ මැ—සමානාධිකරණත්තං, (නීලොත්පලශබ්ද දෙදෙනා වෙන වෙන උච්චාරණයැ කළකල්හි විශිෂ්ටද්‍රව්‍යාවබොධයක් නැතිහෙයින් "නීලඤ්ච තං උප්පලඤ්ච" යී කියා සමානාධිකරණ භාවයෙන් එක්වූකල්හි විශිෂ්ටද්‍රව්‍යාවිච්ඡසමහවයැ හෙතු කොටැගෙනැ මෙසේ ඒ විශිෂ්ටවස්තුයෙහි පැවැත්තාවූ ශබ්ද යන්ගේ) සමානාපිබවෙක්—" නනු ච " යනාදීන් ජිනෙන්ද්‍රබුද්ධි මතයැ පූර්වපක්ෂ කොටැ " නයිදමෙවං " යනාදීන් පරිහාර දක්වූහු—" සිංසපත්ථො සිංසපත්ථව්‍යභිචාරිං රුක්ඛත්ථං පකාර න්තරෙහි පලාසාදීහි ව්‍යවච්ඡිජ්ජ සිංසපායං ව්‍යවත්ථාපෙනෙතා " යී සම්බන්ධයි—සිංසපායං, ඇට්ටරගස්හි—" අථ තු උච්චතෙ " යනාදීන් චොදකයාගේ වචනාවකාශයැ ආශඞ්කා කෙරේ— අථ තු උච්චතෙ, වැළිත් මෙසේ කියනුලැබේනම්—ඉමෙසං, මේ සිංසපාදීන්ගේ—න සමොධාරිතා, නිශ්චය නොකරන ලද්දී—කිනාතු, එකෙක් ඇතැ—අවසිතවුත්තයො, නිශ්චිතවූ පැවැතුම් ඇත්තාහු—" පයතනං විනා තද පපොති " යි කියා සම්බන්ධයි—පයතනං, " විශෙෂ්‍යෙණ " යන වචනයැ— " තච නත්ථි " යනාදි පරිහාරයි—මෙයින් " අථකිනන භවි තව්‍යමෙව ශිංශපාවෘක්ෂා අම්‍රවෘක්ෂා ඉති විශෙෂණසමාසෙන භවිතව්‍යම් " යනාදින් උභයග්‍රහණයට චොද්‍ය කොටැ නැවත

පරිහාරවශයෙන් දක්වූ "උක්තාර්ථානාමපි හි ලොකෙ ප්‍රයොගො දෘශ්‍යතෙ, තද්‍යථා, පුෂ්පෙ වාවානයෙති" යන ජිනෙන්ද්‍රබුද්ධිමතයද නිරස්තයි—"සමාසස්ස අප්පසඞ්ඛ්‍යායෙව" යි සම්බන්ධයි—ඒවං ජාතියකං, මෙබඳුවූ ස්වරූපකථනප්‍රකාර ඇති—තදෙවං, උක්තප්‍රකාරයෙන්—උභයග්‍රහණං, (විශෙෂණවිශෙෂ්‍යයන්) දෙදෙනාගේ උච්චාරණයැ—අඤ්ඤතරසම්භවෙපි, (විශෙෂණ විශෙෂ්‍යයැ යන මොවුන් දෙදෙනා අතුරෙන්) එක්තරා එකක්හුගේ සම්භවයක් ඇති කල්හිද—ඒවං විධෙපි, මෙබඳුවූ අන්‍යතරසම්භවක් ඇත්තාවූද—පච්චෙකං විසෙසනං සියා, වෙන වෙන මැ විශෙෂණ වීනම්—විසෙසනස්ස පුබ්බනිපාතො ච, විශෙෂණයාගේ පූර්වනිපාතයැද වන්නේ යැ — නාගහිතවිසෙසනා විසෙසෙස්ස බුද්ධි උපජ්ජතීති, "**නාගෘහීතවිශෙෂණා විශෙෂ්‍යෙ බුද්ධිඃ ප්‍රවර්ත්තතෙ**" යන වෛශෙෂිකන්‍යාය හෙයින්—උප්පලනීලන්තිපි, "උප්පලනීලං" යන අනිෂ්ටප්‍රසඞ්ගද — අථවා, වෙනත් යුක්තියෙක් ඇතැ—අඤ්ඤමඤ්ඤානුපකාරිත්තා, ඔවුනොවුන්ට (විශෙෂණ විශෙෂ්‍යත්වයෙන්) අනුපකාරී බැවින්; හෙවත් ස්වප්‍රධානබැවින්—එකත්ථෙ, එක අර්ථයෙක්හි—චොදනායං, ("ශ්වෙතං ඡාගමාලභෙත") යන වෙදවාක්‍යයෙහි—ශ්වෙතං ඡාගම්, ශ්වෙතවර්ණවූ අජයා; ආලභෙත, ස්පර්ශ කරන්නේයැ; යන අර්ථයි — "ඡාගතො'ඤ්ඤෙ, සෙතගුණයුත්තො'පි නාලබ්භතෙ" කියා සම්බන්ධයි—පිට්ඨපිණ්ඩං, (සුදු පැහැ ඇති) පිටිගෙඩියක්—කතකිච්චො, (යජමානතෙමැ) කෘතාර්ථවූයේ—"නච නාලබ්භතෙ තස්මා ගුණෙ අප්පධානං" කියා අධ්‍යාහාර කටයුතු—ගුණනිමිත්තො'පි සමානො, ගුණයැ ප්‍රවෘත්තිනිමිත්ත කොටැ ඇත්තේද—දබ්බසද්දෙ, ද්‍රව්‍යවචන වූයේ—අපායිනො ච, (ද්‍රව්‍යයෙන්) පහවනසුළුත් (වෙති)—"නිවත්තනතීති" යන තැන්හි ඉතිශබ්දයැ යස්මාදර්ථයෙහි වැටේ—"තන්නිමිත්තො සද්දො දබ්බසද්දො න" යි සම්බන්ධයි—"**පූර්වකාලෛකසර්වජරත්පුරාණනවකෙවලාඃ සමානාධිකරණෙන**"* යන සූත්‍රයෙන් පාණිනීන්විසින් ප්‍රපඤ්චිත ප්‍රයොගයන්ගේද න්‍යායසිද්ධත්වයැ දක්වන්නාහු "පුබ්බකාලවාචිනො" යනාදි කීහු—"සමාසො භවති" යනු ශෙෂයි—

* පා. 2, 1, 49.

උපලක්ඛිතොති, ("කාකෙභ්‍යො රක්ෂ්‍යතාමන්නමිති බාලො'පි චොදිතඃ උපලක්ෂණවාක්‍යත්වාන්න ශ්වාදිභ්‍යො න රක්ෂති" යන මේ උපලක්ෂණන්‍යායයෙන්) දක්වනලද්දේයැයි කියා—"එවං" යනාදීන් "**උපමානානි සාමාන්‍යවචනෛඃ**"* යන සූත්‍රයෙන් පාණිනීයව්‍යාකරණයෙහි දක්වනලද "සත්ථිසාමා, හංසගග්ගදා" යනාදි උදාහරණද මෙහි මැ අන්තර්ගත කෙරෙත්—විසෙසාපරිග්ගහා, ("විසෙසනං" යන සාමාන්‍යපරිග්‍රහයැ මුත්) විශෙෂස්වීකාරයක් නැතිහෙයින්—එවමනුත්තස්සාපි, මෙබඳු උපමානස්වරූපයාගේද—සාධම්මියා, ශ්‍යාමත්වාදි සමානධර්ම්ම ඇතිබව හෙතුකොටැ ගෙනැ—වත්තතෙ, උපචාරවශයෙන් පවත්නේයැ—සත්ථිව, (සම්වන්බැවින්) සිරියක් වැනිනුයි—'සත්ථි' නම් පත්තිරමයි—ඉහ, එතෙසං ගුණානං මජ්ඣෙ, මේ (තීක්ෂණශ්‍යාමාදි) ගුණයන් අතුරෙන්—"සාමගුණවනත්තාය" යන තැන්හි "සාමාය" යනු අභීයාතයි—පසිද්ධවසෙන, ("**ප්‍රසිද්ධසාධර්ම්‍යාත්සාධ්‍යසාධනමුපමානම්**" යනුහෙයින් ශස්ත්‍රියගේ ශ්‍යාමගුණප්‍රසිද්ධියැ හෙතුකොටැ ගෙනැ—ප්‍රසිද්ධවූ ශස්ත්‍රාදීන්ගේ ශ්‍යාමාදිසාධර්ම්‍යයෙන් දෙවදත්තාදි අප්‍රසිද්ධසාධ්‍යයාගේ සාධනයැ උපමාන නමැයි දතයුතු—"සාමාන්‍ය වචනෛරිති කිම්, ඵාලා ඉව තණ්ඩුලාඃ" යන ප්‍රත්‍යුදාහරණයැ ප්‍රතිපාදනයැ කරනුවෝ "යත්‍ර තු උපමානෙ" යනාදි කීහු—ඵාලා, සීවැල්—තෙහි, ඔවුන් හා, තණ්ඩුලසද්දා, උපමෙයවූ තණ්ඩුලශබ්දයැ තෙමැ—"තණ්ඩුලත්තමපි වත්වා දබ්බෙ පවත්තො සාමඤ්ඤවචනො න තු භවති" යි සම්බන්ධයි—දබ්බෙ, තණ්ඩුලද්‍රව්‍ය ඵාලද්‍රව්‍යයෙහි—අභිමතො, ("**උපමිතං ව්‍යාඝ්‍රාදිභිඃ සාමාන්‍යාප්‍රයොගෙ**"† යන සූත්‍රයෙන් පාණිනීන්ට) අභිමතයැ—උපමානොපමෙයසාධාරණ, උපමානොපමෙය දෙදෙනාට සාමාන්‍යවූ; සූරත්තාදිධම්මවචනාප්පයොගෙ, ශෞර්‍ය්‍යාදි ධර්ම්මවචනයාගේ හෙවත් මුනි අයං සීහො විය විසාරදො" යන මේ ආදියෙහි විශාරදාදිශබ්දයාගේ අප්‍රයොගයක් ඇතිකල්හි—කෙසඤ්චි, සමහර ශබ්දකෙනකුන් අතුරෙන්—සාමත්ථියතො, (සාමාන්‍යවචන ප්‍රයොගයක් ඇතිකල්හි සාපෙක්ෂබැවින් සමාසයාගේ අප්‍රසඞ්ගයැ වෙයි යන) සාමර්ථ්‍යයෙන්—සාමඤ්ඤප්පයොගත්ථං.

---

* පා. 2, 1, 55.  † පා. 2, 1, 56.

(සමාසවාක්‍යයෙහි) ශෞර්‍ය්‍යාදි සාමාන්‍යවචනයාගේ අප්‍රයෙ ගයැ පිණිසැ—විසෙසානන්තබ්භාවා, (සාමාන්‍යයාගේ සමා සාන්තභාවයක් ඇතිකල්හිද ක්‍රෑරත්වාදියෙන් විශිෂ්ටවූ ශෞර්‍ය්‍යා දිවාච්‍ය) විශෙෂයක්හු සමාසයෙහි ඇතුළත්නොවීමෙන්— 'අථ' යනාදීන් ජිනෙන්ද්‍රබුද්ධිපාදයන්ගේ අභිප්‍රාය ආශඞ්කා කෙරෙත්—"රාජපුරිසො'භිරූපොති එවමාදිසිජ්ඣනත්‍ථං සා පෙක්ඛස්සාපි පධානස්ස සමාසො භවතීති ඤාපනත්‍ථං වචන මාරභිතබ්බං" කියා සම්බන්ධයි—පධානස්ස, ("රඤ්ඤො පුරි සො'භිරූපො" යන මෙහි අභිරූපසාපෙක්ෂත්වයැ ඇති පුරුෂ පදාර්ථයට විශෙෂණවූ එහෙයින් මැ අප්‍රධානවූ සමාසාවයව රාජශබ්දයහට විශෙෂ්‍යභාවයෙන්) ප්‍රධානවූ පුරුෂශබ්දයා ගේ—ඉදම, මෙ (ඥාපනයැ පිණිසැ වචනාරම්භකිරීමෙන් ප්‍රයොජනය) ද—ගමකත්තං න ච අත්‍ථි, ("මුනි සීහොව සූරො" යන වාක්‍යයෙන් ප්‍රතීයමානවූ අර්ථයැ "මුනිසීහො සූරො" යන මෙයින් නොහැඟෙන හෙයින්) ගමකත්වයැ නො මැ ඇති—මුනිසීහශබ්දයෙන් මැ උපමානොපමෙයභාවනිමිත්තවූ වෛශාරද්‍ය්‍යයාගේ උපාදානයැහෙයින් මුනිසීහශබ්දයා හා සූරශබ්දයාගේ සම්බන්ධයෙක් නැති. කුමක්හෙයින්ද "මුනි සීහො සූරො" කීකල්හි මෙ මුනිතෙමැ කිසිගුණයකින් සිංහ සදෘශයැ ප්‍රකෘතියෙන් ශූරයැයි ප්‍රතීතිය වනහෙයිනි—"පුණ්ණ තාය අව්‍යභිචාරො පුණ්ණතාව්‍යභිචාරො, තස්මා" යි ෂෂ්ඨී තත්පුරුෂයි—"ව්‍යභිචාරි විශෙෂ්‍යං සම්භවන්නීලතායා යථො ත්පලම්" යි කීබැවින් "උෂ්ණො'ග්නිඃ" යනාදි අව්‍යභිචාර යෙහි විශෙෂණවිශෙෂ්‍යත්වයැ නැතිහෙයින් "න විසෙස්ස තා" යි කීහු—කථං අත්‍ථවා, කෙසේ සාර්ථක වේද—කෘෂ්ණ සර්පජාතියෙන් හා ලොහිතශාලිජාතියෙන් වෙසෙසනලද හෙයින් "විසිට්ඨජාතිවචනා" යි කීහු—මෙ මැ කීහ භාගවෘත්ති කාරයෝ—"කෘෂ්ණසර්පො ලොහිතශාලිඃ ගෞරඛරඃ සමුදායා එවෛතෙ විශිෂ්ටජාතිවචනාඃ" යි—තච්ඡකභාවානපෙතො, (බාලයුවත්වාදි) තක්ෂකභාවයෙන් අව්‍යාවෘත්තවූ—න විසෙසෙසා න, විශෙෂ්‍යනොවූයේ නොවේ—"වෛ නාමෙදෘ ප්‍රකෘතමර්ථං වදතඃ" යනුහෙයින් "විශෙෂ්‍ය වෙයි" යන අර්ථයි — නාම ධෙයෙන, තදභිධාන මනුෂ්‍යවාචීවූ—ක්‍රියාසද්දෙ, "තච්ඡතීති තච්ඡකො" යන ක්‍රියාව ප්‍රවෘත්තිනිමිත්ත කොටැ ඇති වඩ්ඪකි

වාචිවූ—තෙසඤ්ච, ඔවුන් දෙදෙනාගේද—“නනු තක්ෂකසස ජ්ජස්‍ය විශෙෂණමභවත්‍යෙව” යනාදින් චොද්‍ය උපදවා “නෛතදස්ති න හි නාමධෙයස්‍ය ක්‍රියාශබ්දෙන තුල්‍යාර්ථාභිධාන සාමර්ථ්‍යම්” යනු ආදිකොටැ ඇති “ක්‍රියාශබ්දපිවිෂයාපෙක්ෂා නොපජායතෙ” යනු අවසන්කොටැ ඇති ග්‍රන්ථසන්දර්භයෙන් කියනලද පරිහාරඇති ජිනෙන්ද්‍රබුද්ධිමතයට දූෂණයැ කරනු කැමැති වැ “යො’පාහ” යනාදි කීහු—නාමධෙය්‍යසස අත්ථාභිධානසාමත්ථියං ක්‍රියාසද්දෙන තුල්‍යං න” සී සම්බන්ධයි—අවයවත්ථානුසාරෙන, ප්‍රකෘත්‍යර්ථප්‍රත්‍යයාර්ථානුසාරයෙන්—තස්සං සතියං, (“**අවයවප්‍රසිද්ධෙශ්ච සමුදායප්‍රසිද්ධිර්බලීයසී**” යන න්‍යායයෙන්) සමුදායප්‍රසිද්ධියක් ඇතිකල්හි—“එතං විචාරෙතුං යුත්තො නාධිකතං” සී සම්බන්ධයි—අපිතු, වැළි (කුමක් විචාරනු පිණිසැ ප්‍රස්තුතද)—“තච්ඡකසද්දො අනෙකත්ථවුත්ති වා අනෙකත්ථො න වා ඉති විචාරෙතුමධිකතං” සී යොජනායි—අධිකතං, ප්‍රස්තුතයි—එත්ථ ච, මේ පූර්වපක්ෂයෙහිද—අත්ථාභිධානං, (නාමධෙයක්‍රියාවාචී ශබ්දයන් දෙදෙනාගේ) අර්ථකථනයැ—“අතුල්‍යමත්ථාභිධානං සමුදායප්පසිද්ධියා බලවතීතනාම කඤ්චි පීළං නාවහති” කියා සම්බන්ධයි—“සමුදායප්පසිද්ධියා අවයවප්පසිද්ධිබාධා න ච සක්කා විඤ්ඤාතුං” කියා සම්බන්ධයි—චශබ්ද අවධාරණයෙහි වැටේ—“කමෙනත්ථප්පසිද්ධීති යං එතං පන සක්කා විඤ්ඤාතුං” සී යොජනායි—පටිවිහිතං, පරිහාරකරනලද්දේ—පච්චුදාහරණං, (“තචජකො සප්පො” යන) ප්‍රත්‍යුදාහරණයැ—අනුපපන්නං, (“තචජකසප්පො” සී සමාසවන හෙයින්) අයුක්තයි—අඤ්ඤස්ස, අන්‍යවූ (පීතාදීහු)—“අවච්ඡෙදකත්තා” යන තැන්හි “කාලස්ස” සී අධ්‍යාහර්ත්තව්‍යයි—කාලමහා අඤ්ඤෙ පීතාදිතො අඤ්ඤො, න” සී සම්බන්ධයි—අඤ්ඤෙපි, අඤ්ඤශබ්දයද—“කාලත්තෙන පීතාදිනො ව්‍යවච්ඡිජ්ජමානත්තා” සී සම්බන්ධයි—කාලඤ්ඤානං, කාල අඤ්ඤශබ්දයන් දෙදෙනාගේ—පාණිනින්විසින් “**ප්‍රාප්තාපන්නෙ ච ද්විතීයයා**”* “**කාලාඃ පරිමාණිනා**”† යන සූත්‍රවයෙන් ප්‍රතිපාදිතසමාසද න්‍යායාන්තරයෙන් සාධනු පිණිසැ “පත්තාපන්නානං” යනාදි කීහු—පරිමාණිවාචිනා, මාසො ජාතස්ස යනාදි වාක්‍යයෙහි මාසාදිපරිච්ඡෙදවත්වාචිවූ ජාතාදි

---

* පා. 2, 2, 4. † පා. 2, 2, 5.

හා එක්වැ—ජාතො, සී සෙ ; සම්පන්නො භවති, සම්පුණ්ණ වන්නේයි—මෙයින් "මාසො ජාතස්ස" යන විග්‍රහයට අපි දක්වනලදි—අඤ්ඤථා, (ඕහට මාසයැ සම්පුණ්ණ) නොවීනම්—ස මාසො, (සො මාසො,) (ජාතාදීන්ට පරිමාණත්වයෙන් විවක්ෂිතවූ) ඒ මාසයැ තෙමැ—සමහර පොතෙකැ "මාසො" කියා මැ පාඨයි—"පුබ්බනිපාතප්පසඞ්ගො න ච සියා" සී සම්බන්ධයි—පාණිනීයයෝ "**ක්තක්තවතූ නිෂ්ඨා**" * යන සූත්‍රයෙන් ක්තක්තවතූන්ට නිෂ්ඨාසංඥ කොටැ තදන්තයන්ට අන්‍යපී සමාසයෙහි "**නිෂ්ඨා**" † යන සූත්‍රයෙන් පූර්වනිපාත කෙරෙත්—පරත්තස්ස, පරනිපාතභාවයැ—කෙසඬි, (වාක්‍යකාරාදී) සමහරකෙනකුන්ට ; අභිමතත්තා, ("නිෂ්ඨායාඃ පූර්වනිපාතෙ ජාතිකාලසුඛාදිභ්‍යඃ පරවචනම්" යන මෙයින්)—"න ච යුත්තං" සී සම්බන්ධයි—තථා හි, (ඒ විශෙෂණයාගේ සාපීක්ෂත්වයැ නැතිකල්හි සමාසාභාවයැ). එසේ මැයි—ෂෂ්ඨීසමාසො, ("සති සම්භවෙ ව්‍යභිචාරෙ ච විශෙෂණමර්ථවද්භවති" යන වචනයෙන් විශෙෂණයාගේ සාපීක්ෂත්වයැ වනහෙයින්) ෂෂ්ඨීසමාස වේ—රාජසම්බන්ධී කම්බලාදි අත්ථි න පුරිසො, පුරිසො ච අත්ථි දෙවදත්තාදිසම්බන්ධී රඤ්ඤො න ඉති" සී වාක්‍යයොජනායි—අවචනෙපි, නියමවචනයක් නැතිකල්හිද—වාක්‍යන්තු, ("මාසො ජාතස්ස" යන) වාක්‍යය වනාහි—"**පදෙ තුල්‍යාධිකරණෙ විඥෙයඃ කර්මධාරයඃ**" ‡ යනාදීන් පරයෝ මේ විශෙෂණසමාසයට කර්මධාරයැයි සංඥ කෙරෙත්.

**ණස්ස**[a] ——එත්ථ ච, මේ ("**ම ණස්ස**"[b] යන) සූත්‍රයෙහි මැ—"පාමනපුත්තාදීසු" යන තැන්හි "පාමා අස්ස අත්ථි" යන වාක්‍යයෙහි පාමාශබ්දයාකෙරෙන් "**දිස්සන්තඤ්ඤෙපි පච්චයා**"[c] යන සූත්‍රයෙන් අස්ත්‍යර්ථයෙහි නප්‍රත්‍යය වූ තැනි—"පාමනස්ස පුත්තො" සී ෂෂ්ඨීසමාසයි—ගුලථාදිසන්ධියෙහි සිහින්කස් පාමා නම් වේ — විරිතපදසාධනසන්‍යකාරයෝ "පාමා නම් විචච්චිකායි ; ක්ලාසයට නම්" සී කීහු—පරිශුද්ධස වුත්ත්‍යා, නිෂෙධ්‍යවර්ජනයෙන් විශිෂ්ටාර්ථයෙහි පැවැතුම් ඇත්තේද වෙයි—පසජ්ජප්පටිසෙධවුත්ති ච, ප්‍රතිෂෙධයට පැමිණැ

---

* පා. 1, 1, 26. † පා. 2, 2, 36. ‡ කා. 2, 5, 5.

[a] 3, 12 සූ. [b] 3. 74 සූ. [c] 4, 120 සූ.

තත්සදෘශානපෙක්ෂනිෂෙධයෙන් පැවැතුම් ඇත්තේද වේ—
"අබ්‍රාහ්මණමානය" යනාදි තැන්හි මෙන් උත්තරපදයාගේ
අර්ථය ප්‍රතික්ෂෙප කොට ක්‍රියාගුණාදීන් තත්සදෘශවස්තූහු
කෙරෙහි කාර්‍ය්‍යසම්පාදනය කරනුයේ පර්‍ය්‍යුදාස නම් වෙයි.
"අසූර්‍ය්‍යම්පස්සා රාජදාරා" යනාදිතැන්හි මෙන් සර්‍ව්වප්‍රකාර
යෙන් උත්තරපදාර්ථයාගේ අභාවය ප්‍රකාශකරනුයේ ප්‍රසජ්‍ය
ප්‍රතිෂෙධ නම් වෙයි යනු භාවයි—තදන්‍ය තද්විරුද්ධ
තදභාවයැයි නඤර්ථ තුන්වැදෑරුම් වේ—"අව්‍යාකතා ධම්මා,
අකුසලා ධම්මා, අකාතුන පුඤ්ඤං" යනු එයට ක්‍රමයෙන් උදා
හරණයි–මෙයින් පූර්‍ව්වොදාහරණවය පර්‍ය්‍යුදාසය පශ්චිමොදාහ
රණය ප්‍රසජ්‍යප්‍රතිෂෙධයැයි දතයුතු—ඉතරස්මිං පක්ඛෙ පන,
ප්‍රසජ්‍යප්‍රතිෂෙධවෘත්තිපක්ෂයෙහි වනාහි—කෙනචි නිමිත්තෙ
න, (උපවීතදර්ශනාදි) කිසි සංශයකාරණයැකින්— පයොගසා
මත්ථියා, ("අබ්‍රාහ්මණමානය" යනාදි) ප්‍රයොගසාමීප්‍යයෙන්—
තග්ගතා, සදෘශාර්ථගතවූ—නඤිවයුත්තං, නඤ්වචනයෙන් හා
ඉවශබ්දයෙන් යමෙක් යුක්තද එතෙමැ, අඤ්ඤසදිසාධිකර
ණෙ, තදන්‍යවූ තත්පදාර්ථසදෘශාර්ථයෙහි වැටේ ; තථා හි, එසේ
මැයි ; අත්ථසම්පච්චයො, ("අබ්‍රාහ්මණමානය" යනාදි තැන්හි
බ්‍රාහ්මණසදෘශවූ ක්ෂත්‍රියවෛශ්‍යයන්කෙරෙහි ලොකයෙහි අර්ථ
ප්‍රතිපත්තිය දක්නාලදි—මෙ මැ කීහ පුරාතනවෛයාකර
ණයෝ—"නඤිවයුක්තමන්‍යසදෘශාධිකරණෙ තථා හ්‍යර්ථසම්ප්‍ර
ත්‍යයඃ" යී—වීසු පක්ඛෙසු, පර්‍ය්‍යුදාසප්‍රසජ්‍යප්‍රතිෂෙධවෘත්ති
පක්ෂවයෙහි—මෙහි භාෂ්‍යකාරාදීහු උත්තරපදාර්ථප්‍රාධාන්‍යයැයි
කියත්—සමත්ථවාදිනං, (**"සමර්ථඃ පදවිධිඃ"** * යන සූත්‍රයක්
ඇති) සමර්ථවාදීන්ට—"සමාසො විධෙයො" යී යොදනු—විධෙ
යො, අන්‍යසූත්‍රයෙන් කටයුතුයි—එසේ මැයි. "අපුනගෙය්‍යා"
යන තැන්හි ගානය හා නඤ්හුගේ සම්බන්ධය වනබව මුත්
පුනශබ්දාර්ථයා හා සම්බන්ධ නොවේ—"අනොකාසං කාරෙත්වා,
අමූලා මූලං ගනත්වා" යනාදියෙහිද "ඔකාසං අකාරෙත්වා, මූලා
මූලං අගනත්වා," යී කරණගමනයන් හා සම්බන්ධයි—ගම
කත්තවාදිනො, සාමර්ථ්‍යය නැතත් "ගමකත්තඤ්ච සමාසස්‍ය
නිබන්ධනම්" යී ගමකත්වයෙහි සමාස ඇතැයි කියත්නහට—

---

* පා. 2, 1, 1.

එත්ථාපි, මේ "අපුනගෙය්‍ය" යනාදියෙහිද — අභිමතො, ("**ඊෂද්ගුණෙන**" යන සූත්‍රයෙන් චාන්ද්‍රයන්ට) අභිමතයි.

**කුපා**[a] — තතො, ඒ ("**ලක්ඛණෙත්ථම්භූත**"[b] යනාදි සූත්‍රයෙන් විතීයාවිභක්ති කළ) තැතින්—"යදි ස්‍යාදිවිධිවිසයෙ'පි සො සියා" යී සම්බන්ධයි—සො, ඒ සමාසයැතෙමැ—"අධ මාසමධමාසමත්‍ර අනධමාසනත්ථි විච්ඡායමසංඛ්‍යසමාසො යථා" යී සම්බන්ධයි—"**කුඃ පාපාර්ථෙ**" යනු පරයන්ගේ ගණපාඨයි—"කෙචි" යන තැන්හි "ආහු" යී අධ්‍යාහාර කටයුතු—"ඊසකං උණ්හං කදුණ්හන්ති තං ව්‍යභිචාරෙති" කියා සම්බන්ධයි—"**දුර්නින්දායාම්, ස්වතිපූජායාම්, ආඞීෂදර්ථෙ**" යනු පරයන්ගේ ගණපාඨයි—"ආබධො ඉති ඉමිනා උදාහරණෙන ආ ඊසදත්ථෙති ඉදං ව්‍යභිචාරිතං" යී සම්බන්ධයි—යෙසං, යම් (ප්‍රාදි)කෙනකුන්ගේ—පඨමාය, ප්‍රථමාව හා—පයොගෙ, ("පාචරියො" යනාදි) ප්‍රයොගයෙහි.

**වී**[c] — විසදෙ, විප්‍රත්‍යයාන්ත ශබ්දතෙමැ.

**භූ**[d] — පීතිසම්භවො, ප්‍රීතිපූර්වකවූ (ප්‍රත්‍යුත්ථානාසනදානාදි විෂයවූ ආවෙගයැ)තෙමැ — පරිභවො, හෙළාදකීමද ; උදාසීනතා ච, ඖදාසීන්‍යයද ; හෙවත් කර්තව්‍යයෙහි උපෙක්ෂා බවද — වෘත්තියෙහි "සක්කත්වා" යන්නෙහි ශොභන කොටැ ; නොහොත් විද්‍යමාන කොටැයැයි යන අර්ථයි.

**අසක්ද**[e] — ඉච්ඡන්ති, ("**අනත්‍යාධානඋරසිමනසිමධ්‍යෙපදෙනිවචනෙ**"* යනාදීන් චාන්ද්‍රාදීහු) කැමැතිවෙත්—උරසි කරිය, අභ්‍යුපගමයැ කොටැ—මනසිකරිය, නිශ්චය කොටැ යැයි කියාත් අර්ථයි—ඉච්ඡන්ති, "**තූෂ්ණීම්**"† යනාදීන් චාන්ද්‍රාදීහු) කැමැතිවෙත්.

**වා'නෙ**[f] — විවච්ඡිතෙකසංඛ්‍යසාමඤ්ඤං, ("**ස්‍යාදි ස්‍යාදිනා**"[g] යනුයෙන්) විවක්ෂිතවූ ඒකසංඛ්‍යවගේ සාමාන්‍යයැ—අයනතු, මේ (අන්‍යපීසමාසයැ) වනාහි—ස්‍යාද්‍යන්තසස,

---

* "අනත්‍යාධානඋරසිමනසී" පා. 1. 4. 75.
"මධ්‍යෙපදෙනිවචනෙ ච" පා. 1. 4. 76.

† "තූෂ්ණීමිත්‍යෙතද්භවතිනා ක්ත්වාන්තෙන සහෛකාර්ථං වා භවති" බාලාවබොධනචාන්ද්‍රවෘත්ති.

[a] 3, 13 සු. [b] 2, 10 සු. [c] 3, 14 සු.
[d] 3, 15 සු. [e] 3, 16 සු. [f] 3, 17 සු. [g] 3, 1 සු.

සන්‍නිපදයැ—"තස්සෙව" යනුයෙන් සාමර්ත්‍ථලබ්ධවූ පද යාගේ මැ අන්‍යපදත්‍ථසමාසවනබවද "යථා මෙ මාතා තථා මෙ පිතා" යනාදි වාක්‍යත්‍ථයෙහි සමාසප්‍රසඞ්ගයැ නොවනබවද දක්වූහු—තග්ගුණසංවිඤ්ඤාණෙ, තෙසු අඤ්ඤපදත්‍ථෙසු ගුණ විසෙසනානි තෙසං සංවිඤ්ඤාණං ගහණං තග්ගුණසංවිඤ්ඤා ණං තග්ගුණසංවිඤ්ඤාණතො අඤ්ඤං අතග්ගුණසංවිඤ්ඤා ණං තස්මිං.

මෙ මැ කීහ පුරාතනයෝ :—

"අතග්ගුණෙ තග්ගුණෙති සො සමාසො විධා මතො
තං යථා නීයතං ලම්බකණ්ණ'යං දිඨසාගරො"—යී.

ව්‍යධිකරණඤ්ඤපදත්‍ථසමාසං, භින්නාධිකරණවූ අන්‍ය පදාර්‍ථයාගේ සමාසය—විවිධං අධිකරණං අස්ස යස්ස සො ව්‍යධිකරණෙ—අභිමතො, "(සංඛ්‍යයා'ව්‍යයාසන්නාදූරාධික සංඛ්‍යාඃසංඛ්‍යෙයෙ"* යන සූත්‍රයෙන් පාණිනීන්ට)—"අ දසහි සංඛ්‍යා සංඛ්‍යෙයෙ වත්තතෙති දසසනතො දසසඅද්දසස සංඛ්‍යා නවුතාතිං" කියාද පාඨයි—පරිමාණසද්දසන්නිධානෙ, පරිමාණ ශබ්දයා හා එක්විමැ ඇතිකල්හි—පරිමාණමෙව, පරිමාණ ලක්‍ෂණයැ මැ—"දසසංඛ්‍යාහි අ" යී සම්බන්ධයි-තම, ඒ පරිමාණ ලක්‍ෂණවූ සංඛ්‍යෙයද—සංඛ්‍යානරූපං, සංඛ්‍යානස්වභාවයැ—පරිමාණෙන අභිසම්බුජ්ඣමානා පඤ්චසංඛ්‍ය" යී යොදනු—පරිමා ණෙන, පඤ්චසංඛ්‍යාවෙන් පිරිසිඳිනාලබන සංඛ්‍යෙයයයි කියන ලද පරිමාණයෙන්—"ඉහාපි දසසද්දො" යන්නට අනතුරු වැ "පරිමාණෙන—අභිසම්බුජ්ඣමානො" යී අභිප්‍රාපත්‍යයොජනා කරනු—ඉහාපි, මේ දසතැන්හිද—කෙචි, (පාණිනාදි) සම හරකෙනෙක් — ඉච්ඡන්ති, ("සංඛ්‍යායාං කන්" † යන සූත්‍ර යෙන්) — "පකතිපච්චයත්‍ථභෙදසබ්භාවා" යන තැන්හි "පඤ්චපරිමාණමෙසං පඤ්චකා" යන දෘෂ්ටාන්තයෙහි පරිමාණ ස්වරූපවූ අවයවභෙදසමුදායස්වභාවය ප්‍රකෘත්‍යර්‍ථ නම් වෙයි සමුදායි ශකුනයෝ ප්‍රත්‍යයාර්‍ථ නම් වෙති දතයුතු—සන්‍නිපත තා, සන්‍නිපදයක් බැවින්—තදත්‍ථෙපි, ("වා" යන) ඒ (අන්‍යපදයාගේ) අර්‍ථයෙහිද — පඤ්චාධිඨානපඤ්චාලම්බන—කීයේ මැනෝ භාගවෘත්තිපඤ්චිකාකාර ශ්‍රීධරයන්විසින් — "පඤ්චාධි

* පා. 2, 2, 25. † පා. 4, 3, 147.

ණාතපචාලම්බතෙති"සී—නාමතෙතාන, රූඪීනාමභාවයෙන්—අභිමතො, ("**දිඩනාමාන්‍යනතරාලෙ**"* යන සූත්‍රයෙන් පාණිනීන්ට) — විකපපිතං, ("**විභාෂා දික්සමාසෙ බහුව්‍රීහෞ**"† යන සූත්‍රයෙන් විකල්පයෙන් සව්වනාමසංඥවිධානයෙන්) විකල්පිතයැ — අවයවධම්මෙන, අවයවාබ්‍යසවභාවයෙන්—"ව්‍යධිකරණනමපි" යනාදීන් "බහුව්රීහිසසමානාධිකරණම කතාව්‍යඃ, ප්‍රථමාපිං වජ්ජයිත්වා සබ්බවිභකත්‍යපේක්ෂු බහුව්රීහිඃ" යනාදි පරමත නිරසතයි—"සමාසා" යනු හෙවවපියෙහි පම මීයි—අඤ්ඤත්‍ර ච, (තුල්‍යයොගයෙන්) පිටත ("සකම්මකො සලොමකො" යනාදි) තැන්හිද—අභිමතො, ("**තෙන සහෙති තුල්‍යයොගෙ**"‡ යන සූත්‍රයෙන් පාණිනීන්ට)—උපසංඛ්‍යතො, ("**සුබන්තිකාරෙ 'සභික්ඛිරාදිනාමුපසංඛ්‍යානම්**" සි) උපසංඛ්‍යාන කරනලදි — උපසංඛ්‍යතො, ("**සප්තම්‍යුපමානපූර්වපදස්‍ය තතරපදලොපශ්ච ඛකතවා්‍යඃ**" සි) උපසංඛ්‍යතයි—සභාවතො, අයත්නයෙන් — සමහවො, කාලයාගේ සවරූපලාභයතෙම—සමුදයසඅදසස, ("ඔඩ්ඨව මුඛමස්ස" යන වාක්‍යයෙහි 'ඔඩ්ඨ' යන) සමුදයශබ්දයාගේ — ගතත්ථො, පරිඥාතාපීය—උපනාස්සා, වචනොපක්‍රමයෝ—"විසයදසසනත්ථා" යන මෙයින් "කණ්ඩ කාලො අස්ස" යන මේ ආදියැ වාක්‍යයැයි දක්වත්—තංසමාසස්ස, ඒ සමුදායවිකාරෂෂ්ඨීසමාසයාගේ—අභිමතො, (**සමුදායවිකාරෂෂ්ඨ්‍යාශ්ච බහුව්රීහිරුත්තරපදලොපශ්චෙති වකතව්‍යම්**" යන මෙයින් පාණිනීයයන්ට)—තෙහි එව, ඒ රසසුවණණශබ්දයන් දෙදෙනාවිසින් මැ—තදභිධායීනං, ඒ සඞ්ඝාතවිකාරවාචකශබ්දයන්ගේ — පාදීහි පරස්ස, ප්‍රාදිපූර්ව පදයන්කෙරෙන් පරවූ—ධාතුජස්ස, ධාතුයෙන් නිෂ්පන්නවූ (උත්තරපදවූ පතිශබ්දාදියට)—පක්ඛිකො ලොපො, පාක්ෂික ලොපයද ; හෙවත් විකල්පයෙන් ලොප්ද—සඤ්ඤතෙතාන, අන්‍යපදයා හා එක්වැ—අභිමතො, ("**උත්තරපදලොපශ්ච**" යනුවට "**ප්‍රාදිභ්‍යො ධාතුජස්‍ය වා**" සී කීබැවින් වාතීකිකාර යන්ට අභිමතයි—ඤකාරානුබන්ධා සද්ද, නඤ්ශබ්දයාකෙරෙන් —විජ්ජමානත්ථානං, සත්තාවචනයන්ගේ-("පයොගො, **නඤො 'සත්‍යර්ථානාම්**" යන වාතීකිකයෙන්) පාක්ෂිකප්‍රයොගයද; හෙවත් "අවිජ්ජමානො" යන නඤ්සමාසයාගේ "පුත්තො අස්ස"

---

* පා. 2, 2, 26. † පා. 1, 1, 28. ‡ පා. 2, 2, 28.

ගත අන්‍යපදයා හා බහුව්‍රීහිසමාසද පක්‍ෂයෙක්හි උත්තරපදවූ විජ්ජමානශබ්දයාගේ ලොපයද—ඉච්ඡතෙ, ("බහුව්‍රීහිස්ස මානාධිකරණානාමිති වක්තව්‍යම්. ව්‍යධිකරණානාං මාභූත්. පඤ්චභිර්භුක්තමස්‍යෙති" සී පාණිනියයන් විසින්) කැමැතිවනු ලැබේ—නිච්ඡතෙ, "න ඉච්ඡතෙ" කියා පදච්ඡෙදයි-වචනෙපි, සූත්‍රයක් ඇතිකල්හිද—"**ස්‍යාතාං යදි පදෙ වෙ තු යදි වා ස්‍යුර්බහූන්‍යපි තාන්‍යන්‍යස්‍ය පදස්‍යාර්ථෙ බහුව්‍රීහිඃ**"* යනාදීන් පරයෝ මේ අන්‍යාර්ථසමාසයට 'බහුව්‍රීහි' යයි සංඥකෙරෙත්.

**චත්ථෙ**ᵃ—සමුච්චිති, රැස්කිරීමැ—එකං සාධනං, (කර්ත්‍රාදි ත්‍රිසාධනයන් අතුරෙන්) එක්තරා සාධනයක් හෝ—"එකං සාධනං එකං කිරියං වා පටිච්ච චීයමානතා" සී සම්බන්ධයි—අනෙකත්තනති අධිප්පායො, අනෙකත්වයැ සමුච්චය නම් වෙයි යනු භාවයි—සො පන, ඒ සමුච්චය වනාහි—"තුල්‍යබලා නමනියතක්කමයොගපජ්ජානං" යන මෙයට අනතුරු වැ "සද්දානං භවති" සී යොදා පදාර්ථ පිරියැයුතු—"තුල්‍යබලානං" යන මෙයින් වෙනවෙනැ තමතමන්ගේ ප්‍රාධාන්‍යයෙන් ක්‍රියා සම්බන්ධයැ හෙයින් පරස්පරාපෙක්‍ෂා නැතිබව කීහු—"අනිය තක්කමයොගපජ්ජානං" යන්නෙහි "කමො ච යොගපජ්ජඤ්ච කමයොගපජ්ජං, අනියතං කමයොගපජ්ජං යෙසං සද්දානං" යනාදියෙන් සමාසක්‍රම දතයුතු—අනියතක්කමයොගපජ්ජානං, අනිශ්චිතවූ ක්‍රියාවගේ පූර්වාපරපරිපාටියැ හා යුගපද්භාවයැ ඇත්තාවූ—අනු, පශ්චාත් ප්‍රධානානුරොධයෙන්; ආචයො, රැස්කිරීමැ; අන්වාචයො, අන්වාචය නම් වේ—යත්ථ, යම් ක්‍රියා වෙක්හි—තදනුරොධෙන, ඒ ප්‍රධානානුගුණයෙන්; ඊට අනු කූලවැ—අන්වාචීයමානං, විධානකරනුලබන්නේ — ඉතරීතර යොගො, "ඉතරස්ස ඉතරෙන යොගො" සී සමාසයි—ඉතරී තරයොගශබ්දයාගේ අන් ව්‍යාඛ්‍යානගතියකුදු ඇත්—"ඉතරී තරයොගො අඤ්ඤමඤ්ඤමපෙක්ඛාපාදනතා, යථා සාරිපුත්ත මොග්ගල්ලානාති, සාරිපුත්තසද්දො මොග්ගල්ලානපෙක්ඛො හොති මොග්ගල්ලානසද්දො සාරිපුත්තාපෙක්ඛොපීතීතරීතරත්ථ යොගො ස ච පධානභාවෙනෙති බහුවචනං හොති" සී—"අවයවප්පධානො ච" යනුයෙන් "පලක්‍ෂොʼපි න්‍යග්‍රොධඃ න්‍යග්‍රොධොʼපි පලක්‍ෂ ඉති, සහභූතාවෙතාවනෙ‍ක්‍යාන්‍යස්‍යාපීමාහ

---

* කා. 2, 5, 9. ᵃ 3 23 සූ.

තුඃ, න පෘථග්භූතෙ, කිම්පුනඃ කාරණං සහභූතාවෙතාවනෙන න්‍යාසෙනාපීමාහතුනී පෘථග්භූතෙ, අභිධානං පුනඃ ස්වාභාවිකම්" යනාදීන් භාෂ්‍යකාරොපන්‍යස්තපාඨයට අවිරුඬවූ ස්වාභිප්‍රාය දක්වූහු—'ඉති' යනු යස්වොදපීයෙහි වැටේ—බහුත්ථා, (වාච්‍යවූ අර්ථයාගේ සංඛ්‍යාභෙදයෙන්) බහුත්වයැ හෙතුකොටැගෙනැ—ඉතරෙතරයොගයද සමාහාරයද භාවරූප බැවින් අද්‍රව්‍යවුවද "ශුක්ලං වස්ත්‍රං, ශුක්ලා ශාටී, ශුක්ලඃ කම්බලඃ" යනාදීන් ආශ්‍රයෙන් ලිඞ්ගවචනසිඞ්ධියැ වන්නාක් මෙන් මේ සමාසයෙහිද තඞර්මාභිධානයැ හෙතුකොටැගෙනැ ආශ්‍රයභෙදයෙන් ලිඞ්ග වචනභෙදයැ වෙයි දතයුතු—මෙ මැ කීහ භාෂ්‍යකාරයෝ—"යදසෞ ද්‍රව්‍යං ශ්‍රිතො භවති සමාසස්තස්‍ය යල්ලිඞ්ගං වචනඤ්ච තත්සමාසස්‍යාපි භවිෂ්‍යති" යී—සංහතිප්පධානත්තා, (ඉතරීතර යොගයෙහි මෙන් උද්භූතාවයවභෙදයෙන් නොගෙනැ ඔවුන්ගේ මේ සමුදායයැයි) සඞ්ඝාතප්‍රක්‍රමයැ ප්‍රධානකොටැ ඇතිබැවින්—එකං, එකෙක් ; හෙවත් අප්‍රධානවූ ගවානයනාදියැ—තදනුට්ඨානතො, ඒ භික්ෂාටනයැ කරනහෙයිනි—සො, ඒ(නියොගලත් මාණවක)තෙමැ—"අඤ්ඤදත්ථව්‍යපෙක්ඛාරහිතෙ අන්වාචයෙපි" යී පුනස්සම්බන්ධයි—පඤ්චකං වා, ("පාණ්‍යඞ්ගානං තුරියඞ්ගානං" යනාදීන්) වෙන වෙන හෝ—ව්‍යතිකරෙ, සඞ්කරයැ ; මිශ්‍රවීමැ—"චක්ඛුඤ්ච සොතඤ්ච" යනාදීන් වාක්‍ය ගතයුතු—අලසතා ච ආලම්බරෙ ච අලසතාලම්බරං—අලසතා ච, කාහලද ; හෙවත් කාලමද—ආලම්බරෙච, පණාබෙරද—"ආලම්බරෙ, අළිඟුබෙරද" යී ඛණ්ඩහාලජාතක ගැටපදයෙහි කීහු—විරිතාසත්‍යයෙහි "අලසොච තාලම්බරඤ්ච" යන විග්‍රහයැ අස්ථානයැයි දතයුතු—මුරජ ච, මිහිඟු බෙරද—ගොමුඛඤ්ච, ශඞ්ගවාද්‍යයද ; හෙවත් පිඹිනා හඬද—දෙණ්ඩිමා ච, ගැටපහටුබෙරද ; නොහොත් ඩැක්කීද—උමංද ගැටපදයෙහි "ඉකිළිබෙරයැ" යී කීහු — දෙමළජාතකගැට පදයෙහි "දෙණ්ඩිමා, පටහම්" යී කීහු—මද්දවවාදනං සිප්පමස්ස මද්දවිකො—පණවවාදනං සිප්පමස්ස පාණවිකො—මද්දව නම් මිහිඟුබෙරයි—පණව නම් පණාබෙරයි නොහොත් තුණ්ඩීබෙරයි—යාදවප්‍රකාශයෝ "සමෞ පණවමඩ්ඩලෞ" යී කීහු—භරතශාස්ත්‍රයෙහි දසඟුල් පමණ දිග ඇති මැද සිහින් පසඟුල් පමණ මුඛ ඇති තන්ත්‍රිබඞවූ ගානපටහයැ පණව නමැයි කීහු—සම්මඤ්ච, මනුස්සපටද—තාළඤ්ච, කුළුතාළම්ද—

විධුරජාතකගාථාසන්නයෙහි "සම්ම, සැකඬයැ" යි කීහු—පාචනො ච, කෙවිටද—සත්ති ච, තොබද—තොමරඛ, එරිකෝලද—වෙසතුරුදාගාථාසන්නයෙහි "තොමර, අඩයටියැ" යි කීහු—ශෞනකජාතකගැටපදයෙහි "තොමර, කුතතුකොහොල් නොහොත් දෙබලකටුයැ" යි කීහු—පිණ්ඩම, හෙණ්ඩුවාළද—චම්මඛ, පලගයද—කසයින්පිටිපත්හි "චම්මඛ, කොපුවද" යි කීහු—කලාපං, හියවුරද—කීටා ච, බූවණුවෝද—භූරිදත්තජාතකගාථාසන්නයෙහි "කබල්පිටුපණුවනැ" යි කීහු—පටඞ්ගා ච, පලඟැටියෝද — කුන්ථා ච, කුඩාසින්නෝද—කිපිල්ලිකා ච, මහත්සින්නෝද—රුවන්සූත්‍රඅටුවාගැටපදයෙහි "කුන්ථකිපිල්ලිකං, කුරුකුහුඹුවන්" යි කීහු—කසයින්පිටිපත්හි "කුන්ථකිපිල්ලිකං, කැළිසින්නෝද කීඹියෝද" යි කීහු—ඩංසා ච, ඩැහැ ලේබොන මැස්සෝද—සමහර සන්නයෙක්හි "ඇටලේමැස්සෝයැ" යි කීහු—මකසා ච, මදුරුවෝද—උරබෙභ හනත්වා ජීවතීති ඔරබ්හිකො—උරබෙභ, එළුවන්—සාකුනතිකො ච මාගවිකො ච, ලිහිණිවැදිද මුවවැදිද—සාතං සුනඛං පචතීති සපාකො—වෙනො ච රථකාරෙ ච, කුළුපොතුද රියවඩුද—ජාතකපාළියෙහි—

> "කඳූහං රථකාරෙව පරියනතං උපාහනං
> කාමසඤෙඤජනෙ ඡෙජ්ජං යෙ දිබ්බයෙ ච මානුසෙ"

යනුහෙයින්ද, නිඝණ්ඩුයෙහි "චම්මකාරො රථකාරො" යි කීහෙයින්ද සාරත්ථවිලාසිනියෙහි "රථකාරා චම්මකාරා" යනු යෙදෙයි. "වෙනො විලිවකාරො ච නළකාරා සමා ත්‍රයො" යනු නිඝණ්ඩුහෙයින්ද නොයෙක් සිංහල සන්නගැටපදවලැ 'වෙන' ශබ්දයට කුළුපොත්තනැයි කියා මැ අපි කීහෙයින්ද දෙමළජාතකගැටපදයෙහි "වෙන නම් පොරුන්තනැ" යි කීහෙයින්ද "වෙනාති තචජකා" යන ටීකාපදයැ නොයෙදෙයි හැඟේ—පුක්කුසා ච, බබුරෝද—විශුද්ධිමාර්ගසන්නයෙහි පුප්සඬුවෝයැයි කීහු—කාසා ච, වැලුක්ද—උසීර, සුවඳහොටද—බීරණා ච, හොටතණද—අස්සකණ්ණ, අසුගස්ද—පිලක්ඛා ච, පුලිලගස්ද—කපිත්ථනා ච, තෙල්ඇසටුද—රූපසිද්ධියෙහි "අස්සත්ථකපිත්ථං" යනුද එහි සන්න ගැටපද පිටපත්වලැ "අස්සත්ථ, ඇසතු ; කපිත්ථ, ගිවුළු" යනුද දැකැ සමහර පණ්ඩිතම්මන්‍යකෙනෙක් "කපිත්ථනශබ්දයෙක්නැතැ කපිත්ථශබ්දයැ" යි කියති

විනයගැටපදයෙහි "කපිත්ථන, තෙල්ඇසවුයැ" යි කීහෙයින් වෘත්තියෙහි කපිත්ථනශබ්දයැ මැ පඨිතයැයි දතයුතු—සාකා ච, ලමගගස්ද—භෛෂජ්‍යමඤ්ජූෂාවෙහි "තිහිමතලපලාසා සොඬගකො සාකසාලා ධවකමුකකලිඞ්ගවජ්ජාගකණ්ණස්ස කණ්ණ" යන ගාථාර්ථයට ලී සන්නයැ බලා සාකශබ්දයට කී අර්ථයැ නියම දතයුතු—එළකා ච, තිරෙළුවෝද—වළවා ච, වෙලෙඹුද—බලාවාච, මහවෙල්ලූද—කාරණ්ඩව, විලිකුලෝද—අමරසිංහසන්නයෙහි "දියැකිරළුයැ" යි කීහු—බකා ච, කණකොක්කුද — බලාකා ච, රඳුකොක්කුද — බාලාවතාරසන්නයෙහි "බකබලාකං, කොක්ද කෙකිනිද" යි අර්ථ කීහ—නිපජ්ජා ච, අවරද—"චරණසද්දෙයං ඉධ ගය්හති" යි සම්බන්ධයි—සාඛාසඞ්ඛාතෙ, ශාඛායැයි කියනලද.

"තත්‍රර්ග්වේදධරඃ පෛලස්සාමගො ජෛමිනිඃ කවිඃ
වෛශම්පායන එවෛකො නිෂ්ණාතො යජුෂාමුත~
අථර්වාඞ්ගිරසාමාසීත්සුමන්තුර්දාරුණො මුනිඃ
ත එත ඍෂයො වෙදං ස්වං ස්වං ව්‍යස්‍යන්නනෙකධා~
ශිෂ්‍යෛඃ ප්‍රශිෂ්‍යෛස්තච්ඡිෂ්‍යෛර්වේදාස්තෙ ශාඛිනො'භවන්"

යනුහෙයින් පරාශරපුත්‍රවෙදව්‍යාසඍෂීන්විසින් ඍග්‍යජුස්සාමඅථර්වන්යැයි විභාගකරනලද චතුර්වේදයැ ධැරූ පෛලවෛශම්පායන ජෛමිනි සුමන්තුයැ යන ඍෂිවරුන් සතර දෙනා හා ඔවුන්ගේ ශිෂ්‍යප්‍රශිෂ්‍යතච්ඡිෂ්‍යයන්විසින් මන්ත්‍රබ්‍රාහ්මණවශයෙන් විස්තරකරනලද ඒ ඒ වෙදයැ උන් උන්ගේ නමින් ශාඛා නම් වියැයි දතයුතු—ආචාර්‍ය්‍යපාණිනීහු සමාසවිෂයෙහි ප්‍රථමාවිභක්තියෙන් දක්වනලද්දහට "**ප්‍රථමානිර්දිෂ්ටං සමාස උපසර්ජනම්**"* යන සූත්‍රයෙන් උපසර්ජනසංඥ කොටැ නැවැත ඔහුගේ පූර්වනිපාතයැ පිණිසැ "**උපසර්ජනම්පූර්වම්**"† යන විධිසූත්‍රයක් හඳූළහ. එහෙයින් "සමාසවිධාසිස්සු" යනාදි කීහු—අභිමතො, ("**රාජදන්තාදිෂු පරම්**"‡ යන සූත්‍රයෙන් පාණිනීන්ට)—පරපපයොගො'භිමතො, (රාජදන්තාදිපාඨයෙන්මැ)—ඤායානභිඤ්ඤෙ ච, න්‍යායානුසරණයැ නොදන්නේද—"**චනවඃ සමුච්චයො නාමෙනාර්ථබහූනාං වා'පි යො භවෙත්**"§ යනාදීන් පරයෝ මේ චාර්ථසමාසයට චනව යැයි සංඥ කෙරෙත්.

* පා. 1, 2, 43. † පා. 2, 2, 31. ‡ පා. 2, 2, 30. § කා. 2, 5, 11.

**සමා** [a] ---- "සභාපරිසාසද්දස්ස නපුංසකලිඞ්ගත්තිද්දෙසෙ යුත්තෙ'පි" යි සම්බන්ධයි—ඉත්ථිලිඞ්ගවසෙන නිද්දෙසස්ස, ("**සභාපරිසාය**" යි) ස්ත්‍රීලිඞ්ගවශයෙන් දක්වීමැ—නපුංසකභාවස්ස, නපුංසකලිඞ්ගනොවීමැ—ඤාපනතො, (සාධුත්වයැයි) හඟවනහෙයින්.

**සංඛ්‍යා** [b] ---- තථා හි, ඒ ("**සමාහාරෙ නපුංසකං** [a]" යන සූත්‍රයෙන්) නපුංසකත්වසිද්ධියැ දක්වමු—කෙසේද—පයොජනෙ සති, (ලාඝව) ප්‍රයොජනයක් ඇතිකල්හි—සම්බන්ධියති, විශෙෂණග්‍රහණයැ සම්බන්ධකරනුලැබේ—එසේ, මේ "**සංඛ්‍යාදි**" [b] යන සූත්‍රයෙහි — එකත්තවච්පදෙසො කාතබ්බො, ("**සංඛ්‍යා පුබ්බො දිගු**"* යන සූත්‍රයෙන් සංඛ්‍යාපූර්වසමාසයට දිගු සංඥා කොටැ ඒ දිගුසංඥාඇත්තාහට "**දිගුරෙකවචනම්**" † යන සූත්‍රයෙන් පරවෛයාකරණයන් මෙන් එකවචනභාවයැ කටයුතුයැ—බහුනනං එකීකරණං, (බාහ්‍යව්‍යාපාරයෙන් හෝ බුද්ධියෙන් හෝ) බොහෝදෙනා එක්කිරීමැ.

**ක්වචෙ** [c] ---- අවිසෙසෙන උදාහරණෙපි, (ආචාර්‍ය්‍ය ශ්‍රීචන්ද්‍රගොමිපාදයන් මෙන් "**ඡායා**" යි සූත්‍රයක් බැඳැ විකල්පයෙන් "කුඩ්‍යච්ඡායං කුඩ්‍යච්ඡායා" යි සිද්ධ කොටැ "**බාහුල්‍ය**" යන සූත්‍රයක් බැඳැ අවිකල්පයෙන් "ඉක්ෂුච්ඡායම් ශලභච්ඡායම්" යි උදාහරණ නොකොටැ) සාමාන්‍යයෙන් ("සලභච්ඡායං සකුනච්ඡායං" යි) උදාහරණ දක්වූකල්හිද—අඤ්ඤත්ථ, (බහුලභාවයෙන්) පිටත්තැන්හි — විග්ගහමත්තස්ස, විග්‍රහසාමාන්‍යයැ—යථාසම්භවං, ලැබෙන ලැබෙන පරිද්දෙන්—සද්ද, ශබ්දයාකෙරෙන් පරවූ.

**සඤාදි** [d] ---- පාරිභාසිකං, සෞත්‍රිකයැ; හෙවත් සූත්‍රසිද්ධයැ—පරිභාසාය නිබ්බත්තං පාරිභාසිකං—වත්තුතො, ස්වභාවයෙන්—ආරභිතබ්බමෙව, සඤ්ඤායැහටද හ්‍රස්වවිධානයැ පිණිස පඨිතව්‍ය මැයි — අනිස්සිතමපි කාරියං, ("**සබ්බගමාදිනො**" [e] යනාදීන් විධියමානවූ) එකාරාදිකාර්‍ය්‍යද—"එතං අනිස්සිතං කාරියං න ච යුත්තං" යි යොදනු—"සලභච්ඡායෙ ඉති" යි පදච්ඡෙදයි.

**සප** [f] ---- අප්පධානත්තං, මාලාවගේ අප්‍රාධාන්‍යයැයි—කුස

---

* පා. 2, 1, 52. † පා. 2, 4, 1.

[a] 3, 24 සූ. [b] 3, 25 සූ. [c] 3, 26 සූ. [d] 3, 27 සූ. [e] 2, 62 සූ. [f] 3, 28 සූ.

මෙබන, කුශාම්බනම් රජහුවිසින්—යටගිය දවසැ බ්‍රහමක්‍ෂත්‍රිය වංශයෙහි කුශනම් රජහට දූ වැ වෛදර්භී නම් බිසවුන් කුසින් උපන් කුශාම්බයැ කුශනාභයැ අධූර්ත්තරජසයැ වසුයැ යන සතරබෑ රජදරුවෝ වැඩී වියැ පැමිණැ ප්‍රජාපාලනයැ කරවයි පියරජහුගෙන් නියොග ලැබැ අමුතු වැ මහනුවර සතරක් කරවා විසූහ. එකලැ ඔවුන් කැරවූ නුවරවලැ නම් දක්වන වාල්මීකිමහර්ෂීහු විසින් රාමායණයෙහි බාලකාණ්ඩයේ එක්තිස්වන සර්ගයෙහි—

"තෙෂාං කුශාම්බඃ කෞශාම්බීම්පුරීමාවාසයත්තදා
කුශනාභස්තදා රාම පුරං චක්‍රෙ මහොදයම්."—
"අථාධූර්ත්තරජා රාම චක්‍රෙ ප්‍රාගෙජ්‍යතිෂම්පුරම්
ධර්මාරණ්‍යසමීපස්ථං වසුශ්චක්‍රෙ ගිර්ව්‍රජම්"—යි

කීහෙයින් පදසාධනසන්න්‍යකාරයන් "කුසම්බෙන, කුසම්බනම් ඍෂියාවිසින්" යි කීමද විරිතසන්න්‍යකාරයන් "කුසම්බෙන, එනම් ඍෂීහුවිසින්" යි කීමද ඔවුන්ගේ අශ්‍රැත ව්‍යාඛ්‍යානයැයි දතයුතු.

**ගොසස්සු**[a]—සකත්ථපරිච්චාගෙන, ස්වකීය (ගොශබ්දයෙන් වාච්‍යවූ සාසනා ලාඞ්ගූල කකුද ඛුරවිෂාණවත්) පදාර්ථයාගේ පරිත්‍යාගයෙන්.

**ඉත්‍ථි**[b]—ඉත්‍ථිවිධිසු, ("**පුමුස්ස පථවපුථවා**"[c] යන සූත්‍රයැ අවසන්කොටැ ඇති) ස්ත්‍රීවිධියෙහි—අකාරන්තතො නාමස්මා, (එකත්වාදිමදර්ථවාචීවූ) අකාරාන්තනාමයාකෙරෙන්—ඉත්‍ථත්තං, (එසාප්‍රසිද්ධිමත් අර්ථසාමාන්‍යයාගේ බාලයුවත්වාදිලක්‍ෂණවූ) ස්ත්‍රීත්වයැතෙම—පකතිඅත්‍ථොති, (ප්‍රත්‍යයාර්ථ නොවැ) ප්‍රකෘත්‍යර්ථයැයි—"ජොතකාති දසෙසති" කියා සම්බන්ධයි—"ජොතකා ඉත්‍ථත්තස්ස" යනු ප්‍රකරණගම්‍යයි—"සමානාධිකරණත්තං බහුවචනම්පි හොති" යි සම්බන්ධයි—අඤ්ඤෙ, (ජයාදිත්‍යජිනෙන්ද්‍රබුද්ධ්‍යාදි) සමහර ආචාර්‍ය්‍යකෙනෙක්—ජයාදිත්‍යයන් විසින් පක්‍ෂවය මැ අභ්‍යුපගතයැ ඔහු එහෙයින් මැ කීහ කාශිකාවෙහි—"ස්ත්‍රීත්වම ප්‍රත්‍යයාර්ථඃ ප්‍රකෘත්‍යර්ථවිශෙෂණමෙතද්‍යුගය ථා'පි ප්‍රයුජ්‍යතෙ, ස්ත්‍රියාමභිධෙයායාං ස්ත්‍රියාං වා යත්ප්‍රාතිපදිකං වර්ත්තත ඉති" යි—මෙතැන්හි ජිනෙන්ද්‍රබුද්ධිපාදයෝ මෙසේ

[a] 3, 29 සූ [b] 3, 30 සූ. [c] 3, 47 සූ

වර්ණනා කළහ—“යද්‍ය ස්ත්‍රීශබ්දො විනාපි භාවප්‍රත්‍යයෙන
ස්ත්‍රියෙව වර්ත්තතෙ තද්‍ය ස්ත්‍රියාමභිධෙයායාං ටාබාදයො භව
න්ත්‍යිති ස්ත්‍රීත්වම්ප්‍රත්‍යයාර්ථො භවති යථෛව හි ගොශබ්දො ජාති
පදාර්ථපක්ෂෙ භාවප්‍රත්‍යයරහිතො'පි ගොත්වෙ වර්ත්තතෙ තථා
ස්ත්‍රීශබ්දො'පි ස්ත්‍රීත්වෙ යදා තු ස්ත්‍රීත්වවිශෙෂණමුපාදාය තද්වති
ද්‍රව්‍ය ස්ත්‍රීශබ්දො වර්ත්තතෙ තදාසාපෙක්ෂො භවති ස්ත්‍රියාං
යත්ප්‍රාතිපදිකං වර්ත්තතෙ තස්මාට්ටාබාදය ඉති ස්ත්‍රීත්වම්ප්‍රකෘති
විශෙෂණමභවති” යි—ඉත්ථියමභිධෙය්‍යායං, ස්ත්‍රීලිඞ්ගාඛ්‍ය ස්ත්‍රී
ත්වයැ අභිභූතකල්හි—“තත්‍ථ ඉත්ථත්තං දෙවදත්තාය” යනා
දීන් පරොපවර්ණිත පක්ෂයාගේ අයුක්තත්වයැ නිශ්චයකො
රත්—නොපපජ්ජය්‍ය, දෙවදත්තශබ්දයාගේ වාච්‍යයැද ස්ත්‍රී
ත්වයෙන් අව්‍යතිරික්තහෙයින් “ඉත්ථත්තං දෙවදත්තාය” යන
භින්නාධිකරණත්වයැ නොයෙදෙන්නේයැ—“දෙවදත්තාය”
යනාදීන් යථොක්තවූ අනුපපත්තිය මැ සමර්ථනයැ කෙරෙත්—
සමානාධිකරණත්තමෙව සියා, (“ඉත්ථී දෙවදත්තා” යන
තැන්හි දෙවදත්තාශබ්දවාච්‍යයැ ස්ත්‍රීශබ්දවාච්‍යයෙන් අනන්‍ය
බවහෙයින්) සාමානාධිකරණ්‍යයැ මැ වන්නේයි—අතො
එව ච, ඒ ස්ත්‍රීත්වයෙහි විධානයෙන් මැ—“තබ්බතො අත්‍ථස්ස”
යනු ජයාදිත්‍යමතානුසාරයෙන් කීහු—තබ්බතො, ඒ යථො
ක්ත ස්ත්‍රීත්වවත්වූ—“අථෛත්ථතොපි” යන එවමාදීන් යථො
ක්ත දෝෂපරිහාරයැ පිණිසැ ජිනෙන්ද්‍රබුද්ධිපාදයන්විසින් කී
“නෛතෙ දොෂාඃ න හි සාමාන්‍යවිශෙෂණමාශ්‍රයාත් භෙදඃ
ස්ත්‍රීප්‍රත්‍යයානෙතනාභිධීයතෙ තතො ව්‍යතිරෙකලක්ෂණ ෂෂ්ඨී
ස්‍යාත් තස්මාත්පුනර්නාභිධීයතෙ ශබ්දශක්තිස්වාභාව්‍යාත්”
යනාදි උපවර්ණනාව අශඞ්කා කළෝ—“එසො එව වරහි”
යනාදීන් උපහාසපූර්වක වැ උත්තර කීහු—මසිමක්ඛිත කුක්කු
ටො විය, දූලිගෑ කුකුළකුමෙන්—යම්කලෙකැ පොරගැසූ
කුකුළන් දෙන්නාගෙන් එකෙක් එකකුට පැරැද භයගෙන
නැවත නොවදීනම් එකලැ දිනූ කුකුළාගේ ඇඟ මූණ දූලි ගා
වෙස් මාරුකොටැ අලකලැ භයවන් කුකුළු ඔහු වෙන කුකු
ළෙකැයි සිතා පොරගසාලූ. එලෙසින් ප්‍රකෘත්‍යර්ථවිශෙෂණ
පක්ෂය මැ ප්‍රත්‍යයාර්ථව්‍යාජයෙන් දක්වනලද්ද යනු භාවයි—
ව්‍යාජෙන, අපදෙශයෙන්.

තද[a] ---- “ඉත්ථියං වත්තමානෙහි” යන්නෙහි ස්ත්‍රීලිඞ්ග

[a] 3, 31 සූ.

යෙහි වැටෙන්නාවූ නදාදීන් කෙරෙන් පරවැ යැ යන අර්ථයි— වා ඉති අත්ථො, විකල්පයෙන් මැ ඞීප්‍රත්‍යය වෙයි යන අර්ථයි— "ඒමහි" යනුයෙන් නිරනුබන්ධප්‍රත්‍යය දක්වූහු—"**ගොසසා වඩ්ඪි**" යනුයෙන් ඞීප්‍රත්‍යයා පරකල්හි ගොශබ්දයහට ආව ඞාදෙශ කළ සූත්‍රයැ දක්වූහු.

**ආරා**[a] ——"ආරාමිකසස භරියා" යනාදීන් "ආරාමිකිනී; අනන්තරායිකිනී" යනාදියට විග්‍රහ දක්වූහු.

**ඝරා**[b] —— පොක්ඛරං, දියැ නොහොත් නෙළුම්—තංසනති යොගා, ඒ නීප්‍රත්‍යයා හා එක්විමෙන්—"පුනනාමයමා යොගා අපාලකනතා නදාදිපාඨාති අත්ථො" යි සාධ්‍යාහාරසම්බන්ධයි— "යොගාති සාමඤ්ඤාභිධානෙපි ගණසුතෙන යසෙසසනාම භූතො ඉත්‍ථියං වතතතෙ තසස සුතතතා තෙන යොගාති ලබ්භතීච්චාහ පුංයොගතොති" යනු ටීකායෙහි ප්‍රක්ෂෙප්‍ය පාඨයි—පුංයොගතො, පුරුෂසම්බන්ධයැ හෙතුකොටැ ගෙනැ; හෙවත් ස්වස්වාමිභාවලක්ෂණියෙන්—"පාලකනතවජ්ජිතා" යනුයෙන් "පසුපාලිකා, ඛෙත්තපාලිකා" යනාදි තැන්හි ආප්‍රත්‍යය මුත් ඞීප්‍රත්‍යය නොවනබව දක්වූහු—"**පුගනාමෙනා යොගාදපාලකානතාත්**" යනු චාන්ද්‍රව්‍යාකරණයෙහි විධිසූත්‍රයැ ඒ මෙහි ගණසූත්‍ර කළහයි දතයුතු.

**උපා**[c] —— කරභො විය, මණිකටුවටත් සුළගිල්ලටත් අතුර මෙන්—කීයේමැනෝ අමරකොශයෙහි—"මණිබන්ධා දාකනිෂ්ඨං කරස්‍ය කරභො බහිඃ" යී—ශෘඞ්ගාරප්‍රකාශයෙහි "කරභො'ත්‍ර ධනුරටනිඃ"—දුනුමුඩාවයි කීහු—සංහිතො, සම්බන්ධවූ—සහිතො, වටවූ—සංහතො, හැසුණුවූ—සණ්ඨො, සිලුටුවූ—වාමො, මනොඥවූ—ලක්ඛණො, ("ඌරූ ඝනෞ කරි කරප්‍රතිමාවරෝමෞ" යනාදි) ලක්ෂණසම්පන්නවූ.

**පුථු**[d] ——("බ්‍රහා මහන්තං විපුලං විසාලං පුථුලං පුථු" යනු අභිධානහෙයින්) පුථුභූතා, පළල්වූවායැ යන අර්ථයි.

**සමා**[e] ——"අවසානවත්‍යී අවයවො" කියා පදච්ඡෙදයි— පරවිධිනාපි, පරකොටැ විධානයෙන් මැ—අනෙතාභාවා භාවතො, අනන්‍ත්‍යීවයැ නැතිහෙයින්—"පලලවිතසස රුක්ඛසස පලලවානං ඉව" කියා සම්බන්ධයි.

---

[a] 3, 34 සූ. [b] 3, 38 සූ. [c] 3, 42 සූ. [d] 3, 47 සූ. [e] 3, 48 සූ.

**අසං**[a] — "අතික්කන්තමඞ්ගුලියො" කියා වාක්‍ය ගත යුතු—අතොපි, ඒ මත්තප්‍රත්‍යයාදීන්ට ලොප් කොටැ විශෙෂණසමාසකිරීමෙන්ද.

**දීඝා**[b] — විභජ්ජ, සූත්‍රවිධාකරණයැ කොටැ—අසමාසන්ත පක්ඛ, සමාසාන්ත අප්‍රත්‍යයාගේ අභාවපක්‍ෂයෙහි.

**ගොණ**[c] — "සඞ්දිලොපො කථං නාවසීයතෙ" කියා සම්බන්ධයි.

**රත්ති**[d] — ආධෙය්‍යසාපෙක්ඛානං, "රත්තින්දිවං භුජති" යනාදි ප්‍රයොගයෙහි භොජනසංඛ්‍යාතවූ ආධෙයයෙහි සාපෙක්‍ෂවූ රත්තිආදීන්ගේද.

**ආසා**[e] — අනුගවං, ගවායාමයෙන් යුක්තවූ ශකටයැ—යම්සේ ගවයා ආයතද එසේ මැ ශකටයද ආයතයැ යන අර්ථයි.

**දූරෙ**[f] — "ලොපෙන භවිතබ්බං" යී සම්බන්ධයි — තබ්බිධානෙ, ඒ (අප්‍රත්‍යය) විධානයෙහි—"තබ්බිධානෙ පයොජනං සිස්සාකාරො" කියා සම්බන්ධයි—"සබ්බමිත්තො සබ්බසඛො සබ්බභූතානුකම්පකො" යී පාඨ පෙනෙනහෙයින් සමාසවිෂයෙහි සබ්බශබ්දයා කෙරෙන් පරවූ සිව්භක්තිහට ඔකාරාදෙශ නැතැයි යනු පරීක්‍ෂා කටයුතු—"අව්‍යජනන්තා" යනුයෙන් සංස්කෘතව්‍යාකරණයෙහි "අහන්, උපානහ්, ශරද්" යන ශබ්ද තුන ව්‍යඤ්ජනාන්තබව දක්වූහු—"කපිධ්වජස්‍ය ගාණ්ඩීව ගාණ්ඩිවෞ පුන්නපුංසකෞ" යී කී බැවින් අර්ජ්ජුනයාගේ දුන්න ගාණ්ඩීව නම් වේ—චාන්ද්‍රව්‍යාකරණයෙහි "ධන්වනිති ප්‍රකෘත්‍යන්තරමවිශෙෂෙණ සංඥායාමසංඥායාඤ්ච" යී කීහෙයින් "සක්කතසද්දසත්ථකාරානමපි" යනාදි කීහු—"ධන්වසද්දො පකතන්තරං" යනු "ධනුශ්චාපෞ ධන්වශරාසනකොදණ්ඩකාර්මුකම්" යී අමරකොශයෙහි කී නියෙන් දතයුතු.

**වි**[g] — සක්කතානුසාරෙන, ("**ගන්ධස්‍යෙදුත්පූතිසුසුරභිභ්‍යඃ***" යනාදි) සංස්කෘතසූත්‍රානුසාරයෙන්.

"පුනො පත්තං ගහෙත්වාන සොධයිත්වා සුගන්ධිනා
පසන්නචිත්තා පූරෙත්වා සඞ්ඝතං සක්ඛරං අදා" —

* පා. 5. 4. 135.

[a] 3, 52 සූ. [b] 3, 53 සූ. [c] 3, 54 සූ. [d] 3, 55 සූ. [e] 3, 56 සූ. [f] 3, 58 සූ. [g] 3, 59 සූ.

යන භද්‍රකාපිලානීස්ථවිරීඅපදානපාළියෙහි පෙනෙන “සුගන්ධි” යන ප්‍රයොගයැ මේ සුතුරෙහි “ච” යන යොග විභාගයෙන් සිද්ධයැයි දතයුතු—කොකනදං පදුමං, කොකනද සංඛ්‍යාතවූ බහුපත්‍රවර්ණසම්පන්නවූ රක්තපද්මයෙක්—කොකනදං, හෙළපියුමැයි; කියාද අභී කියත්—කායො, කාය ගොමැ; දුග්ගන්ධො, දුර්ගන්ධයැ; අසුචි, ශුචි නොවන්නේයැ; කුණපො, කුණුයැ; උක්කරූපමො, කසලගොඩක් බඳුයැ; වර්චස්කූපයක් බඳු හෝ.

**ලතාවි**[a]—“සුබහූ සුභා සුප්පටිමුත්තකම්බු” යනු සංඛ ජාතකයෙහි

“සුබහූ සුභා සුප්පටිමුත්තකම්බු
පග්ගය්හ සොවණ්ණමයාය පාතියා
භුඤ්ජස්සු භත්තං ඉති මං වදෙති
සද්ධාවිත්තා තමහං නොති බ්‍රෑමි”—

යන ගාථායෙහි පූර්වපාදයයි—සුප්පටිමුත්තකම්බු, බහා පල දනාලද (කිරීට කටක කෙයූර තාඩඞ්කාදි) කනකාභරණ ඇත්තී—“සුප්පටිමුත්තකම්බූති පටිමුත්ත සුවණ්ණාලඞ්කාරා” යනු අටුවායි—සාරාර්ථවිලාසිනියෙහි “පටිමුත්තකම්බූති ආමුත්ත වලයා” යනු අටුවා නොබලා “කම්බුතීනා වලයෙ ශඞ්ඛ” යන නිඝණ්ඩු සිතා ලී අභිසි.

**වාක්‍යඤ්ද**[b]—කාපෙක්ඛහි, කප්‍රත්‍යයාපෙක්‍ෂයන් කෙරෙත්.

**උත්තර**[c]—“ආ පරිච්ඡෙදාවසානා” යනු එයින් මත්තෙහි ණාදිකාර්‍ය්‍යවිධානයැ හෙයින් කීහු.

**ඉම**[d]—“පුබ්බුත්තරපදෙ විභත්තිලොපො” කියා සම්බන්ධයි—“**කිස්ස කො වා නාමෙ**” යනු වක්තව්‍යයි—සමාසවිෂයෙහි නාමශබ්දයා පරකල්හි කිංශබ්දයහට විකල්පයෙන් කො යනාදෙශ වේ—එහෙයින් “කො නාමො තෙ උපජ්ඣායො” යනාදි සිද්ධයි—“කිං නාමං අස්ස” සී විග්‍රහයි.

**අ**[e]—“නෙතා න” සී සම්බන්ධයි.

**ලතු**[f]—අපවාදවිසයෙපි, “**විජ්ජායොනිසම්බන්ධානමා තත්‍ර චත්ථෙ**”[g] යන මේ සූත්‍රයාගේ විෂයෙහිද.

**විජ්ජා**[g]—තසද්දෙන, (තත්‍ර යන තැන්හි) තශබ්දයෙන්.

---

a 3, 60 සු. b 3, 61 සු. c 3, 62 සු. d 3, 63 සු.
e 3, 66 සු. f 3, 71 සු. g 3, 72 සු.

**ඉත්ථි**[a]—“ඉත්ථියනත්ති ඉත්ථිලිඞ්ගසෙසව ගහණං” යි යොදනු.

**ජායාය**[b]—අඤ්ඤෙසුපි ච, (ගතානුගතිකවූ) සෙසු (රූපසිද්ධිකාරාදීන්) විසින්ද—සමහර අභිධානප්‍රදීපිකාපොතෙහු “ජයම්පතී තුදම්පතී” කියා පෙනෙයි එමැ සත්‍යයෙහි “ජයම්පතියැ දම්පතියැ” යි විභාගකොටැ ලී හෙයින් “ජයම්පතී ච දම්පතී” යනු ශුද්ධපාඨයැයි දතයුතු—මෙහි “දං, ජං” යනු අසංඛ්‍යයැයි කීහ. ආචාර්‍ය්‍ය සර්‍වගුණාකරමහාස්ථවිරයන් විසින් වනාහි “**ජායාය දංජංජානිසො පතිම්හි**” යන සූත්‍රයෙන් ජායාශබ්දයහට “දං” “ජං” ආදෙශ කරනලද්දැයි දතයුතු.

**සොතා**[c]—උදකස්ස, ජලයාගේ; සොතො, නිර්ගමවාරයැ—උක්තමැ නු වෛජයන්තියෙහි—

“ස්‍රොතො'ම්බුනිර්ගමවාර ඉන්ද්‍රියෙ'පසු ජලස්‍රුතෙ”—යි.

“**පිපාසාසං බුද්ධස්ස ලොපො දස්ස**” යනු වක්තව්‍යයි—පිපාසාශබ්දයා පරකල්හි බුද්ධශබ්දයාගේ දකාරයහට ලොප් වේ—එහෙයින් “බුප්පිපාසාභිභූතො” යනාදි සිද්ධයි.

**අන්**[d]—“**වණ්ණෙ යන්තන්තදද්දෙ**” යනු ශිෂ්ටවචනයි—වණ්ණෙ, වර්ණයා පරකල්හි ; යං, යම් (කාර්‍ය්‍යයෙක් කරනු ලැබේද); තං, ඒ (කාර්‍ය්‍ය); තදද්දෙ, ඒ වර්ණයා ආදිකොටැ ඇති (උත්තරපදයා පරකල්හි පැමිණෙන්නේයැ) යන අර්ථයි.

**නගො**[e]—“එවං අගො” යි පදච්ඡෙදයි.

**සහ**[f]—තස්ස, ඔහු පරකල්හි—“යස්ස ච ඛිත්තං” කියා සම්බන්ධයි.

**අපච්ච**[g]—වාතමණ්ඩලිකා නම් පෙයාසුලඟයි—කපොතාදිභාවෙ, (කිසි ගෘහාදිපක්ෂයෙක්හි) කපොත වාතමණ්ඩලිකාදීන්ගේ දර්ශනසද්භාවයක් ඇතිකල්හි—අඤ්ඤත්‍රාපි, (ගෘහාදියෙන්) පිටත් තැන්හිද—කපොතාදිනො, කපොතවාතමණ්ඩලිකාදි සාධනයාගේ—අග්ගහදියොගං, අගහ්‍යද්ධනුමෙයසම්බන්ධයැ—මනුව්‍වා, (“**ලිඞ්ගාදර්ශිදර්ශිනමනුමානම්**” යනුහෙයින් අනුමානඥානයෙන්) දැනැ—පයොගො, (“සාගහි සපිසාචා” යි) ප්‍රයොග කිරීමයි.

---

[a] 3, 75 සූ.  [b] 3, 78 සූ.  [c] 3, 81 සූ.
[d] 3, 83 සූ.  [e] 3, 85. සූ.  [f] 3, 86. සූ.  [g] 3, 88 සූ.

**අඣා** [a] ⁓ " වුත්ති භවති " යී සම්බන්ධයි.

**ශනඨා** [b] ⁓ " යුගපදි ධුරා සධුරං " යී විග්‍රහයි.

" නිමෙෂා අෂ්ටාදශ ප්‍රොක්තාඃ කාෂ්ඨා ත්‍රිංශත්තු තාඃ කලා
කලාස්ත්‍රිංශදෂ්ටී ප්‍රොක්තා ෂට්භාගං වාභාගං ක්ෂණඃ ස්මෘතඃ
ස මුහූර්තාස්ත්‍රිංශතා තෛශ්චාහොරාත්‍රං නිගද්‍යතෙ " ⁓ යී

දෛවඥමුඛමණ්ඩනයෙහි කීබැවින් ' කලා ' නම් දෙවිනාඩිකාවෙකි—අධිකො මාසකො අස්ස සමාසකො—විකප්පෙන, (" **සහස්ස සො'ඤ්ඤෙත්ථ** "[c] යන සූත්‍රයෙන්) විකල්පයෙන්.

**සමා** [d] ⁓ " පතන්තිනී පත්නි " යනු " සමානො පති යස්සා සා සපත්තිනී, සපත්නි " යී නිෂ්පන්නශබ්දයන්ගේ ඒකදෙශ දර්ශනයෙකි.

**උද** [e] ⁓ අඤ්ඤාඤ්ඤස්මිනති, " **අඤ්ඤඤ්ඤස්මිං** "[f] යන ඉයප්‍රත්‍යය විධායකසූත්‍රයෙන්.

**තම්ම** [g] ⁓ " තං ඉහ අඤ්ඤත්‍රසද්දසම්බන්ධා පඨමන්තන මභිසම්බන්ධීයති " යී සබඳ.

**විධා** [h] ⁓ ගබ්භෙන, (කුක්ෂිගත) ගර්භයෑ හා (එක් වෑ).

මෙ මෑ කීහ වෛද්‍යපති බාහටාචාර්‍ය්‍යයෝ.

" මාතෘජං හ්‍යස්‍ය හෘදයං මාතුශ්ච හෘදයෙන තත්
සම්බන්ධං තෙන ගර්භිණ්‍යා නෙෂ්ටං ශ්‍රද්ධාවිමානනම් " ⁓ යී.

පුබ්බපදෙ, පූර්වපදයෙහි ; හෙවත් දුශබ්දයෙහි.

**දී ශු** [i] ⁓ " ගුණ්ණ පටලා " යනු ටීකායි—වෙ සතානි අස්ස, ඞිනනං සතානං සමාහාරො,. යී විග්‍රහයි—" ක්වචි දෙ පද මජ්ඣෙ " කියා වක්තව්‍යයි—කිසිතැනෙක්හි පදමධ්‍යයෙහි වූ විශබ්දයහට දෙආදෙශ වේ—එහෙයින් " කඞනදෙපිඤ්ජො " යනු සිඩයි—කඞනවණ්ණා වෙ පිඤ්ජා වෙ පක්ඛා යස්ස හංස රාජස්ස සො'යං කඞනදෙපිඤ්ජො.

**චත්තා** [j] ⁓ සමපතෙන විහාසා සමපතනවිහාසා—තයො ච අසීති ච, තීහි වා අධිකා අසීති තියාසීති—සමපතනවිභා සතතා, (**ආ සංඛ්‍යාසාදි**[k] සූත්‍රයෙන්) ආකාරපත්තෙහි විකල්ප බැවින්—න නිද්දිඨං, (මේ ප්‍රත්‍යුදාහරණයෑ) නොදක්වනලදි—කෙවි, කාත්‍යායනයෝ—නිප්ඵාදෙනති, (" **ගණනෙ දසස්ස**

---

[a] 3, 89 සු. [b] 3, 90 සු. [c] 3, 86 සු. [d] 3, 91 සු.
[e] 3, 92 සු. [f] 4, 121 සු. [g] 3, 97 සු. [h] 3, 99 සු.
[i] 3 100 සු. [j] 3, 104 සු. [k] 3, 102 සු.

ඡිතිවතුපපජ්ජස්සන්තාඨනවකානං විතිවත්තාරපඤ්ඤපජ්ජස්සන්තා සනවා යොසු යොනවිසමාසංඛිපිනීතුති"[a] යනාදි සූත්‍රවලින්.)

ඉති මොග්ගල්ලානෙ ව්‍යාකරණෙ පඤ්චිකාපදීපෙ
සමාසකණ්ඩො තතියො.

---

ණෙ වා [b]—සූත්‍රානුක්තවූ " ජඪීයන්තා නාමස්මා " යනාදි විවරණයට කාරණවූ සාමර්ථ්‍යය දක්වන්නාහු "අපච්චස්සාභි සම්බන්ධිත්තා" යනාදි කීහු—අපච්චස්ස, අපත්‍යාර්ථයාගේ—අපච්චවත්‍යා, අපත්‍යවචාවකශබ්දයාකෙරෙන් — " ධම්මස්මා පච්චනති ආදිසු ණාදිප්පච්චයො න ජායතෙ "යි සම්බන්ධයි—ධම්මෙන, ධර්මය කරණ කොට ගෙන—ධම්මාය, ධර්මය පිණිස—ධම්මස්මා, ධර්මය හෙතු කොට ගෙන—" කස්ස " යන පෘච්ඡාවට " දෙවදත්තස්ස " යනු අපත්‍යවත්වූ අපෙක්ෂ්‍යමාණ පදාර්ථයයි—" කම්බලො වසිට්ඨස්සාපච්චං දෙවදත්තස්ස " යන මෙහි වශිෂ්ඨයා අපත්‍යවත්හෙයින් ඒ අපත්‍යවත් ශෂ්ඨ්‍යන්තනාමයාකෙරෙන් ණප්‍රත්‍යය වන්නේයැයි ආශඞ්කා කරනුවෝ " න ච කම්බලො " යනාදි කීහු—" න ච හොති "යි සම්බන්ධයි—"අසම්බන්ධා" යනු තදර්ථසාධකවූ හෙතුයි—මූලප්පකතිතො, පරමප්‍රකෘතීහුකෙරෙන්; හෙවත් කුල කූටස්ථයාකෙරෙන් — චාන්ද්‍රව්‍යාකරණයෙහි "ආද්‍යාණ්" යන නියමසූත්‍රයෙන් පරමප්‍රකෘතීහුකෙරෙන් අණ්ප්‍රත්‍යය විහිතය මෙහි එසේ නොකීහෙයින් " න ච තාදිසං වචනමත්ථි " යනාදි කීහු—සම්බන්ධාභාවයෙන් හා තාදෘශලක්ෂණාභාවයෙන් මූලප්‍රකෘතීහුකෙරෙන් ණාදිප්‍රත්‍යයාභාවය දක්වා දූත් පරමප්‍රකෘතීහුකෙරෙන් මැ ප්‍රත්‍යයව්‍යවස්ථාව දක්වන්නාහු "මූලප්පකතිතො" යනාදි කීහු—අව්‍යවහිතජනකයාගේ මැ අපත්‍යයා හා මුඛ්‍යසම්බන්ධය දක්වනු පිණිස "කථම්පන" යනාදි කීහු—"ඉති පිතාමහො මමායනති අත්තානං න නිද්දි සති උප්පාදෙතාරමෙව නිද්දිසති තස්මා උප්පාදෙතායෙව අපච්චෙන සම්බජ්ඣති න පිතාමහො" කියා සම්බන්ධයි—ව්‍යවහිතජනිත පුත්‍රයාගේද පරමප්‍රකෘතීහු හා සම්බන්ධ සද්භාවය දක්වන පිණිස "ඉදමයුත්තං" යනාදි කීහු—ඉදං,

---

[a] ක. 2. 8. 46. [b] 4, 1 සූ.

මේ යථොක්ත ජනකනිර්දෙශයෑ—අයුත්තං, අසමඤ්ජසයි—
"තෙන අපච්චෙන සග්ගං උප්පාදෙතුමෙව යොගො පටිපාදෙ
තුං න සක්කා" යි සම්බන්ධයි—තත්‍ථ, ඒ ප්‍රශ්නයෙහි—තෙන,
ඒ අපත්‍යයා හෙතු කොටැ ගෙනැ—අපතනමහවති, (නරක
යෙහි) නොහීම වේද—"න පතන්ත්‍යනෙනෙති අපච්චං"
යනු නිරුක්තියි—පූර්වජවූ පිතාමහප්‍රපිතාමහාදීන්ගේද ඔහු
කරණ කොටැ ගෙනැ අපතනයෑ වනහෙයින් අපත්‍යයෑයි
ලොකසංස්ථිතියෙකි—සො, ඒ පුරුෂතෙමෑ—"ඤාතුං න ඉච්ඡි
තො" යි සම්බන්ධයි—"සො උප්පාදෙතාමෙව ඤාතුමිච්ඡිතො"
කියා සම්බන්ධයි—තු යනු ඒ අපත්‍යයා හෙතු කොටැ ගෙනැ
නරකාපාතිසර්වජනජිඥාසාවිශෙෂද්‍යොතකනිපාතයෙකි—"සදි
සියා" යි සම්බන්ධයි — අත්තානම්පි නිද්දිසෙය්‍ය න කෙවල
මුප්පාදෙතාරං" යනු අර්ථයාතයි—තන්නිමිත්තං, ඒ අපත්‍යයා
කරණ කොටැ ගෙනැ—තං අපච්චං නිමිත්තං කාරණං යස්ස,
තං—ව්‍යවහිතජනිතෙන, ව්‍යවහිතයාවිසින් උපදවනලද්දවූ
පුරුෂයා කරණ කොටැ ගෙනැ—හෙතු කොටැ ගෙනැ කියා
හෝ අර්ථයි—හි යනු යස්මාදර්ථයෙහි වැටේ—ඒ මතු "තස්මා" යනු
හා සම්බන්ධයි—යස්ස, යම් පූර්වජයක්හුගේ—තදපතනතො,
තෙන අපච්චෙන අපතනං තදපතනං, තතො—භාවෙ සති,
විද්‍යමානත්වයක් ඇතිකල්හි—"ව්‍යවහිතෙන ජනිතෙ අප
ච්චෙපි නිමිත්තත්තං අත්‍ථියෙව" යි සම්බන්ධයි—අභෙදොපචා
රෙන, වෙනසක් නැතිකොටැ සිතා ගැන්මෙන්—"තං අප
ච්චං" යි පදච්ඡෙදයි—උභයථාපි, න්‍යායොපචාරප්‍රකාරවයින්
මැ—තතො ච, ඒ මූලප්‍රකෘතීහුකෙරෙන්ද—අපච්චසාමඤ්ඤ
වචනිච්ඡායං, (ස්ත්‍රීපුන්නපුංසකත්වයුක්තවූ පුත්‍රවිශෙෂොප
ග්‍රාහි) අපත්‍යසාමාන්‍යයක්හුගේ විවක්‍ෂාවක් ඇතිකල්හි—
චාන්ද්‍රයෙහි "**පෞත්‍රාදෙරස්ත්‍රියාං ගුර්වාසන්නෙන**" යන සූත්‍ර
යෙන් විහිත ණාදිප්‍රත්‍යයද යුක්තියෙන් සාධන්නාහු "නත්තා
දීහි" යනාදි කීහු—"බහුලාධිකාරා ඉත්‍ථිවජ්ජිතෙ පසත්‍ථෙයෙ
වාපච්චෙ ණාදිපච්චයො" යි සම්බන්ධයි—පසත්‍ථෙයෙව, (ගුර්වා
දිෂ්ටාචරණයෙන්) ප්‍රශස්තවූ මැ—අත්‍ථතො, අර්ථබලයෙන්—
පුත්‍රයා කිවමනාකල්හි විධීයමානවූ ප්‍රත්‍යයතෙමෑ අපත්‍යවත්හු
කෙරෙන් උපදනේ "තස්සාපත්‍යම්" යන අර්ථයෙහි උපදනේයෑ
ඒ මේ අර්ථවිශෙෂයෑතෙමෑ ෂෂ්ඨ්‍යන්තත්වයෑ නැතිකල්හි කෙ
සේ වේද්දයි යනු මෙහි අර්ථබලයි—"අනන්තරෙ වා'පච්චෙ'හි

ධෙය්‍ය නත්තාදෙවා'පච්ච'භිධෙය්‍ය" යි සම්බන්ධයි—"න තත්තාදෙ එව" යි පදච්ඡෙදයි—ජඤ්ඤාදිවිසෙස, පුත්‍රවිශෙෂයැ—අතන්තතා ච, (සූත්‍රයෙහි ලිඞ්ගවචනයාගේ) අප්‍රාධාන්‍යයද—වචනිච්ඡාභාවතො, (සූත්‍රයෙහි ප්‍රාධාන්‍යයෙන්) විවක්ෂාව නැතිහෙයින්.

කියනලද මැයි.

"පලාලාදෙරුපාදානං යථා ධාන්‍යාර්ථිනස්තථා
අමුඛ්‍යස්‍යාපි ලිඞ්ගස්‍ය වචනස්‍ය ච ලක්ෂණෙ" යි.

උපලක්ඛියස්ස, උපලක්ෂ්‍යවූ (ස්ත්‍රීපුංසත්වයුක්ත ජන්‍යවිශෙෂයාගේ)—උපලක්ඛණත්තා, ("අපච්ච" යන මේ) උපලක්ෂණය වනාහි—අප්පධානං, අප්‍රධානයි—මෙ මැ කීහ රත්න ශ්‍රීඥානාචාර්‍ය්‍යයෝ.

"න චාපත්‍යාදිශබ්දානාමප්‍රයොගො'ස්මින්නපෙක්ෂතෙ
තදර්ථමාත්‍රනිර්දේශාදණාදිවිධිවෘත්තයෙ" යි.

සයං, යථොක්ත උපලක්ෂණයැතෙමේ—කාරියපටිපත්තියා, (පුල්ලිඟුවූ හෝ නපුංසක ලිඟුවූ හෝ අපත්‍යයා කිවමනාකල්හි විධිවන්නේයයි මෙසේ) කාර්‍ය්‍යප්‍රතිපත්තියැ පිණිසැ—"තග්ගතා ලිඞ්ගසංඛ්‍යා න පමාණං" යි සම්බන්ධයි—පමාණං න, නිර්ණායක නොවන්නේයි—"ප්‍රමාණං හෙතුමර්‍ය්‍යාද ශාස්ත්‍රයත්තාප්‍රමාතෘෂු" ඉත්‍යමරඃ—පාණිනීයව්‍යාකරණයෙහි "**සමර්ථානාම්ප්‍රථමාද්වා**"* යන අධිකාරසූත්‍රයක් ඇතිහෙයින් "**තස්‍යාපත්‍යම්**"† යන සූත්‍රයෙහි ප්‍රථමානිර්දිෂ්ටවූ "තස්‍ය" යන ෂෂ්ඨ්‍යන්තයාකෙරෙන් ප්‍රත්‍යය වෙයි දෙවැනි වැ දක්වූ "අපත්‍යම්" යන ප්‍රථමාන්තයා කෙරෙන් ප්‍රත්‍යය නොවෙයි මේ මෞද්ගල්‍යායනයෙහි එබඳු අධිකාරයක් නැතිහෙයින් න්‍යායානභිඥවූ සමහරකෙනෙක් "අපච්චං" යන පදය ගාවා ප්‍රත්‍යය ලියා රූපසාධනය කෙරෙති එලෙස නොලියා "වසිට්ඨස්ස අපච්චං" යන වාක්‍යයෙහි ෂෂ්ඨ්‍යන්තවූ වසිට්ඨශබ්දයා කෙරෙන් ඔහුගේ පුත්‍රයැ යන මේ අර්ථයෙහි "**ණො වා'පච්චෙ**"[a] යන සූත්‍රයෙන් පැමිණි ණප්‍රත්‍යය අපත්‍යවත්වූ වසිට්ඨශබ්දයා කෙරෙන් පරකොට ලියවා බාලයන්ට රූපසිද්ධික්‍රම දක්විය යුතු—ප්‍රවචනානුරූපවශයෙන් වාසිට්ඨශබ්දයාගේ සකාරසථ

* පා. 4, 1, 82. † පා. 4, 1, 92. [a] 4, 1, සූ.

ඉකාරයැහට **කදම්නා** දි[a] සූත්‍රයෙන් එකාරාදෙශ වැ "වාසෙට්ඨ" කියාද වේ—අගොත්තාදිතො, ගොත්‍රයට ආදිභූත නොවූ (අකාරාන්තමාත්‍රයා) කෙරෙන්—තස්මිං අපෙච්ච, ඒ (වාක්‍යොපදර්ශිත වූ) අර්ථයෙහි—තං, ඒ වාක්‍යය—සමාසවුත්තිඤ්ච නිවත්තෙතබ්බං." යි සම්බන්ධයි — සති පන, (වාකාරයා) ඇතිකල්හි වනාහි—"වාගහණෙ **සති**" යි පදයොජනා කරනු—අනිච්චත්තා, (ණප්‍රත්‍යයාදීන්ගේ) අනිත්‍යබවහෙයින්—"තෙන ච පක්ඛන්තරෙ සමාසො න බාධීයති" යි සම්බන්ධයි—සොපි, ඒ සමාසයද—"සමාසො වා" යනාදින් පක්‍ෂාන්තරයක් කීහු—තෙන, ඒ වාක්‍ය සිද්ධවීමෙන්—"පක්ඛෙ වාක්‍යසමාසාපි සියුං" යන තැන්හි "පක්ඛෙ සමාසවුත්තියා එව බාධිතත්තා පක්ඛන්තරෙ ණාදිවුත්ති න බාධීයතීති වාක්‍යසමාසාපි සියුං" යි සාභිප්‍රාය පදයොජනා කොටැ අර්ථ කීයැ යුතු.

**වච්ඡා**[b] —— "**කණ්හා බ්‍රාහ්මණෙ**"* යනු ගණසූත්‍රයි—බ්‍රාහ්මණෙ, බ්‍රාහ්මණවිෂයෙහි වැටෙන්නාවූ ; කණ්හා, කණ්හශබ්දයැතෙමැ, (වච්ඡාදිසු පඨියතෙ)—අස්සල, ආශ්වලායන සෘෂිහුගේ පියේ අස්සල නම් වේ — බාදරායණසෘෂිහුගේ පියේ බදර නම් වේ — ආදිශබ්දයෙන් අග්ගිවෙස්ස හරිත ගග්ග දක්ඛ දෙණ යනාදීන්ගේ ග්‍රහණයයි—"**කත්තා ණි යොව**" යනු ගණසූත්‍රයි—තත්සූත්‍රප්‍රදෙශයෙහි මේ ගණසූත්‍ර නොහැදෑලද දිච්චාදීන් ආකෘතිගණහෙයින් පඨිතමැයැයි බුද්ධිසථ කොටැ "දිච්චාදිපාඨො" යනු කීහු†—තස්ස, ඒ ගොත්‍රයට ; ආදයො, පූර්වපුරුෂවූවාහු; ගොත්තාදීහු නම් වෙත්.

**කත්ති**[c] —— ඛපා, ඛසංඥපසංඥයෝද — "අත්තිපණ්හිආදයො කත්තිකාදයො" යි යොදනු—අත්තිස්ස ඉසිනො අපච්චං, පණ්හිස්ස රඤ්ඤො අපච්චං, යි වාක්‍ය ගෙනැ "අත්තෙය්‍යො, පණ්හෙය්‍යො" යි පද සිද්ධකටයුතු.

**ණෙය්‍ය**[d] —— ගග්ගාදිගණං, (සංස්කෘතව්‍යාකරණයෙහි පඨිතවූ "ගර්ග වත්ස වාජසෙ සංකෘති අජ ව්‍යාඝ්‍රපාත්" ආදිවූ) ගර්ගාදිගණයද—තතොපි, ඒ ගර්ගාදිගණයෙන්ද—"පදුත්තාදෙව" යන එවකාරයෙන් "ගග්ගස්සාපච්චං" යන විවක්‍ෂායෙහි "ගග්ගි" කියා මැ සිද්ධවනබව හඟවත්.

* 4, 3 සූ.

† "තං සුත්තප්පදෙසෙ කත්තා ණියොවෙති පාඨාභාවෙ දිච්චාදිනමාකති ගණත්තා පඨිතමෙව නාම හොති වුත්තං" යනු මෙහි පඤ්චිකාටීකායි.

[a] 1, 47 සූ. [b] 4, 2 සූ. [c] 4, 4 සූ. [d] 4, 5 සූ.

**අ ණ්**[a] — පකතස්ස, ("මාගධං සද්දලක්ඛණං" කියා හෝ "නාමසමා" කියා හෝ) ප්‍රස්තුතවූ—තදන්තගවිධිති, ("**විධිබ්බිසෙසනන්තස්ස**"[*] යන පරිභාෂාසූත්‍රයෙන්) තදන්තවිධියැයි -"අනන්තරං අපච්චං" යි සම්බන්ධයි—පච්චයන්තෙන, ("රාජඤ්ඤො" යන) ප්‍රත්‍යයාන්තයෙන්.

**මනු**[b] — සමුදායෙන, ප්‍රත්‍යයාන්තසමුදායයෙන්.

**ජන**[c] — රාජසම්බන්ධෙ, ("රඤ්ඤො" කී) රාජසම්බන්ධයෙහි.

**ණ රා**[d] — "රත්තො වණ්ණන්තරපත්තාවත්ථවිසෙසො ච ලොහිතො" යි කීබැවින් මෙහි ශෙවතයාගේ වර්ණාන්තර පාදනයෙහි වැටෙන රක්තශබ්දයැ ගෘහීතයැයි "කුංකුමාදිනා" යනාදි කීහු—මෙ මැ කීහ කාශිකාවෘත්තියෙහි ජයාදිත්‍යයෝ—"ශුක්ලස්‍ය වර්ණාන්තරපාදනම්හ රඤ්ජෙරර්ථඃ" යි—නිර්දේශයැ අර්ථප්‍රධානකොටැ ඇතිහෙයින් "රාගාති අත්ථග්ගහණං" යි කීහු—ඒ අර්ථපරත්වයද අවිච්ඡින්නපාරම්පර්‍ය්‍ය ඇති ආචාර්‍ය්‍යෝපදෙශයෙන් හැගේ—"ණ" යනු ප්‍රත්‍යය නිර්දේශයැ "**රාගා**" යනු කෂායසංබන්ධ අර්ථනිර්දේශයැ "**තෙන**" යනු පටයාගේ රක්තභාවයෙහි රාගයාගේ කරණ නිර්දේශයැ "**රත්තං**" යනු ප්‍රත්‍යයාර්ථනිර්දේශයැයි—ඒ රාගයෙන් රඳනලද යන මේ අර්ථයෙහි තෘතීයාන්තවූ රාගාර්ථවාචක ශබ්දයාකෙරෙන් ණප්‍රත්‍යය වෙයි යනු සූත්‍රාර්ථයි—අභිධානතො, (උපචාරවශයෙන්) කියනහෙයින්—තෙන විනාපි, ඒ ප්‍රත්‍යය නැතිවැ ද—භාවො, වීම.

**නක්ඛ**[e] — "තතියන්තතො චිත්තාදිං තෙනාති අනුවත්තතෙ" යි සම්බන්ධයි—ඉදින් කාලයැ තෙමැ චන්ද්‍රයා හා යුක්තවූ නක්ෂත්‍රයෙන් විහනිත විද එකල්හි ඒ නක්ෂත්‍රයෙන් විහනිතවූ කාලයැ කියමනාකල්හි තෘතීයාවිභක්ත්‍යන්තවූ නාමයාකෙරෙන් ණප්‍රත්‍යය වෙයි යනු සූත්‍රාර්ථයි—සූත්‍රවිවරණයෙහි "තමෙ නක්ඛත්තං" යනාදියැ භාවාර්ථදර්ශනමුඛයෙන් කාල ව්‍යාඛ්‍යානයි—බෞද්ධසිද්ධාන්තරීතියෙන් "ක්‍රියාරූපො කාලො" යනු කීහු.

එහෙයින් කීහ.

"ආදිත්‍යග්‍රහනක්ෂත්‍රපරිස්පන්දමථාපරෙ
භින්නමාවෘත්තිභෙදෙන කාලං කාලවිදො විදුඃ" — යි.

---

[*] 1, 13 සූ. [a] 4, 6 සූ. [b] 4, 9 සූ. [c] 4, 10 සූ. [d] 4, 12 සූ. [e] 4, 13, සූ.

“දබ්බරූපො” යන්නෙන් න්‍යායවෛශෙෂිකමතයෑ දක්වූහු.

එහෙයින් කීහ තාර්කිකරක්ෂාවෙහි.

“භූරපො ජ්‍යොතිරනලො නභඃ කාලස්තථා දිශඃ
ආත්මා මන ඉති ප්‍රාහුර්ද්‍රව්‍යාණි නව තද්විදඃ”~සී.

උභයස්සාපි, “කාලස්ස” යනු ශෙෂයි — “ලක්ඛියතනා ලක්ඛණෙ තතියා” සී යොදනු—විසෙසාවසායො, (කාලයාගේ) විශෙෂාවබොධයෑතෙමෑ — කාදාචිකත්තා, කාදාචිත්කබව හෙයින්; හෙවත් කිසිකලෙකෑ වනබැවින් — ලක්ඛියතෙ, දන්නාලැබෙයි—“නක්ඛත්තසද්දෙන කාලාභිධානං” සී යොජනායි—සකලිඞ්ගසංඛ්‍යායුත්තෙන, (“**ලුපි යුක්තවද්‍ව්‍යක්ති වචනෙ**”* යන සූත්‍රයෙන් යුක්තවද්භාවයෙන් ස්වලිඞ්ගසංඛ්‍යායුක්තවූ—ණිලොපෙ, (නක්ෂත්‍රශබ්දයෙන් උපන්) අණ්ප්‍රත්‍යය (“**ලුබවිශෙෂෙ**”† යන සූත්‍රයෙන්) ලොප්කළ කල්හි—කෙචි, පාණිනීයාදී සමහරකෙනෙක්—විප්පටිපන්නා, වරදවා පිළිපන්හ—තදුපලක්ඛිතො කාලො, ඒ කෘත්තිකාවෙන් උපලක්ෂිතවූ කාලයෑ තෙමෑ—න වුච්චතෙ, නොකියනුලැබේ—තදුපලක්ෂිතකාලාභිධානයෙහි දොෂ දක්වනපිණිසැ “අජ්ජ” යනාදී කීහු—තදත්ථෙන සති, තදුපලක්ෂිතකාලාර්ථයෑ ඇතිකල්හි—සත්තමී සියා, (“**නක්ෂත්‍රෙ ච ලුපි**”‡ යන සූත්‍රයෙන්)—“චන්දෙ පත” යනාදීන් ස්වසිද්ධාන්තයෙහි යුක්තිමත්වයෑ දක්වත්—සාහචරියා, සහචරභාවයෙන්.

**සාස්ස**[a]~යාගසම්පදානම්පි, (පුරොඩාශාදි) යාගයාගේ ප්‍රතිග්‍රාහකද—ඉන්ද්‍ර දෙවතා අස්ස, ඉන්ද්‍රං—හවි, පුරොඩාශාදි යාගද්‍රව්‍යයි — මන්තථොමනීයම්පි, මන්ත්‍රස්තුත්‍යයද — සාමඤ්ඤෙන විධානා, (පාණිනීයයෙහි මෙන්” **සා’ස්මින් පෞර්ණමාසීති සංඥායාම්**”§ යන විශෙෂවචනයක් නැති වෑ “අස්ස” කියා) සාමාන්‍යයෙන් විධානයෑ හෙතුකොටැ ගෙනැ—

---

° පා. 1, 2, 51. † පා. 4, 2, 4. ‡ පා. 2, 3, 45.

§ පා. 4, 2, 21. (මෙහි “සංඥායාම්” යනු භාෂ්‍යකෞමුද්‍යාදියෙහි සෞත්‍රත්වයෙන් නොගෙනැ පාඨශෙෂත්වයෙන් “සංඥාග්‍රහණං කර්තව්‍යම්” “ඉති ශබ්දස්‍යසංඥායාමිති ලභ්‍යතෙ” සී අධ්‍යාහර්තව්‍ය කරනලද්දවත් ජයාදිත්‍යමතානුයායී පඤ්චිකාටීකාප්‍රදීපකාර ආචාර්‍ය්‍යවරයන්විසින් හෙද සෞත්‍රත්වයෙන් ස්වීකෘතයි.)

[a] 4, 14, සු.

යස්සං තිපියං, (පළමුවෙන් කුලීදෙන දවසැ පෑලවියැයි කියා ලියාගත්හෙයින් ඒ පිළිවෙළින් අා) යම් වකෙක්හි—නීහරිතබ්බා වචනං නිබ්බචනං තතො—තස්සං, ඒ පෞර්ණමාසියෙහි—"සා ඝතකමාසස්ස සම්බන්ධිනී න" යි සම්බන්ධයි—සොයෙව, ඒ මාසශබ්දයැ මැ—න උජ්ජුකනන්ති, ප්‍රත්‍යයෙන් සාක්ෂාත්කථනයැ නොවන්නේයැයි කියා.

**නම**[a]— "කොවියෙව හොති" යි සම්බන්ධයි—"කොවි" යන එකවචනාපෙක්ෂාවෙන් "හොන්ති" යන බහුවචනයැ හෙද කොටැ "හොති" යි යොදනු—"තද්දෙසස්ස" යනාදියැ "**තද්දෙසාසන්නග්‍රහණෙන ගෘහ්‍යතෙ**" යන පරිභාෂාවෙහි අභිප්‍රායයි—"යථා තෙන ජිතං ජයති" යනාදියැ වෛධර්ම්‍ය දෘෂ්ටාන්තොපන්‍යාසයි—"තෙන ජිතං ජයතීච්චාදි න පච්චෙකාභිසම්බන්ධෙන" යනු ව්‍යභිචාරදර්ශනයි—"යථා තෙන ජිතං ජයතීච්චාදි පච්චෙකාභිසම්බන්ධෙන විසෙසයති එවමයං විධි මා විසෙසයීති" යි අන්වයයි—තෙන ජිතං ජයතීච්චාදි, ("**තෙන කතං කීතං**"[b] යනාදි සූත්‍රයෙහි) "තෙන ජිතං ජයති" යනාදියැ — මුහුත්ත, රෞද්‍රාදි මුහූර්තයැ—"රෞද්‍රස්සාපීසත්‍රථා මෛත්‍රඃ පෛත්‍රාවාසව එවච" යනාදි ත්‍රිංශන්මුහූර්තයන් බාර්හස්පත්‍යය බලා දතයුතු—ටීකායෙහි "මුහුත්තො කත්තිකාදි" යනු ආදිග්‍රහණයට විරුඩයි—"යතො ච" යනාදියැ "පසිද්ධුපසඞ්ගහත්ථං" යන තුන්වෙනි ප්‍රයොජනයට පඞ්ක්තායි—"යතො ච උප්පන්නෙන විධිනා අපෙක්ඛිතු සඤ්ඤා අභිධානං පසිද්ධං" යි සම්බන්ධයි.

**නිවා**[c]— නිවාසාදෙ, නිවාස අදූරභව නිබ්බත්ත අසත්‍යාපි යන මෙහි—ද්විධං, (සංහිතයැ අනුවෘත්තයැයි) දෙවැද්ෆරුම් වේ.

**අදූර**[d]— විදිසාය, විදිශානම් නුවරට.

**තෙන**[e]— යථායොගන්ති, "යථායොගං" යන මේ ශබ්දයෙහි අර්ථයි—තත්‍ර—"සත්තා ච ජාති ච ගය්හතෙ" යි පද සම්බන්ධයි.

**කණි**[f]— යොගවිභාගා, සූත්‍ර වෙන්කිරීමෙන්—"**දිස්සන්තඤ්ඤෙපි පච්චයාති එය්‍යකො**" යනු අනුසන්ධාන කට යුතු—"අඤ්ඤෙපි පච්චයන්තරානි හොන්ති" යි ශෙෂයි.

---

[a] 4, 15 සූ. [b] 4, 30 සූ. [c] 4, 17 සූ. [d] 4, 18 සූ. [e] 4, 19 සූ. [f] 4, 26 සූ.

**නාම** [a] ~ සායෙව, අභ්‍යාසකටයුතු ජ්‍යානනක්‍රියාවට පූර්වවූ වාදනක්‍රියාව මැ ; විසෙසිත්‍වං, (වීණාදිශබ්දයෙන්) වෙනැස් කරන්ට—දබ්බං, තතානතසමුද්‍රයසවරූපයැ—“ වීණාවාදනවිස යං සිප්පං වීණාවාදනන්ති යථා ” යි සම්බන්ධයි—කොසල්ලං ක්‍රියාවිසයත්තා ක්‍රියාසද්දෙන වුච්චති ” යි පද සම්බන්ධයි—අනු විධීයමානං, කරනුලබන්නේ.

**කාං ක** [b] ~ තනනානනාරීයකත්තා, ඒ වචනභෙද කාල භෙදයන් හැර නොපවත්නාබවහෙයිනි—අනභිධානා, අභි ප්‍රකාශයැ නැතිහෙයිනි.

**තෙනා** [c] ~ උක්කංසාධානං, අතිශයාරොපණයැතෙමැ—අභිසංඛාරො, අභිසංසකාර නම් වේ—එසො, මේ (සංසග්ගියැ) තෙමැ—“ උක්කං සෙන න ච භවිතබ්බං ” යි සම්බන්ධයි—අභි සංඛතො, කරනලද වාසනාඇත්තේ—“ සංසකාරො වාසනා මතා ” ඉති හලායුධඃ—රූපිධම්මත්තා, මූර්තිමවස්තුධර්මත්ව යෙන්—තස්ස, ඒ සංසග්ගියාගේ—චරති, චර යන ධාතු තෙමැ—කිමන, කිසිවෙක්—අභිධානලක්ඛණ, සාමර්ථ්‍යයෙන් යුක්තවූ වාක්‍යයක් ඇතිකල්හි සමාසවීමෙන් අභිප්‍රකාශකිරීමැ ස්වභාවකොටැ ඇත්තානුයි.

**ගවා** [d] ~ දුනො, වෘක්ෂයාගේ.

**නිඥ** [e] ~ සෙන රූපෙන, සවරූපයෙන්—අපචිත, මළවූ—පටිච්ඡන්දකං, පෙතැලිරූයි—ඉමෙ, මොහු ; තො, අපගේ ; හත්ථිකා, ගෙනැ කෙලනා ඇත්රූහ ; ඉමෙ, මොහු ; අස්සා, කෙලනා අස්රූහ ; ඉමෙ, මොහු ; තො, අපගේ ; බලිවද්ද, කෙලනා ගොන්රූහ—“ බුබ්බො ” යනාදියැ අච්චාවෙහි කප්‍ර ත්‍යය ලොප්වූ තැනි.

කීයේ මැතෝ දෙවපථාදිගණියෙහි.

“ අච්චාසු පූජනාර්ථාසු චිත්‍රකර්ම්මධ්වජෙසු ච
ඉවෙ ප්‍රතිකෘතෞ ලොපඃ කනො දෙවපථාදිෂු ” ~ යි.

චඤ්චා ඉව, තෘණපුරුෂයක්හු වැනිනුයි—“ චඤ්චා ” නම් පඹ කොල්ලායි—වට්ටිකෙව, වරපටක් වැනිනුයි—වත්ථිව, දෘතියක් වැනිනුයි—මිලනං, එක්වීමැ—ආකස්මිකෙ, යම්කිසි අබුද්ධි පූර්වකයෙක්හි—අකස්මා එව ආකස්මිකං—“ කාකතාලීයං ”

---

[a] 4, 28 සූ. [b] 4, 29 සූ. [c] 4, 30 සූ. [d] 4, 36 සූ. [e] 4, 41 සූ.

යනාදී උදාහරණ පාණිනීයව්‍යාකරණයෙහි “**සමාසාච්ච තද්විෂයාත්**” * යන සූත්‍රයෙන් සෑදූහ—අපිත්විසින් එහි අභිප්‍රාය—

‘චයෝර්වාපියෝරත්‍ර නිමිත්තත්වමප්‍රතීයතෙ
එකෙනාවයවො යුක්තඃ ප්‍රත්‍යයො’න්‍යො න යුජ්‍යතෙ—
මෛත්‍රස්‍ය තත්‍රාගමනං කාකස්‍ය ගමනං යථා
චයොරභිනිපාතස්තු තාලස්‍ය පතනං යථා”—

යනාදීන් වෘත්තිසමුද්දේශයෙහි කියනලද ක්‍රමයැ බලා දත යුතු—මුනිව මෞනිකො—බාලොව බාලිකො—ලොහිතොව ලොහිතිකො.

**තමස්ස** [a]—අභිමතො, (“**සංඛ්‍යායාඃ සංඥාසඞ්ඝසූත්‍රාධ්‍යයනෙෂු**” † යන සූත්‍රයෙන් පාණිනීන්ට)—පඤ්චාවුත්තයො, පස් විටෙක්; ආවෘත්තීහු පස්දෙනෙක්; හෙවත් “රූපානි පඤ්ච” යනු මෙහිද යොදනු—“රූපානි” යනුද ආවෘත්තියට පර්‍යාය යයි—එහෙයින් කීහ ජයාදිත්‍යයෝ—“පඤ්චාවෘත්තයඃ පඤ්චවාරාඃ පඤ්චරූපාණ්‍යස්‍යාධ්‍යයනස්‍ය පඤ්චකමධ්‍යයනම්” යි.

**කිමහා** [c]—“එසං දසන්නං අයං කා සංඛ්‍යා” යි යොජනායි—“රකාරානුබන්ධො ඉංසද්දලොපත්ථො” යි යොදනු.

**තගෙසා** [d]—උච්චත්තෙන මානං, මත්තෙන් ප්‍රමාණ කරනුලබන්නේ.

එහෙයින් කීහ.

“ඌර්ධ්වමානං කිලොන්මානම්පරිමාණන්තු සර්වතඃ
ආයාමස්තු ප්‍රමාණං ස්‍යාත්සංඛ්‍යාබාහ්‍යාස්තු සර්වතඃ”—යි.

“**ප්‍රමාණපරිමාණාභ්‍යාං සංඛ්‍යායාශ්චාපි සංශයෙ මාත්‍රජ්වක්තව්‍යඃ**” යන පාණිනීයව්‍යාකරණමත දක්වා නිරාකරණයැ කරනු කැමැති වැ “පමාණ” යනාදි කීහු—“න වත්තබ්බං” යනාදි උත්තරපක්ෂයි—තථා, එසෙයින් මැ (“විදත්ථිමත්තං පමාණමස්ස” යනාදීන්;) අභ්‍යූහනතො, තර්කනාමූලක සම්මර්ශයෙන්—ටීකායෙහි “අභ්‍යූහනතො අභ්‍යුපගමතොති අත්ථො” යි කීහු—අභ්‍යුපගම නම් ගිවිසීමයි—“අභ්‍යූහනං සංසයස්ස” යි ගම්‍යයි.

* පා. 5, 3, 106. † පා. 5, 1, 58.
[a] 4, 42 සූ. [b] 4, 45 සූ. [c] 4, 48 සූ.

**අඤ්ඤ**[a] ~ උපාධ්‍යන්තර, ("අං සෙ" යන) නිමිත්තාන්තරයක් හුගේ.

**සංඛ්‍යා**[b] ~ පච්චයන්තෙන, (ණවණ්ණීණකාෂිපණ්ණාදිවූ) ප්‍රත්‍යයාපීයෙන්.

**තස්ස**[c] ~ පූරියතෙ, යැයි සේ ; සම්පජ්ජතීති, පුරනුලැබේනුයි—"ඔඝිකා" නම් මැටිතාළියයි—මෙ මැ කීහ අමරකොශශෙෂයෙහි "මෘදභාණ්ඩ'ප්‍යුෂ්ට්‍රිකා සත්‍රියාම්" යි.

**එකා**[d] ~ සංඛ්‍යාවාචිගහණෙ, සංඛ්‍යාවාචීවූ එකශබ්දයාගේ ග්‍රහණයැ කළකල්හි—උපපජ්ජතෙ, ("බහුත්තවිසයෙ පයොගො" යනු) අපෙක්ෂාකෙරේ.

**වච්ඡා**[e] ~ අප්පමත්තාවසෙසතා, කිඤ්චින්මාත්‍රාවශෙෂතාවයි—වලවායං, වෙළඹකුසැ.

**තෙන**[f] ~ "මනුස්සනාමවිසෙසෙ" යනාදීන් "දයායාම්" යනු වැටෙනුයෙහි "**නෘනාමනි ඨඡ්ඝනතිලචො වා**"* යන සූත්‍රයෙහි අභිප්‍රාය දක්වත් — ලොකියා, ලෞකිකයෝ ; හෙවත් පරශබ්දශාස්ත්‍රකාරයෝ—"ඉහ තු අවිසෙසෙන වුත්තං" යි සම්බන්ධයි—"නිරුත්තියං සාමඤ්ඤෙන වුත්තත්තා" යි යොදනු—"කෙචි" යනුයෙන් පාණිනීයයන් දක්වත්—දත්තසද්දලොපං කත්වා, ("**විනාපි ප්‍රත්‍යයෙන පූර්වොත්තරපදයොර්විභාෂා ලොපො වක්තව්‍යඃ**" යන වක්තව්‍යයෙන්)—"කෙචි පන" යනුයෙන් චාන්ද්‍රයන් දක්වත්—කප්පනාගාරවො, (දත්තශබ්දලොපනාමෙකදෙශවශයෙන්) කල්පනාගෞරවයැද—"රාහුලො සීහලො ගරුළො" යනාදියැ කෘදන්තපදයි—රාහුලශබ්දයට නිර්වචන අග්‍රවංශාචාර්‍යයන් විසින් දක්වනලදි—ශේ මෙසේ දතයුතු :—

"රාහු විය ලාති ගණ්හාතීති රාහුලො, කො සො, සික්ඛාකාමො ආයස්මා රාහුලභද්දො බුද්ධපුත්තො, තස්ස හි ජාතදිවසෙ සුද්ධොදනමහාරාජා පුත්තස්ස මෙ තුට්ඨිං නිවෙදෙථාති උය්‍යානෙ කීළන්තස්ස බොධිසත්තස්ස සාසනං පහිණි, බොධිසත්තො තං සුත්වා රාහු ජාතො බන්ධනං ජාතන්ති ආහ, පුත්තස්ස හි ජායනං රාහුගහො විය හොති තණ්හාකිලිස්සනතාපාදනතො දළ්හත්ත ච සංඛලිකාදිබන්ධනෙන බන්ධනං

* (වාන්ද්‍ර ?)

[a] 4, 50 සූ. [b] 4, 51 සූ. [c] 4, 52 සූ. [d] 4, 56 සූ. [e] 4, 57 සූ. [f] 4, 59 සූ.

විය හොති මුඤ්චිතුං අප්පදානතොති රාහු ජාතො බන්ධනං ජාතන්ති ආහ, රාජා කිං මෙ පුත්තො අවචාති පුච්ඡිත්වා තං වචනං සුත්වා ඉතො පට්ඨාය මෙ නත්තා රාහුලොතෙව නාමං හොතූති ආහ, තතො පට්ඨාය කුමාරො රාහුලො නාම ජාතො—මහාපදානසුත්තටීකායං හි “රාහු ජාතොති එත්ථ රාහූති රාහුග්ගහො”ති වුත්තං, තං පන රාහුලොති වචනස්සත්ථං පාකටං කාතුං අධිප්පායත්ථවසෙන වුත්තං, න හි කෙවලො රාහූති සද්දො රාහුග්ගහොති අත්ථං වදති අථඛො ජාතසද්දසම්බන්ධං ලභිත්වා වදති, තථා හි රාහු ජාතොති බොධිසත්තෙන වුත්තවචනස්ස රාහුග්ගහො ජාතොති අත්ථො භවති, තස්මා සුද්ධොදනමහාරාජා මම නත්තා රාහු විය ලාතීති රාහුලොති වත්තබ්බොති විනෙත්වා රාහුලොතෙව නාමං හොතූති ආහාති දට්ඨබ්බං—කෙචි පන රාහුලො ජාතො බන්ධනං ජාතන්ති පඨන්ති කත්ථචි පොත්ථකෙ ච ලිඛන්ති තං න සුන්දරං අත්ථස්ස අයුත්තතො ටීකාය ච සද්ධිං විරොධිතො, න හි රාහුලොති කුමාරස්ස නාමං පඨමං උප්පන්නං පච්ඡායෙව පන උප්පන්නං අඤ්ඤකෙන දින්නත්තා, තස්මා තදා බොධිසත්තෙන රාහුලො ජාතොති වත්තුං න යුජ්ජති, තථාහි අනභිසිත්තෙ අරාජිනි පුග්ගලෙ මහාරාජාති වොහාරො නප්පවත්තති, ටීකාය ච රාහූති රාහුග්ගහොති වුත්තං, අථාපි තෙසං සියා රාහුලො ජාතො බන්ධනං ජාතන්ති පදස්ස විජ්ජමානත්තා එවං ටීකාය රාහුග්ගහොති භාවවසෙන ලාසද්දෙන සමානත්ථො ආදානත්ථො ගහසද්දො වුත්තොති, එවම්පි නුප්පජ්ජති රාහුලානං ජාතං බන්ධනං ජාතන්ති පාඨස්ස වත්තබ්බත්තා, රාහුලොති හි ඉදං සීහලොති පදං විය දබ්බවාචකං, න කදාචිපි භාවවාචකං, තස්මා රාහුලො ජාතො බන්ධනං ජාතන්ති එතං එකච්චෙහි දුරොපිතං පාඨං අග්ගහෙත්වා රාහු ජාතො බන්ධනං ජාතන්ති අයමෙව පාඨො ගහෙතබ්බො සාරතො පච්චෙතබ්බො සුපරිසුද්ධෙසු අනෙකෙසු පොත්ථකෙසු දිට්ඨත්තා පොරාණෙහි ච ගම්භීරසුඛුමඤ්ඤාණෙහි ආචරියපාචරියෙහි පසීතත්තා, අයං පනෙත්ථ සාධිප්පායා අත්ථප්පකාසනා, රාහු ජාතොති බොධිසත්තො පුත්තස්ස ජාතසාසනං සුත්වා සංවෙගප්පත්තො ඉදානි මම රාහු ජාතොති වදති, මුඤ්චිතුං අප්පදානවසෙන මම ගහණත්ථං රාහු උප්පන්නොති හි අත්ථො, බන්ධනං ජාතන්ති ඉදානි මම බන්ධනං ජාතන්ති වදති, තථා හි ටීකායං වුත්තං රාහූති රාහුග්ගහොති, තත්ථ

රාහුග්ගහො හොති ගණ්හාතීති ගහො රාහු එව ගහො රාහුග්ගහො මම ගාහකො රාහු ජාතොති අත්ථො, අථවා ගහණං ගහො රාහුනො ගහො රාහුග්ගහො, රාහුග්ගහණං මම ජාතන්ති අත්ථො, පුත්තො හි රාහුසදිසො පිතා චන්දසදිසො පුත්තරාහුනා ගහිතත්තා, එකච්චෙ පන රාහුලොතෙව නාමං හොතූති ඉමං පදෙසං දිස්වා රාහු ජාතොති වුත්තෙන ඉමිනා න සමෙති රාහුලො ජාතොතියෙව පන සමෙතීති මඤ්ඤමානා එවං පාඨං පඨන්ති ලිඛන්ති, තස්මා සො අනුපපරික්ඛිත්වා පඨිතො දුරොපිතො පාඨො න ගහෙතබ්බො, යථාවුත්තො පොරාණිකො පොරාණාචරියෙහි අභිමතො පාඨොයෙව ආයස්මන්තෙහි ගහෙතබ්බො අත්ථස්ස යුත්තිතො ටීකාය ච සද්ධිං අවිරොධතො" යී.

සීහං ලාති ආදදාතීති සීහලො පුබ්බපුරිසො, තබ්බංසෙ ජාතා එතරහි සබ්බෙපි සීහලා—ගරුං ලාති ආදදාතීති ගරුළො.

තස්ස ~ සපන්ති පකාසෙන්ති අත්ථමනෙනෙති සද්දා—"පදත්ථාදිසු" යන තැන්හි ආදිශබ්දයෙන් ලීලාවෙණ්ඩාදීන්ගේ ග්‍රහණයයි—රූපසාධනවාරෙන, (භාවශබ්දයාගේ) රූපසාධනමුඛයෙන්—නිමිත්තස්සරූපානුගතා බුද්ධි ච අභිධෙය්‍ය වත්තතෙ" යී අන්වයයි—"සරූපානුගතා ච බුද්ධි" යනුයෙන් "ශබ්දඥනයොඃ ප්‍රවෘත්තිනිමිත්තම්භාවඃ" යන ක්‍රමයෙන් බුද්ධියට ප්‍රවෘත්තිනිමිත්තද භාවයැයි හැඟවූහු—ශබ්දප්‍රවෘත්තිනිමිත්ත නම් ඒ ඒ වචනාධීනියතවූ අතාත්විකවූ නාමප්‍රඥප්තියෙකි—"තං නිමිත්තං" යී ශබ්දයාගේ ප්‍රවෘත්තිකාරණයැ—දබ්බ වුත්තියං ගුණෙ නිමිත්තං" යී අධ්‍යසම්බන්ධයි—වුත්තියං, ප්‍රවෘත්තියක් ඇතිකල්හි—ක්‍රියාශබ්දයෙන් ද්‍රව්‍යාදීන්ගේ ග්‍රහණයයි—සඤ්ඤාසද්දානං, දෙවදත්තාදි සංඥශබ්දයන්ගේ—පවත්තිනිමිත්තං, ජාතිලක්ෂණයැ—සම්බන්ධිභෙදතො, (ඝටාදි) සම්බන්ධීන්ගේ භෙදයෙන්—අභාවස්ස භෙදතො, (ඝටපටාදි) සම්බන්ධ්‍යභාවයාගේ භෙදයෙන්—අභාවස්ස භෙදතො අභෙදෙපි භෙදා උපචරිතා සන්ති" යී යෙදියැයුතු — යස්ස වසා, යමක් කාරණ කොටැ—නිරවයවාවිජ්ජමානවිසයානං, (ආකාශය මෙන්) අවයවනොවූද (අභාවය මෙන්) අවිද්‍යමාන විෂය වූද ශබ්දයන්ගේ—සූචකස්ස, කෝලාම් කියන්නහුගේ—"න දබ්බං" යී සම්බන්ධයි.

---

4, 60 සූ.

**තර** [a]—විධියන්ති, ("ඞිබහුෂු ප්‍රකර්ෂේ තරපතමපෙ" ")* "ගුණාදීයසුනිෂ්ඨෙ ච"* යන සූත්‍රවලින්—"එවම්හා විධානං සුඛසාධනත්‍ථං" යි සබඳ—සරාදී, (ඉය ඉඪ යන) ස්වරාදි ප්‍රත්‍යයෝ.

**කසස** [b]—කොසාතං, තිරිපකුත්ගේ—ඔසධි, ලතාදීහුයැ—මෙතැන්හි "ඔසධි" යනු කදලිධාන්‍යාදි ඵලපාකාන්ත වෘක්ෂ නොවේ.

**ජතු** [c]—උපපත්‍යන්තරං, අන්‍යයුක්තියක්—පියාල නම් මොරගසි.

**සමු** [d]—විසුත්තිරෙසු ච වත්තතෙ" යි සම්බන්ධයි.†

**ජ** [e]—ඉතිසද්දො වා, ("මදනීයන්ති" යන තැන්හි) ඉති ශබ්දයැ හෝ.

**ඉශො** [f]—"අඤ්ඤසමිනති වචනා අඤ්ඤසම්මපි අත්‍ථෙ ඉයො" යි යොජනායි.

**තමෙත්‍ථ** [g]—"සත්තාය අව්‍යභිචාරෙ'පි" යි පදසම්බන්ධයි—යදි අත්‍ථීති උපාධි සම්පතිසත්තාපරිග්ගහත්‍ථං" යි සම්බන්ධයි—සම්පතිසත්තා, වර්ත්තමානකාලයෙහි සත්තාවගේ—උපාධි, විශෙෂණයැ—අත්‍ථන්තර, අර්‍ථාන්තරයාගේ හෙවත් ප්‍රතිෂෙධ ස්වරූපවූ අර්‍ථයාගේ—පදනිබන්ධනස්ස විධිනො අබාධිකා" යි සම්බන්ධයි—"කතිපයසම්භවෙන පුන ගොමා රුක්ඛවා" යි යොදනු—තෙහි, ඒ ප්‍රභූතප්‍රශංසාර්‍ථ දෙකින්—කකුද්වතෙනා, මොල්ලියැ වට හිරි—දබ්බ'භිධෙය්‍ය, (ජාත්‍යාශ්‍රයවූ ගො පිණ්ඩාදි) ද්‍රව්‍යයැ කියමනාකල්හි—භවං භවතෙනා, යම් කිසි කලෙකැ වන්නේ.

**දණ්ඩා** [h]—"විජ්ජාගහණත්‍ථං" යනාදියැ සාරසඞ්ග්‍රහකාර මතයෙන් කියනලද—ශ්‍රීධරාචාර්‍යමතයෙන් බ්‍රහ්ම නම් නිර්‍වාණයැ තදර්‍ථවූ ව්‍රතයෙහි හැසිරෙන්නේ බ්‍රහ්මචාරි නම් වෙයි දතයුතු—ත්‍රිකාණ්ඩයෙහි "වර්ණිනො යතයඃ ප්‍රොක්තාඃ" කීහෙයින්ද—

---

* (වාදු සූත්‍රද්වයොයි ගනිමු.)

† "තිපුත්තරෙසු ච වත්තතෙති සම්බන්ධො"—ටීකා.

[a] 4, 65 සූ. [b] 4, 67 සූ. [c] 4, 68 සූ. [d] 4, 69 සූ.
[e] 4, 70 සූ. [f] 4, 71 සූ. [g] 4, 79 සූ. [h] 4, 81 සූ.

"ශ්‍රියඃ කුරූණාමධිපස්‍ය පාලනීං
ප්‍රජාසු වෘත්තිං යමයුඞ්ක්ත වෙදිතුම්
ස වර්ණිලිඞ්ගී* විදිතස්සමායයෞ
යුධිෂ්ඨිරං ද්වෛතවනෙ වනෙචරඃ" ෴

යි භාරවීන් කීහෙයින්ද ශ්‍රීධරමතයැ මැ යුක්තතරයැයි සිතියැ යුතු—යො නියමවිසෙසො,

("සෙවෙතෙමාංස්තු නියමාන් බ්‍රහ්මචාරී ගුරෞ වසන්
සන්නියම්‍යෙන්ද්‍රියග්‍රාමං තපොවෘද්ධ්‍යර්ථමාත්මනඃ ෴
නිත්‍යං ස්නාත්වා ශුචිඃ කුර්‍ය්‍යාද්දෙවර්ෂිපිතෘතර්පණම්
දෙවතාභ්‍යර්ච්චනඤ්චෛව සමිදාධානමෙව ච ෴
වර්ජ්ජයෙන්මධුමාංසානි ගන්ධමාල්‍යරසාන් ස්ත්‍රියඃ
ශුක්තානි චෛව සර්ව්වාණි ප්‍රාණිනාඤ්චෛව හිංසනම් ෴
අභ්‍යඞ්ගමඤ්ජනඤ්චාක්ෂ්ණොරුපානච්ඡත්‍රධාරණම්
කාමං ක්‍රොධඤ්ච ලොභඤ්ච නර්ත්තනං ගීතවාදනම්" ෴

යනාදීන් මනවාදිප්‍රොක්ත) යම් නියමවිශෙෂයෙක් ඇද්ද—"තෛවර්ණිකො" යනුයෙන් මෙතැන්හි වර්ණශබ්දයැ චාතුර්ව්වර්ණ්‍යපර්‍ය්‍යාය නොවනබව දක්වුහු—එහෙයින් කීහ ශාකටායනයෝ —"වර්ණශබ්දො බ්‍රාහ්මණාදිවර්ණවචනඃ, තත්‍ර බ්‍රහ්මචාරිණ්‍යනෙන ශුද්‍රො ව්‍යවච්ඡිද්‍යතෙ, තෙන ත්‍රෛවර්ණිකො වර්ණීත්‍යුච්‍යතෙ, ස හි විද්‍යාග්‍රහණාර්ථමුපනීතො බ්‍රහ්ම චරති න ශුද්‍ර ඉති" යි.

මුඛා ෴ "හනු දන්තො වා" යනු සුභූතිචන්ද්‍රයන් කී "කුජො හනුර්දන්තශ්ච" යන නිර්ව්වචනයට අනුසාර වැ කීහු—ජයාදිත්‍යයෝ වනාහි "හසතඃ කුජශබ්දෙනොච්‍යතෙ" යි

* "වර්ණිනඃ ප්‍රශස්තිරස්‍යාති වර්ණී, තදුක්තම්—
ස්මරණං කීර්ත්තනං කෙලිඃ ප්‍රෙක්ෂණං ගුහ්‍යභාෂණම්
සඞ්කල්පො'ධ්‍යවසායශ්ච ක්‍රියානිර්වෘත්තිරෙව ච ෴
එතන්මෛථුනමෂ්ටාඞ්ගං ප්‍රවදන්ති මනීෂිණඃ
විපරීතං බ්‍රහ්මචර්‍ය්‍යමෙතදෙවාෂ්ටලක්ෂණම් ෴
එතදෂ්ටවිධමෛථුනාභාවඃ ප්‍රශස්තිඃ, වර්ණිනාද්බ්‍රහ්මචාරිණීති ණිනි ප්‍රත්‍යයඃ, තස්‍ය ලිඞ්ගං චිහ්නමස්‍යාස්තීති වර්ණිලිඞ්ගී බ්‍රහ්මචාරිවෙෂවාන් ඉත්‍යර්ථඃ." ඝණ්ටාපථසමාඛ්‍යා කිරාතාර්ජ්ජුනීයව්‍යාඛ්‍යා.

* 4, 92 සූ.

කීහු—" පාසාණමයා පාසාදදයො පාසාණමයා දෙවතාලයා " සී යොදනු—" අදයො " යනුයෙන් අපණාදියැ දර්ශිතයි.

" දෙවතාවෙශමභිශ්චිත්‍රෛ ප්‍රාසාදපණවෙශමභිඃ
නගරං දර්‍ශයේච්චාන් රාජමාගෛශ්ච ශොභනෛඃ"—

යනු නගරලක්ෂණයි.

ලකඛණ[a]—" උපාදනතො " යනුයෙන් " ආශ්‍රයකරණ මෙකශශාසත්‍රියො නත්‍යඃ " යනු දක්වූහු.

බො[b]—පටිසිඩවිසයෙපි, (" අවධාවබොහො ගුඃ "* යන සූත්‍රයෙන්) — ජාතියවජ්ජිතානං, (" තබබති ජාතිණො " [c] සී කියනලද) ජාතියප්‍රත්‍යයවිසින් වර්ජිතවූ.

කුහිං[d]—විධීයතෙ, (" හිංහංහිචනං " †යන සූත්‍රයෙන්)— හිච්ආදීනං, හිඤ්-දවි-රහච් ආදීන්ගේ.

අජ්ජ[e]—නිමිත්තනිමිත්තජීනං, කාරණකාය්‍යීයන්ගේ— උපරි, මත්තේ (තන්‍යාදිකාණ්ඩයෙහි).

සබ්බා[f]—" විසෙසො පකාරො " යනුයෙන් " ප්‍රකාරෙ෯ භෙදසාදශ්‍යෙ෯ " යන ප්‍රකාරශබ්දයාගේ අර්ථදෙකින් භෙද අර්ථයැ ගත්හු.

ධා සං[g]—සංඛ්‍යාශබ්දයෙන් සංඛ්‍යාවාචිශබ්දයෝ ගන්නා ලදහ එබැවින් " අපි " යනාදී කීහු—" නවධා දබ්බං බහුධා ගුණො " යනාදියැ වෛශෙෂිකසඞකතයි — " පයොගදසස නතො ව්‍යවච්ඡෙජ්ජභාවා සබ්බත්‍ථක්‍රියෙවෙති විසෙසනොපාද නමයුත්තං " සී සම්බන්ධයි—විසෙසනොපාදනං, (" විධා ප්‍රකාරඃ ස ච ක්‍රියාවිෂය ඉහ ගෘහ්‍යතෙ,‡ ක්‍රියාප්‍රකාරෙ වර්තමානා යාඃ සංඛ්‍යයා ධාප්‍රත්‍යයඃ, එකධා භුඞ්ක්ත ද්විධා භුඞ්ක්ත ද්විධා ගච්ඡති "§ සී ජයාදිත්‍යාදීන්ගේ ක්‍රියාවිෂයප්‍රකාරයැ ගන්නා ලැබෙයි යන) විශෙෂණග්‍රහණයැ—තතොයෙව, ඒ (විශෙෂ ණොපාදනයැ අයුක්ත) හෙයින් මැ— " සභාවතො අලිඞගම

* " අපාදනෙ චාහීයරුහොඃ "—පා. 5, 4, 45. † ක. 2, 5, 6.
‡ " විධා ප්‍රකාරඃ සර්වක්‍රියාවිෂය එව ගෘහ්‍යතෙ "—කාශිකා.
§ " එකධා භුඞ්ක්ත, ද්විධා ගච්ඡති, ත්‍රිධා, චතුර්ධා, පඤ්චධා "—කාශිකා.

[a] 4, 103 සූ. [b] 4, 107 සූ. [c] 4, 125 සූ. [d] 4, 116 සූ.
[e] 4, 119 සූ. [f] 4, 120 සූ. [g] 4, 122 සූ.

සංඛ්‍යච " යි සම්බන්ධයි—අභිමතො, (" අධිකරණවිචාලෙ ච "* යන සූත්‍රයෙන් පාණිනීන්ට).

**ධාබ්බ** [a]— පකාරවති, ප්‍රකාරවත් අර්ථයෙහි.

**සකිං** [b]— නිපාතනස්ස, (සකිං යන) නිපාතනයැ.

**දිස්ස** [c]— " ඉදං විජ්ඣඞ්ගපරිභාසා භවති " යි ශෙෂයි— " විධියෙව සුත්තමිදං " යි යොදතු — වක්ඛමානසුත්තවයං, " **අඤ්ඤස්මිං**, [d] **සකාලෙසු** " [e] යන සූත්‍රවය.

**අධා** [f]— තස්සා, ඒ අධාතුප්‍රකෘතියැගේ—තෙන ච, ඒ කකාර යෙන්ද—" අකාරෙ විසෙසීයතෙ " යි සම්බන්ධයි—පුබ්බග්ගහණං, (" **ප්‍රත්‍යයස්ථාත්කාත්පූර්වස්‍යාත ඉදාප්‍යසුපඃ** "† යන පාණිනීයසූත්‍රයෙහි මෙන්) පූර්වග්‍රහණයැ—එතං, මේ (" බහුපරිබ්බාජකා " යන රූපයැ; සියා, වන්නේයි—ස්‍යාදිතො, (සමාසවාක්‍යයෙහි ස්‍යාද්‍යන්තබැවින්) ස්‍යාද්‍යන්තවූ පරිබ්බාජක ශබ්දයාකෙරෙන්—" අස්‍යාදිස්මා පරොති කත්වා බහුපරිබ්බාජක සද්දතො න ස්‍යාදුප්පත්ති " යි සම්බන්ධයි—තතො ච, ඒ බහුපරිබ්බාජකශබ්දයාකෙරෙන්ද.

ඉති මොග්ගල්ලානෙ ව්‍යාකරණෙ පඤ්චිකාපදීපෙ
ණාදිකණ්ඩො චතුත්ථො.

---

**තිජ** [g]— සම්බන්ධස්ස, (පදයන්ගේ පරස්පර) සම්බන්ධයැ තමා—අත්ථන්තරස්ස, (නිශානාදි) අර්ථාන්තරයාගේ—" සුතානුමිතානං " යනාදීන් " **ශ්‍රැතානුමිතයොශ්‍රැතසම්බන්ධ එව බලීයාන්** " යන පරිභාෂාව දක්වූහු—" තිතික්ඛක්‍රියත්ථා " යන මෙයින් " **සනාද්‍යන්තා ධාතවඃ** "‡ යනාදීන් පරවෛයාකරණයන්ගේ බාද්‍යන්තයන්ට ධාතුසංඥාවිධානයැ නිරර්ථකයැයි දක් වූහු—ස්වාර්ථයෙහි ඛසප්‍රත්‍යයන්ගේ විධානයැ හෙතු කොටැ ගෙනැ තදන්තයන්ගේ ක්‍රියාවාචකත්වයැ සිද්ධයැයි සිතූහු—අනුවාදරූපානං, (අනාදිකාලසංසිද්ධ) ශබ්දානුවාදස්වරූපයන්ගේ—ඉතරීතරාපෙක්ඛදොස, (වීමංසාශබ්දයැ සිද්ධවූකල්හි සවිධි උපදනේයැ සවිධි උපන්කල්හි " වීමංසා " යන රූපයැ උපදනේයැයි යන) ඉතරෙතරාශ්‍රයදොෂයාගේ.

---

* පා. 5, 3, 43. † පා. 7, 3, 44. ‡ පා. 3, 1, 32.
4, 125 සු. [b] 4, 129 සු. [c] 4, 132 සු. [d] 4, 133 සු.
[e] 4, 134 සු. 4, 154 සු. [g] 5, 1 සු.

**කිතා**[a] — විසස්සත්ථො, විශබ්දයාගේ අර්ථයැ—විධොදාහරණං, (සංකෙතයැ නිකෙතයැයි) දෙපරිද්දෙකින් ලක්ෂණ දක්වීමැ—කෙතොති, අ, ("**භාවකාරකෙ**"[b] යනාදීන්) අප්‍රත්‍යය වේ.

**නිඤ්ඤ්යං**[c] — බන්ධතීති බන්ධකො.

**තුංසමා**[d] — තදර්ථනාභාවත්තා, (යමක්හුකෙරෙන් විහිතද) ඔහු හා වෙන්නොවනසුලුබැවින්—සපාදිතො, ප්‍රාදිසහිත (තුම න්තයා) කෙරෙන් — ඛජ්ජුප්පත්තාභාවා, ඛජසප්‍රත්‍යයන්ගේ උත්පත්තියැ නැතිහෙයිනි—විතො, විඋපසර්ගයාකෙරෙන්—ඉච්ඡාභිලාසොති, ඉච්ඡායැ අභිලාෂයැ යන දෙදෙන ; සමානත්ථා, සදෘශාර්ථයෝයි—වාක්‍යයාගේ සාධුත්වඛ්‍යාපනයැ පිණිසැ "**ධාතොඃ කර්මණඃසමානකර්තෘකාදිච්ඡායාං වා**"* යන සූත්‍රයෙන් ආචාර්ය පාණිනීන්විසින් විහිතවූ වාවිධානයැ නිරාකීර්ණු වැ "වාක්‍යම්පි" යනාදි කීහු—"පකත්‍යාදි" යන තැන්හි ආදිශබ්දයෙන් අර්ථවිශෙෂග්‍රහණයැයි—තුමන්තාදි තොමැ ප්‍රකෘතිවිශෙෂයැ ; ඉච්ඡාර්ථයැ අර්ථවිශෙෂයි—ඉදං ලක්ඛණං, "**තුංසමා ලොපො චිච්ඡායං තෙ**"[e] යන මේ ලක්ෂණයැ—පදන්තරෙන, පෘථක්පදයෙන්—නියොගතො, නියමයෙන්—"**අශබ්ද්‍යාසාමුපසංඛ්‍යානම්**" යි වාක්‍යකාරොකත උපසංඛ්‍යානයැ නිරාකරණයැ කරනුපිණිසැ "ආසංකායං" යනාදි කීහු—අසිද්ධෙනාසිද්ධසාධනං, අසිද්ධවූ වාක්‍යයෙන් අසිද්ධවූ ඛජසප්‍රත්‍යයන්ගේ සෑදීමයි—ඉච්ඡාය උපලද්ධි, ඉච්ඡාවගේ පරිඥනයැ—උපයුක්තං, උද්දෙශ ඇත්තාවූ—රජ්ජු, රැහැණයැ—කීල, කණුයැ—පූලි, සැවැන්කැරැලියැ — සා, ශුනකතෙමැ — "කොසකකුණෙය්‍ය" යි යොදනු—"**ඉච්ඡාසහානනානාතප්‍රතිෂෙධොවක්තව්‍යඃ**" යි පාණිනීයවාර්ත්තිකකාරයන් කී වක්තව්‍යප්‍රත්‍යාඛ්‍යානයැ පිණිසැ "බුභුක්ඛිතුං" යනාදි කීහු—"සකං බන්ධං" යනාදීන් "නහි සුශික්ෂිතො'පි නටපටුස්සවස්කන්ධමාරොහති" යන ආත්මාශ්‍රයදොෂයට කී උදාහරණවාක්‍යයැ දක්වූහු—ඉතර, අන්‍යවූ ඉච්ඡාර්ථයැ.

**ඊෂො**[f] — තංසම්බන්ධියෙව, ඒ ඉච්ඡාර්ථසම්බන්ධිවූයේ මැ—පකති සහායො යස්ස ඊයස්ස සො පකතිසහායො—අනභි

* පා. 3, 1, 7.

[a] 5, 2 සූ. [b] 5, 44 සූ. [c] 5, 3 සූ. [d] 5, 4 සූ. [e] 5, 4 සූ. [f] 5, 5 සූ.

ධානාති, (ආත්මග්‍රහණයාගේ නොකීමෙන්) විශෙෂාභිධානයැ නැතිහෙයින්—“ඊයස්ස පරසම්බන්ධිත්‍යපි පසඞ්ගො” යි සම්බන්ධයි—පසඞ්ගො, (පාණිනියෙහි මෙන් “සුප ආත්මනඃ ක්‍යච්”* යන සූත්‍රයෙන් “ආත්මනඃ” යනු වැටෙනුයෙහි “කාම්‍යච්ච”† යන සුතුරෙන් ප්‍රත්‍යය අවිහිතහෙයින්)—ඉට්ඨං නාම, ඉදින් ඉෂ්ටවී නම් (එකල්හි)—අප්පත්තියා, අප්‍රාප්තියැ කරණ කොටැ ගෙනැ; නොහොත් අප්‍රාප්තියැ හෙතුකොටැ ගෙනැ—න ච ඉට්ඨො, නෙව ඊයප්පච්චයො ඉට්ඨො—එත්ථ, (“අත්තනො පුත්තමිච්ඡති” යන) මෙහි—ඊයප්‍රත්‍යයෙන් මැ ආත්මාර්ථයැ උක්තහෙයින් ආත්මශබ්දයාගේ අප්‍රයොගයැයි කීමද අයුක්ත යැයි ප්‍රතිපාදනය කරනුවෝ “න ච සක්කා” යනාදි කීහු—පකතිසමානාධිකරණස්සෙව, (අපූපාදි) ප්‍රකෘතියැ හා සමානවූ අර්ථඇත්තාවූ මැ—“ආපූපිකො” යනු “තමස්ස සිප්පං සීලං පණ්‍යං පහරණං පයොජනං” [a] යන සූත්‍රයෙන් ණික ප්‍රත්‍යය වූ තැනි—“න තු භින්නත්ථස්ස” යනාදියැ ව්‍යතිරෙක දෘෂ්ටාන්තොපන්‍යාසයි—තුශබ්ද අවධාරණයෙහි වැටේ—“තු භෙදෙ චාවධාරණෙ” ඉත්‍යමරඃ—“න චාපි අප්පයොගො” යි සම්බන්ධයි—වාක්‍යත්ථෙ, (අත්තනො පුත්තමිච්ඡති” යන) වාක්‍යාර්ථයෙහි—පදස්ස, (පුත්තීයාදි) පදයාගේ—“ඊයන්තස්ස පුත්තීයාදිනො සමුදායස්ස අවචනා” යනුයෙන් “පුත්තීයති” යන සමුදායයාගේ නිපාතනයැ නොවෙයි ප්‍රත්‍යයමාත්‍රයාගේ නිපාතනයැයි හැඟවූහු—“අත්තත්ථස්ස” යනාදීන් අර්ථාපත්ති යෙන් හා ප්‍රස්තාවයෙනුත් පුත්‍රයාගේ ආත්මීයත්වයැ හැඟේ යැයි කීහු—“නියොගතො න ච පප්පොති” යි සබඳ—වරහි, එබැවින් යන අර්ථයි—අක්ඛමායං, නොඉවැසීමෙහි (වැටේ)—තබ්භාවි, අන්‍යවාචීවූ—සුතග්ගහණං, “අඤ්ඤස්සාසුතත්තා” යන තැන්හි ශ්‍රැතග්‍රහණයැ—වත්තුමිට්ඨෙකසංඛ්‍යස්ස, විවක්ෂිතෛකසංඛ්‍යාවූ; සාමඤ්ඤස්ස, කර්මසාමාන්‍යයාගේ—“අවයවතොපි සාපෙක්ඛතාය න හොති” යි සම්බන්ධයි—“මහා පුත්තමිච්ඡතීති යදා එවං කරීයති තදා මහාපුත්තීයතීති භවිතබ්බං” යි යොජනායි.

උප [b]~~~පසිද්ධසාධම්මතො, ප්‍රසිද්ධවූ ගවාදීහු හා සමානස්වරූපවූ ගවයපදාර්ථයා ආශ්‍රයකොටැ ගෙනැ; සාධියසාධනං, (“ගො

* පා. 3, 1, 8. † පා. 3, 1, 9. [a] 4, 28 සූ. [b] 5, 6 සූ

සදෘශෝ'සම්පශුග්ගිවයශබ්දවාච්‍යඃ " සී සංඥුසංඥිසම්බන්ධසං බන්‍ධ) සාධ්‍යයාගේ සිඬකිරීමැ ; උපමානං, උපමානනම් වේ— යථා ගො විය ගවයොති, "ගො විය ගවයො" යනු මෙනි— ගවයො, ගවර—තදෘචරණෙන, තෙන ආචරණෙන—තබ්බි සිඪාචරණෙ, ඒ උපමානයෙන් විශිෂ්ටවූ ප්‍රවෘත්තියෙහි— අඤ්ඤත්‍ථා, උපමානොපමෙයභාවයැ ඊයප්‍රත්‍යයෙන් ද්‍යෝතිතවූ බැවින් තදන්තයාගේ උපමෙයයෙහි වෘත්තියැ වන්නේ වීනම්—තිනා, තිප්‍රත්‍යයෙන්.

**ආධා**[a]—උපමානාතනෙතාභාවා, උපමානයෙහි (උපමෙ යයාගේ) ඇතුළත්නොවීමැ හෙයින්.

**කත්තු**[b]—කත්තුවචනයෙන් "කම්මා" යනු නිවෘත්තයි.

**ච්‍ය**[c]—කරාදිවිසිඬො, කරාසහුත්‍රයෙන් වෙසෙසනලද— "**භෘශාදිභ්‍යො භුව්‍යච්වෙල්ලොපශ්ච හලඃ**"* යන සූත්‍රයෙහි ආචාර්‍ය්‍ය පාණිනින් විසින් භූවිග්‍රහණයැ උපාත්තයැ මෙහි කුමක් හෙයින් අගෘහීතදැයි අශඩකා කොටැ එයැට "තෙනෙව" යනාදින් හෙතු දක්වූහු—තෙනෙව, (යම්හෙයකින් කරාදි විශිෂ්ටවූ අභූතතද්භාවයැ ව්‍යපිද) එහෙයින් මැ—ඉතිශබ්ද හෙතුයෙහි වැටේ—තප්පකරණෙ, ඒ ධාතුප්‍රත්‍යයප්‍රකරණ යෙහි—ච්ච්, (භූසො යන ප්‍රථමාන්තයා කෙරෙන්) ච්ප්‍රත්‍යය වේ—ඉහෙව, ("**ච්‍යන්තෙ**"[d] යන) මේසූත්‍රයෙහි මැ—"න ච වුච්චතෙ" සී යෙදියැයුතු.

**සද්දෘ**[e]—ප්‍රත්‍යයවිධියෙහි පළමින් නිර්දෙශයැ යුක්තවූවද "සද්දාදීනි" යන විතීයාග්‍රහණසාමීප්‍යයෙන් "දුතියන්තෙහි" යන වෘත්තියැ කීහු—සබ්බත්‍ථ, (සද්දං කරොති, සච්චමාචික්ඛති, යනාදි) සියලුතැන්හි—පඤ්චිකාටීකායෙහි "සබ්බත්‍ථ" යන තැන්හි "**තමධීතෙ තං ජානාතිච්චාද්‍යෙ සබ්බත්‍ථ**" සී ණාදි ප්‍රත්‍යයාපිනිර්දෙශයද මෙහි මැ සඩගෘහීතයැ ඒ වනාහි ණාදි කාණ්ඩයෙහි "**තං හනාති**"[f] යනාදි සූත්‍රවිවරණපඤ්චිකාපාඨ යෙහි නිරූපිතහෙයින් මෙතැන්හි නොයෙදෙන්නාක් මෙන් හැගේ—ඉප්පච්චයොපි, ("**ධාතවත්‍ථෙ නාමස්මි**"[e] යන සූත්‍ර යෙන්) ඉප්‍රත්‍යයද—නානාවාක්‍යභාවෙන, ("**ධාතවත්‍ථෙ නා මස්මි**[g]" "**සද්දාදීනි කරොති**"[h] යන භින්නවාක්‍යත්වයෙන්—

* පා. 3, 1, 12.

5, 7 සූ. [b] 5, 8 සූ. [c] 5, 9 සූ. [d] 5, 10 සූ. [e] 4, 29 සූ.
[f] 5, 12 සූ. [g] 5, 10 සූ.

සමුච්චයා, අයප්‍රත්‍යයාගේද ඉප්‍රත්‍යයාගේද සමුච්චයහෙයින්—"තිමහි ලෙ ච සිඬං" යී සම්බන්ධයි—න විහිතො, (පාණිනීයාදී යෙහි මෙන් "ධාතොරෙකාචො හලාදෙඃ ක්‍රියාසමභිහාරෙ යඞ්"* යනාදීන්) අවිහිතයි—"සාමාන්‍යවිහිතා විධයඃ ප්‍රයොග මනුසරන්ති" යන ලක්‍ෂණයෙන් සාමාන්‍යයෙන් විහිතවූ මානප්‍රත්‍යය භාෂාභිඥ්ඥයෙහි වැටෙතී හැඟවූහු.

**ධා**[a]—අපරිනිප්ඵන්නෙනා, අසිඬාවස්ථායෙහි සිටියාවූ—අසත්වභූතො, අද්‍රව්‍යවූ—සාමත්ථියං න ඉති, සමර්ථභාවයැ නැත් තේයැයි කියා.

**සච්චා**[b]—"සුඛං වෙදයති" යනාදී විග්‍රහයි — ව්‍යාපාර්ථා, විකල්පයෙන් හඳුලහෙයින්.

**චුර**[c]—අත්ථාතිදෙසා, (සූත්‍රයෙහි) කිසි අර්ථවිශෙෂයක් නොදැක්වීමෙන්—යොගවිභාගතො, ණි යන යොගවිභාග යෙන්.

**පයො**[d]—"ප්‍රයොජක" නම් චොදකයි ; මෙහෙයන් නේයි—"පෙසනාජ්ඣෙසනාදි" යන තැන්හි ආදිශබ්දයෙන් "භික්ඛා වාසයති කරීසොජ්ඣාපයති" යනාදී තත්සමර්ථා චරණයන්ගේ ග්‍රහණයයි—ඉදං පයොජකව්‍යාපාරෙතීදං—පයොජකමත්ත, ප්‍රයොජකසාමාන්‍යයාගේ—තං, ඒ (ප්‍රයො ජකග්‍රහණයැ)—රූළ්හො, ප්‍රසිඬයැ—තං, ඒ චුරාදීන්කෙරෙන් ණිවිධානයැ—එවං, මේ වක්‍ෂ්‍යමාණප්‍රකාරයෙන්.

**කොත**[e]—පරසමඤ්ඤා, පරෙසං, කාත්‍යායනයන්ගේ ; සමඤ්ඤා, සංඥවෙකි—පරොක්ඛ, ඉන්ද්‍රියාවිෂයකාලයෙහි—පුබ්බාපරීභූතලක්ඛණෙ, (විකෙලදනාදි ප්‍රධානක්‍රියාවට අවය වවූ) පූර්වාපරීභූත අධිශ්‍රයණෝදකසෙචනාදී ක්‍රියාරූපයැ ලක්‍ෂ ණකොටැ ඇති—තණ්ඩුලයන්ගේ විකෙලදනයැතෙමැ පචි ධාතුහට ප්‍රධානාර්ථ වෙයි අධිශ්‍රයණාදීහු තාදර්ථ්‍යයෙන් පච්වාච්‍ය වෙති දතයුතු—එහෙයින් කියනලදි භර්තෘහරීන්විසින්.

"අනන්තරං ඵලං යස්‍යඃ කල්පේ‍යතෙ තාං ක්‍රියාං විදුඃ
ප්‍රධානභූතාං තාදර්ථ්‍යාදන්‍යාසාන්තු තදෘත්‍යතා"—යී.

"සත්වභූතො පතීයතෙ" යී ශෙෂයි—බහුවචනමපි, ("පාකා පාකෙ" යනාදීන්) බහුවචනද—"යදා කම්මමෙව කත්තුභා

---

° පා. 3, 1, 22.

[a] 5, 12 සූ. [b] 5, 13 සූ. [c] 5, 15 සූ. [d] 5 16 සූ. [e] 5, 17 සූ.

වෙන විවජ්ජීයතෙ" සී සම්බන්ධයි—සුඛෙදත්තාදිනා, සුඛෙද්‍රුත්වාදියැ හෙතුකොටැ ගෙනැ—අනන්තරෙන වචනං, (පාණිනීයාදියෙහි මෙන් "**කර්ම්මවත්කර්ම්මණා තුල්‍යක්‍රියඃ**"*සී) සූත්‍රයක් නැතිවැ—අත්ථතො, ("කම්මමෙව කත්තු" සී සාක්‍ෂාත්කණ්ඨොක්ත නුවූවද) අර්ත්ථහෙයින්—අඤ්ඤථා, ඉදින් කර්ම්මයෙහි මැ තෙප්‍රත්‍යය නොවී නම්—අතො, මේ ("භිජ්ජතෙ" යන් නාහු) කෙරෙන්—වාක්‍යතො, ("භිජ්ජතෙ කුසූලො සයමෙව" යන) වාක්‍යයෙන්—උද්ධරිත්වා, වෙන් කොටැ—පදෙ සංඛරියමානෙ, ("භිජ්ජතෙ" යන) පදයැ නිෂ්පාදනයැ කරනුලබන කල්හි—තදෙව, ඒ (පදූපිසාමාන්‍යයැ) මැ—තන්නිප්ඵාදනෙ, ඒ (සංස්කාර්‍ය්‍යමාණපදයාගේ) සංස්කාරණයෙහි—"න පදමුදාහරණං" යනුයෙන් වාක්‍යයැ මැ උදාහරණයැයි දක්වූහු—අස්මිං පක්ඛෙ, මේ (කර්ත්තෘත්වයෙන් විවක්‍ෂිත) පක්‍ෂයෙහි—තබ්බිසයත්තං, කර්ම්මවාචිවූ ස්වයංශබ්දවිෂයත්වයැ—"ඉමිනා අනෙන ච විසෙසිතත්තා" සී සම්බන්ධයි—වචනං, (පාණිනීන් මෙන් "**ලඃ කර්ම්මණි ච භාවෙ චාකර්ම්මකෙභ්‍යඃ**"† යන) සූත්‍රයෙක්—ක්‍රියත්ථනියමොපි, (අකර්ම්මකධාතූහුකෙරෙන් භාවයෙහිද කර්ත්තෘයෙහිද සකර්ම්මකධාතූහුකෙරෙන් කර්ම්මයෙහිද කර්ත්තෘයෙහිද ප්‍රත්‍යයවෙයි යන) ක්‍රියාපිනියමයද—"යථා වුත්තෙතන සාමත්ථියා ලබ්භතෙ" සී සම්බන්ධයි.

**ණීණ**[a] ~ යදත්ථං, යම් ප්‍රයොජනයක්—"ආදෙ න උදාහටො" සී සම්බන්ධයි.

**භාව**[b] ~ විවච්ඡාභෙදෙන, (සකර්ම්මාකර්ම්මක) විවක්‍ෂාභෙදයෙන්—උභයත්ථ, (භාවකර්ම්ම) දෙක්හි.

**කිච්ච**[c] ~ "**සඤ්ඤායං භරා**" (°) යනු ගණසූත්‍රයි.

**ගුහා**[d] ~ සද්දිකානං, (පාණිනීයාදි) වෛයාකරණයන්ට; අභිමතො, ("**ප්‍රෛෂාතිසර්ගප්‍රාප්තකාලෙෂු කෘත්‍යාශ්ච**"‡ **පෙසාතිසග්ගපත්තකාලෙසු කිච්චා**"§ යනාදි සූත්‍රයෙන්)—කාමචාරානුඤ්ඤා, කරනුකැමැත්තහට ඉච්ඡාවූපරිද්දෙන් අනුදැනීමැ—නිමිත්තභූතස්ස, ("භොතා කටො කත්තබ්බො" යනාදි තැන්හි කටකරණයට) කාරණවූ—විධිවිසෙසතොපි,

* පා. 3, 1, 87. † පා. 3, 4, 69. ‡ පා. 3, 3, 163. § ක. 4, 6, 12.
[a] 5, 20 සූ. [b] 5, 27 සූ. [c] 5, 31 සූ. (°) 5, 32 සූ. [d] 5, 33 සූ.

(ප්‍රෛෂාදි) විධීන්ගේ විශෙෂත්වයක් ඇතිකල්හිද—අතො යෙව, ඒ බහුලංවිධානයෙන් මැ—"නාවස්සං" යනාදියැ ජයාදිත්‍යව්‍යාඛ්‍යානයැ ආශ්‍රය කොටැ කීහු—කියනලදමැයි ඔහුවිසින්—"කිමර්ථං ප්‍රෛෂාදිෂු කෘත්‍යා විධීයන්තෙ, න සාමාන්‍යෙන භාවකර්මණොර්විහිතා එව, තෙ ප්‍රෛෂාදිෂ්වන්‍යත්‍ර ච භවිෂ්‍යන්ති, විශෙෂවිහිතෙනානෙන ලොටා බාධ්‍යන්තෙ, වාසරූපවිධිනා භවිෂ්‍යන්ති, එවං තර්හ්‍යෙතජ්ඥාපයති* ස්ත්‍ර්‍යධිකාරාත්පරෙණ වාසරූපවිධිර්නාවශ්‍යම්භවතීති" යි—අසරූපවිධි, අසරූපාපවාදප්‍රත්‍යයතෙමැ—"අවස්සං න හොතීති ඤාපනත්ථම්පි න විධීයතෙ" යි සම්බන්ධයි—"**වා'සරූපො'ස්ත්‍රියාම්**"† යනු පරසූත්‍රයි—"ධාත්වධිකාරෙ විහිතඃ අසරූපොපවාදප්‍රත්‍යයො බාධකො භවති ස්ත්‍ර්‍යධිකාරෙ විහිතම්ප්‍රත්‍යයං වර්ජයිත්වා" යනු මෙහි වෘත්තියි—අභිමතා, ("**ලිඞ් චොර්ධ්වමෞහූර්තිකෙ**"‡ යන සූත්‍රයෙන් පාණිනීන්ට)—"අරහාදිසු" යන ආදිශබ්දයෙන් "**අර්හේ කෘත්‍යතෘචශ්ච**"§ යන සූත්‍රයෙන් අභිකත්තෘයෙහිද, "**ශකි ලිඞ් ච**"‖ යන සූත්‍රයෙන් ශක්තිවිශිෂ්ටකර්තෘයෙහිද, "**ආවශ්‍යකාධමර්ණ්‍යයොඃ**"¶ යනු වැටෙනුයෙහි "**කෘත්‍යාශ්ච**"** යන සූත්‍රයෙන් ආවශ්‍යකාධමර්ණ්‍යවිශිෂ්ටකර්තෘයෙහිද විහිත තව්‍යාදීන්ගේ ග්‍රහණයයි—තංයොගා, ඒ ශක්තියැ හා එක්වීමැ හෙතුකොටැ ගෙනැ.

**ඛාතනාමි** [a]—උපාදනසීලො, උගන්වනසුලුවූයේ.

**ආසිං** [b]—ක්‍රියාවිසෙසකත්තුවිසයා, ක්‍රියාවිශෙෂයාගේ කත්තෘහු විෂයකොටැ ඇත්තී—අස්සා ක්‍රියාය, මේ (ජීවනනන්‍දනාදි) ක්‍රියාවට.

**කාරා** [c]—කරොති අත්තනො ඵලන්ති කාරණං.

**හායනො** [d]—"ජහන්ති උදකං" යනු ව්‍රීහිවිෂයෙහි වැටෙන්නාවූ හායනශබ්දයට ප්‍රවෘත්තිනිමිත්තමාත්‍රදර්ශනයෙ කැයි දතයුතු.

**ක්වච** [e]—තෙන, ඒ ඛවිග්‍රහණයෙන්—තස්ස, ඒ බහුලංවචනයාගේ—මහාධිකාරත්තා, මහාවිෂයබැවින්—කුතොචි, කිසි (ධාතුවක්හු) කෙරෙන්.

---

* "තර්හි ඥාපයති"-බාරාණසී. † පා. 3, 1, 94. ‡ පා. 3, 3, 164. § පා. 3, 3, 169. ‖ පා. 3, 3, 172.
¶ ආවශ්‍යකාධමර්ණ්‍යයොර්ණිනිඃ (පා. 3, 3, 170). ** පා. 3, 3, 171.
[a] 5, 34 සූ. [b] 5, 36 සූ. [c] 5, 37 සූ. [d] 5, 38 සූ. [e] 5, 42 සූ.

**සමා**[a] ~ තාඬ, ඒ උපමානයද—හෙදෙන විවරණං, ("සමානාදීහි" යන පමණක් නොකියා "සමානාදීහි යාදීහි" යි) හෙදයෙන් අපි කීමැ.

**භාව**[b] ~ තදධිකරණ, ඒ ශක්තියට ආධාරවූ—තත්‍රට්ඨතාය, (ශක්තිය) ඒ ද්‍රව්‍යාදියෙහි පිහිටිබැවින්—තෙසං, ඒ කර්තෘාදි කාරකයන්ගේ—අඤ්ඤමඤ්ඤව්‍යවුත්තරූපත්තා, ඔවුනොවුන්කෙරෙන් නිවෘත්තවූ කරණාදිස්වරූප ඇතිබැවින්—එවම කත්වා, එසේහෙයින්—"කත්තා නිමිත්තං" යි සම්බන්ධයි—තදත්ථෙ, ඒ කර්මසමවායිනීවූ පචනාදික්‍රියාවගේ අර්ථයෙහි—"අධිස්සයනාදයො පවත්තෙන්තො ක්‍රියාය නිමිත්තං" යි සම්බන්ධයි—අධිස්සයනාදයො, භාජනසංස්කරණාදීන්—විධාපත්තියං, (වෘක්ෂාදීන්ගේ) ඡේදකරණයෙහි—ව්‍යාපනෙ, සම්බන්ධයෙහි—අවණ්ණන්ති, ("**එඔනමවණ්ණෙ**"[c] යන සූත්‍රයෙහි) අවණ්ණ යන—එස්ස, ("**ලහුස්සුපන්තස්ස**"[d] යන සූත්‍රයෙන් කරනලද) ඒකාරයහට—සකලෙන, ("එඔනමවණ්ණෙ"[h] යන සියලුසූත්‍රයෙන්—සාමඤ්ඤෙන, ("**පදරුජවිශස්පෘශො ඝඤ්**"* "**සෘස්ථිරෙ**"† "**දුරජාරෙ කර්තරි ණ්වුල් ච**"‡ යනාදීන් විශෙෂවිධානයැ නොකොටැ "**භාවකාරකෙස්වඝණ්ඝකා**" යි[b]) සාධාරණ්‍යයෙන්—නෙපථ්‍යං, සැරහුම්ද.

**වමා**[e] ~ සාපානදෛණ්‍යං සිත, බලුහඹුකොටුවෙකැ තුබූ; සුපාණවමදු විය, බල්ලන් නැඟු දෙයක් මෙන්.

**කම්**[f] ~ "යථාදස්සනත්ති ආචික්ඛති" යි යොදනු—කුතොචි, කිසිධාතුවක්හු කෙරෙන්.

**ඉකාපි**[g] ~ අපරිපඨිතො, ධාතුපාඨයෙහි නොහදූලේසි—ගුහනං, රුජනං, මොදනං, යි වාක්‍යයි—ති කිච්චාසිඨෙති, "**ති කිච්චාසිඨෙ**"§ යන සූත්‍රයෙන්—"සඤ්ඤායමභිධෙය්‍යායං ආසිඨෙ ගම්‍යමානෙ ධාතුහි තිප්පච්චයො හොති ආසිඨෙ කිච්ච" යනු මෙහි විරිතයි—"ජිනො එනං බුජ්ඣතූති ජිනබුඩ්" යනාදි උදාහරණයි—ගුහා, අස්වැන්නයි—"ක්‍රොෂ්ටුවින්නා සිංහපුච්ඡී කලශී ධාවනී ගුහා" යනු නිඝණ්ඩුයි.

* පා. 3, 3, 16. † පා. 3, 3. 17. ‡ පා. (3, 3, 20) වාර්තික.
§ කා 4, 2, 3.

[a] 5, 44 සූ. [b] 5, 45 සූ. [c] 1, 37 සූ. [d] 5, 84 සූ.
[e] 5, 47 සූ. [f] 5, 48 සූ. [g] 5, 50 සූ.

**ඉක්ඛී**[a] ~ කරණං, උච්චාරණයැ.

**සීලා**[b] ~ ගම්‍යමානෙ, (අපිප්‍රකරණශබ්දාන්තරාදීන්) ප්‍රතීය මානකල්හි—අභිමන්තො, (“**ආවශ්‍යකාධමර්ණ්‍යයොර්ණිනි**” යන සූත්‍රයෙන් පාණිනීන්ට)—යොගවිභාගා, ණී යන සූත්‍ර විධාකරණයෙන්—“සාධු කරොති, බ්‍රහ්මං වදති, අසද්ධං භුඤ්ජති, පණ්ඩිතමත්තානං මඤ්ඤති” යී වාක්‍යයි.

**ථාව**[c] ~ දෙසන්ධකාරභිදුරෙ, දෙශාන්ධකාරයැ බිඳුනේ.

**කාතන්ති භූ**[d] ~ ලොකෙ, සත්වලොකයෙහි; සබ්බේව භූතා, සියලු සත්වයෝ මැ; සමුස්සයං, ශරීරයැ; නික්ඛිපිස්සන්ති, චුතිවශයෙන් හෙළත්.

**කොනා**[e] ~ ක්තප්‍රත්‍යයෙන් කර්මයැ උක්තහෙයින් “කතො” යනු අභිමාත්‍රයෙහි ප්‍රථමායැ කර්තෘ අනභිහිතබැවින් “භවතා” යනු කර්තෘයෙහි තෘතීයායැයි දක්වනුවෝ “විප රියෙන පඨමාදිකා විභත්ති” යනු කීහු—කම්මෙ ගුණීභූත ත්තා, කර්මයැ ඇතිකල්හි (භාවයැ) අප්‍රධානබැවින්.

**කාතන්ති**[f] ~ සො ච, ඒ (ආරම්භය) ද—සරූපාඛ්‍යානායෙ, ස්වභාවකථනයැ පිණිසැ—“ක්‍රියාරම්භෙ” යනු ක්‍රියාපිවිශෙෂණ වුවද ප්‍රත්‍යයාපිවිශෙෂණ වුවද නිවරදබව දක්වන පිණිසැ “ක්‍රියත්ථවිසෙසනං” යනාදි කීහු—“අනන්තරසුත්තෙන යො විහිතො කොනා සොපි සාමඤ්ඤෙන වචනතො භාව කම්මෙසු ආරම්භෙපි හොති” යී සම්බන්ධයි—සාමඤ්ඤෙන, (“භාවකම්මෙසු” යී) සාමාන්‍යයෙන්—තත්‍ර, ඒ විශෙෂයෙහි.

**ඨාස**[g] ~ අනාරම්භත්ථං වචනං, (ආරම්භයැ පූර්වසූත්‍රයෙන් සිද්ධවූබැවින්).

**ගම**[h] ~ යම් ප්‍රයොගයෙක්හි කර්තෘහුවිසින් නිෂ්පාදිතවූ පදයාගේ ක්‍රියාතොම කර්මරහිත වැ නොපවතීද ඒ සකර්මක නම් වෙයි—ඒ මෙසේ දතයුතු—“පචතෙති හි වුත්තෙ තු යෙන කෙනචි ජන්තුනා ඔදනං වා පනඤ්ඤං වා කිඤ්චි වත්‍ථු නති ඤායති” යී—යම් ප්‍රයොගයෙක්හි පදයාගේ ක්‍රියාතොම කර්මරහිත වේද ඒ අකර්මක නම් වේ—ඒ මෙසේ දතයුතු—“තිට්ඨති දෙවදත්තොති වුත්තෙ කෙනචි ජන්තුනා ඨානංව බුද්ධි

---

[a] 5, 53 සු. [b] 5, 4 සු. [c] 5, 55 සු. [d] 5, 56 සු.
[e] 5, 57 සු. [f] 5. 58 සු. [g] 5, 59 සු. [h] 5, 60 සු.

විසයො කම්මභූතං න කිඤ්චි"—සී—ඤෙනා න විධාතබ්බා, "පද ගතෞ" යන ධාතුහුකෙරෙන් "**අනිෂ්පන්නාන නිෂ්පන්න ශබ්දශක්ත්‍යා නිෂ්පන්නත්වාත්**" යන වාර්ත්තිකයෙන්)—සාලි කාරණෙසු, සස්සාදියෙහි.

**අභා** [a]—කුතොචි, කිසි (ආධාරාදියක්හු) කෙරෙන්—අප කස්සනං, අපකර්ෂයෙක්; හෙවත් වෙන්කිරීමෙක්—"චකාර තො යථාපත්තනමෙති සම්බන්ධො—වුත්තං" සී ශෙෂයි—"භාව කම්මෙසු සම්බජ්ඣතෙ" සී යොජනායි—කෙචි, (පාණීනාදි) සමහරකෙනෙක්; ඉච්ඡන්ති, ("**ක්ලීබෙ ක්තඃ**"* යන සූත්‍රයෙන්)—කත්තමිච්ඡන්ති, ("**මතිබුද්ධිපූජාර්ථෙභ්‍යශ්ච**"† යන සූත්‍රයෙන්)—අඤ්ඤථා, ඉදිත් අතික්‍රාන්තවචන නොවීනම්—සීල පපභූතීහි, "සීල-සමාධිම්හි, රක්ඛ-පාලනෙ" යනාදි ධාතුන්කෙරෙන්—මෙයින්

"ශිලිතො රක්ෂිතඃ ක්ෂාන්ත ආක්‍රුෂ්ටො ජුෂ්ට ඉත්‍යපි
රුෂ්ටශ්ච රුෂිතශ්චාභිව්‍යාහෘත ඉත්‍යපි—
හෘෂ්ටතුෂ්ටෞ තථා කාන්තස්තථොභෞ සංයතොද්‍යතෞ
කෂ්ටං භවිෂ්‍යතීත්‍යාහුරමෘතඃ පූර්ව්වත් ස්මෘතඃ"—

යන වාර්ත්තිකොක්ත ප්‍රයොගසාධනක්‍රම දක්වත්—කෂ්ටම්, කෂ්ටශබ්දයැ; භවිෂ්‍යති, භවිෂ්‍යත්කාලයෙහි (වැටෙයි); අමෘතඃ, අමෘතශබ්දයැතෙමැ; පූර්ව්වත් ස්මෘතඃ, පළමුකී පරිද්දෙන් (වර්ත්තමානයෙහි වැටෙයි) දන්නාලදි—"යඤ්ච පන ඵලභූතෙ දුක්ඛ කණ්ඩසඤ්ඤ වත්තතෙ" සී සම්බන්ධයි.

**තුංනා** [b]—තස්ස, ඒ ක්‍රියාපියාගේ—තදත්ථ, ඒ වාච්‍යවූ භාවයෙහි—"ඨාතබ්බං" යනු භාවයෙහි තබ්බප්‍රත්‍යයයි—සක නිස්සයක්‍රියාව්‍යපදෙසො, ස්වාශ්‍රයක්‍රියාව්‍යවහාරයැතෙමැ—උච්චාරිතායමෙව, (ගච්ඡති යනාදීන්) කණ්ඨොක්තක්‍රියාවෙහි මැ—අභිමතා, ("**ඉච්ඡත්ථෙසු සමානකත්තුකෙසු තවෙතුං වා**"‡ යන සූත්‍රයෙන්)—ඉච්ඡිතස්ස, ("දෙවදත්තං භුඤ්ජමානං ඉච්ඡති" යන) "ඉස-ඉච්ඡායං" යන ධාතුහුගේ—සාධනත්ථ තා, කම්මසාධනයැ අපිකොටැ ඇතිබැවින්—අභිමතා, ("**අරහසක්කාදිසු ච**"§ යන සූත්‍රයෙන් කාත්‍යායනයන්වද, "**ශකධෘෂජ්ඤාග්ලාඝටරභලභක්‍රමසහාර්හාස්ත්‍යර්ථෙෂු තුමුන්**"‖

* පා. 3, 2, 187. † පා. 3, 2, 188. ‡ ක. 4, 2, 12.
§ ක. 4, 2, 13. ‖ පා. 3, 4, 65. [a] 5, 61 සු. [b] 5, 62 සු.

යන සූත්‍රයෙන් පාණිනීන්ටද)—අක්‍රියාර්ථවූ ශකාදීන් උපපද කල්හි තුමුන්ප්‍රත්‍යය වන පිණිසැ පුනරාරම්භයැ කරනලද්දැයි යනාදීන් පාණිනීයයන් විසින් වර්ණිතක්‍රම විඝටනයැ පිණිසැ "තෙන" යනාදි කීහු—"තාදත්ථියමත්ථියෙව" යනුයෙහි "සක්කොති" ආදීන්ට භොජනක්‍රියාර්ථත්වයැ ඇත්තේමයැ යනු අභිප්‍රායයි—සිද්ධමෙව, ("**තුංකාමෙ**"[a] යනාදි සූත්‍රයෙන් තුං ප්‍රත්‍යය) සිද්ධමැයි—හොනතීති, "**පයත්තාපත්තිවචනෙනෙවලමත්ථෙසු**"* යන සූත්‍රයක් නැතිවත්) වන්නාහුයැයි—අභිමතා, ("**කාලසමයවෙලාසු තුමුන්**"† යන සූත්‍රයෙන් පාණිනීන්ට) —ඉමස්ස, මම් "කාලො භොත්තුං" යනාදියටද—අව්‍යභිචාරතො, අවිනාභාවයෙන්—"භොජනං භාවො භවති" යී යොදනු—තදත්ථා, ඒ භොජනයැ ප්‍රයොජන කොටැ ඇත්තී—පාණිනීන් විසින් තුමුන්විෂයෙහි "**තුමුන්ණ්වුලෞ ක්‍රියායාං ක්‍රියාර්ථායාම්**"‡ යන සූත්‍රයෙන් ණ්වුල්ප්‍රත්‍යය විහිතහෙයින් "කාරකො වජති" යනාදි කීහු—"පුබ්බණ්හෙන" යනාදීන් පරිහාර කීහු—"**ණ්වුලඃ ක්‍රියාර්ථොපපදස්‍ය විධානං§තෘජාදිප්‍රතිෂෙධාර්ථම්**" යන වාර්ත්තිකමතානුසාරීවූ චොදකයන්ගේ ප්‍රසඞ්ගයැ ආශඞ්කා කොටැ "නචෙවං" යනාදි කීහු.

**පවි**[b] ~ "සොතුන" යනාදියෙහි "සවනං කාතුන" යනාදීන්ද "සුතෙන" යන තැන්හි "සවනං" කියාද වාක්‍ය ගතයුතු.

